sinhalaebooks.com

©

මෙම කෘතිය කතුවරයාගේ පූර්ණ අනුමැති සහිතව
sinhalaebooks.com වෙබ් අඩවිය විසින්
පාඨකයන්ගේ කියවීම උදෙසා නොමිලේ බෙදාහරින ලද කෘතියකි.

Published with Author Consent.

sinhalaebooks.com



sinhalaebooks.com

"එහෙම වෙන්නේ කොහොමද යකෝ? එතකොට මගේ නංගිට මොකද වෙන්නේ?"

සංදේශ් කෑගැසුවේ කෝපයෙනි. රංගන තම මිතුරා දෙස බලා උන්නේද එම පැනයම දෙනෙතට නගාගෙනය. සමාධි ගිය සතියේ ලංකාවට ආවේ හැකි ඉක්මනින් ම අසිත හා විවාහ වීමේ බලාපොරොත්තුවෙනි. අසිතගේ දුරකතනයද දැන් දින කීපයක සිටම වසා දමා තිබීම නිසා ඔහුට තවමත් සමාධි ලංකාවට ආ බව දැනුම් දෙන්නට ලැබුණේ නැත.

වසර කිහිපයකට පෙර අසිත ඉන්දියාවට ගියේ වැඩිදුර අධ්‍යාන කටයුතු සඳහාය. ඔහු සංගීත විෂයේ දක්ෂයෙකි. එම දක්ෂතාවත් මනා කඩවසම් පෞර්ෂයත් හේතුවෙන් ඔහුට තරුණියන් අතර ජනප්‍රිය චරිතයක් වීමට ගත වූයේ ඉතා කෙටි කාලයකි. ඔහුට සමාධි මුණගැසුණේ ඉන්දියාවට ගොස් මාස දෙකතුනකට පසුවය.

සුන්දර අහිංසක යුවතියක් වූ සමාධිගේ පවුලේ අය ඉන්දියාවේ නතරවී උන්නේ ඇයගේ අධ්‍යාපන කටයුතු අවසන් වන තුරුය. සමාධිගේ අයියා සංදේශ් ලංකාවේ නතරවූයේ ව්‍යාපාර කටයුතු නිසාය. හමු වී කෙටි කලකින්ම සමාධි හා අසිත පෙම්වතුන් බවට පත් වූ අතර මේ ගැන සමාධිගේ මව්පියන් ද දැන සිටියහ.

මීට මසකට පෙර අසිතට හදිස්සියේ ලංකාවට එන්නට සිදු වූයේ ඔහුගේ මව අසනීප වීම නිසාය. ලංකාවට පැමිණි පසු ඔහු දිනක් සංදේශ් හමුවීමට ද ගියේය.

******************

# 01.

කෙත්මි ගෙදර ආවේ මාස තුනකට පසුවය. ඒ ආච්චි අම්මාගේ අවුරුද්දේ දානයට සහභාගී වීමටය. බෝඩිමක නතර වී අධ්‍යාපනය හදාරන වන කෙත්මිට පසුගිය මාස තුනේම ගෙදර එන්නට අවස්ථාවක් ලැබුණේ නැත. නිවාඩුවකුත් ලැබුණු නිසා මෙවර නම් ආවේ ටික කාලයක් නවතින්න හිතාගෙනය.

***"අපූරු යාළුවා... ලැස්ති වෙලා ඉදපන් එන ගමන් උඹවත් ගන්නම් කියලා කිව්වේ... යකෝ.... මං පාරේ... මේකි ගෙදර ඇවිල්ලා සැපේ ඉන්නවා...."***

හංසි කෙත්මිගේ කාමරයට ආවේම කෑගසාගනය. ඇය කෙත්මිගේ හොඳම මිතුරියයි. හැමදාමත් කෙත්මි ගෙදර එන දවසට හංසි කෙත්මිටත් පෙර මෙහි එයි. හංසිට තමන්ගේ ගෙදරට වඩා මේ ගෙදර හුරුය. අද ඇයට කෙත්මි මගදීම අමතා කීවේ ඇයව

sinhalaebooks.com

ගන්නට එන බවය. දැන් මේ ආවේ බලන් ඉඳ බැරිම තැනය.

*"අනේ රත්තරනේ..... මට ඒක අමතකම වුණා දෙයියෝ...."*

කෙත්මි කීවේ සැබෑවකි. ඇයට ඒ බවක් අමතකම වී ගොස් තිබුණි. හංසිව සිහි වූවේ ඇයම කාමරයට ආ පසුය.

*"මාව අමතක වුණා... මේ මාව ? උඹ කොහොමද බං මට මෙහෙම කළේ ? මං උඹේ හොඳම යාළුවා නේද?"*

*"අනේ මට සමාවෙයන් මැණිකේ.... ඉන්නකෝ.... මං ඔයාට චොකලට් එකකුත් ගෙනාවා..."*

*"අනේ අනේ.... තියාගනින්. උඹ හැමදාම මට කරන්නේ මෙහෙමනේ... මට සේරටම කලින් කියපන්... අර සාලෙට වෙලා විරිත්තන රිලවු දෙන්නා කවුද කියලා..."*

හංසි කියන විට කෙත්මිට සිනහවක් නැගුණි. මේ කියන්නේ අසිතයි දිලූෂයි ගැන විය යුතුය. අද ඇයව

sinhalaebooks.com

ගන්නට අමතක වූයේ ඔවුන් දෙදෙනා නිසා කී විට මෙතන හොඳ යුද්ධයක් බලා ගන්නට හැකිය.

*"මට ඔය හිනාව නම් අල්ලන්නේ නෑ...."*

*"ඔය ඇවිල්ලා ඉන්නේ ඔයත් දන්න කියන දෙන්නෙක්... ඔයාට මතකද අසිතයි දිලූෂයි කියලා දෙන්නෙක් ?"*

*"මොනවා..... මේ ඒ දෙන්නද ඒ ඇවිල්ලා ඉන්නේ?"*

*"ඔව් බං... මට කෝච්චියේදි හම්බුණේ. මාවත් කන්ෆියුස් උනා... පස්සේ ඉතිං මං එක්කම ආවා..."*

*"හරිනේ.... එහෙනම් ඉතිං මාව අමතක වුණ එක අහන්නත් දෙයක්ද.... මෙයාගේ ලව් එක ඇවිල්ලනේ...."*

*"කෑනොගහා හිටිං යකෝ.... අම්මට හරි අර කේලම් බතලයාට හරි ඇහුණොත් මං ඉවරයි..."*

sinhalaebooks.com

*"අක්කා.... අක්කාා.... අක්කාාා ....."*

*"මොකද බං අර... කැඩිච්ච ඇම්බියුලන්ස් නලාවක් වගේ කෑ ගහන්නේ?"*

*"ඇහුනේ නෑ වගේ ඉදපං"*

කෙත්මිගේ මල්ලි රනුක් පහළ සිට කෑගසනු ඇසුණත් කෙත්මිත් හංසිත් දෙදෙනාම ඔහුගේ හඩ නෑසුණ සේ උන්නෝය. කතා කර කතා කර බැරිම තැන ඔහු අඩි සද්ද කරමින් පඩිපෙළ නැඟ එනු ඇසුණි. අනතුරුව ඔහු දඩිබිඩි ගාමින් දොරට ගසන්නට විය. හංසි දොර අරින්නට ගියේ ඔහුට බනින අතරේ ය.

*"දොර කඩන්න එපා බතලයෝ....."*

*"ආ..... හංසි මැඩම් ඇවිල්ලා නේද.... මං ඒත් බැලුවා මොකද පරක්කු කියලා..."*

*"කොහෙද බං අද උඹලගේ අක්කට අද උතුර දකුණ මාරුවෙලා ඉන්නේ...."*

***“ආ.... ඒක එයාගේ හැටි නේ. මේ අක්කේ, අන්න ලොකු හාමුදුරුවෝ පණිවිඩයක් එවලා තිබුණා... ගෙදර ආපු හැටියේ ටිකකට දෙන්නත් එක්ක පන්සල පැත්තේ ඇවිල්ලා යන්න කියලා.....”***

***“දෙන්නත් එක්ක කිව්වේ තමුසෙයි මමයි නේද ? ඉන්නවා මං ඇඳුමක් දාන් එන්නම්...”***

***“දෙන්නා කිව්වේ මට නෙමෙයි මැන්ටලේ... තමුසෙලා දෙන්නට... අනේ මන්දා මූන් දෙන්නගේ මොළේ කොහේ තියනවද කියලා..”***

රනුක් යන්නට ගියේ වෙනසක් නොකර දෙදෙනාටම බැනවදිමින් ය.

***“අපිට බැන බැන යන එවුන් මගදි කකුල පැටලිලා වැටියං දෙයියනේ....”***

හංසි කීවේ කාමරයෙන් එළියට හිස දමාගෙනය. කුස්සියේ උයමින් සිටි කෙත්මිගේ අම්මා හසන්තිගේ මුහුණට සිනහවක් නැගුණි. දැන් ඉතිං දවස් ගානක් මේ යුද්ධයට ඇස් කන් හුරුකර ගත යුතුය. තුන් දෙනාම එකෙකුට එකෙක් නොදෙවෙනි රණ්ඩු කෙකිය.

sinhalaebooks.com

*"හසන්ති ඇන්ටි මොකෝ මේ තනියම හිනාවෙන්නේ ?"*

අසිත හා දිලූෂ කුස්සියට එනවිටම දුටුවේ ඇයගේ සිනහවය. ඔවුන් දෙදෙනා දුටු විට ඇයගේ සිනහව තවත් වැඩිවිය.

*"ඇහෙනවා නේද පුතා අක්කලා මල්ලිලාගේ සද්දේ ? හැමදාම ගෙදර ආවම මේක එකම පොර පිටියක් කරනවා තුන් දෙනා එකතු වෙලා...."*

*"ඇත්තට කවුද පුංචි අර ආපු නංගි ?"*

දිලූෂ අසන්නේ හංසි ගැනය. හසන්ති දිලූෂගේ පුංචි බව සැබෑය. ඒත් ඔහු අද මෙහි ආවේ පළමු වතාවට ය. මීට අවුරුදු දහයකට දොළහකට පෙර කෙත්මිලා කොළඹ ගෙවල් දොරවල් විකුණා දමා මෙහි ආවේ කෙත්මිගේ අම්මාගේ ස්ථාන මාරුවක් නිසාය. අවසානයේ මෙහිම නතර වන්නට ඔවුන් තීරණය කළේය.

ආච්චිගේ මරණයට ආවේ අම්මලාය. මෙවර අසිතත් පැමිණි නිසා දෙදෙනාට මේ ගමන එන්නට සිදුවිය. ඔවුන් ආවේ ඉතාමත් කැමැත්තෙනි. අසිතලාගේ පවුලත් ඉස්සර සිටම කෙත්මිලාගේ පවුලේ මිතුරන්ය.

*"ඒ අපේ සුදූගේ හොඳම යාළුවා... හංසි... හරි හොඳ කෙල්ල. අපේ ගෙදරත් එයාගෙ ගෙදර වගේ තමයි... ජේනවනේ සද්දේ..."*

*"රනුක්ට නේද ඒ කෑ ගහලා බනින්නේ ?"*

*"ඔය පටන් ගත්තා විතරයි. හෙට අනිද්දට බලන්න පුළුවන් දෙන්නා තුන්දෙනාගේ වැඩ. ඔයාලා දෙන්නත් පරිස්සමින් ඉන්න වෙයි..."*

*"ආ... ටොමී බෝයි... මොකද ආපු ගමන් කුස්සියේ ?"*

රනුක් ආවේ එසේ අසාගෙනය. *ටොමී* යන නම දිලූෂට දැම්මේ කෙත්මි පුංචි කාලයේ ය. ඇය ඒ නම සොයා ගත්තේ ටොම් ඇන්ඩ් ජෙරී කාටූනයෙනි. එදා සිටම පවුලේ අය දිලූෂට කතා කරන්නේ ටොමී කියා ය.

*"බලන්න පුංචා මුන් දෙන්නා තාමත් මේක අමතක කරලා නෑ නේ..."*

*"ඒවා ඒහෙම තමයි නේද පුංචා......"*

රනුක් අම්මාගේ කරේ එල්ලෙමින් කීවේය.හසන්ති ඔහුට නොරිදෙන්නට පහරක් ගසා සිනාසුණාය.

# 02.

***“ඈ බොල බතලයෝ… එදා ඉඳලා එකට හිටපු මේ අක්කලා දෙන්නට වඩා බොට අර ටොම්යාව ලොකු වුණා නේද?”***

හංසි කීවේ අමනාපයෙන් පසුපස අසුනේ සිටි රනුක් දෙස බලමිනි. අක්කලා දෙන්නා පන්සලට දමා එන්නට කී විට ඔහු ඊට අකමැති වූයේ දිලූෂ හා අසිතත් සමඟ නාන්නට වැවට යාමට කතා කරගෙන සිටි නිසාය.

නමුත් හංසිගෙන් හා කෙත්මිගෙන් රනුක්ට ගැලවීමක් නොවීය. අවසානයේ අක්කලා දෙන්නා පන්සලට ඇරලවන්නට ඔහු එකඟ විය. ඉන්පසු නාන්න යන්නටත් නැමෙන් පසු යළිත් අක්කලාව ගන්නත් අකමැත්තෙන් වූවද රනුක් කැමති වූවේය.

***“මල්ලී…. පරිස්සමින් වාහනේ ගෙනියනවා හොඳේ… නැත්තන් මටයි අප්පච්චිගෙන් බැනුම්…”***

sinhalaebooks.com

කෙත්මි වාහනය පන්සල අසල නවතමින් කීවේ රනුක් දෙසට හැරෙමින් ය.

*“හරි හරි වදේ. ඔයා එහෙට වෙලා ඉද්දි මේක වැඩි හරියක් අරන් යන්නේ මං තමයි.”*

අක්කාට නෝක්කාඩු කියමින් රියදුරු අසුන වෙත ආ රනුක්ගේ මුවෙහි දඟකාර සිනහවක් ඇඳුණේ ඈතින් එන රුව දැකීමෙනි. අක්කා තවමත් ඔහුව නොදුටු බව විශ්වාසය. වාහනය පණගන්වා ගෙන රනුක් අක්කලා දෙස බැලුවේ ය.

*“මොකද ඒ පාර තමුසේ කුණු හිනාවක් දාන් ඉන්නේ ?”*

හංසි ඇසුවේ රනුක්ගේ වෙනස හොඳින්ම දුටු නිසාය. කෙත්මි මෙතෙක් උන්නේ වෙන කල්පනාවක ය.

*“අක්කේ අර බලනවකෝ.... තමුසෙගේ ලව් එකත් අද පන්සල් එනවා....”*

රනුක්ගේ කතාවට දෙදෙනාම පාර දෙස බැලුවේ පුදුමයෙනි. දෙදෙනාම ඒ රුව දුටුවේ එවිට ය.

sinhalaebooks.com

***"දෙයියෝ සාලේ.... අර දත් ටිකත් විරිත්තන් මේ පැත්තට එන්නේ පසන් නරියා නේද ?"***

හංසි කියන විට රනුක් සිනහවෙන් ම වාහනය ඉදිරියට ගත්තේ පසන්ට ද නලාව හඬවමිණි.

මිතුරියන් දෙනාට කතා කරන්නට ඉඩක් නොවුණේ පසන් ඔවුන් අසලට ආ බැවිණි. කෙත්මි කරන්නට දෙයක් නැති තැන සිනහවක් මවා ගත්තාය.

***"ආ... සුදු නංගි, කවද්ද ගෙදර ආවේ ?"***

***"අද ආවේ පසන් අයියේ.... ආපු ගමන් මේ ආවේ ලොකු හාමුදුරුවන්ගේ පිණ්ඩපාතට...."***

***"හ්ම්...හ්ම්... මාත් ආවේ ඒ පිණ්ඩපාතට තමයි. යමු එහෙනම්..."*** කියමින් පසන් ඉස්සර වූවේ ය.

හංසි හා කෙත්මි නිහඬවම ඔහු පසුපසින් ආවාසගෙය දෙසට ගියෝ ය. ලොකු හාමුදුරුවෝ ආවාසයෙන් පිටතට වැඩියේ ඒ මොහොතේම ය. ආවාසය දෙසට එන තිදෙනා දැක උන්වහන්සේ නැවතී බලා සිටියහ.

sinhalaebooks.com

*"ආ... ළමයි. තුන් දෙනාම එකම වෙලාවේ ආ එක හොඳයි."*

තිදෙනාම ස්වාමීන් වහන්සේගේ දෙපා නැමද පසෙකට වූහ.

*"අපේ හාමුදුරුවනේ අපට එන්න කියලා පණිවිඩයක් එවලා තිබුණේ ?"*

*"ඔව් පසන්... මට ඔය ළමයින්ගෙන් උදව් අවශ්‍යයි මේ පාර වෙසක් උත්සවය පවත්වන්න..."*

*"අනේ... අපි කැමැත්තෙන්ම උදව් කරන්නම් අපේ හාමුදුරුවනේ... අපෙන් මොනවද කෙරෙන්න තියෙන්නේ කියලා විතරක් කියන්නකෝ... නේද සුදු නංගි ?"*

*"එහෙමයි අපේ හාමුදුරුවනේ."*

*"කෙත්මිණී දුව මේ සති දෙක තුන ගෙදර ඉන්න බව මට දිසානායක මහත්තයා කිව්වා."*

*"එහෙමයි. ආයේ විභාගේ ලියන්නම යන්න කියලා ඉන්නේ."*

*"එහෙමනම් හොඳයි. දානේ කටයුතු එහෙම ඉවර වෙලා, දෙන්නා එක්ක දහම් පාසලේ දරුවන්ට භක්ති ගීත පුහුණු කරන කටයුත්ත භාර ගන්න පුළුවන් නේද?"*

*"එහෙමයි අපේ හාමුදුරුවනේ. මට ඒක කරන්න පුළුවන්."*

කෙත්මිට මේ යෝජනාව ගෙන ආවේ සතුටකි. ඇය කවදත් මෙවැනි අහිංසක වැඩවලට ආශා කළා ය.

*"එහෙමනම් බුදුන් වැඳලා එහෙම එන්න. දරුවෝ ටික තව ටිකකින් ඒවි. එයාලා එක්ක කතාබහ කරලම යන්න බැරියැ.... පසන් පුතා එක්ක මට සැරසිලි වැඩ ගැන කතා කරගන්න වුවමනයි..."*

ලොකු හාමුදුරුවන් පසන් දෙසට හැරෙද්දී කෙත්මි හා හංසි උන්වහන්සේගේ දෙපා නැමඳ බෝ මළුව දෙසට පියවර නැඟූහ.

*"කෙත්මියෝ... මාර සීන් එකනේ..."*

sinhalaebooks.com

*"ඇයි හංසී ?"*

*"මට තව පැයකින් ක්ලාස් එකක් බං. අද නම් කට් කරන්නත් බැරි සීන් එකක් තියෙන්නේ..."*

*"අඩේ... දැන් යන්න වෙලාව ඇති ද ? කලින් කියන්න එපැයි මෝඩියේ..."*

*"වෙලාව නම් ඇති බං. මං කෝකටත් කියලා බෑග් එකත් අරන් ආවේ ඒකයි. ඒත් උඹ තනියමනේ බං... අර පිස්සු හෝන්තුවත් ඉන්නවා ඒ මදිවට..."*

*"මේ පිස්සු නැතුව දුවපන් පන්තියට... මට ඇති තනියක් නෑ. පන්ති ඉවර වෙලා ඉක්මනට ගෙදර වරෙන්..."*

*"ඒත්...."*

*"ඒත් මෙත් නෑ .... දුවන්නයි කිව්වේ පන්තියට..."*

sinhalaebooks.com

හංසි පන්ති යන්නට ගියේ සිතකින් නොවේ. කෙත්මිව දමා යන්නට නොසිතේ. ඒත් පන්තිය මඟ හරින්නට ද නොහැක.

*******************

අක්කලාව පන්සලට ඇරලවූ රනුක් ගෙදර ආ විගසම අසිත හා දිලූෂ සමග නාන්නට වැවට ගියේ හොදටම හවස් වී ඇති නිසා ඉක්මනින් එන්නට සිතාගෙන ය. දිලූෂ මිතුරියන් දෙදෙනා මතක් කළේ නාන අතරේ ය.

*"කෝ බං අර කෙල්ලෝ දෙන්නා ?"*

*"අපොයි.... අර මාර දූවරු දෙන්නා ගැන වෙන්නැති ඔය අහන්නේ...."*

*"ඇයි බං එහෙම කියන්නේ ? උඹේ අක්කයි අක්කගේ යාළුවයි නේ...."*

අසිත කීවේ සිනාසෙමින් ය. ගෙදරට ආ මොහොතේ සිට තුන් දෙනාගේ රණ්ඩු ඔවුන් දෙදෙනාට ම ඇසුණි. දැන් ඉන්නේ මීට වසර පහ හයකට පෙර සිටි කෙත්මි නොවේ.

sinhalaebooks.com

***"උඹට හරි දුක නේද කෙල්ලට බනිද්දී ?"***

දිලූෂ කීවේ ඇසක් වසමිණි. පුංචි කාලයේ සිට ම දෙදෙනා අතර මිතුරුකමට එහාගිය හිතවත්කමක් වූ බව දිලූෂ ඒ කාලයේ සිට ම දැන උන්නේ ය. ඒ හිතවත්කම මීට වසර කිහිපයකට පෙම් සබඳතාවක් වූ බව ද ඔහු දනී.

***"නිකම් හිටහං බං. ආවත් හරි කෙත්මි එක්ක කතා කරන්නවත් බැරි වුණා..."***

***"පන්සලට ගියේ අසිත අයියේ... රෑ වෙලා කතා කරන්න බැරියැ.. කොහොමත් ඔයාලා ටික දවසක් ඉන්නවා නේ...."***

අසිත මෙන් ම කෙත්මිද උන්නේ ඔහු හා කතා කරන්නට ඉඩක් නැතිව ය. අසිත නොකියාම ආවේ තමාව පුදුම කරන්නට බව ඇය දනී. ඔහු රහසින් ලබා දුන් තෑගි පාර්සලය දිගහරින්නට ඇයට ඉඩක් නොවීය. කෙත්මිද බලා උන්නේ මේ සියල්ල නිමා කොට ඔහුත් සමඟ දොඩමළු වන්නට ය.

# 03.

කෙත්මි දරුවන් පිටත් කර යවා ධර්ම ශාලාවෙන් පිටතට එන විටත් අඳුරු වැටී තිබුණේ නොදැනුවත්වම ය. පසන් ඇය එනතුරුම ශාලාවෙන් පිටත රැඳී සිටියේ ඇය තනිවම නිසාය.

*"රෑ වුණා නේද සුදු නංගී... මං ගෙදරට ඇරලවන්න ද ?"*

*"කරදර වෙන්න එපා පසන් අයියේ... මල්ලී දැන් වාහනේ අරන් එයි."*

*"එහෙනම් මං මල්ලි එනකම් ඉන්නම්..."*

*"මට තනියම ඉන්න පුළුවන් අයියේ... පන්සලේ මොනවට බය වෙන්න ද... අයියා ගෙදර යන්න..."*

sinhalaebooks.com

කෙත්මි කීවේ පසන්ගෙන් ගැලවෙන්නට සිතාගෙන ය. නමුත් පසන් එය ගණනකට නොගෙන නතර වූවේ ය.

'ෂික්... මේ බතලයා තාම ආවේ නැනේ..'කෙත්මි උන්නේ රනුක්ගේ පමාව ගැන සිතෙන් බැනවදිමිනි.

*"නංගි අද ආවේ කොහොමද ? මං අහන්නේ මේ කොළඹ ඉඳලා ආවේ... මාමා ආවේ නෑ නේද?"*

*"නෑ... මං තනියම ආවේ කෝච්චියේ... අප්පච්චි වාහනේ ස්ටේෂන් එකේ දාලා... යතුර ස්ටේෂන් මාස්ටර්ට දීලා තිබ්බා..."*

*"හොඳටම විශ්වාසද ආවේ තනියම කියලා?"*

පසන් ඇසුවේ වෙනස් ම ස්වරයකිනි. මෙතෙක් ඉවත බලාගෙන සිටි කෙත්මි ඔහු දෙස බැලුවේ ඒ නිසාවෙනි. පසන්ගේ මුවෙහි රැඳී තිබුණේ සමච්චල් හිනාවකි.

*"ඇයි එහෙම ඇහුවේ ?"*

sinhalaebooks.com

*"නෑ අපට නම් ආරංචි වුණේ තව කොල්ලෝ දෙන්නෙකුත් එක්ක ආවයි කියලා..."*

*"ඔව්... ඒක ඇත්ත. මාත් එක්ක තව පිරිමි ළමයි දෙන්නෙක් ආවා. ඉතිං ඔයාට මොකද ? හැමදේම ඔයාට කියන්න මං බැඳිලා නෑ නේ පසන් අයියේ... මගේ අම්මටයි අප්පච්චිටයි හොඳ නම් ඔයාට මොකද ? ඔයා මට යාළුවෙක් විතරයි. කරුණාකරලා ඒ සීමාව පනින්න හදන්න එපා..."*

පසන්ට බැනවදින අතරේම රනුක් වාහනය පන්සල අභියස නවතා බසිනු ඇය දුටුවාය. ඒ නිසාම යළිත් පසන් දෙස නොබලා ඇය වේගයෙන් ගේට්ටුව දෙසට ගියේ අඩ අඳුර මැදින්ය. පසන් ඒ දෙස නිහඬව බලා උන්නේ ඇය ඉන්නේ කේන්තියෙන් බව වටහාගෙනය.

නමුත් සිදුවූයේ නොසිතූවකි. හදිස්සියේම කෙත්මි ගලක හැපී ඇඳවැටුණේ පසන් සහ රනුක් දෙදෙනාම බලා ඉද්දීය. ඔවුන් දෙදෙනා එතැනට දුවගෙන එනවිටත් වැටුණු වේගයටම ඇය නැගිට ගත්තාය. අඳුර නිසා කිසිවක් පැහැදිලි නැත.

*"සුදූ.... තමුසෙට තුවාලද අක්කේ? කළුවරේ පේන්නෙත් නෑ..."*

sinhalaebooks.com

*"අවුලක් නෑ රනුක්. අපි ඉක්මනට ගෙදර යමු මට මහන්සියි."*

කෙත්මි රිදුම් දෙන නළල වැසෙන්නට අතක් තබාගෙනම කාරයට නැඟුණේ වම්පසිනි. රනුක්ට පුදුම සිතුණේ අක්කා කවදාවත් ඇය සිටින විට තමාට වාහනය පදවන්නට නොදෙන නිසා ය. ඔහු ඉක්මනින් පසන්ගෙන් සමුගෙන රියදුරු අසුනට වී කෙත්මි දෙස බැලුවේ ය.

*"සුදු අක්කා... තමුසෙට මොනවා වෙලාද ? දැන් මමද අද වාහනේ ගෙනියන්නේ..."*

*"ඔව් බං... මට මෙහෙම වාහනේ ගන්න බෑ. අපි ඉක්මනට ගෙදර යමු."*

රනුක් තවත් කිසිවක් නොකියාම වාහනය පදවන්නට වූවේ ය.

අද කෙත්මි ඉන්නේ කේන්තියෙන් බව ඔහු ට දැනුණි. එකත් එකටම එය පසන් හා වූ ගැටුමක් බව විශ්වාසය. පසන්ව මුණගැසුණු පසු ඇයගෙන් මීට වඩා හොඳ මුහුණක් බලාපොරොත්තු වන්නට බැරිය. ඒ ගැන සිතද්දීත් රනුක්ගේ මුවෙහි සිනහවක් නැඟුණි.

sinhalaebooks.com

ගෙදර ආ විගසම කෙත්මි නාන කාමරයට වැදුණාය. හංසි ඒ මොහොතේ උන්නේ කුස්සියේ උයන්නට උදව් වෙමිනි. අසිතලාද කුස්සියට වී කියවමින් සිටියහ. අක්කා කාමරයට දුවන දෙස බලා සිටි රනුක් කුස්සියට ගියේ ඇයට මේ හදිස්සියේ කුමක් වූවාදැයි සිතමිණි.

*"ආ... ඔයාලා ආවද?"*

*"ආවා... ආවා.."*

*"කෝ අපේ කෙත්මි ?"*

අසිත ඇසුවේ කෙත්මි ඒවියැයි මොහොතක් බලා හිඳය. හංසි ද රනුක් දෙස බැලුවේ ඒ පැනයම මුහුණේ ලියාගෙන ය.

*"හංසියෝ පොඩ්ඩක් බලන්න වෙයි. අද එයා නෝ කතා.. නෝ සිනා... ආපු ගමන් උඩට ගියා."*

හංසි රනුක්ට ටොක්කකුත් ඇනගෙනම නැගිට්ටේ ඔහුගේ කතාවට අනිත් අය සිනාසෙන අතරේ ය.

හංසි එනවිටත් කෙත්මි උන්නේ නාන කාමරයේ ය. ඇය නිහඬවම ඇඳෙන් වාඩි වී බලා උන්නේ කෙත්මි එනතුරුය.කෙත්ම් ආවේ තවත් විනාඩි දහයකට පමණ පසුව ය.

*“දෙයියනේ... කෙත්මි මේ.. මේ.. මොක ද?”*

හංසිට ඉබේම කෑගැසුණේ කෙත්මිගේ නළලෙහි වූ තුවාලය දැකීමෙනි. කෙත්මි ඇඳට බර වුණේ තවමත් ලේ උනමින් රිදුම් දෙන තුවාලය අතකින් වසාගෙනය.

*“කෙත්මී.... කතා කරන්නකෝ.... ඇයි මේ ?”*

*“මං පන්සලේ ඉඳලා පාරට එද්දී කකුල පැටලිලා වැටුණා හංසි. එතන පඩියක වැදුණා නළල..”*

*“අනේ... බලපං ඉතිං හොඳටම තුවාල වෙලා... මල්ලි දැක්කේ නැද්ද?”*

*“නෑ... කළුවරේනේ.. ගෙදර ඇවිල්ලා තමයි මාත් දැක්කේ මෙච්චර තුවාලයි කියලා. ඔලුවත් එක්ක හිරි වැටිලා වගේ..”*

sinhalaebooks.com

*"ඉදපන් මං බෙහෙත් මොනවා හරි අරන් එන්නම්..."*

හංසි වේගයෙන් පහළට දිව්වේ පහළ සිටි රනුක්ට ද කැගසමින් ය. ඒ හඬට රනුක් මෙන්ම දිලූෂ ද දුවගෙන ආවෝය. හොඳ වෙලාවට අසිත නාන කාමරයේ ය. නැතිනම් ඔහුත් මෙතැන ය.

*******************

හංසි පුළුන් කැබැල්ල තුවාලයට ලං කළේ වෙව්ලන සුරතින් ය. කෙත්මි ඇය දෙස බලා සිනහවක් පෑවාය. හංසිට මෙය කරන්නට බැරි බව කෙත්මි දනී.

*"ඔයාට බෑ ළමයා... අහක බලා ගන්න... නැත්තන් ලේ දැකලා කලන්තේ හැදෙයි ඔයාට...."*

හංසි ඇයගේ කීම ගනනකට නොගෙන ඇයට රැව්වාය. කලන්ත වේවියැයි බයට තුවාලයට බෙහෙත් නොදමා ඉන්න ද ?

*"කෝ හංසි පැත්තකට වෙන්න...."*

දිලූෂ කතා කළේ දෙදෙනා ම දෙස මද වෙලාවක් බලා සිටය. එක්වරම ඇසුණ හඬින් තිගැස්සුණු

හංසි හැරී බැලුවා ය. ඇය තමා දෙසම බලා සිටින අයුරු දුටු දිලූෂට සිනහවක් නැගුණි.

*“යකෙක් දැක්කා වගේ බලන් ඉන්නේ නැතුව අයින් වෙයන් බං... මං බෙහෙත් දාන්නම්...”*

හංසි නැගිට්ටේ ලැජ්ජාවෙන් මුහුණ රතු කරගෙන ය. තුවාලයේ වේදනාව මැදම කෙත්මි සිනහවක් පෑවාය. දිලූෂ කෙත්මි අසලින් ඇදේ වාඩි වී පුළුන් කැබැල්ල තුවාලයට තද කළේය. කෙත්මිට කෑගැසුණේ ඉබේටම ය.

*“ආාාව්... රිදෙනවා මෝඩයෝ.... මගේ මුළු මූණම හමගහන්නද හදන්නේ ?”*

*“මෙකි යකෝ... නංගී මේ... තුවාල කරගන්න තරම් ලේසි නෑ සනීප කරගන්න එක... අනිත් එක මං ආවේ නැත්තං දෙන්නා එක්ක වැනි වැනී ඉදීවි... පුදුම තොත්ත බබාලානේ මේ.. තුවාලෙකට ඔය තරම් බයවෙනව ද?”*

*"දන්න දෙයක් කතා කරනවා ටොමියෝ.... ඔයා නිකම් කෑගහන්නේ මාරාන්තික තුවාලයක් වගේනේ...."*

*"එහෙම නොවුණ එක ලොකු දෙයක්... නැත්තන් ඉතිං ලෙඩාට කලින් බෙහෙත් කරන්න ආපු එකා බය වෙලා මැරෙනවා...."*

දිලූෂ හංසි දෙස නෙත් කොණින් බලා කියද්දී හංසි කෝපයෙන් බැල්කනියේ දොර ඇරගෙන එළියට ගියේ ඔහු තමාව විහිලුවකට ගෙන ඇති නිසාය.

*"පච්... මෝඩ ටොමියෝ මිනිස්සුන්ගේ දුර්වලකම් වලට හිනා වෙන්න එපා...."*

*"විහිළුවක් කරන්න හැදුවේ... කොහෙද ඉතිං තමුසේ වගේම තමයි... වචනයක් වරදින්න බෑ..."*

*"ඔව් ඉතිං මගේ යාළුවා නේ...."*

*"මොකට කියනව ද... ඔන්න හරි. මං යනවා. අර බෝම්බේ අඩ ගහගන්නවා..."*

දිලූෂ බෙහෙත් පෙට්ටිය වසා දමමින් නැගිට්ටේ හංසි ගිය දෙස ද බලමිනි.

*"තැන්ක් යූ ටොමියෝ..."*

*"දැන් අවුරුදු විස්සක් නේද ? මටත් දැන් විසි පහක් වෙනවා... දෙයියනේ කියලා දැන්වත් මට අයියා කියලා කියපං බං... බල්ලාට කතා කරනවා වගේ ටොමී කියන්නේ නැතුව.."*

*"සාධාරණ ඉල්ලීමක් නිසා මං ඒ ගැන සලකා බලන්නම් හොඳේ..."*

sinhalaebooks.com

# 04.

කෙත්මි හා හංසි රෑ කෑම මේසයට ආවේ අනික් අය ආවාටත් පසුවය. එතරම්ම ලොකු තුවාලයක් නොවුණත් දිලූෂ බෙහෙත් දමා තිබූ ආකාරයට එය ලොකුවට පෙනුණි. හැමෝම ඒ ගැන වද වෙද්දී කෙත්මි කීවේ වරද තමාගේවත් තුවාලයේවත් නොව බෙහෙත් දැමූ කෙනාගේ බවය. ඒ කතාවට නම් කෙත්මිගේ තාත්තාට ද සිනහවක් නැඟුණි.

*"සුදූ... ඇයි ඔය... කන්නේ නැද්ද ?"*

හසන්ති ඇසුවේ බොහෝ වෙලාවක් කෙත්මි දෙස බලා හිඳය. කෑම එක අන අනා සිටියා විනා ඇය එක කටක්වත් නොකෑවාය.

*"බඩගිනි නෑ අම්මා...."*

*"මං දැනන් හිටියා බබා ඔයාට අද බඩගිනි නැතිවෙන බව... මං හිතුවා හරි එහෙනම්..."*

sinhalaebooks.com

රනුක් කීවේ කෙත්මි දෙස බලා ඇසක් වසමිනි. මව මෙන් ම පියාද රනුක් වෙත හැරුණේ පුදුමයෙනි.

*"චූටි පුතා... මොකක් ද ඒ කතාව ?"*

*"අම්මා... අද මෙයාගේ හිත පිරිලා ඇත්තේ... පසන් අයියත් පන්සල් ඇවිල්ලා හිටියනේ..."*

රනුක් කියද්දී කෙත්මි ඔහු දෙස බැලුවේ ගිනි පිටවෙන දෑසිනි.

පසන් ගැන කියද්දී දිලූෂ හා අසිත දෙදෙනාම කෙත්මි දෙස බැලුවේ පුදුමයෙනි. හංසි නම් මොකුත්ම විශේෂයක් නොකර නිහඬව කෑම ගත්තේ දැන් කෙත්මි ඉන්නේ කේන්තියෙන් බව දැනගෙන ය.

*"සුදූ ඉතිං කොහොමත් පසන්ව මුණගැහෙන දවසට කෑම කන්නේ නෑ නේ..."*

තාත්තා සිනා වෙමින් කියද්දී කොපයෙන් නැගිටගත් කෙත්මි වේගයෙන් පඩිපෙළ නැඟ කාමරයට ගොසින් මහ හඬින් දොර වසා ගත්තාය.

sinhalaebooks.com

හසන්ති තම සැමියා දෙස බැලුවේ අමනාපයෙනි. තාත්තලා පුතාලා කළොත් කරන්නේ ඔහොම දෙයකි.

***"හරි හරී.. මට රවන්න එපා. එයා කොහොමත් දැන් කෑම කන්නේ නැති බව ඔයා දන්නවනේ..."***

හසන්ති කේන්ති ගත් බව දැනුණු කෙත්මිගේ තාත්තා කෑම මේසයෙන් නැගිට්ටේ ආහාර ගෙන අවසන් බව පවසමිනි.

***"ඔය ඉතිං අපේ සුදූගේ හැටිනේ... ඔයාලා කන්න.."***

කී හසන්ති ද කෑම මේසයෙන් නැගිට කුස්සියට ගියා ය.

***"දැන් හරිනේ... මෝඩ බතලයා...."***

***"ඇයි බං හංසි අක්කේ මං කිව්වේ බොරු ද?"***

***"ඒකිව කේන්ති ගස්සන එකේ සීමාවක් තියාගනින්... ගෙදර ඇවිත් දවසක් ගියේ නෑ පටන් ගත්තා ඉතිං..."***

sinhalaebooks.com

හංසි ද කේන්තියෙන් එතනින් ඉවත් වූවාය. මේ වෙලාවේ කාමරයට ගියොත් කෙත්මි තවත් කේන්ති ගන්නා නිසාම හංසි මිදුලට ගියා ය.

***"කවුද බං පසන් කියන්නේ ?"***

අසිත ඇසුවේ මෙතෙක් අසාගන්නට බැරි වූ දේය. රනුක් සිනාසෙමින් ඇසක් වැසුවේ ය.

***"අපේ සුදුට වාත වෙවී පස්සෙන් එන ඩයල් එකක්... සුදූ මිනිහට කොච්චර කැමති ද කියනව නම් දැක්ක දාට බත් කන්නෙත් නෑ..."***

***"පසන්..! කෙත්මි මට නිකම්වත් එහෙම කෙනෙක් ගැන කියලා නෑ නේ..."***

***"ඒකට කමක් නෑ මස්සිනේ... පණට ආදරයක් තියනවා නම් දැන් ඔය ගැන අහන්න යන්න එපා... අපේ එකී උඹේ බෙල්ල මිරිකයි. බෙල්ල..."***

රනුක් කීවේ අක්කාගේ තරම දන්නා නිසාය. ඇයට මේ වෙලාවට හංසිව පවා රුස්සන්නේ නැත. හංසි කාමරයට නොයා එළියට ගියේ

sinhalaebooks.com

ඒ නිසා බව රනුක් දනියි... අසිත මදක් කල්පනා කරමින් සිට කාමරයට ගියේ කෑම අතරමඟ නවතා දමාය.

*"ඒ මොකක් ද බං ඒ වුණේ ?"*

දිලූෂ තමාට ම මෙන් මුමුණා ගත්තේ මේ සියල්ල නිහඬව බලා සිටය.

*"මොකුත් වුණේ නෑ... බය වෙලා වගේ බලන් ඉන්නේ නැතුව උඹවත් බත් කාපං ටොමියෝ..."*

රනුක් කීවේ දිලූෂගේ පිඟානට තවත් බත් හැන්දක් බෙදන අතරේය. අක්කා ගෙදර ආ විට අඩුම එක වරක්වත් මෙය සිදුවන නිසා රනුක් මෙය ඒ තරම් සිතට ගත්තේ නැත...

*******************

කෙත්මිගේ දුරකතනය නාදවන්නට වූයේ පාන්දර දෙකට පමණය. කෙත්මි මෙන් ම හංසිද උන්නේ තද නින්දකය. දුරකතනයේ හඬට මුලින් ම අවදි වූයේ හංසිය.

*"උඹට කෝල් එකක් බං..."*

sinhalaebooks.com

කෙත්මිට ඇන කී ඇය අනෙක් පසට හැරී යළි නින්දට වැටුණාය.

*"මේ වෙලාවේ මොන මළ යකා කෝල් කරනවද..."*

කෙත්මි කවුද කියා නොබලාම දුරකතනය කනේ තබා ගත්තේ සිත යටින් බණිමිනි.

*"සුදූ.... නින්ද කැඩුවට සමාවෙන්න... මට ඔයා එක්ක ටිකක් කතා කරන්න ඕන..."*

එහා පසින් අසිතගේ කටහඬ ඇසෙද්දී කෙත්මි තිගැස්සී ඇදේ වාඩි වූවාය.

*"ඕ.. ඔයා මේ වෙලාවේ..."*

*"සුදූ බැල්කනි එකට පොඩ්ඩක් එන්න ඉක්මනට.."*

*"මේ... දැන් ?"*

*"ඔව්... හදිස්සියක්... ඉක්මනට එන්න."*

sinhalaebooks.com

*"හ.. හරි.. මං එන්නම්."*

*"ඒයි මේ... හංසිට ඇහැරවන්න එපා හරිද.."*

කෙත්මි ඉක්මනින් ඇඳෙන් බැස ගවුමක් දා ගත්තේ හංසි ඇහැරේවි දැයි බලමිනි. නැත. ඇය ඉන්නේ තද නින්දක ය. කෙත්මි සීරුවට කාමරයෙන් පිටතට ආවා ය. ඇය ඊයේ සිතා උන්නේ රෑ වෙලා අසිත සමඟ කතා කරන්නට ය. එය මඟහැරුණේ කෑම මේසයේදී ඇදී ආ කතාව නිසාය.

කොරිඩෝවේ දැල්වෙන විදුලි පහනේ මලානික ආලෝකය අතරින් බැල්කනියට එබුණු රුවැත්තිය දෙස අසිත බලා උන්නේ ආශාවෙනි. ආදර සම්බන්ධයක් තිබුණු ද ඒ දුරකතනයෙනි. ඊයේ ඇයව හැබැහින් දුටුවේ වසර පහකට පමණ පසුය.

ඡායාරූපවල නොදුටු අමුතු සුන්දරත්වයක් ඇය තුළ ගැබ්වී ඇති බව ඔහුට හැඟුණි. ඇයව දකිද්දී අසිතට දැනෙන්නේ ආදරයකටත් වඩා ඇයව හිමිකර ගැනීමේ ආශාවකි. ඇය තමා සතු වස්තුවක් බව ලොවටම පෙන්වීමේ ආශාවකි.

අසිතව දුටු කෙත්මි ද ගොළු වූවාය. වසර දෙකතුනක් තිස්සේ ආදරය කළාට පුංචි කාලයේ

දැක්කාට පසු දකින්නේ දැන් ය. ඊයේ තිබූ කලබලයට ඔහුව සිත පුරා දැකගන්නට ද බැරි විය.

*"එන්න සුදූ මෙතනට..."*

අසිත කතාකලේ ඇයගෙන් නෙත් ඉවතට නොගෙන ය. ඔහු උන්නේ බැල්කනියේ වූ ඕංචිල්ලාවේ ය. නිදහස් වෙලාවකට කෙත්මි මෙතනට වී ඉන්නට ආසාය. තාත්තා ඕංචිල්ලාව ගෙන දුන්නේ ද කෙත්මිගේ ඉල්ලීමටය. කෙත්මි හෙමිහිට පැමිණ අසිත අසලින් වාඩි වූවාය.

*"ඇයි සුදූ මාත් එක්ක කතා කළේ නැත්තේ ? මං බලන් හිටියා සුදූ මට කතා කරනකම්..."*

*"මං රෑ වෙලා කතා කරන්න හිටියේ..."*

*"ඇත්තට මං අහන්න හිටියේ මොකක්ද ඒ කතාව ? කවුද පසන් කියන්නේ?"*

*"මේ ගමේ එක්කෙනෙක්... කීපසැරයක් මගෙන් යාළුවෙන්න ඇහුවා... ඒ ගැන කිය කිය ඔය මල්ලී විහිළු කරන්නේ...."*

*"ඔයා මට ඒ ගැන කියලා නෑ නේ... ඔයත් එයාට කැමැත්තක් තියනව ද ?"*

*"මට පිස්සු කියලා හිතුව ද ? ඔයාට ආදරේ කරන ගමන් එයාටත් ආදරේ කරන්න... ඔයා හිතන් ඉන්නේ මං ඒ ජාතියේ කෙල්ලෙක් කියලද?"*

කෙත්මි කීවේ ඇත්තටම කේන්තියෙනි. ඇය අසිතගෙන් මෙවැනි කතාවක් කීයටවත් බලාපොරොත්තු වුණේ නැත.

*"අයියෝ... මං විහිළුවක් කලේ... ඔය තරම් කේන්ති ගන්න එපා... මගේ සුදු මැණිකේ කලු වේවි..."*

*"පිස්සා...."*

කෙත්මි ඔහුගේ අතට සෙමෙන් පහරක් ගැසුවාය. ඔහු එකවරම ඇයව තමා වෙත ඇදගත්තේ ඇයට සිතන්නටවත් ඉඩක් නොතබාය.

*"ඔය ඉතිං.... ඇත්තමයි බබා මම ඔයා එක්ක තරහවෙන්න ඕන හරි නම්..."*

*"ඒ මොකද.... මං මොන වරදක් කරාටද?"*

sinhalaebooks.com

"දන්නේ නෑ වගේ අහන හැටි... අම්මා අසනීප උන නිසා ආවා මිසක ඔයා තව අවුරුදු දෙක තුනක් එහෙට වෙලා ඉන්නවා..."

"ම්ම්ම්..... මට එහෙම නවතින්න තිබුණේ මෙයා මොකද කරන්නේ බලන්න...."

"ආාා... ඒක තමයි. මෙයාට එහේ ඉන්න කෙල්ලෙකුට හිත ගිහින් ඇති...."

"ඔය කිව්වේ ඉතිං කතාවක්....මං එහෙම කරයි කියලා සුදූ හිතනවද ?"

"නෑ... මගේ හිතේ විශ්වාසයක් තියනවා ඔයා මට කවදාවත් එහෙම කරන එකක් නෑ කියලා... ඒ නිසා මං ඔයා ගැන සැක කරන්නේ නෑ..."

"ඒත් සුදූ.... බැරි වෙලාවත් මං ඒ විශ්වාසේ කැඩුවොත්.........?"

sinhalaebooks.com

අසිත ඇසුවේ කෙත්මිගේ සිත දැනගන්නටය. කෙත්මිට ඒ කතාවේ අමුත්තක් දැනුනෙන් ඇය මොහොතක් අසිත දෙසම බලාන උන්නාය. අවසානයේ ඔහුගෙන් දෑස් ඉවතට ගෙන ඈතින් පේන අඳුරු වෙල් යාය දෙස බලාන කතා කරන්නට වූවාය..

*“මගේ ජීවිතේ මං ආදර සම්බන්ධයක් පටන් ගත්තේ ඔයා එක්ක විතරයි. වෙන කෙනෙක් එක්ක එහෙම සම්බන්ධෙකට යන්න මං හීනෙකින්වත් හිතලා නෑ... අපි ආදරේ කරන්න අරන් අවුරුදු තුනකට ළඟයි. ඒත් අපි මුලින් ම මෙහෙම කතා කළේ අද.... අද ම ඔයා මගෙන් ඒක අහපු එක හොඳයි...”*

*“මං ඒක විහිළුවට ඇහුවේ සුදූ.... ඒ ගැන සීරියස් හිතන්න යන්න එපා...”*

*“ඒකට කමක් නෑ... හැබැයි මගේ උත්තරේ විහිළුවක් නෙමෙයි... මං ඔයාට ගොඩක් ආදරෙයි. ඒත් ඔයා... මං ඔයා ගැන තියපු විශ්වාසේ බින්දා කියලා දැනගත්ත දවසක මේ සේරම වෙනස් වෙයි. කවදාවත් මං ඔයාව ඉල්ලලා අඬන්නේ නෑ... ඔයාගේ පස්සෙන් එන්න එකකුත් නෑ. එහෙම දේවල් මගෙන් බලාපොරොත්තු වෙන්නත් එපා. ඔයා එක විනාඩියකට*

*හරි එහෙම කළොත්... එතනින් එහාට මං ඔයාව කවදාවත් විශ්වාස කරන්නේ නෑ... ඒ වගේම මං ඔයාට කවදාවත් සමාවක් දෙන්නෙත් නෑ...."*

කෙත්මි මෙසේ කියද්දී අසිත මදක් තිගැස්සී ගිය බව කෙත්මි නෙත් කොණින් දුටු නමුත් කිසිවක් නොකීවාය. ඇත්තෙන්ම අසිත හීනෙන්වත් මෙවැනි පිළිතුරක් බලාපොරොත්තු වූයේ නැත. ඔහු සිතාගෙන උන්නේ ඇයත් අනෙක් ගැහැණු ළමයින් මෙන් එලෙසින් තමාව දමා යන්නට එපා කියාවියි කියාය.

*'අපි බලමුකෝ.... ඔය මොන දේවල් කිව්වත් ඔයාට මාව එහෙම අතඅරින්න බෑ කෙත්මි.'*

අසිත සිතින් තමාටම කියා ගත්තේ ඇති වූ නොසන්සුන්කමින් මිදෙන්නට ය.

sinhalaebooks.com

# 05.

හෙට රෑ බණ නිසා මුළු ගෙදරම එකම ගාලගෝට්ටියකි. අසිතලා උදේම තාත්තා සමඟ ටවුමට ගියේ බණට හා දානයට අවශ්‍ය වූ බඩුවගයක් ගෙන එන්නට ය. රනුක් මිතුරන් සමඟ සැරසිලි වැඩ කරමින් මිදුලේ විය. පසන් ඇවිත් සිටිනු දුටු කෙත්මි මිදුලට නොගොස් කෙලින්ම කුස්සියට ගියාය.

හංසි උන්නේ කුස්සියට වී අච්චාරුවකට ළූණු සුද්ද කරමින් ය. දානයට අමතරව හෙට බණ අසන්නට එන අයට රෑ කෑම හා තේ මේසය සූදානම් කළ යුතුය. එළියේ සැදූ මඩුවක ගමේ කාන්තාවන් වැඩ කරමින් සිටියි. කෙත්මි කුඩා පිහයක් රැගෙන හංසි අසලින්ම වාඩි වූවාය.

***"ආාාා මැඩම්... ගුඩ් මෝනිං...."***

***"මොකද උඹ නිකං ඇදේට වගේ කතා කරන්නේ?"***

sinhalaebooks.com

*"මගේ නම් ඇදයක් නෑ... රෑ තිස්සේ කෝලම් කර කර ඉඳලා උඹ කෙලින් ඉන්න එක නම් මට පුදුමයි."*

*"මොකක් ! මොන කෝලමක් ගැනද කියන්නේ..."*

කෙත්මි ගනනකට නොගෙන කියන විට හංසි වටපිට බලා ඇය දෙසට නැඹුරු වූවා ය.

*"අනේ මේ තොත්ත බබෝ... මං කියන්නේ අර මළ පාන්දර පිනිබාගෙන බැල්කනියට වෙලා නටපු කෝලම ගැන..."*

කෙත්මි ඇය දෙස බැලුවේ පුදුමයෙනි. හංසි මේ ගැන දැන ගත්තේ කෙසේ ද ? කොහොමත් කෙත්මි උන්නේ හංසිට මේ ගැන කියන්නට ය. කියන්නට පෙරම දැන ගත්තේ කෙසේ ද ?

*"ඔයා කොහොමද....? මං මේ දැන් ඔයාට ඒ ගැන කියන්න හිතුවා විතරයි."*

*"උඹ කාමරේ හිටියේ නැති නිසා මං පොඩ්ඩක් වටපිටේ බැලුවා හීනෙන් ඇවිදින්නත් පටන් අරන්ද කියලා... බැල්කනියේ වෙනම සීන් ඒකක්නේ... අපි*

sinhalaebooks.com

*පොඩි ළමයි. ඕවා බලන්න හොඳ නෑ... ඒ නිසා මං නිදා ගත්තා...”*

හංසි ඇසක් වසමින් කියන විට කෙත්මි ඇයගේ අත කෙනිත්තුවාය. ඒ සමඟම අම්මා කුස්සියට ආ නිසා දෙදෙනාම කතාව නවත්තා ඇණූ සුද්ද කරන්නට විය.

උදේ වරුව කොයි තරම් කලබලකාරී වූව ද පාන්දර අසිත ඇසූ පැනය තමා දුන් පිළිතුරට ඔහු තිගැස්සුණ අයුරු කෙත්මිගේ සිතට හැම මොහොතකම වද දෙන්නට විය.

පසුව එය අමතක කර දෙදෙනා සැහැල්ලුවෙන් ආදරයෙන් ඒ පැය කීපය ගෙව්වද අසිතගෙන් වෙන් වී කාමරයට ආ මොහොතේ සිටම ඇය ඒ ගැන යළිත් සිතුවාය.

‘ ඇයි එයා මගෙන් එහෙම දෙයක් ඇහුවේ? මං ඒකට උත්තර දෙනකොට එයා ගැස්සිලා ගියා... ඒත් ඊට පස්සේ එයා හොඳට කතාබහ කරලා හිටියනේ... මං නිකම් බොරුවට එයාව සැක කරනවද ? එහෙම දෙයක් තියනවා නම් ඔහොම මගෙන් අහලා එයා අවදානමක් ගනීද? අනේ මන්දා...’

sinhalaebooks.com

රනුක් කෙත්මිව සොයාගෙන එන විට කෙත්මි උන්නේ අංජලී සමඟ වැඩකරන අයට තේ අල්ලමින් ය.

*"සුදු අක්කා.... මෙන්න තමුසෙට කෝල් එකක්..."*

*"කවුද ?"*

*"දන්නේ නෑ .... සේව් කරලා නැති නම්බර් එකක්...."*

කෙත්මි ඈය අත වූ බිස්කට් බන්දේසිය රනුක් අතේ තබා දුරකතනයත් රැගෙන මදක් එහාට ගියා ය.

*"හෙලෝ.....?"*

*"හෙලෝ... මේ මිස් රිතූ කෙත්මිණී දිසානායක වෙන්න ඇති..."*

එහා පසින් ආවේ පිරිමි කටහඬකි. ඔහු තමාගේ මුළු නම ම කියා කතා කරද්දී කෙත්මි සිතුවේ කවුරුන් හෝ අඳුරන කෙනෙක් කියා ය.

*"ඔව්... රිතූ තමයි. කවුද මේ ?"*

sinhalaebooks.com

*"මිස් රිතූ... මං කවුද කියන එකට වඩා වැදගත් දෙයක් මට මිස්ට කියන්න තියනවා..."*

*"මට ?"*

*"ඔව් මිස්... මේක අහලා මිස් ඇත්තටම ගොඩක් පුදුම වෙයි..."*

*"මොකක් ගැනද කියන්නේ ? කරුණාකරලා කියන දෙයක් ඉක්මනට කියන්න. මට මේ වෙලාවේ ගොඩක් වැඩ තියනවා..."*

*"ඔව්... මං දන්නවා. ආච්චි අම්මගේ දානේට මිස්ලා බරටම වැඩ නේ..."*

එහා පසින් කතා කළ කෙනා කියද්දී කෙත්මිට පුදුම නොවී බැරි විය. මේ කෙනා සේරම දේවල් දැනගෙන කතා කරන්නෙකි. ඇත්තටම මේ කවුද?

*"පුදුම වෙන්න එපා... ඇත්තටම ඔය වැඩ අස්සේ මං මේ දේවල් කියලා මිස්ව කලබල කරන එක හරි*

sinhalaebooks.com

*නෑ... ඒත් මට මේකට වැඩි කාලයක් ගන්න බෑ. අනිත් එක මේක ඉක්මනට දැනගන්න එක මිස්ටත් හොඳයි...."*

*"හොඳ හරි නරක හරි ... කියන්න තියන දෙයක් ඉක්මනට කියන්න..."*

*"එහෙනම් මේක හොඳට අහගන්න... මිස් අසිතව විශ්වාස කරන්න එපා... උඹ මිස්ට ලොකු බොරුවක් කරන්නේ...."*

*"මොකක්.... තමුසෙට පිස්සුද ?"*

කෙත්මිට ඇසුණේ තරමක කේන්තියෙනි.

*"මට පිස්සු නෑ මිස්... මං දන්නවා මිස්ට මේවා විශ්වාස කරන්න අමාරු ඇති... ඒත් මිස් දන්නවද අසිත ඉන්දියාවේ ඉද්දී වෙන ගෑණු ළමයෙක්ව බඳින්න පොරොන්දු වුණා කියලා... එහෙම ඉද්දියි අම්මා අසනීපයි කියලා අසිත ලංකාවට ආවේ... ඒ ගෑණු ළමයත් දැන් ලංකාවට ඇවිත් ඉන්නේ... ඒත් එයා තාම දන්නේ නෑ මිස් රිතූ එක්කත් අසිත යාළු බව....."*

sinhalaebooks.com

*"මේ මොනවද කියන්නේ? අසිත එහෙම කෙනෙක් නෙමෙයි... අනිත් එක ඇයි මං තමුන් කියන දේවල් විශ්වාස කරන්නේ ? මං තමුන්ව දන්නෙත් නෑ..."*

*"මං දන්නවා... විශ්වාස කරන්න බැරි බව. වරද මිස්ගේ නෙමෙයි. අසිතගේ... මිසුත් පව් එක අතකින්... ඒත් මිස්, මං මේක වගකීමෙන් කියන්නේ. මොකද අසිත බඳින්න පොරොන්දු වුණේ වෙන කෙනෙක් ව නෙමෙයි... මගේ නංගි සමාධිව..."*

*"මොනවාාා...?"*

කෙත්මිට කියවුණේ ඉබේටමය.දෙවියනේ මේ අහන්නට ලැබෙන්නේ මොනවා ද? මේක ඇත්තක් ද ?

*"ඔව් මිස්... මාත් මෙතනදී අසරණයි. කල්පනා කරලා කරලා බැරිම තැන මිස්ට කතා කළේ වෙන කරන්න දෙයක් නැති නිසා. සමාධි මේ මොකුත් දන්නේ නෑ. ඇත්තටම මිස් මං මගේ නංගිව අසිත වගේ ඩබල් ගේම් කාරයෙකුට දෙන්න කැමති නෑ... ඒත් ඉන්දියාවේදී මේ දෙන්නා අතර වෙලා තියන දේවල් නිසා අපිට ඒ දෙන්නව එකතු කරනවා ඇරෙන්න කරන්න දෙයක් නෑ...."*

එහාපසින් කතා කළ කෙනා කියාගෙන යන දේවල් ඇසෙද්දී කෙත්මිට දැනුණේ තම දෙපා පණ

sinhalaebooks.com

නැති වී යන බවකි. ඇය දුරකතනය කනේ තබාගෙනම බිම ඉඳගත්තේ තමා ඇදගෙන වැටේවි යැයි බියෙනි.

*******************

*"අසිතයා අද පාන්දර උඹ මොන ලෝකෙද අතුරුදහන් වුණේ ?"*

දිලූෂ ඇසුවේ කෙත්මිගේ පියා බැංකුවට ගිය අතරතුරේ ය.

*"පොඩ්ඩක් එළියට ගියා බං... නින්ද ගියේ නෑ..."*

*"හැබෑට... එහෙනම් අපේ සුදූටත් නින්ද යන්න නැතුව ඇති නේ..."*

දිලූෂගේ පැනයට අසිත පිළිතුරක් නොදී සිනහවක් පෑවේ ය. එනමුත් දිලූෂ උන්නේ සිනාසෙන්නට හැකි තත්වයක නොවේ... මිතුරාගේ වෙනස හසිත ද හොඳින්ම දැක්කේය.

*"මොකද දිලූෂයා අවුලෙන් වගේ... අවුලක් නම් කියපං මං උඹේ යාළුවා නේ..."*

sinhalaebooks.com

*"උඹ මගේ යාළුවා නොවුණා නම්... මට මේක විසඳගන්න ලේසි වෙන්න තිබ්බා...."*

*"මොනවද බං උඹ මේ කියන්නේ ?"*

*"මට ඇත්ත කියපං අසිත උඹ අපේ සුදූට ඇත්තටම ආදරේ කරනවද ?"*

*"දිලූෂ මොනවද බං මේ අහන්නේ... උඹ දන්නවනේ මං කෙත්මිට ආදරේ කරන්න පටන් ගත්තේ පුංචි කාලෙමයි කියලා..."*

*"හොඳයි.. ඒක එහෙම නම් කවුද සමාධි ?"*

දිලූෂගේ පැනයට අසිත තිගැස්සී ගියේ ය. මේ දේවල් දිලූෂ දැනගත්තේ කෙසේ ද? දැන් මොකකින් මොකක් සිදුවේ ද ?

*"උ...උඹ... ට.... කවුද...."*

*"මං  මේවා දැනගත්තේ අද උදේ... මට ඇත්ත කියපන් අසිත... මේ මොනවද වෙන්නේ ?"*

sinhalaebooks.com

දිලූෂ මේ ගැන දැනගත්තේ උදේ අසිතගේ දුරකතනයට ආ කෙටි පණිවිඩයක් නිසා ය. එය එවා තිබුණේ සමාධි විසිනි. මෙතෙක් ඒ ගැන විශ්වාසයක් නොතිබුණ ද දැන් අසිත කලබල වූ ආකාරයෙන් ම එය ඇත්තක් බව ඔහු තේරුම් ගත්තේ ය.

***"මේ අහපං දිලූෂ... ඉන්දියා ඉන්න කාලේ ඔය ගර්ල් එක්ක මං ටිකක් හිතවත් වෙලා හිටියා... ඒත් මං එන්න කලින් ඒ සේරම නවත්තලා දැම්මා...."***

***"එහෙනම් ඇයි ඒ ගර්ල් තවත් උඹට කතා කරන්නේ ?"***

***"ඒ කෙල්ල දැන් මට බල කරනවා එයාව මැරි කරන්න කියලා. ලංකාවටත් ඇවිල්ලා... මේ අහපං දිලූෂ, උඹවත් මාව විශ්වාස කරපන්. මං ආදරේ කරන්නේ කෙත්මිට විතරමයි බං. කෙත්මිට විතරමයි..."***

දිලූෂට තවත් යමක් කියාගන්නට නොහැකි වූයේ කෙත්මිගේ පියා පැමිණි බැවින් ය. අසිත කියනා දෙය ඇත්තක් වන්නටද බැරි නැත. එහෙත් එක එල්ලේම ඔහු කියනදේ පිළිගන්නට ද සිත දෙන්නේ නැත. නිදහසේ මේ ගැන කල්පනා කරන්නට ඔහු සිතා ගත්තේ ය.

sinhalaebooks.com

අසිත කුඩා කාලයේ සිටම තම මිතුරා බව සැබෑය. එහෙම කියා අන්ධ විශ්වාසයකින් ඉන්නට බැරිය. අද ඇත්තේ තම එක කුස උපන් සහෝදරයාත් විශ්වාස කරන්නට බැරි තත්වයකි. මේ ගැන සෙවිය යුතුය. සිදුව ඇත්තේ අසිත කියනවාට වඩා වෙනස් දෙයක් නම් අමාරුවේ වැටෙන්නේ තම නැඟණියයි. ඇය ද මතක ඇති කාලයක සිට හසිතට ආදරය කරන බව දිලූෂ දනී.

# 06.

සංදේශ් නිවසට ආ විගස කාමරයට වැදී දොර වසා ගත්තේය. සමාධිට මොනවා කියන්නදැයි සිතාගන්නට බැරිය. මේ දේවල් දැනගතහොත් ඇය ජීවිතයට අනතුරක් කරගන්නටද බැරි නැත. හැන්දෑවේ සංදේශ් හා ඔහුගේ මිතුරු රංග කතාකර ගත්තේ මේ ගැන කොයිම මොහොතකවත් සමාධිට හා අම්මලාට නොකියා ඉන්නට ය.

*"අයියා.... අයියා.... මේ දොර ටිකක් අරින්නකෝ."*

*"එන්න පැංචී... දොර ලොක් කරලා නෑ..."*

ගෙදර හැමෝම සමාධිට හුරතලයට කීවේ පැංචි කියාය. ඒ නිසාම සංදේශ් පමණක් නොව ඔහුගේ මිතුරන් ද සමාධිට කතා කරන්නේ පැංචි කියාය. සමාධි හෙමිහිට දොර ඇරගෙන ඇවිත් අයියා ළඟින්ම ඇඳෙන් වාඩි වූවාය.

sinhalaebooks.com

***"මොකද මේ ආපු ගමන් කාමරේට වෙලා ? ඇඳුම් මාරු කරන්නෙත් නැතුවම ඇඳට පැනලා..."***

***"මහන්සියි පැංචි.."***

***"ඒ වුණාට... ඔයා වෙනදට ඔහොම නෑ..."***

***"අනේ මේ... උඹ අවුරුදු ගානක් රට ඉඳලා ඇවිත් වෙනදට මං ඉන්න විදිහ කියන්න එනවා.."***

***"යනවා යන්න... මෝඩයා..."***

***"මේ... තමුසෙගේ ලව් එක තාම කතා කලේ නැද්ද?"***

ඒ ගැන අසන විටත් ඇයගේ මුවේ ඇඳෙන සුන්දර සිනහව සංදේශ්ව අසරණ කරයි. මේ අහිංසකී අසිතට ආදරය කරන්නේ සීමා විරහිතව ය. ඒ ගැන සිතද්දී ඔහුට කෙත්මිවද සිහිවිය. රිතූ... එක අතකින් ඔයත් පව් නංගි... ඔහු සිතින් මිමිණුවේ ය.

***"මැසේජ් කරලා තිබ්බා අයියා... ටිකක් දුර යන්න වුණාලු... යාළුවෙක්ගේ ආච්චි නැති වෙලා මෙයා රට***

sinhalaebooks.com

*ඉන්න දවස්වල. මේ දවස්වල එහෙ දානෙට ලෑස්ති වෙනවලු. ආපු ගමන් මෙහේ එනවා කිව්වා....”*

*“එහෙම ද ?”*

*“ඔව් අයියා. යාළුවෙක්ගේ දේකට නොයා බෑනේ. මං කිව්වා කමක් නෑ ඉඳලා එන්න කියලා....”*

*“තමුසේ උඹට බුරුල දෙනවා වැඩියි පැංචි... කියන කියන එකට හා කියන්නේ නැතුව පොඩ්ඩක් තදින් ඉන්නවා...”*

*“එහෙම ඕන නෑ අයියා... මට එයාව විශ්වාසයි. ඒ නිසා මං එයාට නිදහස දීලා තියෙන්නේ....”*

සංදේශ් තැවුණේ නංගි ආදරය කරන්නට අසිතවම තෝරාගත් එක ගැනය. ඔහු ඇයගේ විශ්වාසය බිඳ ඇත. ඇය දුන් අසීමිත නිදහසින් අසිත අයුතු ප්‍රයෝජන ගනී. ආරංචි වූ හැටියට රිතූව අසිත හඳුනන්නේ පුංචි කාලයේ සිටය. එක්කෝ අසිත රිතූව රවට්ටනවා... නැතිනම් සමාධිව.....

දැන් සියල්ල රිතූට කියා අවසන්ය. තීරණය ඇය අතේ ය. එක අතකින් බැලූවිට ඇය කුඩා

sinhalaebooks.com

කල සිට දන්නා හඳුනන අසිතව තමාගේ කීම නිසා සැක නොකරනු ඇත. නමුත් හිතේ කොණක පුංචි බලාපොරොත්තුවක් ඇත. සම්පූර්නයෙන් ම විශ්වාස නොකළත් රිතූ මේ ගැන සිතා බලනු ඇත.

*"අයියා.... මොනවද හලෝ හිතන්නේ...."*

සමාධිගේ කෑගැසීම නිසා සංදේශ් තිගැස්සුණේය. අයියා අද ඉන්නේ මොකක් හෝ ගැටලුවක බව මේ හැසිරීමෙන් ම සමාධිට කිව හැකිය.

*"ඈ අයියේ... මොකද අනේ මේ.. අපේ නෑනා තරහ වෙලා ද ?"*

*"කවුරු... නෑනා ?"*

*"ඔව්... ඔව්... මං දන්නවා නොකිව්වට ලස්සන කෙල්ලෙක් ඉන්නවා කියලා..."*

*"පිස්සුද බං.. මං ඔය සබ්ජෙක්ට් එකට නෑ නේ...."*

***"අනේ මේ අයියා... මං නම් ඔයාගේ බොරුවලට අහුවෙන්නේ නෑ. වොෂ් එකක් දාන් එළියට එනවකෝ... මං රස කෑමක් හදලා තියනවා."***

සමාධි කාමරයෙන් එළියට ගියේ සංදේශ්ගේ හිසකේ අවුල් කරමිනි. සංදේශ් සොයුරිය දෙස බලා උන්නේ ආදරයෙනි.

මං මැරයෙක් නෙමෙයි... ඒත් නංගි උඹේ සතුට තියෙන්නේ අසිත ළඟ නම්....මං පුළුවන් හැමදේම කරලා ඌව උඹ ළඟට ගේනවා... මට හැමදේටම වඩා මගේ නංගිගේ සතුට වටිනවා.

*******************

***"ආාාච්......"***

කෙත්මි පිහිය අතහැරියේ කෑගසමිනි. බටු මෝජුවට බටු කපන්න ගත්තේ දහවලේ ආ දුරකතන ඇමතුමෙන් පසුව සිතෙහි ඇති වූ නොසන්සුන්කම නිසාවෙනි. කපාගෙන කපාගෙන යද්දී පිහියට ඇඟිල්ල කැපී ගියේ සිතන්නටත් පෙරය.

sinhalaebooks.com

*"කෙත්මි... ඇඟිල්ල කැපුනා නේද ? ඔහොම ඉන්න නැන්දට කතා කරන්න. අනේ මන්දා බං... උඹේ බෙල්ලේ ෆස්ට්එ්ඩ් බොක්ස් එකක් එල්ලා තියන්න වෙනවා."*

හංසි සූදානම් වූයේ හසන්ති සොයන්නට යන්නය. ඇය එළියේ සිටිනු හංසි මොහොතකට පෙර දුටුවාය. නමුත් කෙත්මි අතින් අල්ලා ඇයව නතර කලාය.

*"අම්මට කියන්න එපා. මං මේකට ප්ලාස්ටර් එකක් ගහගෙන එන්නම්. ලොකු තුවාලයක් නෙමෙයිනේ...."*

කී කෙත්මි කුස්සියෙන් පිටව යන අයුරු හංසි බලාඋන්නේ පුදුමයෙනි.

කෙත්මි ඉන්නේ ලොකු කල්පනාවක බව හංසි දහවලේ සිටම දුටුවාය. නමුත් ඒ ගැන අසන්නට නොගියේ කෙත්මි ම ඒ ගැන කියනතුරුය. කෙසේ වෙතත් කෙත්මිගේ සිතේ උදේ තිබූ සතුට දැන් නැති බව විශ්වාසය.

හංසි කෝකටත් කියා කෙත්මි පසුපසින්ම ගොස් කාමරයට එබුණා ය. කෙත්මි කබඩ් එකෙන් ගත් ප්ලාස්ටරය ගසාගෙන ඇඳෙන් වාඩි වූයේ සුසුමක් හෙළමිනි.

sinhalaebooks.com

*"කෙත්මි.... ඇයි මේ ?"*

*"ඇයි හංසි ?"*

*"උඹ අද දවල් ඉඳලා ලොකු කල්පනාවක ඉන්නේ... අහන්නත් හදලා මං නිකම් හිටියා උඹ කියයි කියලා... මොකක්ද බං ප්‍රශ්නේ ?"*

*"හංසි...."*

කෙත්මි කතා කළේ බිඳුණු හඬිනි. හංසි කෙත්මිගේ අත් දෙකෙන්ම අල්ලා ගත්තේ ඇය ඉන්නේ ලොකු ගැටලුවකට මැදිව බව තේරුම් ගෙනය.

කෙත්මි දහවලේ ආ දුරකතන ඇමතුම ගැන සියල්ලම හංසිට කිව්වාය. හංසි පවා මේ කතාව අසා උන්නේ අදහා ගන්නට බැරිවය.

*"මොනවද කෙත්මි මේ කියන්නේ... මට නම් හිතාගන්න බෑ.."*

*"මටත් හිතාගන්න බැරුව ඉන්නේ... මේ මොනවද හංසි මට අහන්න ලැබෙන්නේ ?"*

***“කෙත්මි... මට මුලින් ම මේක කියපං... ඔයාට අසිතව සැකයි ද?”***

හංසි කෙලින්ම ඇසුවාය. හිතට හොරෙන් කතා කළ පලක් නැත. කෙත්මිට මේ ගැන පුංචි හෝ සැකයක් තිබේ නම් තවත් සොයා බැලිය යුතුය. සමහරවිටක මෙය තරහාකාරයකු කල දෙයක් වන්නට ද බැරි නැත.

***“මෙච්චර කාලෙකට මං එයාව සැක කරලා නෑ හංසි... එහෙම හිතන්නවත් මම කැමති නෑ...”***

***“එහෙනම් ඉවරයිනේ... මේක සමහරවිට අසිතගේ තරහාකාරයෙක් කලා වෙන්න පුළුවන්... කොහොම වෙතත් මේ කොහෙන්වත් ආපු කෝල් එකකට ඔය තරම් කලබල වෙන්න එපා.”***

කෙත්මි ඇය කියනා දේවල් නිහඬවම අසා උන්නාය. හංසි සිතන විදිහට සිතන්නට කෙත්මි කැමතිය. එහෙත් පාන්දර බැල්කනියේදී වූ කතාව නිසා කෙත්මිගේ සිත නොසන්සුන්ය.

අසිත එවැන්නක් කියන්නට ඇත්තේ මේ නිසා වන්නට ද බැරි නැත. ඒ කතාවෙන් පසු ඇසුණ මේ කතාව නිසා කෙත්මිගේ සිතෙහි ඔහු ගැන පුංචි සැකයක් දළුලන්නට විය.

sinhalaebooks.com

එනමුත් හංසිට මේ කිසිම දෙයක් දැන්ම ම නොකියා ඉන්නට කෙත්මි සිතා ගත්තාය.

*"කෙත්මි... මං නම් කියන්නේ තවත් ඔය ගැන කල්පනා කරලා වැඩක් නෑ. අපි කෙලින් ම මේ ගැන අසිත අයියාගෙන් අහමු...."*

*"අහන්න පුළුවන්... ඒත් එහෙම දෙයක් නැත්තන්... මං එයාව සැක කළා කියලා දුක හිතයි නේද?"*

*"ඔව් ඉතිං... උඹ හිටපන්කෝ මං මේ ගැන ටොමියා එක්ක කතාවක් දාලා බලන්නම්. දෙන්නා හොද යාළුවෝ නේ. විහිළුවට හරි ඔය වගේ දෙයක් තිබුණා නම් දන්නවා ඇති..."*

හංසි කියන දේත් ඇත්තක් ඇත. විහිළුවට හරි එහෙම දෙයක් තිබුණා නම් දිලූෂ නොදැන ඉන්නට විදිහක් නැත. තවමත් එහෙම දෙයක් තිබෙනම් තමාගේත් අසිතගේත් සම්බන්ධයට ඔහු කීයටවත් ඉඩ නොදෙන බව කෙත්මිට විශ්වාසය. ඒ අතින් දිලූෂ වගකීම් සහගත සහෝදරයෙකි.

# 07.

බණ දවසේ උදේම හංසි සූදානම් වූයේ ගෙදර ගොස් එන්නටය. අද හංසිගේ අම්මාට බෙහෙත් ගන්නට යන දවසය. හංසි සූදානම් වූයේ අම්මාටත් තාත්තාටත් යන්නට කියා අද නොයා ඉන්නටය. එහෙත් කෙත්මි එයට තදින්ම විරුද්ධ වූවා ය.

***"පිස්සි... මෙහේ වැඩ කරන්න කට්ටිය ඇති තරම් ඉන්නවා. වෙනදට අම්මා එක්ක යන්නේ ඔයානේ. ඒ නිසා ගිහින් එන්න... වැඩි වෙලාවක් යන්නේ නෑ නේ....."***

හංසිට අන්තිමේ යාමට ම සිදුවිය. ජංගම දුරකතනයේ බැටරි බැස තිබුණෙන් හංසි කෙත්මිගේ කාමරයේ වූ දුරකතනය අතට ගත්තේ අම්මාට ලෑස්ති වී ඉන්න කියන්නට ය.

එකකට එකක් සම්බන්ධකර තිබූ රැහැන් දුරකතනයෙන් වෙනත් කවුරුන් හෝ ඇමතුමක

sinhalaebooks.com

සිටිනු ඇසීමෙන් හංසි සූදානම් වූයේ දුරකතනය තබන්නට ය.

***“සමාධි... අහන්නකෝ බබා... මට තව සතියක් දෙන්නකෝ... මං ගෙදර ඇවිත් අම්මලා එක්ක එන්නම්...”***

එහාපසින් ඇසුණේ අසිතගේ හඬයි. හංසි මොහොතකට ගල් වූවා ය. සමාධි? කවුද සමාධි? දෙයියනේ... ඊයේ කෙත්මිට ලැබුණ නාඳුනන ඇමතුමෙන් කීවේද සමාධි කෙනෙක් ගැන නොවේද?

හංසි කෙත්මිට කතාකළේ අතිනි. අම්මාට කතා කරන්න ගිය කෙනා මේ මොනවා කරනවාදැයි සිතමින් කෙත්මි දුරකතනය අසලට ආවාය. කතා කරන්නට එපා යැයි අතින් අඟවමින් හංසි ඇයට රිසීවරය පෑවාය. කෙත්මි එය කනේ තබාගත්තේ පුදුමයෙනි.

හංසිට මෙය කෙත්මිගෙන් සඟවන්නට ද තිබුණි. මෙතන වෙන්නේ කුමක්දැයි තවමත් හරියට කියන්න බැරිය. නමුත් හරි හෝ වැරදි කෙත්මි ම මෙය අසා දැනගැනීම හොඳය. අසිත සමාධිට කතා කල විලාසය නිසා හංසිට ද අමුත්තතක් දැනුණි. එය එසේ නම් කෙත්මි අමාරුවේ දමන්නට බැරිය.

sinhalaebooks.com

රිසීවරයෙන් එන හඬ අසිතගේ බව කෙත්මි ක්ෂණිකව හඳුනා ගත්තාය. ඒ වැඩි හරියක් මේ හඬ ඇසුනේ දුරකතනයෙන් නිසා වන්නට ඇත.

*"නෑ... නෑ.. බබා. මං ඔයාට කියලා තියනවනේ මගේ යාළුවා දිලූෂ. එයා එක්ක ආවේ..."*

*"ආාා... ඔයා පොඩිකාලේ ඉඳලා දන්නවා කිව්වේ...."*

*"ඔව් ළමයෝ... බය වෙන්න එපා මෙහේ ඔයා තරම් ලස්සන කෙල්ලෝ නෑ මට බලන්න..."*

කෙත්මි තිගැස්සී ගියා ය. මේ කතා කරන ගෑනු ළමයා කවුද? සමාධිවත් ද? අනික මෙයාලා කතා කරන්නේ යාළුවෝ විදිහට නෙමෙයි නේ... අසිත කී කතාවට එහාපසින් ඒ ගෑනු ළමයා සිනාසෙනු ඇසුණි.

*"මං දන්නවා මගේ මෝඩ කොල්ලෝ.... ඔයා ආදරේ කරන්නේ මට විතරමයි. මට ඒක විශ්වාසයි. ඒ නිසා බයක් නෑ මට..."*

ආදරේ කරනවා ? කෙත්මි හංසි දෙස බැලුවේ අසරණ දෑසිනි. කුමක් හෝ වන බව හංසිට ද දැනේ.

*"ඉතිං ඉතිං... අපේ මස්සිනා මහත්තයා එහෙම සුවෙන් ඉන්නවද ?"*

*"අයියා ඊයෙත් ඔයාව මතක් කලා.. මට බැන බැන හිටියේ... මං ඔයාට නිදහස දෙනවා වැඩියිලු"*

*"සමාධි... ඔයත් එහෙම හිතනවද මැණික? මං කවදාවත් ඔයාගේ නිදහසින් අයුතු ප්‍රයෝජන අරන් නැති බව ඔයා දන්නවනේ.... අපි ආදරේ කරන්න අරන් දැන් අවුරුදු හතරකටත් ළඟයි නේද?"*

*"ඔය ඉතිං... අයියා එහෙම කිව්වට මං කිව්වද? පොඩ්ඩ ඇත්නම් ඇතිනේ ඔයාටත් ඉතිං. දැන් ඔය ඇති... අපි අපේ වෙඩින් එක ගැන කතා කරමු..."*

තවත් අහන් ඉන්නට බැරි තැන කෙත්මි රිසීවරය තැබුවාය. අවුරුදු හතරක සම්බන්ධයක්? එසේ නම් තමාගෙන් ආදරය විමසන විටත් අසිත සමාධි සමඟින් ආදරයක් පටන් ගෙන අවසන් ද? එහෙමනම් අසිත මේ විදිහට තමා සමඟ කළ සෙල්ලම කුමක් ද?

*"අනේ හංසි......"*

sinhalaebooks.com

කෙත්මි එතැනම බිමින් වාඩිවෙද්දී හංසි ඇය වෙත දුවගෙන ආවාය. කෙත්මි ඉන්නේ කිසිවක් සිතා ගන්නට බැරිවය. අඬන්නද.... හිනාවෙන්නද.. ඇයට සිතා ගන්නට බැරිය. අංජලී ඇය අසලම බිමින් වාඩිවෙද්දී කෙත්මි එකවරම හංසිව වැළඳගෙන හඬන්නට වූවාය.

*“කෙත්මි.... අනේ....මේ....”*

*“හංසි.... ඒ... ඒ... ගෑනු ළමයා... අනේ හංසි... ඇයි එයා මට.....”*

එහෙනම් තමාට දැනුන දේ වැරදී නැත. නාදුනන ඇමතුම්කරු කී විලසට ම අසිත ඇයත් සමඟ සම්බන්ධයක් තිබෙනවා ද ?

*“අනේ... හංසි ඔයා... ඔයාට ඇහුණද ? ඒ... ඒ... ඒ ළමයා...”*

*“ඒ කතා කළේ සමාධි. එහෙම නේද?”*

කෙත්මි ඔව් කියන්නට හිස වැණුවේ කඳුළු පිසදමා ගනිමිනි. හංසි ඇය දෙස බලා උන්නේ දුක්බරවය. කෙත්මි ආදරය ගැන කිසිවක් නොතේරෙන කාලයේ සිටම අසිතට ආදරය කලාය. ඒ බව හොදින්ම දන්නේ හංසිය. ඇය ඔහු ගැන කියෙව්වේ හංසි එක්ක ය.

ඔහු ආදරය ප්‍රකාශ කළ දවසේ උඩ පනිමින් සතුට සැමරුවේ හංසි සමඟ ය.

හංසි පවා මෙවැනි දෙයක් අසිතගෙන් බලාපොරොත්තු නොවූවා ය. මේ දේවල් මෙහෙම සිදුවෙද්දී අසිත යනු සිතූ තරම්ම හොඳ පුද්ගලයෙක් නොවන බව පමණක් හංසිට පැහැදිලි ය.

***"ඒ කියන්නේ.. අසිත ඔයා එක්ක යාළුවෙලා ඉන්න අතරෙම සමාධි එක්කත් යාළු වෙලා..."***

***"නෑ... නෑ හංසි. ඒක එහෙම නෙමෙයි වෙලා තියෙන්නේ...."***

***"එහෙනම් ?"***

හංසි අසද්දී කෙත්මි වාඩිවී සිටි තැනින් නැගිට ඇඳ උඩින් වාඩිවූයේ සුසුමක් හෙලන අතරේය.

හංසිද ඇය අනුවම නැඟිට පුටුවක් ගෙන කෙත්මි අසලින් වාඩිවී ඇය දෙස බැලුවා ය. කුඩා කාලයේ සිටම දැක පුරුද්දෙන් හංසි කෙත්මිගේ මුහුණේ දුක කෝපය හොඳින් හඳුනයි. එහෙත් දැන් ඒ මුහුණේ ඇත්තේ ඒ දෙකම නොවේ.... දැඩි කලකිරීමකි.

sinhalaebooks.com

*"කියන්නකෝ කෙත්මි.... එහෙනම් මොකක්ද මේ?"*

*"සමාධි නෙමෙයි හංසි... මමයි ඒ කතාවේ තුන්වෙනියා..."*

*"මොනවා...? මොනවද ඔයා මේ කියවන්නේ?"*

*"ඔව් හංසි... මට එයාලගේ කතාවෙන් තේරුණු විදිහට ඒ සම්බන්ධේ දැන් අවුරුදු හතරක් විතර...."*

එවර නම් හංසිගේ දෑස් පුදුමයෙන් විසල් විය. අසිත කෙත්මි සමඟ මේ කලේ මොන විදිහේ සෙල්ලමක් ද? හංසිට අසිත ගැන තද කෝපයක් දැනුණි. සමාධි එක්ක සම්බන්ධයක් තිබුණා නම් කෙත්මි මොකටද?

*"මූ මහ ජරා සතෙක් බං... ඉදපංකෝ මම අද මේකාට..."*

හංසි කේන්තියෙන් නැගිට්ටේ පහළට ගොස් හොඳ දෙකක් කතා කරන්න හිතාගෙනය. එහෙත් කෙත්මි හංසිව අතින් අල්ලා නතර කරවූවාය.

sinhalaebooks.com

*"හංසි... ප්ලීස් අපි මේ දවස් දෙක ඉවසමු. අද ගෙදර හොඳ දෙයක් කරන්න යන්නේ... ප්‍රශ්න ඇති කරගන්න ඕන නෑ..."*

*"ඒත් කෙත්මී..."*

*"නැහැ හංසි... අද නෙමෙයි. මේවා ඉවර වුණාම මං ම එයාට කතා කරන්නම්. මටත් අහන්න ඕන එයාගෙන්... මට මෙහෙම කරන්න මං එයාට කරපු වැරැද්ද මොකක්ද කියලා... ඒත් අපි අද දවස කිසිම දෙයක් නොදන්න ගානට ඉමු. ප්ලීස්..."*

*"හ්ම්...."*

හංසි ඇය අසලින්ම වාඩිවී ඇයගේ කර වටා අතක් දමා ගත්තා ය. කෙත්මි ඇය දෙස බලා අසරණ සිනහවක් පෑවාය. සිනහවකටත් වඩා එය හැඬුමකට සමානය.

*"ඔයාට පරක්කු වෙනවා හංසි...."*

*"මං යන්නේ නෑ.... උඹව මෙහෙම දාලා මං කොහේ යන්න ද? අම්මා තාත්තා එක්කලා යයි."*

sinhalaebooks.com

හංසි කියද්දි කෙත්මි මොකුත්ම නොකියා ඇයගේ උරහිසට හිස බර කලා ය. හංසි සිටින එක මේ මොහොතේ සිතට සහනයකි.

*******************

අසිත සමාධිත් සමඟ කතාකර දුරකතනය තැබුවේ මේ කිසිවක්ම නොදැනය. දිලූෂ පිටතට ගොස් සිටි නිසා ඇයත් සමඟ නිදහසේ කතා කරන්නට හැකි විය. ඔහු ඇදට වැටුණේ සමාධි හා කෙත්මි ගැන සිතමිණි.

නුදුරේදි ම දෙදෙනාගෙන් එක් කෙනෙක් තෝරා ගන්නට සිදුවෙන බව හිත දනී. නමුත් දෙදෙනාව තරාදියකට දමා කිරා බලන්නට අසිතට බැරිය. එක අතකින් කෙත්මිව දන්නේ උපන් දා සිටමය. සමාධි සමඟ සම්බන්ධය තිබියදීත් ඇය සමඟ සම්බන්ධයක් ගොඩනගා ගත්තේ ඇයි දැයි ඔහුටත් සිතා ගන්නට බැරිය. දැන් ඇයව අතරමං කරන්නට ද බැරිය.

ඒ වුණත් සමාධිව කොහෙත්ම අතහරින්නට බැරිය. ඇය කෙත්මිටත් වඩා අහිංසක

sinhalaebooks.com

යුවතියකි. ඇයත් සමඟ ආදරයක් ගොඩනැගුණේ වසර හතරකට පෙරය. මේ සියල්ලටම වඩා ඇයව අත්හරින්න බැරිවී ඇත්තේ මේ වන විටත් ඇයත් සමඟ බොහෝ දුරක් ගොසින් අවසන් නිසාය. මේ තත්වයෙන් ඇයව තනි කරන එකත් අසාධාරණ ය.

මොකකින් මොකක් කරන්නදැයි සිතාගන්නට බැරිය. සමාධි කෙත්මි ගැනවත් කෙත්මි සමාධි ගැනවත් තවම දන්නේ නැත. එය සහනයකි.

*“අසිත අයියේ....”*

*“ඉදහන් මේ එනවා....”*

රනුක් තමා සොයා එන්නට පෙර අසිත ඇඳෙන් නැගිට සාලයට ගියේ ය. කල්පනා කරන්නට වෙලාවක් නැත. අද වැඩ අධික දවසකි.

sinhalaebooks.com

08.

ධර්ම දේශනාව නිමා වූ පසු පැමිණි අයට සංග්‍රහ කිරීමේ කටයුතු පසන් හා ඔහුගේ මිතුරන් භාරගත් නිසා හංසිට හා කෙත්මිට මද විවේකයක් ලැබුණි. අමුත්තන්ගෙන් මිදුණු කෙත්මි බැල්කනියේ වාඩි වී සුසුමක් හෙළුවාය. හංසිද ඇය හා පැමිණ බැල්කනියේ සුදු යකඩ වැට ට වාරු වූවාය.

කෙත්මි මේ තරම් වෙලා උන්නේ සුළුපටු දුකක් සිතේ සිරකරගෙන නොවන බව හංසි හොඳින්ම දනී. ඒ නිසා කෙත්මිට මොහොතක් නිස්කලංකයේ ඉන්නට ඉඩ හැර හංසි නිහඬවම පහළ කලබලය දෙස බලා උන්නාය.

අසිත කල දේත් එක්ක බලද්දී පසන් කොතරම් හොඳ කෙනෙක්දැයි හංසි කල්පනා කලේ ඔහු දෙස බලාගෙනය. වසර ගනනාවක සිට ඔහු කෙත්මිගේ ආදරය බලාපොරොත්තුවේන් බලා හිඳියි. කෙත්මි කෙතරම් ප්‍රතික්ෂේප කළ ද ඔහු වෙනස් වූයේ නැත. මොන දේවල් කීවත් තරහ ගන්නේ ද නැත.

sinhalaebooks.com

කෙත්මිගේ අගය ඔහු අසිතට වඩා හොඳින් දනී. අසිතට මේ තරම් හොඳ කෙල්ලෙක් තමාට ආදරය කරද්දීත් ඇයව රැක ගැනීමට බැරි වුණේ ඇයි?

*"පුතා... හංසි... හංසි..."*

පහළින් කවුරුන් හෝ කතා කරනු ඇසී හංසි කල්පනාවෙන් මිදී එබී බැලුවාය. පහළ උන්නේ කෙත්මිගේ පියා ය.

*"පුතා... අපේ සුදූ ඔතන ඉන්නවද ?"*

ඔහු අසද්දී හංසි පසුපස හැරී කෙත්මි දෙස බැලුවාය. ඇය මේ කිසිවක් නොඇසෙන තරම් තද කල්පනාවක ගිලී ගොසිනි.

*"ඉන්නවා මාමා. පොඩ්ඩක් ඉන්න..."*

හංසි කෙත්මි වෙත ගොස් ඇයගේ උරහිසට අතක් තබා කතා කලාය. කෙත්මි ඇය දෙස බැලුවේ තිගැස්සීගෙනය. කෙත්මිගේ මුහුණේ ඇති කඳුළු බිඳු හංසි සුරතින් පිස දැමුවාය.

*"තාත්තා පහළ ඉඳන් කතා කරනවා... පොඩ්ඩක් බෙල්ල දාලා බලපං...."*

sinhalaebooks.com

*"කෝ....."*

*"පහළ ඉන්නේ... මෙතනින් එබිලා බලන්න."*

කෙත්මි පැමිණ හංසි පෙන්වූ තැනින් පහළට එබුණාය.

*"සුදූ ඔයා ඇඳුම් මාරු කරලා නෑ නේද ?"*

*"නෑ තාත්තා. ඇයි ?"*

*"පොඩ්ඩක් පහළට එන්නකෝ පුතේ...."*

කෙත්මි හංසි දෙස හැරී බැලුවාය. හංසිත් ඉන්නේ බොහෝ විඩාවෙන් බව කෙත්මි දනී. උදේ සිට ම තමාගේ වැඩ වලිනුත් වැඩි හරියක් කළේ ඇයයි.

*"ඔයා ඉන්න හංසි මං ඉක්මනින් බලලා එන්නම්...."*

කෙත්මි පහළට ගියේ හංසිව බැල්කනියේ තනි කරය.

sinhalaebooks.com

ඇය පහළට එන විට තාත්තා උන්නේ අසිත හා දිලූෂ සමඟ කතා කරමිනි. කෙත්මි වෙනසක් නොපෙන්වා එතනට ආවා ය.

***"ඇයි තාත්තා ?"***

***"සුදූ... හෙට දානෙට ඕන බඩු වගයක් තියෙනවා පන්සලෙන් ගේන්න... මට දැන් වෙන වැඩකට යන්න වෙලා. සුදූට පුළුවන් ද ගිහින් එන්න ?"***

***"දැන්...? ගොඩක් රෑ වෙලානේ තාත්තා... මේ රෑ මං තනියම...."***

***"තනියම කොහෙද ළමයෝ... මේ අසිත අයියා එක්ක යන්න..."***

දවස් දෙකකට පසු කෙත්මි අසිත දෙස බැලුවාය.ඔහු වෙනසක් නැතුව සිනාසෙමින් ඇය දෙස බලා උන්නේ ය.

***"ඉතිං තාත්තා මේ දෙන්නව යවන්නකෝ...."***

sinhalaebooks.com

*"මං බාප්පා එක්ක යන්න ඕන සුදූ... අනික ඔයාවනේ හාමුදුරුවෝ දන්නේ... ඔය දෙන්නා ගිහින් එන්න..."*

දිලූෂ අවසන් තීරණය දුන්නේ ය. කෙත්මි බැල්කනිය දෙස බැලුවේ අසරණ දෑසිනි. කලින් නම් බලා උන්නේ මෙවන් මොහොතක් එනතුරුය. දැන් තත්ත්වය වෙනස් වී ඇත. අසිත සමඟ මෙසේ තනිවනවා යන හැඟීම කෙත්මිට නොසන්සුන් බවක් ගෙන ආවේ ය.

*"යමු සුදූ...."*

තමාත් එන්නදැයි හංසි බැල්කනියේ සිට ඉඟියෙන් අසද්දී කෙත්මි එපා යැයි කියන්නට හිස වනා අසිත පසුපසින් ගියාය.

දින දෙකක් තිස්සේ කතාබහ කරන්නට බැරි වූ බව ඇත්ත ය. එනමුත් කෙත්මිගේ පැහැදිලි වෙනසක් අසිත මේ මොහොතේ දුටුවේය. ඇය වෙනදාට නම් මෙවන් ගමනකට පැකිලෙන්නේ නැත. මේ දෙදෙනාට තනිව ගමනක් යාමට ලැබුණු මුල්ම අවස්ථාවයි. අසිත සිතුවේ ඇය බොහෝ සතුටුවේ යැයි කියායි.

*"සුදූ..."*

ඔහු කතා කලේ වාහනය පණගන්වාගත් පසුය.

*"ම්......"*

*"ඇයි මේ? කතා කරන්නෙත් නෑ... එන්නත් බෑ කිව්වේ ? මාත් එක්ක තරහා වෙලා වගේ....."*

*"එහෙම දෙයක් නෑ අයියේ... මට ටිකක් මහන්සියි...."*

*"අනේ... දන්නවා නම් මං තනියම එනවා බබා.."*

*"ඒකට කමක් නෑ..."*

කෙත්මි තවත් කතා කරන්නට ඉඩක් නොතබාම අසුනට බර වී දෑස් පියා ගත්තාය. අසිත නිහඬ වූයේ ඇය ඉන්නේ සැබෑවටම මහන්සියෙන් යැයි හැඟුණ නිසාය.

*******************

***"දිලූෂ අයියේ... කිසිම මනුස්සයෙක්ට අයිතියක් නෑ මෙහෙම තව කෙනෙක්ගේ ජීවිතේ විනාස කරන්න. වාචිකව තියා නීතියෙන් බැඳීමක් තිබුණත්... ලේ බැඳීමක් තිබුණත්... එහෙම කරන්න අයිතියක් නෑ. මං අහන්නේ මේක මොන විදිහේ සෙල්ලමක් ද ?"***

හංසි කියවාගෙන ගියේ හිතේ වේදනාවටය. දිලූෂ මේ දේවල් අසා උන්නේ ඇය මොනවා කියනවාදැයි නොදැනය. ඔහු හංසිව සොයා ආවේ කෙත්මිගේ හැසිරීමේ වෙනසක් දැනුන නිසාය. ඒ ගැන අසන්නට හොඳම කෙනා හංසිය.

නමුත් හංසි මේ කියවන්නේ මොනවා ගැනදැයි දිලූෂට හිතාගන්නට බැරිය. ඇය ඉන්නේ කවුරුන් හෝ සමඟ විශාල කේන්තියකින් බව නම් පැහැදිලිය.

***"හංසි... ඔයා කියන දේ මට පැහැදිලි නෑ නංගි."***

***"ආ... දැන් ඔයා කියන්නේ ඔයා මේ ගැන දන්නේ නෑ කියලද ?"***

***"මොනවා ගැනද හංසි ?"***

sinhalaebooks.com

*" මං කතා කරන්නේ අසිත ගැන.....ඔයා දැන් කියන්නේ අසිත ඉන්දියාවෙදි සමාධි කියලා ගර්ල් කෙනෙක් ඒක්ක යාළු වුණ බව දන්නේ නෑ කියලද ?"*

දිලූෂ හංසි දෙස බැලුවේ පුදුමයෙනි. හංසි මෙය දැන ගත්තේ කෙසේද ? මේවා කෙත්මිත් දන්නවා ද?

*"ඔයා කොහොමද ඒවා දන්නේ ?"*

දිලූෂ අසද්දී හංසි පෙරදා කෙත්මිට පැමිණි දුරකතන ඇමතුම ගැන සියල්ල දිලූෂ සමඟ කීවාය. එහෙත් අසිතගේ දුරකතන ඇමතුම ගැන ඇය තවම කීවේ නැත.

*"නංගි... මාත් ඔය සිද්ධිය දැනගත්තේ ඊයේ උදේ. අසිත බාත්රූම් ඉද්දි ඔය ගෑණු ළමයා කතා කලා. ඒ කෝල් ඒකෙන් පස්සේ මාත් ඔය වගේම කලබල උනා...."*

*"ඒ කියන්නේ ඔයාත් මේක මුලින් දැනන් හිටියේ නැද්ද ?"*

*"නෑ නංගි... මං ඊයෙම අසිතගෙන් මේ ගැන ඇහුවා. මෙතන තියෙන්නේ අපි හිතන විදිහේ දෙයක් නෙමෙයි."*

*"එහෙනම් කොහොම දෙයක් ද?"*

*"අසිත ඔය ගර්ල් එක්ක ටික කාලයක් සම්බන්ධයක් තිබිලා තියනවා. කොල්ලෝ වුණාම ඉතිං... ඔය පොඩි පොඩි වැරදි වැඩ වෙනවානේ. පස්සේ ඒ සම්බන්ධෙ අසිත නතර කරලා. දැන් ඒ ගර්ල් මෙයාට කරදර කරනවාලු. මෙතනදි අසිතගේ වරදක් තියනවා. ඒත් ඉතිං මේ වයසට ඔහොම දේවල් වෙනවානේ... අනික අසිතම පිළිගන්නවා කළේ වරදක් කියලා."*

*"ඇත්තද ? ඔයාට හොදටම විශ්වාස ද ? ඒ වුණාට අපට ඔය කතාව පිළිගන්න බෑ..."*

හංසි තමාගේ කීම එක එල්ලේම ප්‍රතික්ෂේප කරද්දී දිලූෂ ඇය දෙස බැලුවේ චකිතයෙනි. හංසි මේ ලෙසින් කතා කරන්නේ තමා දන්නා දෙයට ඉහළින් යමක් දැනගන විය යුතුය.

*"හංසි?"*

*"මේකයි අයියේ... අද උදේ..."*

හංසි උදෑසන සිදුවීම දිලූෂ සමඟ කීවේ අසිත ඔහුවත් රවටාගෙන ඇති බව දැනුණ නිසාය. කතාව

sinhalaebooks.com

අසද්දී ඔහුගේ මුහුණ වෙනස්වන අයුරු හංසි හොඳින්ම දුටුවාය.

*"මොකක්..? එතකොට අසිත මට කිව්ව කතාව බොරු ද ...?"* ඔහු තමාගෙන්ම අසා ගත්තේ ය.

*"ඔයාම හිතලා බලන්න. අසිත විහිළුවක් කරගෙන තියෙන්නේ අර සමාධිව නෙමෙයි අයියේ... අපේ කෙත්මිව... ඒ කෙල්ල එක්ක එෆෙයාර් එක තියෙද්දී මෙයා කෙත්මි එක්ක යාළු වුණේ. හරි... ඒත් කමක් නෑ කෙත්මි එක්ක යාළුවෙලා ඒ සම්බන්ධෙ නතර කලානම්. එහෙම දේවල් සාමාන්‍යයෙන් වෙන දේවල්. දැන් ඔයා අතින් කියලා තියෙන්නෙත් ඒ වගේ කතාවක් නේ... ඒත් අසිත ඒක නතර කරලා නෑ. දැන් ඒ දෙන්නා වෙඩින් එකකුත් ප්ලෑන් කරනවා.... එතකොට අපේ එකීට මොකද වෙන්නේ?"*

දිලූෂට ඇත්තෙන්ම දැනුණේ මහා අසරණ බවකි. අසිත කුඩා කාලයේ සිටම තම මිතුරාය. ඒ මිත්‍රත්වය නිසාම කෙත්මිත් සමඟ ඇති කරගත් සම්බන්ධයද පිළිගත්තේ ය. නමුත් මේ කියන ආකාරයට ඔහු කෙත්මිවත් තමාවත් දෙදෙනාම රවටා ඇත. දිලූෂගේ සුරත කෝපයෙන් මිට මෙලවුනි.

sinhalaebooks.com

*"ෂිට්... මූ මගේ යාළුවෙක් වුණා නේ... ආව දෙන්කෝ අද.. මේවා දන්නවා නම් මං කෙත්මිට ඒකා එක්ක යන්න දෙන්නෙත් නෑ..."*

*"අයියේ... දැන් කලබල නොවී මේ අහන්න..."*

හංසි කීවේ දිලූෂ අසලින්ම වාඩි වී ඔහුගේ උරහිසට ද අතක් තබාගෙන ය. ඔහු සිටින්නේ කේන්තියෙනි.

*"මට කෙත්මි කිව්වේ මේ ගැන දැන්ම මොකුත් කතා කරන්න එපා කියලයි..."*

*"කතා නොකර කොහොමද හංසි...?"*

*"මාත් ඔය සිද්දිය දැනගත්තු ගමන් හැසිරුනේ ඔයා ඔය හැසිරෙන විදිහට තමයි... ඒත් කෙත්මි මාව නතර කලා..."*

*"එයා මොනවද දැන් කියන්නේ... ඇත්ත දැනගත්තටත් පස්සේ ?"*

*"අයියේ... අපි එයාට ටිකක් ඉඩ දෙමු. එයා බලන් ඉන්නේ හෙට දානේ ඉවර වෙනකම්. හෙට දවල්ට එයා*

*අසිත එක්ක මේ ගැන කතා කරයි. අපි එතකම් මේ දේවල් නොදන්න ගානට ඉමු....”*

*“ඒත් හංසි...”*

*“මේ අහන්න... දැන් ඔය ගැන අසිතට මොකුත් අඟවන්න එපා. එහෙම වුණොත් හෙට වෙද්දී එයා ලස්සන කතාවක් ගොතයි.... ඒක වෙන්න ඉඩ නොතියා අපි බලමු මිනිහා මොනවද කියන්නනේ කියලා....”*

*“ඒත් හංසි උඹව දකිද්දී මට මගේ කේන්තිය පාලනය කරගන්න බැරි වේවි.”*

දිලූෂ කීවේ බොරුවක් නොවේ. ඔහු තමාටත් කෙත්මිටත් මේ තරම් බොරුවක් කල බව දැනගත් පසු.... සියල්ල දැන දැන නොදන්නවා සේ හිදීම අපහසුය. හංසිද එය දනී. කෙත්මිත් ඇයත් අද උදේ සිටම අසිතව මඟහැරියේ ඒ නිසාය.

*“මං දන්නවා. ඒකට ඔයා පුළුවන් තරම් එයාව මඟ ඇරලා ඉන්න බලන්න. අද කොහොමත් කලබල දවසක්නේ... ශේප් එකක් දා ගමු. ඔයා අද නිදාගන්න රනුක්ගේ කාමරේට පැන්නා නම් හරි...”*

sinhalaebooks.com

හංසි කියද්දී දිලූෂ සිනහවක් පා උන් තැනින් නැඟිට්ටේය. සුසුමක් හෙලා ඔහු යන්නට ගියේ හංසිගේ හිසත් අතගාගෙනය. හංසිට ඒ මොහොතේ නම් ඔහුව කෙත්මිගේ පමණක් නොව තමාගේද අයියා ලෙසින් දැනුණි.

sinhalaebooks.com

09.

දානයේ වැඩ කටයුතු ඉතා ඉහළින් කිරීමට හැකි වූ නිසා සියල්ලන් ම උන්නේ සතුටිනි. පැමිණි බොහෝ දෙනා පිටව යද්දී අහල පහල කිහිප දෙනෙකුත් හංසිගේ අම්මලාත් නිවසේ ඉතිරි වූහ. ගැහැණු උදවිය කුස්සිය අස්පස් කරද්දී පිරිමි අය මිදුලේ හට් පුටු ආදිය අස්කරන්නට පටන් ගත්හ.

කෙත්මි උඩට වී මිදුලේ වැඩ කරන පිරිස දෙස බලා උන්නාය. පසන් හා ගමේ තරුණයන් සමඟ සිනාසෙමින් කතාබහ කරන අසිත දෙස ඇයට නොබලා සිටින්නට බැරි ය.

***ඇයි අයියේ මට මෙහෙම කලේ? මං හීනෙකින්වත් හිතුවේ නෑ ඔයා මට මේ වගේ බොරුවක් කරයි කියලා... මං පුංචි කාලේ ඉඳන් ඔයාට ආදරේ කල බව ඇත්ත... ඒත් ඔයාට තිබ්බා නේද සමාධිට ආදරේ කරනවා නම්... මාව මෙහෙම සෙල්ලමකට නොගෙන ඉන්න. දැන් මං කොයිතරම් විඳවනවද කියලා ඔයා දන්නේ නෑ...***

sinhalaebooks.com

රනුක් කෙත්මිව සොයාගෙන උඩට ආවේ කෙත්මි කල්පනාවේ ගිලී සිටින අතරේය. හංසි උන්නේ අම්මලා සමඟින් කුස්සිය අස්කරමිනි. නිකමට මෙන් කෙත්මි කොහෙද කියා බලා එන්නයැයි රනුක්ට කීවේ හංසිය.

***"සුදූ... අනිත් ඔක්කොමලා පහල ඉද්දී තමුසේ මොකද අක්කා මෙතන තනියම ?"***

රනුක්ගේ හඬට කෙත්මි හැරී බැලුවා ය. රනුක් විමසිල්ලෙන් අක්කා දෙස බැලුවේ වෙනසක් දැනුන නිසාය.

***"ඇයි සුදූ... තමුසෙට සනීප නැද්ද ?"***

***"මට ඇති අසනීපයක් නෑ හලෝ... කෝ හංසි ?"***

***"මොන විකාරයක් ද බං මේ? එයා මෙයාව හොයනවා... මෙයා එයාව හොයනවා..."***

***"කොහෙද කියපංකෝ..."***

sinhalaebooks.com

*"කුස්සියේ වැඩ අන්න හෝ ගාලා...එන්න කියන්නද ?"*

*"එපා..."*

*"එහෙනම් කෙල්ලේ මං ගියා...."*

රනුක් අතකුත් වනාගෙන ආපසු හැරෙද්දී කෙත්මිට යමක් මතක් විය. ඇය යලිත් රනුක්ට කතා කලා ය.

*"මල්ලී..."*

*"මොකෝ ?"*

*"පුළුවන්නම් අසිත අයියට පොඩ්ඩක් එන්න කියන්නකෝ...."*

*"අයියෝ... සිම්පල් නේ... කලින් කිව්වනම් මෙලහටත් මං මැසේජ් එක දීලානේ සුදූ..."*

රනුක් උඩ පැන පැන පඩිපෙළ බසිනු කෙත්මි බලා උන්නාය. වෙනදාට නම් මේ වැඩේ කෙත්මිට පෙන්නන්න බැරිය. තාත්තා වුවද සද්ද කරමින්

sinhalaebooks.com

පඩිපෙළ නැග්ගොත් කෙත්මිගෙන් බැණුම් ය. අද කෙත්මිට ඒ ගැන සිතන්නට සිහියක් නැත.

මුලින් ම මේ ගැන අසිත සමඟ කතාකොට ඔහුට මේ ගැන කියන්න ඇත්තේ මොනවාදැයි ඇසිය යුතුය. ඉන් පසු මේ ගැන තීරණයක් ගත යුතුය. ඔහු ඇයට ආදරය කරනවා නම් තමා ඔහුව බලෙන් තබාගෙන පලක් නැත.

රනුක් පණිවිඩය දුන් සැනින් අසිත උඩට ආවේ දෙවරක් නොසිතාය. ඔහු සිතුවේ ඊයේත් හරිහැටි කතා කරන්නට බැරි වූ නිසා කෙත්මි තමාට කතා කරන්නට ඇතැයි කියා ය. අසිත ගිය මොහොතේම දිලූෂ රනුක්ට ළං වූයේ ඔහු ගියේ කෙත්මි හමුවීමට බව දැනගෙන ය.

*"කොහෙද බං අර දුවන්නේ ?"*

*"අනේ අනේ ටොමියෝ... උඹටත් ඕන නැති මඟුලක් නෑ... ඔය ගියේ අක්කව හම්බෙන්න..."*

*"ආ... සුදූ උඩ ද?"*

*"ඔව්... අර බැල්කනියට වෙලා අහස පොළොව ගැට ගහන්න විදිහක් හොයනවා..."*

*"හංසි එක්ක ද ?"*

*"හංසි ? හංසි අන්න කුස්සියේ බරටම වැඩ. වෙලාවකට එයා අපේ ගෙදර ළමයා වෙලා අපේ අක්කා පිට ළමයා වෙනවනේ...."*

රනුක් තනිවම කියවමින් එහාට යද්දී දිලූෂ කුස්සිය දෙසට ගියේ හංසිව සොයන්නටය.

අසිත බැල්කනියේ සුපුරුදු ඔංචිල්ලාවට බර වුණේ කෙත්මිටත් ඉඩක් තබමිනි. එහෙත් කෙත්මි එතනට නොයා පුටුවක් ගෙන ඔහුට මුහුණලා වාඩි වූවා ය. අසිත එය එතරම් ගනනකට ගත්තේ නැත.

*"ඇයි සුදූ මේ හදිස්සියේ ? මං රෑ වෙලා ඔයා එක්ක කතා කරන්න එන්න හිටියේ...."*

*"රෑ වෙලා කතා කරන්න කලින් මට ඔයාගෙන් දැනගන්න දෙයක් තියනවා... මං හිතනවා ඔයා මට ඇත්තම කියයි කියලා..."*

sinhalaebooks.com

*"මොනවා ගැනද සුදූ.. මං ඉතිං ඔයාට බොරුවක් කියන්නේ නැති බව ඔයා හොදට ම දන්නවානේ...."*

*"ඒක ඉතිං මට වැඩිය හොදට ඔයාගේ හිත දන්නවා ඇතිනේ..."*

ඒ කතාවෙන් නම් අසිතට යම් අමුත්තක් දැනුණි. කවදාවත් කෙත්මි මෙවැනි දේවල් කියා නැත. ඇය අද කතා කරන්නේ මොනවා හෝ හිතේ තබාගෙනය.

*"හරි හරි... ඔයාට දැන් මොනවද අහන්න තියෙන්නේ ?"*

*"මට අහන්න තියෙන්නේ මෙච්චරයි... කවුද අයියේ සමාධි ?"*

*"ස..ස්..සමාධි...?"*

එකවරම ඔහුගේ හදේ ඇති වූ තිගැස්ම කෙත්මි කටහඩින් ම අදුනා ගත්තාය.

sinhalaebooks.com

*“අයියේ... මං මේ ගොඩක් දේවල් දැනගෙන කතා කරන්නේ. ඒ ගර්ල් එක්ක ඔයාට එෆෙයාර් එකක් තියනව ද ?”*

කෙත්මි අසන්නට තිබූ දේ කෙලින්ම ඇසුවාය. නමුත් අසිත එකවරම පිළිතුරක් දුන්නේ නැත. ඔහු මදක් කල්පනා කලේ ය. අනතුරුව කතා කලේ වරදක් කර හසුවූ පොඩි දරුවෙකු මෙන් හිස පහතට හොවාගෙන ය.

*“සුදූ... මට සමාවෙන්න. මං ඉන්දියා ඉද්දී මං ඔය කියන සමාධි එක්ක එෆෙයාර් එකක් තිබුණා. ඒත් දැන් ඒක නෑ...”*

*“ඇයි ඒ...?”*

*“මං ඇත්තම කියන්නම්කෝ... මං එදා ඉදලම ආදරේ කළේ ඔයාට විතරයි සුදූ. විහිළුවට වගේ සමාධි එක්ක යාළු වුණාට මං හැමදාමත් ආදරේ කළේ ඔයාට...”*

*“ඉතිං දැන් ඒක ඉවරනම් එයා ඇයි ආයෙත් ඔයාට කතා කරන්නේ ?”*

sinhalaebooks.com

***"එයා මගේ පස්සෙන් එනවා සුදූ එයාව මැරි කරන්න කිය කියා... මං මේ වැඩ ඉවර වෙලා ඔයාටත් මේ ගැන කියන්නයි හිටියේ...."***

***"හොඳයි... දැන් මට කියන්න ඔයා මේ ගැන මොකක්ද අරන් තියෙන තීරණේ ? එයාව මැරි කරනව ද ?"***

***"මොනවද මේ කියන්නේ සුදූ... මට පුළුවන් ද ඔයාට ආදරේ කරන ගමන් එයාව මැරි කරන්න ? මට එයාගෙන් වැඩක් නෑ. හෙටම හරි කමක් නෑ ඔයා කැමති නම් අපි දෙන්නා මැරි කරමු.."***

කෙත්මි මෙතෙක් වෙලා අසිත කී දේවල් අසා උන්නේ ඉවසීමෙනි. ඔහු කියන්නේ ගොතාගත් කතාවකි. එහෙත් අවසානයට කී කතාවෙන් නම් කෙත්මිගේ ඉවසීමේ සීමාව පැන්නේය.

***"ඇති... හොඳටම ඇති. දැනුත් ඔයා කියන්නේ බොරු. ඔයා කොහොමද මාව මෙහෙම සෙල්ලමට ගන්නේ ? මං ඔයාගේ සෙල්ලම් බඩුවක් නෙමෙයි. මං ඔයාට ආදරේ කලා පොඩි කාලේ ඉඳලා. ඒක ඇත්ත. හැබැයි මං ඔයාගෙන් ඉල්ලුවේ නෑ මට ආදරේ කරන්න කියලා.***

sinhalaebooks.com

*ඔයා සමාධි එක්ක යාළුවෙලා අවුරුදු හතරක්... එයා එක්ක යාළුවෙලා ඉඳගෙන මාව මෙහෙම සෙල්ලමට ගත්තේ මං ඔයාට මොන වරදක් කලාට ද ? ඔයා ඊයේ උදේ සමාධි එක්ක වෙඩින් එක ප්ලෑන් කරලා.. අද කියනවා මාව මැරි කරනවලු.. ඔයා කාටද මේ බොරු කරන්නේ ?"*

කෙත්මි ඒ කතාව දැනගත්තේ කෙසේදැයි අසිතට සිතා ගන්නට බැරිය. ඒ මොහොතේ දිලූෂවත් ළඟක උන්නේ නැත. නිදහසේ කතා කලේ ඒ නිසා ය.

*"සුදූ... ඔයාට වැරදීමක් වෙලා ඇති. එහෙම දෙයක් නෑ සුදූ..."*

*"වැරදීමක් වෙලා... ඔව් මට වැරදුණා.. ඔයාව ඕනවටත් වඩා විශ්වාස කරපු නිසා මට වැරදුණා."*

*"සුදූ... මං කියන දේ පොඩ්ඩක්.."*

*"නෑ... මට තව මොකුත් අහන්න ඕන නෑ. මං ඔයාට එදා කිව්ව විදිහටම අද ඔයා මගේ විශ්වාසේ බින්දා. මං එදත් කිව්වනේ... මෙතනින් එහාට සේරම ඉවරයි..."*

sinhalaebooks.com

*"සුදූ...."*

*"නැහැ... මීට පස්සේ මට ඔය නමින් කතා කරන්න ඔයාට බෑ... මං රිතූ... රිතූ කෙත්මිණී. එච්චරයි. ඊට වඩා දෙයක් නෑ... කරුණාකරලා මීට පස්සේ මට කතා කරන්න එපා..."*

අසිතට තවත් යමක් කියන්නට ඉඩ නොතබාම කෙත්මි යන්නට හැරුණාය. අසිත උන් තැනම ගල් ගැසී බලා උන්නේය. එදා කීවාට කෙත්මි මේ කරම් ඉක්මනින් තමාව අතහැර දමාවි යැයි ඔහු සිහිනෙන්වත් නොසිතුවේ ය.

යන්නට ගිය කෙත්මි ආපසු නතර වී ඔහු දෙස හැරී බැලුවේ දෙනෙතට උනන කඳුළු නවතාගැනීමට වෙර දරමිනි.

*"හෙටම මෙහෙන් යනවනම් මම කැමතියි. දැන් දානේ ඉවරනේ... මට තවත් ඔයාව දකින්න ඕන නෑ."*

කෙත්මි වේගයෙන් කාමරයට වැදී දොර වසා ගත්තාය. මෙතෙක් වෙලා පහළට වී විමසිල්ලෙන් සිටි හංසි උඩට දුවගෙන ආවේ කෙත්මි දොර වසන හඬටය.

sinhalaebooks.com

අගුළු ලා නොතිබුණෙන් හංසි දොර ඇරගෙන කාමරයට ආවාය. කෙත්මි උන්නේ ඇඳේ වැතිරී හඬමින් ය. හංසි නිහඬවම ඇය අසලට වී ඇයගේ හිස අතගෑවාය.

අසිතත් කෙත්මිත් කතාකළ දේවල් දිලූෂ හා හංසි මුල සිටම අසා සිටියෝ ය. ඇත්ත දැන දැනත් කෙත්මි එතරම් ඉවසීමකින් අසිතට කතා කලේ කොහොමදැයි හංසිට සිතා ගන්නට බැරිය. කෙත්මි වෙනුවට එතන තමා සිටියා නම් අතට අසුවූ දෙයකින් දමා ගසන්නට වැඩි වෙලාවක් ගන්නේ නැත. කෙසේ වෙතත් කෙත්මි දුන් අවස්ථාවෙන් තමා කෙතරම් කපටි පහත් පුද්ගලයෙකුදැයි අසිත නොදැනුවත්ව ම පෙන්වා දුන්නේය.

sinhalaebooks.com

## 10.

අසිතට මේ සිදුවූ දෙය තවමත් තේරුම් ගැනීමට බැරිය. කෙත්මි මේ සියල්ල දැනගත්තේ කෙසේද ? මේ දේවල් ඇයට කියනවා තබා දිලූෂවත් දැන උන්නේ නැත. කොහෙන් හෝ විශ්වාසදායක මගකින් ඇය මේ දේවල් දැනගන තිබේ. ඇය කතා කලේ සියල්ලම දැනගෙන ය. මේ ගැන දිලූෂගෙන් අසන්නට සිත් නොදේ. කොහොමත් ඒ සිද්ධියෙන් පසු දිලූෂ තමාව මඟහරින බව හසිතට දැනුණි.

තවත් මේ ගැන කතා කරමින් වද වී තේරුමක් නැත. කෙත්මිව යළිත් තමා වෙතට ළං කර ගත්තද කෙදිනක හෝ මේ රඟපෑම නිමා කල යුතුම ය. අසිත පහුවදාම ආපසු යන්නට තීරණය කලේ ඒ නිසාය. දිලූෂත් මේ ගමනට එක් වූයේ ආවේත් ඔහු සමඟ නිසා මිස හිතවත්කමට නම් නොවේ.

කෙත්මිගේ නිවසින් පිටව යන මොහොතේ කෙත්මි නිවසේ උන්නේ නැත. ඇය උදේම හංසි සමඟ පන්සලට ගියේ තමාව මඟහරින්නට බව

අසිත දනී. ඒ නිසාම ඔහු ඒ ගැන අසන්නට ගියේ නැත. මේ කිසිම දෙයක් නොදැන උන් කෙත්මිගේ ගෙදර අය නම් ඔවුන් දෙදෙනා මෙතරම් ඉක්මනින් ආපසු යාම ගැන දුක් වූහ.

***“අපරාදේ මං හිතුවේ පුතාලා සතියක් දෙකක් ඉදීවි කියලා...”***

කෙත්මිගේ තාත්තා කීවේ පිටත්වන මොහොතේ ය.

***“මං හිතුවේ නෑ උඹ අපට මෙහෙම කරයි කියලා....”***

දිලූෂ කීවේ දුම්රියේ තමාට ඉදිරියෙන් ඇති අසුනට බර වී කල්පනාවක ගිලී සිටි අසිත දෙස බලාය. මිතුරා තමාට මෙසේ කිරීම ගැන දිලූෂට තිබුණේ වේදනාවකි.

දිලූෂ කතා කරන්නේ වේදනාවෙන් බව අසිත දනී. ඔහුගේ වේදනාව සාධාරණය. තමා රැවටුවේ ඔහුව ය. ඔහුගේ සහෝදරියව ය.

***“මං දන්නවා සමාව ඉල්ලන්න මං සුදුසු නෑ. ඒත් මට සමාවෙයන් බං... මං සමාධිට වගේම කෙත්මිටත්***

sinhalaebooks.com

*ආදරෙයි දිලූෂයා. මං දැනන් හිටියා දෙන්නගෙන් එක් කෙනෙක් මට අත අරින්න වෙන බව. ඒත් මෙච්චර කාලෙකට මට ඒක කරන්න හිත දුන්නේ නෑ...”*

*“එක්කෙනෙක් අත අරින්න වෙන බව දැන දැන දෙන්නටම ආදරේ කරපු එකයි වරද... කෙත්මි මේ ගැන දැනගත්ත නිසා මේ විදිහට එයා දුක් වෙනවා. වැරදිලාවත් කෙත්මි මේවා නොදැන සමාධි දැනගත්තා නම්... ඒත් කෙල්ලෙක්නේ බං. මං හිතුවේ නෑ උඹ මෙහෙම වෙයි කියලා..”*

අසිත නිහඬ වූයේ කියන්නට දෙයක් නැති තැනය. තමා කළේ ආපසු හරවන්න බැරි තරම් ලොකු වරදකි. එය තේරුම් යද්දී වරදින් මිදෙන්නට බැරිතරම් දුරක් ගොසින් අවසන් ය. කෙත්මි තමාට ආදරය කරන්නට පටන් ගත්තේ පුංචි කාලයේදී ම බව අසිත දනී. අසිතගේ සිතේත් කෙත්මි උන්නේ ඒ කාලයේ සිටමය.

නමුත් ඒ කාලයේ ඒ ගැන කතා කිරීමට තරම් වයසක් දෙදෙනාටම සපිරී තිබුණේ නැත. දෙදෙනාම පුංචි ළමුන් ය. කියා ගැනීමට පුළුවන් වයසට එද්දී කෙත්මි උන්නේ බොහෝ දුරකට ගොසිනි. අසිත ඉන්දියාවට ගියේ යළි පැමිණි පසු කෙත්මි සමඟ ඒ ගැන කතා කරන්න සිතාගෙනය.

sinhalaebooks.com

*"ඒ කෙල්ලගේ හිතේ පුංචි කාලේ තිබුණ දේවල් තවත් තියෙයි කියලා විශ්වාසද උඹට ? අනික මචං ඒ කාලේ උඹලා දෙන්නම හිටියේ ආදරේ කියන්නේ මොකක්ද කියලවත් තේරුම් ගන්න පුළුවන් වයසකද ? මං නම් කියන්නේ ඒ කෙල්ලට කොල්ලෙක් ඇති දැන්... උඹත් තව ඕය ගැන හිතන්න යන්න එපා... බැරි වෙලාවත් උඹ යද්දී කෙල්ලට කොල්ලෙක් හිටියොතින් කෙල්ලත් අසරණ වෙනවා..."*

ඉන්දියාවට ගිය අලුත ආ ගිය තොරතුරු කතා කරමින් ඉද්දී මිතුරෙකු කී කතාව අසිතට තවමත් මතකය. ඒ කතාව දිගේ බොහෝ දුරට සිතද්දී ඔහු කියන දේ වරදක් නැති බව අසිත තේරුම් ගත්තේය. හිත්වල තිබුණු දේවල් ඒ කාලයේ කතා කරගන්නට බැරි වුණි. කෙත්මිට ඒ දේවල් අමතක වී ගොස් ඇතැයි අසිතට එදා සිතුණි.

හිත තුළ මෙවැනි විපර්යාසයක් සිදුවද්දී විශ්වවිද්‍යාලයේ උදේ හවා දකින අහිංසක රුවැත්තිය වෙත අසිතගේ සිත ඇදී ගියේ නොදැනීම ය. චකිතයකින් තොරව ඇය හා ආදරයෙන් බැඳුණේ කෙත්මිට තමාව අමතකම වී ඇතැයි සිතාගෙනය.

එහෙත් කෙත්මි එදා වගේම තවමත් තමාට ආදරය කරන බව අසිත දැන ගත්තේ සමාධි හමුවී වසර

sinhalaebooks.com

දෙකක් ගෙවී ගිය පසු ය. එය දැනගනිද්දී අසිතගේ සිත මහා වරදකාරී හැඟීමකින් පිරී ගියේ ය. ඇය මේ තරම් කාලයක් තමා වෙනුවෙන් බලා හිදිද්දී තමා ඇයව අමතක කළ බව කියන්න ද ?

අසිත දෙවරක් නොසිතාම කෙත්මිට ආදරය ප්‍රකාශ කලේය. එනමුත් වසර දෙකක් තිස්සේ ආශ්‍රය කළ පුංචි අහිංසකාවියගෙන් සමු ගන්නට අසිතගේ සිත ඉඩ නොදුන්නේ ය. අද වැනි දවසක් උදාවන බව මුල සිටම දැන උන්න ද ඒ ගැන දිගින් දිගටම සිතන්නට අසිත බිය වූවේ ය.

*******************

අසිතලා ගියපසු කෙත්මි බොහෝ වෙලාවක් බැල්කනියට වී කල්පනා කරමින් උන්නාය. ඈත තියා ඒ දෙස බලා උන්නද හංසි ඇයට බාධා කරන්න නොගියාය. මේ මොහොතේ කෙත්මි ඉන්නේ ලොකු වේදනාවකින් බව ඇය දනී. ඇය තවමත් ඒ දුක පිට නොකර සිතේ සඟවාගෙන හිදියි.

***"හංසි... මේ ගැන අම්මලා දැනගන්න ඕන නෑ. අසිත සමාධි එක්ක යාළු බව අපි මුල ඉදලම දන්න විදිහට ඉන්න...."***

sinhalaebooks.com

*“ඒත් කෙත්මි... කටින් නොකිව්වට එයාලා දැනන් හිටියා...”*

*“ඒක නිකම්ම සිතුවිල්ලක් කියලා පෙන්නමු හංසි. මෙතන ප්‍රශ්න ඇති වෙන්න නොදී ඒ දෙන්නාගේ වෙඩින් එක වෙන්න දෙමු....”*

කෙත්මි මේ ලෙසින් කීවේ අසිතලා යනවාත් එක්කම ය. අම්මලා මේ දේවල් දැනගතහොත් මේ පවුල්වල හිතවත්කම් ද නැති වී යනු ඇත. මේ ගැන දිලූෂටත් කතා කර කියන්න කීවේ ඒ නිසා බව හංසි තේරුම් ගත්තාය.

*“හලෝ මැඩම්... කොල්ලා ගිය නිසා දුක ද ?”*

රනුක් එසේ අසාගෙන කෙත්මි ළඟ වාඩි වූයේ බොහෝ වෙලාවක් ඇය දෙස බලාගෙන සිටය. එහෙත් හංසි පවා ඔහුව දැකකේ කෙත්මි අසල වාඩි වන විටය.

*“කාගේ කොල්ලද ?”*

*“කාගේ කොල්ලද! උඹේ කොල්ලා ගැන අහන්නේ බං සුදූ....”*

sinhalaebooks.com

*"මට කොහෙන්ද බං කොල්ලෝ...."*

කෙත්මි කීවේ කට කොනකට සිනහවක් නංවාගනිමින් ය.

*"ඇයි අර අසිතයා... ?"*

*"එයා කොහොමද මල්ලී මගේ කොල්ලා වෙන්නේ? එයාට ගර්ල් කෙනෙක් ඉන්නවා. ළඟදිම මැරි කරයි..."*

කෙත්මි කියා දැම්මේ වෙනසක් නොදැනෙන අයුරින් නමුත් රනුක් ඇය දෙස මොහොතක් පුදුමයෙන් බලා උන්නේ ය.

*"මොකක් ? තමුසේ මට විහිළු කරනවද සුදූ ?"*

*"මං මොකටද විහිළු කරන්නේ ? හංසි උඹවත් කියපං මෙයාට... මං යනවා වොෂ් එකක් දා ගන්න..."*

කෙත්මි හෙමිහිට මල්ලිගේ අවධානය හංසි දෙසට හරවා කාමරයට ගියා ය. රනුක් ඇය යන දෙස බලාගෙනම හංසි අසලින් වාඩි වූවේ ඇය කී දේ සිතා ගන්නට බැරිව ය.

sinhalaebooks.com

***"ඈ බං හංසියෝ... මේකි මේ මොනවද කියන්නේ?"***

***"ඒකි කියන්නේ ඇත්ත බං..."***

***"ඒත් එහෙම වුණේ කොහොමද? හැමෝම හිතාගෙන හිටියේ මේ දෙන්නා අතරේ...."***

***"අපි හිතන හැමදේම ඇත්ත වෙන්නේ නෑ බං... මටත් මුලදී ඔය විදිහට හිතුණා. ඒත් ඉතිං කෙත්මි ඒ කෙල්ල ගැන සේරම දන්නවා. මටත් කිව්වා..."***

***"අනේ මන්දා... මට නම් මේක නිකම් අමුතුයි වගේ. අපේ ටොමියාවත් මෙහෙම එකක් කිව්වේ නෑ නේ...."***

රනුක්ට ඇත්තටම මේ කතාව අදහන්නට බැරිය. මුවින් නොකිව්වාට දෙදෙනා අතර සම්බන්ධයක් තිබූ බව හැමෝම සිතා උන්නෝ ය. අක්කාත් අසිතත් හැසිරුණේත් ඒ අයුරින්ම ය. කොටින්ම හංසි හා දිලූෂ නිතරම ඔවුන් දෙදෙනාට විහිළු කරන අයුරු ද රනුක් දුටුවේ ය.

sinhalaebooks.com

දැන් අක්කා කියන්නේ ඔහුට පෙම්වතියක් සිටින බවය. ඔවුන් විවාහ වීමට සූදානමින් සිටින බවය. ඒත් මේ ගැන මේ වෙන තෙක් කාටවත්ම නොකීවේ ඇයි ? අසිතලාගේ හදිසි පිටව යාමටත් මේ කතාවේ සම්බන්ධයක් ඇතැයි රනුක්ට නිකමට මෙන් සිතුණි.

*"මොනවද බං ඕකේ ඔච්චර කල්පනා කරන්න තියෙන්නේ ? අපි එහෙම හිතං හිටියට උන් දෙන්නා හිතලා නැත්තං ඉතිං මොනවා කරන්නද?"*

හංසි කීවේ රනුක් බර කල්පනාවකට වැටුණු නිසාමය. ඔහුට මේ කතාවේ සැකයක් දැනී ඇති බව හංසි දනී.

*"මෙතන මොකක් හරි වැරැද්දක් වෙලා තියනවා... හංසි අක්කේ, ඔයාලා මට මොනවා හරි හංගනවා..."* රනුක් කෙලින්ම චෝදනා කළේ ය.

ඒ චෝදනාවට නම් හංසි මදක් තිගැස්සුණාය. විහිළු කළාට... රණ්ඩු වුනාට රනුක් තමාටත් කෙත්මිටත් වෙනසක් නැතුව ආදරේ බව හංසි දනී.

සහෝදරයෙකුටත් වඩා ඔහු හොඳ මිතුරෙකි. රනුක් ළඟදීම මේ දේවල් දැනගනු ඇත. නමුත් දැන්ම මේ ගැන කියන්නට බැරිය.

sinhalaebooks.com

*"තමුසෙට අපි මොනවා හංගන්නද හලෝ... විකාර නැතුව ඉන්නවා..."*

*"හරි හරි... මං ම හොයා ගන්නම්... මට අවුලක් දැනෙන නිසා කියන්නේ... අර අපේ එකී ගැන පොඩ්ඩක් ඇහැ ගහන් ඉන්නවා..."*

රනුක් කෙත්මි ගිය දෙසට අත දිගු කරමින් කියා පහළට ගියේ හංසි ගොළු වී බලා සිටින අතරේ ය.

අද හෙටම මේ ගැන කතාවක් ඇදෙනු ඇත. අද කතා කරද්දී දිලූෂ කීවේ හවස අසිතලාගේ ගෙදර අය සමාධිලාගේ නිවසට යාමට සූදානම්වන බවය. එහිදී විවාහයට දින යොදාගනු ඇත. මෙහි එන්නටත් පෙරම සමාධි ගැන අසිත ගෙදරටත් කියා තිබීම හංසිට ද පුදුමයක් ගෙන ආවේය.

ඒ සියල්ල සූදානම් කර මෙහි පැමිණ කෙත්මිට කළේ මොනතරම් බොරුවක් ද ? එදා ඒ දුරකතන ඇමතුම ආවේ නැතිනම් කෙත්මි අදටත් මේ ගැන නොදන්නී ය.

11.

පසන් කෙත්මිව සොයාගෙන කෙත්මිලාගේ නිවසට ආවේ අසිතලා පිටවී ගොස් දින දෙකකට පසුව ය. ඒ මොහොතේ කෙත්මි උන්නේ කාමරයට වී කල්පනා කරමිනි. හංසිත් ඇය අසලටම වී පොතක් බලමින් උන්නාය.

***"සුදූ... සුදූ..."***

අම්මා කතා කරනු ඇසී කෙත්මි හංසි දෙස බැලුවාය. හංසිත් කෙත්මි දෙස බලා පොත වසා නැගිට්ටාය. කෙත්මිද ඒ අනුවම නැගිට කාමරයේ දොර ඇරියා ය.

***"ඇයි අම්මා.....?"***

***"මේ පසන් පුතා ඇවිල්ලා... පොඩ්ඩක් පහළට එන්නකෝ...."***

sinhalaebooks.com

අම්මා කියද්දී කෙත්මි පුදුමයෙන් පඩිපෙළ බැස පහළට ආවාය. පසන් මෙහි ආවේ ඇයි ? ඔහු සාමාන්‍යයෙන් නිතරම එන කෙනෙක් නොවේ..

*"වාඩිවෙන්න පසන් අයියේ...."*

පසන් තවමත් සිටගෙනම බලා සිටින නිසා කෙත්මි සිනහවක් පා කීවා ය.

***"වාඩිවෙන්න බෑ නංගි... ඉක්මනට යන්න ඕන. මං මේ නංගිට පණිවිඩයක් දෙන්න ආවේ.."***

***"ඒ මොකක්ද අයියේ ?"***

***"ලොකු හාමුදුරුවෝ තමයි මතක් කරන්න කිව්වේ...."***

පසන් ඉතිරි හරිය කියන්නට පෙරම කෙත්මිගේ අත නළලට ගියේ ය. දානයේ වැඩවලින් පසු පන්සලේ භක්ති ගීත පුහුණු කරන්නට එන බවට හාමුදුරුවන්ට එදා කීවා නොවේද ? මේ කතන්දර අස්සේ එය ඉබේටම අමතක වී ගිය හැටි...

***"අයියෝ... මට ඒක අමතකම වුණානේ අයියේ..."***

sinhalaebooks.com

*"ලොකු හාමුදුරුවෝ කිව්වා වැඩත් එක්ක අමතක වෙලා ඇති කියලා..."*

*"අනේ ඒකනේ..."*

*"නංගිට අද හවස පුළුවන් නම් මම ළමයි ටික ගෙන්නලා දෙන්නම්..."*

*"අනේ පුළුවන් නම් ලොකු දෙයක් අයියේ.. මං හතර වෙනකොට එන්නම්..."*

*"හරි නංගි.. එහෙනම් මං යන්නම්. යන්නම් නැන්දේ..."*

පසන් පිටත්ව ගිය පසුව කෙත්මි කාමරයට ආවේ හිසත් කසමිනි. ඒ වැඩේ අමතක කල එක ගැන ඇය තමාටම දොස් පවරා ගත්තාය. හංසි මොහොතක් සිනාබරව ඇය දෙස බලා උන්නාය.

*"දැන් හරි බං දවස් දෙකනේ බැරි වුණේ. අද යමන්...."*

sinhalaebooks.com

*"උඹත් එනවද බං ?"*

*"යං.. යං.. මටත් හවස වැඩක් නෑ. පන්සලට ගිහින් එනින් ගමනේ පුළුවන් නම් මාව ගෙදරින් ටිකක් දාපං.."*

*"අනේ මේ ටිකේම මෙහෙට කොටු වුණා නේද? මං එහෙනම් පන්සල් යන්න කලින් ඔයාව ගෙදරට දාන්නම්* හංසි*..."*

*"පිස්සු නැතුව යමං බං. මාත් පන්සලට එන්නම්... හාමුදුරුවෝ අපි දෙන්නටම නේ මේක බාර දුන්නේ.."*

*******************

අම්මලා අසිතගේ දෙමව්පියන් හමුවීමට ගොසින් පැමිණෙන තෙක් සමාධි බලා උන්නේ නොයිවසිල්ලෙනි. අයියා නම් කීවේ විවාහයට ළඟම දිනයක් යොදා ගත යුතුබවය. තමාගේ නිවසේ අය මෙන් ම අසිතලාගේ නිවසේ අයද කේන්දර නැකැත් ගැන වැඩි විස්වාසයක් නොතබන නිසා ඔවුන් කැමතිනම් ළඟම දිනයක් දමා ගනු ඇත.

sinhalaebooks.com

*"අන්න පැංචි නැන්දලා ඇවිත්..."*

ආශා කීවේ සමාධිගේ කාමරයට එබෙමිනි. සමාධි ඇදෙන් නැගිට සාලයට දිව්වේ ආශාගේ ඇඟේද හැපෙමිනි. ආශා තනිවම සිනාසෙමින් ඇය පසුපසින්ම ඉදිරියට ගියාය.

*"අයියා... මොකද වුණේ ?"*

*"ගෙට ගොඩවෙනකම් ඉදහන් බං..."*

අමනාපයෙන් මෙන් කී සංදේශ් තවත් කිසිවක් නොකියා කාමරයට ගියේ සමාධිගේ මූණ අඳුරු වී යද්දී ය. ඇය එහෙම්ම ම අම්මා දෙස බැලුවාය.

*"අම්මා... ඇයි අනේ ඒ ?"*

*"මේ කොල්ලට නම් පිස්සු ඇත්තමයි... ආශා පුතේ මට වතුර එකක් ගෙනත් දෙන්නකෝ..."*

අම්මා සාලයේ පුටුවකට බර වූවාය. සමාධිත් ඇය අසලටම වී බලා උන්නේ ඇය යමක් කියන තුරුය. එහෙත් සමාධිගේ හදිස්සිය අම්මාට නැත. ඇය කතා කලේ ආශා ගෙනැවිත් දුන් වතුර වීදුරුවත් බිව් පසුය.

sinhalaebooks.com

*“පැංචී...”*

*“අම්මා....”*

*“ඒ දරුවගේ අම්මලා කොහොමත් එදා ඇවිත් ගියේ ඔයාට කැමතියි කියලනේ ගියේ.. ඇයි ඉතිං බය වෙන්නේ...”*

*“ඒ වුණාට අම්මා.. ඔයාලා දවසක් දා ගත්තද? කියන්නකෝ....”*

ඒ මොහොතේ සංදේශ් කාමරයේ දොර රෙද්ද ඇත් කොට සාලයට එබී බැලුවේ ය.

*“ඔව්... ඔව්... දාගත්තා බං. ලැස්ති වෙයන් ලබන මාසේ විසි හතර වෙඩින් එක....”*

*“මොනවා.....”*

සමාධි ඉඳගෙන උන් තැනින් ද නැගිටගෙන කෑගසන්නට වූයේ සතුටින් ඉපිලෙමිනි.

නංගිගේ සතුට දෙස මොහොතක් බලා සිටි සංදේශ් නිහඬවම කාමරයට වැදුණේ හදවතේ සියුම්

තැනකින් නැගෙන වේදනාව අන් අයගෙන් වසන් කරන්නටය.

*මං මේ කරපු දේ හරිද ? මගේ නංගි අද මේ ආරංචිය අහලා කොයිතරම් සතුටු වුණාද... ඒත් මේ කතාව ඇහුවම රිතූට මොනවා හිතෙයි ද ? දෙයියනේ ඒ කෙල්ල කොයි තරම් දුක් වෙයිද... මං මේ මොනවද කළේ...*

*සමහර විට මේ වෙද්දිත් එයාට මේ දේවල් ආරංචි වෙලා ඇති... කොහොමත් අසිතගේ අම්මා කිව්වේ එයාට දෙවෙනි මනමාලිට ඉන්න කතා කරලා දෙන්නම් කියලා... පව්. ඒ කෙල්ල මේ දේවල් කොයි විදිහට දරාගනීද ?*

සංදේශ්ට මේ දේවල් වලට දෙන්න විසඳුමක් නෑ... රිතූගේ අහිංසක හීන සේරම බොඳ කරලා දාලා සමාධිට එයාගේ හීනේ අයිති කරලා දීපු එක ගැන සංදේශ්ගේ හිතට තමන් ගැනම දැනුනේ කලකිරීමක්.

වෙන කෙනෙක් වගේ නම් සංදේශ් මෙහෙම නොහිතන්න තිබුණා. ඒත් රිතූ එක්ක කතා කරපු විනාඩි කීපය ඇතුළත රිතූ කියන්නේ මොන වගේ ගැණු ළමයෙක් ද කියලා සංදේශ් හොඳින්ම තේරුම් ගෙන තිබුණා.

*"අයියා......"*

ආශා සංදේශ්ගේ කාමරයට ආවේ ඔහු මෙතරම් වෙලා කාමරයටම වී සිටි නිසාය.

*"ම්ම්ම්...."*

*"මොකද අනේ මේ කාමරේ අස්සටම වෙලා? පැංචිත් ඒත් නැන්දගෙන් ඇහුවා අයියට අසනීපයක්ද කියලා...."*

ආශා අනාරාධිතවම ඇඳේ සංදේශ් අසල වාඩිවෙමින් කීවාය. මුවින් නොබැන හිටියාට සංදේශ්ට මේ කෝලම් පේන්නට බැරිය.

*"එහෙම දෙයක් නෑ. මං මේ මහන්සියට ටිකක් හිටියේ...."*

*"මහන්සියි...! මහ ලොකු දුරක් ගියාද අනේ මහන්සි වෙන්න. යමු යමු කෑම කන්න..."*

*"මට දැන් කන්න බෑ වගේ ආශා.. ඔයාලා කන්න. මං පස්සේ කන්නම්..."*

sinhalaebooks.com

***"අනේ නිකම් ඉන්න ඔය ඔයාගේ කම්මැලිකම. ඉන්න මං ඔයාට කෑම බෙදන් එන්න…"***

***"ඕන නෑ…"***

***"හරි හරි… අතේ ගාගන්න ඕන නෑ මං කවන්නම්. ඔහොම ඉන්නකෝ…"*** කී ආශා සංදේශ් යමක් කියන්නට පෙරම කාමරයෙන් එළියට ගියාය.

තව ටිකකින් ආශා අනිවාර්යෙන්ම බත් පිඟානක් උස්සගෙන එන බව සංදේශ් දනී. ඥාති සහෝදරිය වුවද වෙලාවකට සංදේශ්ට ඇයගේ ක්‍රියා පිළිවෙත මහා වදයකි. ඒ නිසාම සංදේශ් ආශා එන්නට පළමු ව තුවායත් රැගෙන නාන කාමරයට රිංගා ගත්තේය.

sinhalaebooks.com

12.

හසන්ති දුරකතනය තබා සැමියා දෙස බැලුවේ කල්පනා බරව ය. ඇසූ දේ සිහිනයක් දැයි ඇයටම සැකය. ඇය සැමියා වාඩිවී සිටි තැනට ආවේද ඒ ගැන සිතමිනි. එය බොරුවක් වන්නට බැරිය. ඒත් එය එසේ නම් කෙත්මි ?

***"ඇයි හසා ? කවුද කෝල් කළේ ?"***

කෙත්මිලාගේ පියා ඇසුවේ සිය බිරිඳගේ පැහැදිලි වෙනසක් දුටු නිසාය.

***"කෝල් කළේ රමණී අක්කා...."***

***"ආහා... ඉතිං මොකද මේ බය වෙලා වගේ?"***

***"දන්නවද මොකටද කතා කළේ කියලා ?"***

sinhalaebooks.com

*"මං දන්නේ කොහොමද හසා ? ඔයානේ ෆෝන් එක ගත්තේ...."* ඔහු කීවේ සිනා සෙමිනි.

*"විහිළු නෙමෙයි... එයාලා අසිතගේ වෙඩින් එක කියන්න කතා කළේ...."*

එයට නම් ඔහුටත් පුදුම නොවී බැරිවිය. ඔහු දෙනෙත් අයාගෙන තම බිරිඳ දෙස බලා උන්නේ ඇය කියන්නේ සැබෑවක්මදැයි සිතමිණි.

*"මොනවා! අසිතගේ වෙඩින් එක ?"*

හසන්ති ඔව් කියන්නට හිස වැණුවාය. මේ කතාව දෙදෙනාටම අදහන්නට බැරිය.

*"එහෙම වෙන්නේ කොහොමද හසා.? එතකොට අපේ.. අපේ සුදූ එක්ක අසිතගේ සම්බන්ධයක් තිබුණේ නෑ කියලද ඔයා කියන්නේ?"*

*"ඒකම තමයි මටත් තියන ප්‍රශ්නේ...."*

*"දැන් ඔය කාවද අසිත බඳිනවා කියන්නේ ?"*

*"ඉන්දියාවේ ඉද්දි අදුරගත්ත ළමයෙක් කියන්නේ... අනේ මන්දා මේ මොනවා වෙනවද කියලා. මට නම් හොඳටම විශ්වාසයි අපේ සුදූ එක්ක අසිතගේ සම්බන්ධයක් තිබුණා..."*

හසන්ති කීවේ දැඩි විශ්වාසයෙනි. නොකිව්වාට කෙත්මිගේ තාත්තාටත් එවැනි විශ්වාසයක් තිබුණි. එහෙත් මේ දුරකතන ඇමතුම නිසා ඒ ගැන යළිත් සිතන්නට සිදු වී ඇත.

*"ඒ ඉතිං අපි හිතාගත්ත දේවල් නේ හසා.... සමහරවිට ඒ දෙන්නගේ එහෙම දෙයක් තියෙන්න නැතුව ඇති... දැන් කවද්ද වෙඩින් එක?"*

*"ලබන මාසේ විසි හතර කිව්වේ... ඇවිල්ලා ආරාධනා කරන්න තරම් වෙලා නැති නිසා ෆෝන් එකෙන්ම ආරාධනා කරනවා කිව්වේ..."*

*"ලබන විසි හතර කියන්නේ වැඩි කාලයක් නෑ නේ... අපි යන්න එපැයි කොහොමත්..."*

*"ඒක තමයි මාත් කල්පනා කළේ... රමණී අක්කා මගෙන් ඇහුවා අපේ සුදූව දෙවෙනි මනමාලිට එවන්න පුළුවන්ද කියලා..."*

*"ඉතිං ඔයා මොකද කිව්වේ ?"*

*"මං කිව්වා මේ දවස්වල විභාගක් කියලා හෝ ගාලා පාඩම් කරනවා කැමතිවෙයිද විශ්වාස නෑ කියලා...."*

*"ඔයා එහෙම කිව්ව එක හොඳයි... සුදූ මේ දේවල් දන්නවද දන්නෙත් නෑ නේ..."*

කෙත්මිගේ තාත්තා කීවේ බිරිඳගේ ක්‍රියාව අනුමත කරමිනි.

*"එයත් ඉතිං දැන් මේක දැනගන්වනෝ කොහොමත්..."*

*"ඔව්... කෝ දැන් ?"*

*"අන්න හංසි එක්ක පන්සලට ගියා. ලොකු හාමුදුරුවෝ වැඩක් භාර දීලා නේ...."*

*"ඔව් ඔව්... දවසක් මටත් කිව්වා. ඒකත් හොඳයි. අද රෑට අපි මේ අසිතගේ ප්‍රශ්නෙත් කතා කරලා බලමු."*

sinhalaebooks.com

*"සුදූ මේ දේවල් දන්නව නම් ඉතිං එතන ප්‍රශ්නයක් නෑ. එයා දන්නේ නැත්තම් තමයි ප්‍රශ්නේ වෙන්නේ..."* කී හසන්ති ඔහු අසලින් නැගිට කුස්සිය දෙසට ගියාය.

*******************

අඳුර වැටීගෙන එන නිසා පුහුණුවීම් අවසන් කල කෙත්මි දරුවන් පිටත් කර එළියට ආවේ හංසිව සොයන්නටය. මදක් වටපිට බලද්දී පසන්ලා වෙසක් කූඩු හදන තැන ඇය සිටිනු දුටු කෙත්මි ද ඔවුන් වෙත ගියාය.

*"ආ... සුදූ නංගී. දැක්ක කල්...."*

*"එහෙම තමයි... අපි හරි බිසී අනේ...."* හංසි කටත් අමුතු කර කීවේ පිරිස සිනා ගන්වමිනි.

*"කවුද උඹෙන් ඇහුවේ?"*

*"ආ... කවුද ඉතිං උඹට කිව්වේ?"* හංසිත් අත්නොහැර ම කීවාය.

sinhalaebooks.com

*“මේකි යකෝ.....”*

*“ඇයි.... ඇයි.... ඇයි....”*

දෙදෙනාගේ වාදය නිමාවක් නොවන බව දුටු පසන් මොහොතකට කරමින් සිටි වැඩය නවතා කතා කළේය.

*“හා.. හා.. ඇති බං දැන්. මේක පන්සල.. චාමිකයෝ.. උඹත් නිකම් පොඩි එකෙක් වගේ නේ...”*

*“ඒක තමයි... චාමික අයියා දන්නේ නැතුවද මෙයාගේ හැටි...”*

කෙත්මි කියන විට හංසි ඇයගේ අත කෙනිත්තුවේ සියල්ලන්ටම පෙනෙන්නටය.

*“ආව්... මෙන්න මෙහෙ වරෙන් යන්න ගෙදර යන්නත් ඕන නේද?”*

*“හා... යං.. යං... ඒක අමතකත් වුණා...”*

*“ඔව් ඉතිං ඒවා මතක තියෙයි... ආාාාා.....”*

sinhalaebooks.com

පසන් කතාව අතරමැද මහ හඬින් කෑගැසුවෙන් යන්නට ගිය කෙත්මි යළිත් හැරී බැලුවාය. පසන් බිමට නැමී සිටි අතර මිතුරන් ඔහුව වටකරගෙන සිටියෝය. හංසිත් හිසේ අත ගසා ගන්නවා දුටු කෙත්මි ඉක්මනින් එතැනට ගියාය.

*"ඇයි මේ? කෝ හංසි එහාට වෙන්න බලන්න..."*

කෙත්මි සිදු වී ඇති දෙය දුටුවේ ඒ මොහොතේය. කතා කරන අතරේ ඔහු අසල කෙටි බැම්ම මතට බර වී ඇත. වෙසක් කූඩුවල අලවන වීදුරු කැබලි තබා තිබුණේ ඒ මතය. පසන් වේදනාවෙන් අත පසෙකට කරගෙන උන්නේ මිතුරන්ට තුවාලය බලන්නට ඉඩ නොදෙමිනි.

සිද්දිය තේරුම් ගත් කෙත්මි වහා මිතුරන් පසෙකට කර ඔහු අසලට ළං වූවාය. ඇය ඔහුගේ අත අල්ලා ගනිද්දී ඔහු අත පසෙකට කර ගත්තේය. කෙත්මි ඔහු දෙස රවා බලා යළිත් ඔහුගේ අතගෙන අතේ ඇලී තිබූ වීදුරු කටු ගලවන්නට වූවාය.

*"මොනවා කරනවද මන්දා... පොඩ්ඩක් සිහි කල්පනාවෙන් වැඩ කරන්න බැරිද?"*

*"හරි ඉතිං... මේක ඒ තරම් ලොකු දෙයක් නෙමෙයිනේ...."*

sinhalaebooks.com

*"නෑ... නෑ... ලොකු නෑ..."* කියමින් කෙත්මි අත මදක් උඩට එසවූවාය.

*"මේ බලනවා කොච්චර ලේ එනවද කියලා?"*

*"නංගි මේ... මේකාව ඉස්පිරිතාලෙටවත් ගෙනියන්න වෙයි. කැපුණ එක කැපිලා තියනවා කට උත්තර නැති වෙන්නම...."*

*"ඒක තමයි චාමික අයියේ..."*

වීදුරු කටු ගලවා අත තිබූ ලේන්සුවෙන් තුවාලය එතූ කෙත්මි පසන්ව නැගිට්ටවා ගත්තාය.

*"මේකට ගෙදර ගිහින් බෙහෙත් ටිකක් දැම්මාම හරියයි සුදු නංගි..."*

*"අනේ මේ... කට වහගෙන ඉන්නවද... එනවා මෙතන දොස්තර වෙන්න.. චාමික අයියේ ආ කී එක වාහනේ ගන්නකෝ..."*

sinhalaebooks.com

කෙත්මි පසන්ගේ මිතුරන් හා එක්ව ඔහුව රෝහලට රැගෙන ගියේ වදෙන් පොරෙනි. අවසානයේ වෛද්‍යවරයා ඔහුව පරික්ෂාකර බලා තුවාල වලට බෙහෙත් දමන තුරුත් සිටි කෙත්මි නිවසට ආවේ හංසිවත් ගෙදරට ඇරලවාය.

ඇය එන විට ගෙදර සියල්ලෝම ආලින්දයේ අසුන්ගෙන බලා උන්නේ ඇය එන තුරුය.කෙත්මි වාහනයෙන් බැස්සේ සිනහවක් නගාගෙනය.

*"මොකද මේ අද කට්ටියම එළියට වෙලා ?"*

*"සුදු අක්කා... මොකද වුණේ?"*

රනුක් ඇය වෙතට ආවේ කලබලයෙනි. අම්මලාත් කලබල වනු දුටු කෙත්මි පුදුම වූවා ය.

*"ඇයි ?"*

*"ඇයි මේ ඇඳුම්වල ලේ ? ඔයා ආයෙත් වැටුණද?"*

කෙත්මිට ඇද උන් ගවුම දෙස බැලුණේ එවිටය. ගවුම් සාය පුරා විසිරී තිබුණේ පසන්ගේ තුවාලයෙන් ගැලූ ලේ ය.

sinhalaebooks.com

*"ආ... බය වෙන්න එපා මට මොකුත් වුණේ නෑ...."*

*"එහෙනම් මේ ලේ? මොකද වුණේ.... කෝ හංසි?"* හසන්ති ඇසුවේ කලබලයෙනි.

*"මං හංසිව ගෙදරින් බස්සලා ආවේ බය නොවී ඉන්නකෝ අපි දෙන්නටම මොකුත් වුණේ නෑ...."*

*"එහෙනම්?"*

*"අද පන්සලේදී පසන් අයියගේ අත තුවාල වෙලා වීදුරු කටුවලට කැපිලා... පස්සේ මං තමයි වීදුරු ටික අරන් දැම්මේ. ඒ වෙලාවේ ලේ ගෑවෙන්න ඇති..."*

අම්මාත් තාත්තාත් මුහුණෙන් මුහුණ බලා ගනිද්දී රනුක් පසෙකට හැරී සිනාසෙනු දුටු කෙත්මි ඔහු දෙස රවා බැලුවාය.

*"පසන්ට මොකද දැන්?"*

sinhalaebooks.com

***"තුවාල වලට මැහුම් එහෙම දාලා එයාව නතර කර ගත්තා තාත්තා... යාළුවෝ හිටපු නිසා මං*** හංසිව***ත් ගෙදරින් දාලා ආවා..."***

***"හ්ම්... දැන් එහෙනම් ගිහින් වොෂ් එකක් එහෙම දාගෙන එන්නකෝ... අද*** හංසි ***එන්නේ නැද්ද?"***

***"නැති වෙයි අම්මා..."***

කෙත්මි ගෙතුලට ආවේ තවත් වරක් රනුක් දෙස රවා බලමිනි. අද සිදුවීම ගැන ඔහු අනිවාරෙන්ම අලුත් කතාවක් හදන බව කෙත්මි අත්දැකීමෙන් දනී.

කාමරයට ආ කෙත්මිට පාළුවක් දැනුනේ පහුගිය දින කීපයේම හංසි තනියට සිටි නිසාය. ***ඒකිත් ගෙදර ගැන බලන්න ඕන නේ...*** තනිවම කියාගත් කෙත්මි නාන කාමරයට වැදුණාය.

sinhalaebooks.com

## 13.

*“මං දන්නවා අම්මා... මට අසිත අයියා ඔය ගැන කියලා තිබ්බේ...”*

අසිතගේ විවාහය ගැන රෑ කෑම මේසයේ කතා කරද්දී කෙත්මි කීවේ අම්මා තාත්තා පමණක් නොව මල්ලී රනුක් ද පුදුමයෙන් ඇය දෙසට හැරෙද්දීය. කෙත්මි වෙනසක් නොපෙන්නා කතා කළා ය.

*“ඇ... ඇයි ඔහොම බලන්නේ ?”*

*“නෑ... මොකුත් නෑ සුදූ. අපි හිතුවේ නෑ ඔයා මේ ගැන දන්නවා කියලා....”*

හසන්ති කීවේ වෙනසක් නොදැනෙන්නටය. කෙසේ කීවත් අම්මලාගේ හිතේ තමාගෙත් අසිතගෙත් සම්බන්ධයක් ඇතැයි සිතා සිටි බව කෙත්මි දනී...
*මොනවා කරන්නද අම්මා... මටත් මේක හීනයක් වගේ. ඒත් එදා මං මේ දේවල් කියන්න ගියානම් ලොකු*

sinhalaebooks.com

*ප්‍රශ්නයක් වෙන්න තිබ්බා. ඊට වඩා මේ විදිහ හොඳයි..* කෙත්මි තනිවම සිතුවාය.

*"සුදූ දන්නවද ඒ ගැණු ළමයව ?"*

*"ඔව් තාත්තා. අසිත අයියා මට ඒ අක්කගේ ෆොටෝස් පෙන්නුවා දවසක්..."*

*"ම්ම්ම්... ඔයා අපිට කිව්වේවත් නෑ."*

*"ආයේ ඉතිං කොල්ලෙක් කෙල්ලෙක් යාළුවෙන එක එහෙම කියන්න දෙයක්ද තාත්තා."*

කෙත්මි කීවේ මදක් අමනාපයෙනි. ඇත්තටම මේ කෙරෙන කතාව හිතට මහා වදයකි. නමුත් වෙනසක් පෙන්නන්නටත් බැරිය.

මෙතෙක් කෙරුණු කතාව දෙස රනුක් නිහඬවම බලා උන්නේය. අක්කා මොනවා කිව්වත් මෙය විශ්වාස කරන්නට බැරිය. දානයට ආ වෙලාවේ පවා අක්කා අසිත සමඟ ආදරයෙන් කතාබහ කරමින් සිටි අයුරු රනුක් දැක්කේය.

අක්කා මේ වගේ කතාවක් අසිතලා ගිය දවසෙත් කිව්වා රනුක්ට මතකය. එදත් අමුත්තක් දැනුණි.

අක්කා මොනවා කිව්වත් මෙතන වෙනස්ම කතාවක් තිබෙන බව නම් රනුක්ට විශ්වාසය.

*"සුදූ... රමණී ඇන්ටි අම්මට කියලා ඔයාව දෙවෙනි මනමාලිට එවන්න කියලා..."*

අම්මා දැන්ම කියන්න එපා කිව්ව ද රනුක් එය  කීවේ අක්කාගේ ප්‍රතිචාරය බලාගන්නට ය. ඔහු සිතූ ලෙසම එය ඇහෙනවාත් එක්කම කෙත්මි තිගැස්සී අම්මා දෙස බැලුවා ය.

*"ඇත්තද අම්මා?"*

*"ඔව්... ඔය අද කතා කරපු වෙලාවේ කිව්වේ"*

*"අම්මා මොකද කිව්වේ ? හා කිව්ව ද?"*

කෙත්මි ඇසුවේ කලබලයෙනි. නැත. කීයටවත් ඒ දේට නම් හිත හදාගන්නට කෙත්මිට බැරිය. බැරි වෙලාවත් අම්මා කැමති වෙලා නම්....

*"ඔයාගෙන් අහන්නේ නැතුව හා කියන්න බැනේ සුදූ.. මං කිව්වා ඔයා මේ ටිකේ වැඩ.. අහලා බලන්නම් කියලා..."*

sinhalaebooks.com

*"ඒක හොඳයි. ආයෙත් ඇහුවොත් මං බෑ කිව්වා කියන්න අම්මා..."*

කී කෙත්මි තවත් මෙතැන ඉන්නට බැරි බවක් දැනුනෙන් කෑම මේසයෙන් නැඟිට්ටාය.

*"කෑවේ නෑනේ දරුවෝ...."*

*"ඇති අම්මා..."*

*"සුදූ...."*

*"හරි හරි අම්මා.. අද කොහොමත් අක්කා කන දවසක් නෙමෙයි. පසන් අයියව හම්බුණානේ.. අනික පොර අද අසනීපෙන්නේ..."*

රනුක් කීවේ වෙනදා මෙන් කෙත්මිව විහිළුවට ගන්නට සිතා නොවේ. ඇයට මේ කතාබහ අපහසුවක් බව දැනුන නිසාය. මෙසේ නොකීවා නම් අම්මලා සිතන්නේ වෙන දෙයකි.

කෙත්මි පඩිපෙළ නගින්නට වූවේද එසේ කියා හෝ තමාව එතනින් ගලවා ගත්තාට රනුක්ට යටි සිතින් ස්තූති කරමිනි.

*"සුදූ... හෙට හංසිටත් එන්න කියලා ලෑස්ති වෙන්න. වෙඩින් එකට නොයා හරි නෑ නේ.. ඒ නිසා ඇඳුම් ටිකක් ගමු..."* තාත්තා කියද්දී කෙත්මි නිහඬව හිස වැනුවාය.

*"හසා... බලන් යද්දී අපි හිතපු දේ නෙවෙයිනේ වෙලා තියෙන්නේ..."* කෙත්මිට යන්න හැර තාත්තා කීවේය.

*"හ්ම්... මාත් හිතුවේ ඒක තමයි. මේ කෙල්ල ගානක්වත් නැතුව කිව්වනේ ඕක මං දන්නවා කියලා."*

*"එක අතකින් ඒකත් හොදයි හසා... අපි  හිතපු දේ වුණා නම් අද මෙතන මොන වගේ තත්වයක් ඇති වෙන්න තිබ්බද?  දැන් ප්‍රශ්නයක් නෑ නේ. පුතාටත් හෙට නිවාඩු එකේ උදේම ගිහින් ඇඳුම් ටිකක් එහෙම අරන් එමු. කොහොමත් නොයා බෑනේ..."*

sinhalaebooks.com

*"ඔව් ඔව්... හංසිවත් ගෙන්න ගන්න ඕන. රමණී අක්කා මගින් මගට කිව්වා ඒ කෙල්ලටත් අනිවාරෙන් එන්න කියන්න කියලා... කොහොමත් දෙන්නා එක විදිහට අඳින්න කැමති එකේ එක විදිහේ ඇඳුම් දෙකක් ගමු..."*

*"ඔව් එහෙම කරන්න. අර සැකේ හිතෙන් අයින් වුණ එක මට නම් ලොකු සැනසීමක්. නැත්තන් අපේ දරුවා දුක් වෙනවා බලන් කොහොමද යන්නේ..."*

*"ඒක නම් ඇත්ත... මෙහෙම වෙච්ච එක හොඳයි...."*

රනුක් මෙතෙක් මේ කතාව අසා උන්නේ අමනාපයෙනි. ඒ නිසා ඉක්මනින්ම කෑම නිමකල ඔහුත් කෑම මේසයෙන් නැගිට්ටේය. ඔහු කාමරයට ආවේ අම්මලා සමඟත් කේන්තියෙනි.

*"මෙයාලට මෙතන ප්‍රශ්නයක් තියනවා කියලා තේරෙන්නේ නැද්ද ඇත්තටම. හරි. සුදූ ඔය ගැන කලින් ඉඳලා දන්නවා කියමු... ඒකෙන් කියන්නේ ඒ දෙන්නා ආදරේ කළේ නෑ කියන එකද?'*

*'හරි එහෙම කියමු. එහෙනම් ඇයි වෙනදා වෙඩින් එකක් කිව්වම උඩ පනින කෙනා එයාට ඔච්චර ළඟින් හිටපු අසිත අයියාගේ වෙඩින් එක ගැන කතා නොකර*

sinhalaebooks.com

*නැගිටලා ගියේ ? අඩු තරමේ වෙඩින් එක කවදද කියලවත් ඇහුවේ නෑ…'*

*'ඔක්කොටම එහා කාගේ හරි අඳුරන්නේ නැති කෙනෙක්ගේ උනත් වෙඩිමක දෙවෙනි මනමාලිට කතා කරාම උඩ පැනගෙන යන කෙනා… ඇයි මේක ගැන කියද්දී බය වුණේ ?*

*ෂික්… හංසියාවත් හිටිය නම් වෙන්නේ මොකක්ද කියලා දැන ගන්න තිබ්බා. නෑ… වැඩක් නෑ.. මං එදත් ඇහුවට මෙයාලා කිව්වේ නෑ නේ…'*

********************

සංදේශ් කෙත්මිට කතා කරන්නට සිතුවේ මහා වරදකාරී හැඟුමක් සිත වෙලා ගනිද්දීය. නංගි වෙනුවෙන් කරන්නට බැරි දෙයක් ඔහුට නැත. එනමුත් නංගිගේ සතුට වෙනුවෙන් කළ දෙයින් නංගි වැනිම ඇයටත් වඩා ලාබාල යුවතියක් අද දුකින් පසු වන බව සිතද්දී ඔහුට හිත හදා ගන්නට බැරිය.

sinhalaebooks.com

එදා මේ දේවල් ඇයට කියද්දී ඇය මේ ගැන සිතා බලාවි යැයි සිතුවද මේ තරම් ඉක්මනින් ඇය මේ වැනි තීරණයක් ගනී යැයි ඔහු සිතුවේ නැත.

*"උඹට හංගන්න දෙයක් නැනේ මචං කෙත්මි අපේ නංගි. මං දන්නේ නෑ කෙල්ල කොහොම මේක දරා ගත්තද කියලා... ඒත් ඒකි අසිතව අත ඇරලා දැම්මා උඹගේ නංගි වෙනුවෙන්.*

*උඹ එදා කියලා තිබ්බා උඹේ නංගිව මේ වගේ එකෙකුට දෙන්නේ මුන් දෙන්නව වෙන් කරන්නම බැරි නිසා කියලා.. මේ වෙච්ච දේ නිසා මගේ නංගි බේරුණා බං එක අතකින්... උඹ කොහොමත් මූ ගැන අවධානෙන් ඉදපං.*

*සමාධි මේවා දන්නෙත් නෑ නේ... කොහොමත් කෙත්මි ආයේ මේ කතාව මැදට එන්නේ නෑ.. ඒක මට ඉර හඳ වගේ විශ්වාසයි...."*

අසිතලාගේ නිවසට ගිය මොහොතේ දිලූෂ තමාට රහසින් කී කතාව සංදේශ්ට තවමත් ඇසෙන්නා වගේය. ඒ කතාවෙන් පසු සංදේශ් යළි යළිත් ඇය ගැන සිතුවේය.

*"හෙලෝ...."*

කෙත්මි නාඳුනන අංකයෙන් පැමිණි ඇමතුමට සම්බන්ධ වූවේ මදක් දුරකතන තිරය දෙස බලා සිට ය.

*"රිතූ නංගි... මාව මතකද දන්නේ නෑ...."*

කෙත්මි මදක් කල්පනා කළාය. නැත. වරදින්නට ඉඩක් නැත. මේ ජීවිතේ ඇසූ වේදනාත්මකම කතාව ඇසුණේ මේ හඬිනි. ඒ ගැන අහන්නට දෙයක් නැත... ඒත් ඇයි මේ ආයේ මට කෝල් කරන්නේ....?

*"ඔව්... මතකයි. මේ සමාධි අක්කාගේ අයියා නේද?"* කෙත්මි කියද්දී සංදේශ්ගේ මුවඟ සිනහවක් නැඟුණි.

*"නංගිට හොඳ මතකයක් තියනවනේ..."*

*"අයියා මට කතා කළේ එක පාරයි තමයි. ඒත් එදා අයියා කියපු කතාව මට මේ ජීවිත කාලෙටම අමතක කරන්න පුළුවන් කතාවක් නෙමෙයි..."*

*"මං දන්නවා නංගි. මට ඇත්තටම සමාවෙන්න. මට එදා ඒ දේ ඇරෙන්න කරන්න දෙයක් හිතා ගන්න බැරි වුණා නංගි...."*

*"මට තේරෙනවා අයියේ... තමන්ගේ නංගිට අසාධාරණයක් වෙනවට මොන අයියද කැමති... දැන්*

*සේරම හරි නේද අයියේ..? අපිට ආරංචි වුණා වෙඩින් එකට දින දා ගත්තා කියලා....”*

කෙත්මි කීවේ දෙනෙතට උනන කඳුළු නිදහසේ කම්මුල් දිගේ ගලා යන්නට ඉඩ දෙමිනි.

කෙත්මි කතා කරන්නේ හිත යට මහා දුකක් සඟවාගෙන බව සංදේශ් දනී. ඔහුට සුසුමක් හෙළුනේ ඉබේටමය.

*“අයියේ?”*

*“මට ඇත්තටම සමාවෙන්න නංගී... සමාධිගේ වෙඩින් එකට දින දා ගත්තේ ඔයාගේ කඳුළු උඩින් කියලා මතක් වෙද්දී මට කිසිම සතුටක් සැනසීමක් නෑ නංගී....”*

සංදේශ්ගේ කතාවට කෙත්මිට දුක සිතුණි. ඔහු හොඳ අයියා කෙනෙකි.

*“දැන් ඒ දේවල් හිතලා දුක් වෙන්න එපා අයියේ... අයියලා වෙඩින් එකට ලෑස්ති වෙන්න. මේවා වෙන්න තිබුණ දේවල් වෙන්න ඇති..”*

***"නෑ රිතූ. එහෙම කියලා මට හිත හදා ගන්න බෑ නංගී..."***

***"අයියා..."***

සමාධිගේ හඬ දුරකතන රැහැන දිගේ කෙත්මිටද ඇසුණි.

***"මං ආයේ ගන්නම් නංගී.. මගේ නම්බර් එක සේව් කරලා තියා ගන්න මගේ නම සංදේශ්..."***

කලබලයෙන් කී සංදේශ් සමාධි එනවාත් එක්කම දුරකතනය තැබුවේය.

***"ඒ මොකද මාව දැකලා කොල් එක කට් කළේ?"*** සමාධි ඉනට අතකුත් තබාගෙන අහද්දී සංදේශ්ට සිනහවක් නැඟුණි.

***"කවුද කතා කළේ ? අපේ නෑනාද?"***

***"මොන නෑනලාද බං...."*** සංදේශ ගනනකට නොගෙන කීවේය.

*“හා.. හා... මං හොයා ගන්නම්කෝ. අන්න අම්මා කතා කරනවා කෑම කන්න.. යමු.”*

*“යමු යමු...”*

sinhalaebooks.com

14.

***"මොකද කෙත්මි මේ? මොකක් හරි ප්‍රශ්නයක්ද?"***

හංසි කලබල වූවේ කවදාවත් නැතිව අද කෙත්මි නොකියාම උදේම තමාව සොයා ආ නිසාය. ගමනක් යන්න තියෙනවා කියා කෙත්මි කියද්දී හංසි කිසිවක් නොකීවේ අම්මලා ඉන්න නිසාය. වාහනය පාරට දමනවාත් සමඟම ඇය ප්‍රශ්න ඇසීම ඇරඹුවාය.

***"සොරි හංසි... අම්මලා කිව්වේ උදේම ඔයාව එක්කන් එන්න කියලා..."***

***"ඇයි හදිස්සියේ... අම්මලා කොහේහරි යනවද?"***

හංසි ඇසුවේ මීට පෙරත් එවැනි අවස්ථාවල තමාත් සමඟ කෙත්මිව තබා යන නිසාය.

***"අද කට්ටියම යන්න හදන්නේ... ඇඳුම් ගන්න.."***

***"ඇඳුම්? මොකෝ එකපාරටම?"***

හංසි අසනවිට කෙත්මිට නොදැනීම සුසුමක් හෙළුණි. ඒත් සමඟම හංසි ඇය දෙස හොඳින් බැලුවාය.

***"කෙත්මි... මාව බය නොකර කියන්න මොකද්ද වුණේ? ඔයාගේ මූණත් අමුතුයි... ඇසුත් රතු වෙලා... ඇයි මේ..?"***

***"හංසි...."***

වාහනය පසෙකට කර නැවැත්වූ කෙත්මි හංසි දෙස බැලුවේ දෑසට කඳුළු උනද්දීය. ඒ කඳුළු හංසි හොඳින්ම දුටුවාය.

***"අනේ ඇයි ළමයෝ මේ..? මොනවද වුණේ කියන්නකෝ මට..."***

***"හංසි... එයා...එයා..."***

***"කවුද? අසිත අයියද ?"***

sinhalaebooks.com

කෙත්මි ඔව් කියන්නට හිස වැණුවේ කඳුළු කැට විසි වෙද්දීය.

*"ඔව් ඉතිං.. එයා...?"*

*"එයා ලබන මාසේ මැරි කරනවා හංසි... ලබන මාසේ... සති දෙකකට කලිනුත් මට ආදරේ කරපු එයා... ලබන මාසේ සමාධිව මැරි කරනවලු... හංසි...."*

හංසි තම උරහිසට බරවී හඬන කෙත්මිගේ හිස නිහඬවම අතගෑවේ කියා ගන්නට දෙයක් නැතිවය.

අවුරුදු ගානක් තිස්සේ ආදරේ කරපු කෙනෙක් මේ විදිහට වෙන කෙනෙක්ගේ වෙන එක දරා ගන්න කොයිතරම් අමාරුද? අසිත කෙත්මිව රවට්ටපු බව ඇත්ත... ඒත් කෙත්මි අසිතට කරපු ආදරේ බොරුවක් ගෑවිලාවත් නැති බව හංසි දන්නවා...

මේ කියන කතාවත් එක්ක අද ඇඳුම් ගන්න යන්න දාගත්ත ගමන ගැන හංසිට සිතන්නට දෙයක් ඉතිරි වූවේ නැත. කෙත්මිගේ අම්මලා එකත් එකටම මේ යන්නේ අසිතගේ විවාහයට යන්නට සූදානම් වන්නටය.

*"කෙල්ලේ... එතකොට අපි අද යන්නේ එයාගේ..."*

sinhalaebooks.com

***"ඔව් හංසි... අපි යන්නේ වෙඩින් එකට යන්න ඇඳුම් ගන්න. යමු.. අම්මලා අපි එනකම් බලන් ඇති.."*** කෙත්මි කඳුළු පිසලාගෙන වාහනය පණ ගන්වා ගනිමින් කීවාය.

අනේ උඹ පව් කෙල්ලේ.... උඹට මේ මොකක්ද වුණේ.... හංසි තනිවම සිතුවේ මලානික වී ගිය කෙත්මිගේ මුහුණ දෙස බලා සුසුමක් හෙලමිනි. වෙනදාට තිබුණ සතුට සැහැල්ලුව දැන් කෙත්මිගේ මූණ ළඟපාතකවත් පෙනෙන්නට නොවේ...

*******************

සමාධි අයියාව හොයාගෙන ආවේ අම්මාත් ආශාත් පොළට ගිය අතරේය. විවාහයේ වැඩවලට අම්මාට උදව්වට කියා ලොකු නැන්දා ආශාව මෙහි නතර කර ගිය එක ගැන සමාධිගේද වැඩි කැමැත්තක් නැත. උදව්වටත් වඩා ආශා නතර වූයේ අයියා නිසා බව සමාධි හොඳින්ම දනී.

අම්මාට මෙය නොදැනෙන්නට විදිහක් නැත. ඒත් අම්මා කිසිවක් නොදන්නා ලෙස ඉන්නේ ආශාට කැමති නිසාද? නැත. අයියාට ආශාව කිසිසේත්ම

sinhalaebooks.com

නොගැලපෙන බව සමාධිට විශ්වාසය. අයියාට ගැලපෙන්නේ ආශා වගේ කෝළමක් නොවේ...

*"අයියාාා...."*

සමාධි කෑගසාගෙන කාමරයට එද්දී අඩ නින්දක සිටි සංදේශ් තිගැස්සී දෑස් හැරියේ ය. ඔහුගේ බියපත් මුහුණ දුටු සමාධිට සිනහවක් නැඟුණි.

*"මොකද අයියා මේ...?"*

*"මොකද අහන්නේ... බෙල්ල මිරිකනවා වගේ යටිගිරියෙන් කෑගහලා මෙතන...."* සංදේශ් සැරෙන් කීවේය.

*"ම්හු... ඔය පාට් අරයත් එක්ක නම් හරියන එකක් නෑ... ඔහොම කෑගහලා දත් නැතුව බත් කන්න වෙන්නේ...."*

සමාධි බැරෑරුම් ස්වරයෙන් කියද්දී සංදේශ් බලා උන්නේ පුදුමයෙනි. මේ කියන්නනේ මොනවද?

*"මොනවද බං කියවන්නේ? ඔළුව කොහේහරි වැදුනද?"*

sinhalaebooks.com

*"නෑ අයියා... මං මේ කල්පනා කළේ අරයා එන විදිහ නම් මට අල්ලන්නේ නෑ හොඳේ. අම්මත් නොදන්නවා වගේ ඉන්න එකනේ වැඩේ..."*

*"ආශා ගැනද කියන්නේ?"*

*"ඔය තියෙන්නේ... සද්ද නැතුව හිටියට ඔයාටත් එහෙනම් වැඩේ තේරුණා නේද?"*

සංදේශ් කිසිවක් නොකියා සිනාසුණේ ඔහුටත් සමාධි ගැන එසේම සිතුණ නිසාය. ඔහු සිතා උන්නේ එවැන්නක් දැනෙන්නේ තමාට පමණක් කියා ය.

*"මොකටද දැන් හිනා වෙන්නේ? අයියා මේ... ඔය හිනාවෙන් කියන්නේ තමුසෙත් ඒ කෝලමට කැමතියි කියලා එහෙම නෙමෙයි නේ?"* සමාධි කේන්තියෙන් ඇසුවාය.

*"පිස්සුද බං... මේ ලෝකේ ඉන්න අන්තිම කෙල්ල වුණත් මට නම් ඒකිව එපා.."*

*"අම්මේ... ඇති යන්තම්. මං බය වුණා.."*

sinhalaebooks.com

*"මොකටද බය වෙන්නේ?"*

*"එයා ඔයාට ගැලපෙන්නේ නෑ අයියා.... මං හිතන විදිහට, එයාට මගේ අයියාගේ වයිෆ් වෙන්න කිසිම සුදුසුකමක් නෑ...."*

සමාධිගේ පණ්ඩිත කතා වලට සිනාසෙමින් සංදේශ් ඇයගේ හිස අත ගෑවේ ආදරයෙනි. තව මාසයකි. ඉන්පසු ඇය අසිතත් සමඟ යා යුතුය... සංදේශ්ට මහා දුකක් දැනුණි.

*"අයියා..."*

*"ම්...."*

*"මොකද සද්දයක් නැත්තේ?"*

*"නෑ මං මේ කල්පනා කළේ.... මගේ වයිෆ් වෙන කෙනාට තියෙන්න ඕන සුදුසුකම් මොනවද කියලා?"*

*"මං කියන්නද?"*

sinhalaebooks.com

සමාධි ඇඳේ විට්ටමට කොට්ටයක් තියා සැප පහසුවට හේත්තු වෙමින් ඇසුවාය.

*"කියන්න බලන්න...."*

*"ම්ම්ම්... පළවෙනිම දේ ඉතිං ලස්සන වෙන්න ඕන. හැබැයි මෙයාලා වගේ රටේ නැති ඒවා ගාලා නෙමෙයි. නැචුරල් බියුටි එකක් තියෙන්න ඕන හරිද...."*

*"මඟුලක් කතා කරනවා... එහෙම කෙල්ලෝ දැන් හොයන්න නෑ පැංචි..."*

*"ඇයි මේ මං?"*

*"කවුද කිව්වේ තමුසේ ලස්සනයි කියලා?"*

*"කියන්න ඕන නෑ.. මං ඒක දන්නවා..."*

*"හා... හා... ඉතිරි ටිකත් කියන්නකෝ..."*

*"මේ වගේ මෝඩ ගහක් නොවී පොඩ්ඩක් හරි ඉගෙන ගත්ත කෙනෙක් වෙන්න ඕන... වැදගත් විදිහට ඉන්න දන්න... ඔයාගේ නපුරු කම් ඉවසන් ඉන්න පුළුවන් කෙනෙක් වෙන්න ඕන.*

*එහෙම නැතුව අරයා වගේ කෙනෙක් ගෙනල්ලා මඟුල අවමඟුලක් වෙලා ඉවර වෙන්නේ.. තව දෙයක්, මේක තමයි වැදගත්ම දේ...."*

*"ඒ මොකක්ද?"*

*"ඒ කෙනා කවුරු වුණත් එයාට එන ඕනම ප්‍රශ්නෙකදි කෙලින්, මොළේ කල්පනා කරලා තීරණ ගන්න පුළුවන් වෙන්න ඕන... කොයි තරම් වේදනාකාරී වුණත් ඇත්තට මූණ දෙන්න පුළුවන් හරි සාධාරණ කෙනෙක් වෙන්න ඕන...*

*දැන් ඔයා කියන දේ මං දන්නවා අයියා... ඔව්.. මං එහෙම නෑ. ඒ නිසා එයා එහෙම වෙන්නම ඕන... මොකද මට කවදා හරි මගේ ප්‍රශ්නයක් අරන් එන්න වෙන්නෙත් ඔය දෙන්නා ළඟටනේ...."*

සමාධි කියද්දී සංදේශ්ට සිහිවුණේ කෙත්මිවය. ඇය දැනටමත් සමාධිගේ ජීවිතයේ ලොකුම ප්‍රශ්නයක් විසඳා අවසන්ය. සමාධි මේ දේවල් දන්නවා නම්? නැත. ඇයට මේ දේවල් කියනවා නම් කිව යුත්තේ අසිතමය.

sinhalaebooks.com

කෙත්මිවත් ඇයගේ මිතුරිය හෝ දිලූෂවත් එය නොකියන බව විශ්වාසය.

***"අයියා.... ඒ පාර මොනවද හිතන්නේ? එහෙම කෙනෙක් ඉන්නවද?"***

***"තමුසෙත් දන්න දේවල් බං... එහෙම කෙනෙක් ගැන මතකයක් නම් නෑ. අපි තේ එකක් බොන ගමන් මතක් කරලා බලමුද?"***

***"කපටියා... ඉන්නවා මං හදන් එන්නම්.."*** සමාධි කුස්සියට ගියේ සංදේශ්ගේ බාහුවක් කොනිත්තාගෙනය.

සමාධි ගියපසු සංදේශ් කෙත්මිට ඇමතුමක් ගත්තේ ඇයත් සමඟ ටිකක් කතා කරන්නටය. මේ දේ ගැන තව තවත් කතා කිරීමෙන් වන්නේ ඇයගේ සිත තවත් පෑරෙන එක බව සංදේශ් දනී. එහෙත් ඇයත් සමග කතා කර ඇයගේ හිත හදන්නට සංදේශ්ට වුවමනාය.

sinhalaebooks.com

15.

ගෙදර ආ විගසම නින්දකට වැටුණ කෙත්මිට බාධා නොකර හංසි රනුක් සොයා ගියේ කෙත්මිට මේ මොහොතේ ටිකක් නිස්කලංකයේ ඉන්නට ඉඩ හරිමිනි. පැයක් පමණ රනුක් සමග කතා කරමින් සිටි හංසි යළිත් ආවේ බරවූ සිතිනි. කෙත්මි මේ බවක් තවමත් කීවේ නැත. රනුක් කතා කළේ මේ ගැන හංසි දන්නා බව සිතාගෙනය.

***"නෑ හංසියෝ... මං කියන්නේ මෙතන ලොකු දෙයක් ඔයාලා අපෙන් හංගනවා. බලහන් අපේ අක්කා ඉන්න හැටි. මිනිහා මැරිච්ච ගෑණි වගේ. අපේ අම්මලාට මේවා තේරෙන්නේ නැති වුණාට මට පේනවා. අනික අර අසිතයා අපි එක්ක දවස් ගානක් ඉඳලා ගිහින්... කෝල් කරලා කියනවා ලබන මාසේ විසිපහ වෙඩින් එකලු...."***

***"ලබන මාසේ විසිපහ?"***

හංසි තමාටම මුමුණා ගත්තාය. ඇයි ලබන මාසේ විසිපහම?

*"ඇයි... අපේ අක්කා කිව්වේ නැද්ද?"* රනුක් ඇසුවේ සැකයෙන් හංසි දෙස බලමිනි.

*"න්නෑ... නෑ... කිව්වා. මට අමතක වුණා.."* කී හංසි ඉක්මනින් රනුක්ගෙන් මිදී උඩට ආවේ ඔහු මේ ගැන ප්‍රශ්න කිරීම පටන් ගැනීමට පෙරය.

තවමත් ඇඳගෙන ආ ඇඳුම පිටින්ම නිදා සිටින කෙත්මි දෙස හංසි බැලුවේ අනුකම්පාවෙනි. ඇය ඒමේ දේවල් කොහොම දරා ගන්නවාද කියා අංජලීට සිතාගන්නට බැරිය.

*"කෙත්මි.... දැන් නැගිටපන් කෙල්ලේ.. රෑ වෙන්නත් ඇවිල්ලා.. උඹ තාම උදේ ඇඳපු ඇඳුම පිටින්.."* හංසි කියද්දී කෙත්මි දෑස් හැර බැලුවාය.

*"හංසි.... අනේ දරුවෝ තරහා නැතුව ටිකක් මාත් එක්ක මෙතන කඩේට ගිහින් එමුද?"*

sinhalaebooks.com

හසන්ති පහළ සිට කතා කරද්දී කෙත්මි සිනහවක් නැඟුවාය. අම්මටත් හංසි නැතුව කඩේටවත් යන්නට බැරිය.

***"මේ එනවෝ….."***

කියා කෑගැසූ හංසි කෙත්මිගේ උරහිසට තට්ටුවක් දමා පහලට දුවද්දී කෙත්මි දුරකතනය අතට ගත්තේ වෙලාව බලන්නට ය.

***"මිස් කෝල්ස් දෙකක් ? සංදේශ් අයියානේ… ඇයි දන්නේ නෑ හදිස්සියේ. මැසේජ් එකක් තියනවා. බලමු… 'නංගී… ඇයි ෆෝන් එක ගන්නේ නැත්තේ ? ඔයාට මොකක්හරි කරදරයක්ද?"***

පණිවිඩය ඇවිත් තිබුණේ කෝල් කර සෑහෙන වෙලාවකට පසුය. කෙත්මි යළිත් ඇමතුමක් වත් නොගත් නිසා ඔහු බිය වන්නට ඇත. කෙත්මිට ඔහු ගැනත් දුකක් දැනුණි. ඔහු ඉන්නේ මහා වරදකාරී හැඟීමකින් බව කෙත්මි දනී.

නමුත් ඔහුගේ පැත්තෙන් ගත් කළ ඔහු මේ දේවල් තමාට කීවේ ඔහුගේ එක කුස උපන් නැඟණිය වෙනුවෙනි. ඒ නිසා කෙත්මිගේ තුන් හිතකවත් ඔහු ගැන

තරහක් නම් නොවේ. කෙත්මිගේ සිතේ ඔහු ගැන ඇත්තේ ගරුත්වය මුසු හැඟීමකි.

රෑ වෙන්නට කලින් නා ගන්නට ඕනා වුණත් කෙත්මි ඊට පෙර සංදේශ්ට ඇමතුමක් ගත්තේ ඔහුට මෙතෙක් වෙලා ප්‍රතිචාර නොදක්වා සිටීමෙන් ඔහු තමා සිටින්නේ ඔහු සමඟ අමනාපයෙන් යැයි සිතා හිත රිදවා ගනී යැයි සිතුණ නිසාය.

***"හෙලෝ..."***

එහාපසින් ඇසුණේ සුරතල් ගැහැණු හඬකි. ඒ හඬේ හුරු පුරුදු බවක් දැනී කෙත්මි යළිත් දුරකතනය දෙස බැලුවේ තමා ඇමතුවේ සංදේශගේ අංකයමද බලන්නටය.

***"හෙලෝ..."*** එහාපසින් යළිත් කතා කළාය

***"හෙලෝ... සංදේශ් අයියා ඉන්නවද?"***

***"අනේ අයියා නම් ටිකක් එළියට ගියානේ... ෆෝන් එක අමතක වෙලා..."***

සමාධි කතා කළේ තරමක පුදුමයක් සිතේ තබාගෙනය. කටහඬින් නම් ඇය ලාබාල යුවතියකි. මීට පෙර අයියාට මෙලෙස ගැහැණු ළමයින් සමඟ දුරකතන සංවාද නොතිබුණ බව සමාධි දනී. ඔහුට කෙල්ලන් ඇලර්ජික් ය. එහෙම තිබියදී මේ කතා කරන්නේ කවුද?

*"අනේ ඇත්තද... මේ එතකොට සමාධි අක්කද?"*

කෙත්මි ඇසුවේ ඇයගේ කටහඬ මීට පෙර ඇය අසිතත් සමඟ කතා කරද්දී ඇසුණු බව සිහිවූ නිසාය.

***"ඔව්... මං සමාධි තමයි. නංගී මාව දන්නවද?"*** සමාධි ඇසුවේ පුදුමයෙනි.

කෙත්මිට සිනහවක් නැඟුණේ ඇයගේ පුදුම සහගත ස්වරයට ය. *"මං නොදැන කොහොමද... ඔයා නොදන්නවට ඔයා මගේ කතාවේ එක ප්‍රධාන චරිතයක්"* කියන්නට ඕනේ එය වුවද කෙත්මි දුන්නේ වෙනත් පිළිතුරකි.

***"දන්නවා කියන්නේ දැකලා නම් නෑ.. මං අක්කා ගැන විස්තර අහලා තියනවා. අක්කගේ වෙඩින් එකත් ළඟයි නේද? අක්කට වැඩත් ඇති මං තියන්නම්..."***

sinhalaebooks.com

කෙත්මි කියන දේවල් සමාධි අසා උන්නේ පුදුමයෙනි. මේ කෙල්ල මගේ නම විතරක් නෙමෙයි ගොඩක් දේවල් දන්නවා... ඒ තරම් දේවල් කියන්න තරම් මෙයා අයියගේ කවුද ඇත්තටම?

*"වෙඩින් එකේ වැඩ නම් වැඩි හරියක් කරන්නේ අම්මයි අයියයි නංගී... මට ඔයාගේ නම කිව්වොත් අයියට ආපු ගමන් පණිවිඩේ දෙන්න පුළුවන්..."*

සමාධි එසේ කීවේ කතා කරන කෙනාගේ නම දුරකතනයේ සේව් කර නොමැති නිසාය.

*"මං රිතූ... අනේ මං මේ හදිස්සියකට නෙමෙයි අක්කේ කතා කළේ... අයියා හවස මට අරන් තිබ්බා ඒකයි."*

*"හරි හරි... මං පණිවිඩේ දෙන්නම්කෝ..."* කියමින් සමාධි දුරකතනය තැබුවාය.

*එයා මොනවා හිතුවද දන්නේ නෑ... මටත් තිබ්බේ අයියා නැත්තං පස්සේ ගන්නම් කියලා තියන්න....* කෙත්මි දුරකතනය තබා නාන කාමරයට යන අතරේ සිතුවාය.

sinhalaebooks.com

සමාධිද උන්නේ ඇය ගැන කල්පනා කරමිනි. මේ ඇමතුමේ කුමක් හෝ විශේෂයක් ඇතිබව ඇයට දැනේ... මේ අයියගේ ගෑණු ළමයද?

***"රිතූ...? එහෙම නම තියන යාලුවෝ අපේ අයියට මං දන්න තරමින් නෑ... අනික මේ ළමයා මටත් අක්කා කියලා කතා කළේ... මෙතන මොකාක්හරි හොරයක් තියනවා වගේ...."***

හංසි අම්මා එක්ක කඩේට ගිහින් ආවේ කෙත්මි සමඟ ටිකක් නිදහසේ කතා කරන්නට සිතාගෙනමය. ඇය අම්මා අරන් දුන් සීනි මුරුක්කු පැකට් දෙකත් රැගෙනම උඩට ආවේ කෙත්මි ඒවාට කැමති බව දන්නා නිසාය.

***"ෂා.... රස කෑමක් හම්බෙලා තියෙන්නේ.... මොකක්ද බං තව පැකට් දෙක තුනක් උස්සන් එන්න එපැයි... ගානට දෙකක් ගෙනාවේ.."***

කෙත්මි මුරුක්කු පැකට් එකත් අතට ගෙන ඔන්චිල්ලාවේ වාඩි වූයේ එසේ කියමිනි. හංසිද සිනහවක් නංවාගෙන කෙත්මි අසලින් වාඩි වූවාය.

***"අම්මා ඒත් කිව්වා..."***

*"මොනවද හංසි?"*

*"කෙත්මි ආවානම් කඩේ තියන ඔක්කොම සීනි මුරුක්කු ටික උස්සන් එන්න වෙනවා කියලා...."*

*"කෝ ඉතිං ගෙනල්ලා නෑනේ ඒ වුණාට...."*

*"ගෙනාවා බං... අම්මා ඒ ටික අරන් තිබ්බා. මං දැනට මේ දෙක අරන් ආවේ.... අනේ මෙහෙමත් පෙරේතියක්...."*

හංසි කියද්දී කෙත්මි සිනහවක් නගා නැඟිට ගොස් බැල්කනියේ විදුලි බුබුළ දල්වා ආවාය.

*"කෙත්මි....."*

*"ම්ම්ම.....?"*

*"අපිව රවට්ටන්න ඔයා කවදා වෙනකම් ඔය දුක හිරකරන් ඉන්නවද?"*

sinhalaebooks.com

හංසි අසද්දී කෙත්මිට සුසුමක් හෙළුනේ ඉබේටමම ය. කාට බොරු කරත් සෙවනැල්ල වගේ ඉන්න හංසිට බොරු කරන්න කෙත්මිට බැරිය.

***"මං දන්නේ නෑ හංසි... මට කවදා වෙනකම් මේක කරන්න පුළුවන්ද කියලා... අඩුතරමේ එයාලගේ වෙඩින් එක ඉවර වෙනකම්වත්... මට මෙහෙම ඉන්න පුළුවන් වුණොත්..."***

***"කෙත්මී... ඔයා ඔහොම ඉන්නවා අපි කොහොමද බලන් ඉන්නේ? අඩු තරමේ කෑගහලා අඬලා හරි... හිත හදාගමු කෙල්ලේ.. අපිට වෙන කරන්න දෙයක් නෑ..."***

***"මට තේරෙනවා හංසි... තව ටික දවසනේ... කොහොමත් ඒ දෙන්නගේ වෙඩින් එක ඇස් දෙකෙන් ම දකිනකම් මට මේ හැමදේම දැනෙන්නේ නරක හීනයක් වගේ... ඒ දෙන්නගේ වෙඩින් එකෙන් පසසේ මට පුළුවන් වෙයි මේ නරක හීනෙන් ඇහැරෙන්න..."***

කෙත්මි කීවේ කඳුළු වැල් ගලා ගිය මුහුණ හංසිගේ උරහිසේ සඟවාගෙනය. හංසි නිහඬවම කෙත්මිගේ හිස අතගෑවාය. කෙත්මිට පමණක් නොව තමාටද මෙය දැනෙන්නේ භයානක සිහිනයක් ලෙසය. අවසානය කෙසේ වේවි දැයි කියන්නට බැරිය.

sinhalaebooks.com

හංසිට වඩාත්ම බය කෙත්මි මේ ලෙසින් දුක හිරකරගෙන නිහඩව සිටීමය. ඇය අවසානයේ මොනවගේ තීරණයක් ගනීවිදැයි හංසි තුළ ඇත්තේ චකිතයකි.

sinhalaebooks.com

16.

හැන්දෑවේ අසිත සමාධිව බලන්නට ආවේ ඇය ආසා කරන කඩචෝරු කිහිපයක්ද රැගෙනය. සංදේශ් එන විට ඔවුන් උන්නේ මිදුලේ පොකුණ අසළ තැනූ බංකුව මතය. දෙදෙනාට සංදේශ් ආ වගක්වත් ඇසුණේ නැත. සංදේශ් ද ඔවුන් බාධා නොකර කාමරයට ගියේය.

ඔවුන් දෙදෙනා එලෙසින් සිටිනු දකිද්දී සංදේශ්ගේ සිතට සතුටක් දැනුණි. සියල්ලටම වඩා වටින්නේ සමාධිගේ සතුටය. අද ඇය ඉන්නේ සතුටිනි. සංදේශ් ඒ සතුට හොඳින්ම දුටුවේය. සියල්ලටම වඩා වටින්නේ ඇයගේ සතුටය. සියලු දේම කළේ ඇයගේ සිනහව වෙනුවෙනි. ඉදිරියටත් ඒ සිනහව මැකී යන්නට ඉඩක් නොතැබීමට සංදේශ් තමාටම පොරොන්දුවක් වූවේය.

එහෙත් රිතූ? මේ සියල්ල සිදුවන්නේ ඇය කඳුළු මතින් කළ පරිත්‍යාගය නිසාය. නැතිනම් අද තමාට දකින්න වන්නේ සමාධිගේ සිනහව නොව කඳුළු බව සංදේශ් හොඳින්ම දනී.

*නෑ රිතූ... ඔයා මේ කලේ සුළුවට හිතන්න පුළුවන් දෙයක් නෙමේ. ඔයා ගැන ඇත්තටම හිතා ගන්න බෑ නංගි. ඔයා මගේ නංගි වෙනුවෙන් මේ දේ කළ දවසේ ඉඳලා මට නංගිලා දෙන්නයි රිතූ... ඔව්... ඔයත් දැන් මට මගේ නංගියෙක්. ඔයා නොකිව්වත් මං ඔයා ගැන වගකීමක් ගන්නවා. අද දිලූෂ කියපු දේවල් එක්ක මටත් ඔයා ගැන හරි බයක් දැනෙනවා රිතූ දැන්.....*

සංදේශ්ට දිලූෂව මුණගැසුණේ අහම්බයෙනි. නමුත් දිලූෂ සැබැවින්ම සිටියේ සංදේශ් සමඟ ටිකක් කතා කිරීමේ උවමනාවෙනි.

*"අපේ නංගි ගැන මං හරි බයෙන් ඉන්නේ සංදේශ්. එයා ලොකු දුකක් හිතේ හිර කරගෙන ඉන්නේ. නංගිගේ යාළුවත් අද මට කතා කළා. ඒ කෙල්ලත් බය වෙලා ඉන්නේ. අපේ නංගී සාමාන්‍යයෙන් දුකක් දැනුනම කරන්නේ කෑ ගහලා අඬන එක...*

*ඒත් එයා මෙතනදී එහෙම කරේ නෑ. ඒ කියන්නේ එයා මොන මොනවා හරි හිතනවා. අසිතගේ සිද්ධියෙන්ම දැක්කනේ.. රිතූ හරි ඉක්මනට ලොකු තීරණ ගන්න කෙනෙක්... මට බය මේ කෙල්ල මොකක් හරි මෝඩ තීරණයක් ගනීද කියලා..."*

sinhalaebooks.com

*"රිතූ නංගි ඒ වගේ මෝඩ තීරණයක් ගනී කියලා මං හිතන්නේ නෑ...."*

*"සංදේශ් මොනවද අපේ එකී ගැන දන්නේ... වෙලාවකට එයා හරි බොළඳයි.. මේ ළඟදි එක පාරක් අප්පච්චි ගැහුවා කියලා දුක හිතිලා බැල්කනි එකෙන් පහළට පනින්නත් ගියාලු... මට දවසක් පුංචි කිව්වේ... එහෙව් එකේ මේ වගේ දෙයක් වුණාම..."*

එතනින් එහාට දිලූෂ කී දේවල් සංදේශ්ට මතකයක් නැත. ඒ කතාවෙන් සංදේශ් සැබැවින්ම බිය වූයේය. මේ සියල්ලම කලේ තමාය. බැරි වෙලාවත් රිතූ එවැනි තීරණයක් ගතහොත්?

*"ලොකු පුතා... එන්න කෑම කන්න...."*

අම්මාගේ කට හඬින් සංදේශ් තිගැස්සී පියවි ලොවට ආවේය. තමා තවමත් ඇඳගෙන ආ ඇඳුම පිටින් ය.

*"ඉන්න අම්මා.... මං වොෂ් එකක් දාගෙන එන්නම්...."*

සංදේශ් කෑම මේසයට ආවේ තවත් පැය කාලකට පමණ පසුවය. ඒ වන විටත් අසිතත් සමාධිත්, ආශාත් කෑම මේසයේ බලා සිටියේ ඔහු එන තුරුය.

සංදේශ් නිහඬවම සිනහවක් පා කෑම මේසයේ අසුන් ගත්තේය.

*"අයියා එනවා දැක්කෙවත් නෑ..."*

සමාධි කීවේ කෑම බෙදන අතරේය. ඇයගේ කතාවට සංදේශ්ට නැඟුණේ සිනහවකි.

*"හිනා වෙන්නේ මොකද?"*

*"නෑ ඉතිං... මං නම් දෙන්නවම දැක්කා... ඔය දෙන්නට ඉතිං අවට වෙන දේවල් ගැන සිහියක් නොතිබුණාට...."*

සමාධි අසිත දෙස බලා ලැජ්ජාවෙන් සිනාසුණාය. අම්මා කුස්සියේ සිට ආවේ ඒ මොහොතේය.

*"හරි හරි කෑම කාලා ඉන්න ළමයි..."*

*"සංදේශ් අයියටත් දැන් ගෑණු ළමයෙක් හොයාගන්න කාලේ හරි... නේද සුදූ?"*

අසිත කීවේ සිනහ වෙමිනි. ඒ කතාවට ආශා අමුතුම සිනහවක් පා අයියා දෙස බලනු සමාධි ඇස් කොණින් බලා උන්නේ අමනාපයෙනි.

***"අනේ අනේ මේ... උඹලගේ වලටම මාවත් දාගන්නද දෙන්නාගේ කල්පනාව. දන්නවනේ මං ඔය සබ්ජෙක්ට් එකට නැති බව..."***

සමාධිට හවස ආ දුරකතන ඇමතුම සිහි වූයේ මේ මොහොතේය. කතා කලේ ආශාගේ ජාතියේ සක්කරවට්ටමක් නොවන බව විශ්වාසය. ඇත්ත කුමක් වුවත්.. ඇය අයියාගේ කවුරු වුවත්.... මෙය ආශාව අයියාගෙන් ඉවත් කරන්නට හොඳ අවස්ථාවකි.

***"අම්මා... මට නම් හිතෙන්නේ අම්මට මගේ වෙඩින් එක ඉවර වෙද්දිම අයියගේ වෙඩින් එකටත් ලෑස්ති වෙන්න වෙයි වගේ...."***

සමාධිගේ කතාවට පුදුම නොවූවේ ඇය පමණකි. සියලු දෙනාම බලා උන්නේ ඇය දෙසය.

***"අනේ අනේ මේ පැංචි... මට මේ ඉන්න විදිහට ඉන්න දෙනවකෝ."***

sinhalaebooks.com

***"අයියගේ වෙඩින් එකත් ඔයාගේ වෙඩින් එක එක්කම ගන්න තිබ්බා එයත් මනමාලියෙක් තෝරගෙන හිටියනම්..."***

අම්මා සිනහවෙන් ම කීවේ ආශා දෙසත් බලා සිනහවක් පාමිනි. ඒ දුටු සමාධිට අම්මා ගැනද අමනාපයක් දැනුණි. නැත. මෙය නම් කරන්නට දෙන්නම බැරිය.

***"ඒ අපි දන්න තරමනේ... මෙයාට හොද කෙල්ලෙක් ඉන්නවා අම්මා. මට නම් විශ්වාසයි. එයා තමයි මගේ නෑනා...."***

සංදේශ් පුදුමයෙන් සමාධි දෙස බලද්දී ඇය දෑසින් ඔහුට පෙන්වූයේ මුහුණ කළු කරගෙන බිම බලාගෙන සිටින ආශා ය. ඇයගේ ස්වරූපය දුටු සංදේශ්ට සිනහා යන්නට ආවද ඔහු අපහසුවෙන් එය වළකා ගත්තේය.

***"ඇති ඇති දැන් ඔය විහිළුව....."***

අම්මා කීවේ තරවටුවක විලසිනි. එසේ නම් අම්මා තවමත් මෙය පිළිගන්නේ නැත. සිතා සිටියේ ඇමතුම ගැන අයියාව තනිකරගෙන අසන්නටය. නමුත් ආශා ඉදිරියේ පසුබසින්නට සමාධිට සිතක් නැත.

***සොරි අයියා.. මං මේ හදන්නේ ඔයාව බේර ගන්න.. ඔයා පස්සේ හිමීට මට බැනලා තරහ පිට කරගන්න...*** ඇය සංදේශ් දෙස බලාගෙන සිතුවාය.

sinhalaebooks.com

*"මං විහිළු කළේ නෑ අම්මා... මං කියන්නේ ඇත්ත... මං අද හවස ඒ නංගි එක්ක කතාත් කළා..."*

*"මොන නංගියෙක් ගැනද පැංචි කියවන්නේ? විකාරද ඔයාට?"*

සංදේශ් මදක් අමනාපයෙන් ඇසුවේය. දැන් මේ විහිළුව හොඳටම ඇතිය.

*"මට විකාර නෑ අයියා. අපි මේ දේවල් දැනගන්නවට ඔයා අකමැති නම් මීට පස්සේ යන දිහාක ෆෝන් එක අරන් යන්න. පව්.. ඒ ළමයා හවස ඔයාට කෝල් ගත්තා... මං ඒත් කිව්වා අයියා එළියට ගිහින්, ආවම පණිවිඩේ දෙන්නම් කියලා. සොරි මට අමතක වුණා."*

*"මට කෝල් කළා? ගෑණු ළමයෙක්? ඒ කවුද?"*

*"කවුද කියන්නේ.. ඔයාගේ ගෑණු ළමයානේ... නම කිව්වේ රිතු කියලා..."*

*"රිතු!!!!"*

සංදේශ් ට එකවරම බැලුණේ අසිත දෙසය. රිතූගේ නම ඇසෙනවාත් සමඟම අසිතද සංදේශ් දෙස බැලුවේ තිගැස්මෙනි.

***"ආා... දන්නවානේ... රිතූ තමයි කෝල් කළේ..."***

සමාධි යළිත් වරක් කීවාය. ආශා රැවටීමට සිතා මේ කතාව ඇද ගත්තද රිතූගේ නම ඇසූ පමණින් අයියා වෙනස් වනු දුටු සමාධි ද පුදුම වූවාය. ඇය අසිතගේ වෙනසක් නොදුටුවේ අයියා දෙසම බලා උන් නිසා ය.

***"කොයි වෙලාවෙද රිතූ කෝල් කළේ?"*** සංදේශ් ඇසුවේ කලබලයෙනි.

***"හවස.. ඔයා එළියට යනවත් එක්කම වගේ..."***

සමාධි කියා නම වන්නටත් පෙර සංදේශ් නැගිට කාමරයට දිව්වේ ඇයට බැන වදිමිණි.

***"අපූරුයි හවස ආපු කෝල් එක ගැන කියන වෙලාව..."***

අනෙක් තිදෙනාම මේ දෙස බලා උන්නේ පුදුමයෙනි. අසිතගේ සිතෙහි වූයේ මේ කියන්නේ කෙත්මි ගැනද යන පැනයයි. ආශා නම් උන්නේ පිටකර

ගත නොහැකි කෝපයකිනි. අම්මාට දැනුණේ ගැහැණු ළමයෙක් දෙස විහිළුවටවත් නොබැලූ තම පුතා ගැන පුදුමයකි.

කෙසේ වෙතත් ඇයගේ ඇමතුම ගැන කියද්දී සංදේශ් කලබල වූ ආකාරයෙන්ම ඇය විශේෂ තැනැත්තියක් බව සියලු දෙනාම තේරුම් ගත්හ.

*"පොඩ්ඩක් ඉන්න සුදූ... මං ඉක්මනට කෝල් එකක් අරන් එන්නම්...."*

සංදේශ් කාමරයට යනවත් සමඟම අසිත කෑම මේසයෙන් නැගිටිමින් කීවේය.

*"මොකද අනේ මේ කලබලේ..."*

*"කලබලේ කියන්නේ සුදූ... අම්මි දිලූෂට පණිවිඩයක් කියන්න කිව්වා.. අයියා ඔයාට බනිද්දියි මට මතක් වුණේ...."*

සමාධිට බොරුවක් කියා එළියට පැන ගත් අසිත දෙවරක් නොසිතාම කෙත්මිට ඇමතුමක් ගත්තේය. මේ කියන රිතූ කෙත්මිද? එය හරියටම දැන ගත යුතුය.

sinhalaebooks.com

දුරකතනය නාද වද්දී කෙත්මි උන්නේ හංසි පාඩම් කරන තැනට වී මහහැරුණු සටහනක් ලියමිනි. දුරකතන තිරය දෙස බැලූ කෙත්මිගේ දෙනෙත විසල් වනු දුටු හංසිද දුරකතනයට එබී බැලූවාය.

*"අසිත? මෙයා මොකටද මේ අමතන්නේ...?"*

*"අනේ මන්දා හංසි..."*

*"ගනිං බලන්න.. ස්පීකර් ඔන් කරලා ගනිං..."*

කෙත්මිද ඇමතුමට සම්බන්ධ වී හංසි කී ලෙසම ස්පීකර් ඔන් කලාය.

*"කෙත්මි ප්ලීස්... ෆෝන් එක කට් කරන්න එපා... මට ඔයත් එක්ක ටිකක් කතා කරන්න ඕන."*

*"තව මොනවා ගැනද ඔයාට මාත් එක්ක කතා කරන්න තියෙන්නේ ?"*

කෙත්මි කිසිදු බුරුලක් නොපෙන්වා ඇසුවාය. තමා විදින වේදනාව මොහුට පෙන්වා පලක් නැති බව ඇය තේරුම් ගෙන උන්නාය.

sinhalaebooks.com

***"මට ඔයාගෙන් දෙයක් දැන ගන්න ඕන..."***

***"මොනවද ඔයාට දැන ගන්න ඕන?"***

***"ඔයා සංදේශ් කියලා කෙනෙක්ව අඳුරනවද?"***

අසිත අසද්දී කෙත්මි කෙලින්ම බැලුවේ හංසි දෙසය. හංසිද කෙත්මි දෙස බැලුවේ පුදුමයෙනි. සංදේශ් කෙත්මිට කතා කළ බව අසිතට නොකියා ඉන්නට කෙත්මි හංසි හා දිලූෂව පොරොන්දු කරවා ගෙන තිබුණි.

ඒ මේ දේවල් මෙතනින්ම අවසන් කර දැමීමට සිතාගෙනය. මොනවා වුණත් ඒ මස්සිනාලා දෙන්නාය. මේ දේවල් කියා ඔවුන් වෛරක්කරුවන් කල යුතු නැත.

***"කෙත්මි..."***

ඇයගේ නිහඬ බව නිසාම අසිත යළිත් කතා කළේය. කෙත්මි ලොකු හුස්මක් ගෙන කතා කරන්නට පටන් ගත්තාය.

***"ඇයි මං ඒ දේවල් ඔයාට කියන්නේ? මං කවුරු කොහොම දැනගෙන හිටියත් ඒක ඔයාට ප්‍රශ්නයක් වෙන්න විදිහක් නෑ...."***

sinhalaebooks.com

*"කෙත්මි ප්ලීස්.... මට කියන්න. ඔයා කොහොමද සංදේශ්ව අඳුරන්නේ?"*

*"මං ඔයාට කලිනුත් කිව්වා... ඇයි මං ඒවා ඔයාට කියන්නේ? මගෙන් මෙහෙම දේවල් අහන්න ඔයා මගේ කවුරු කියලද හිතන් ඉන්නේ?"*

කෙත්මිගේ පැනයෙන් අසිත මොහොතකට ගොළු වී ගියේය. හංසි කෙත්මි දෙස බැලුවේ උඹ හරි කියන්නට ය. කතා කළ යුත්තේ එසේය.

*"මං දන්නවා ඔයා මාත් එක්ක තරහින් ඉන්නේ කියලා. ඒත් කෙත්මී... ඒ දේවල් වලට කලින් අපි හොඳ යාළුවෝ නේද? යාළුවෙක් කියලා හිතලවත් මගේ ප්‍රශ්නෙට උත්තරයක් දෙන්න ඔයාට බැරිද?"*

*"යාළුවෝ? හහ්... ඒ ඉස්සර.. දැන් මට නම් ඔයාව යාළුකමටවත් සුදුසු කෙනෙක් නෙමෙයි. මං ආශ්‍රය කරන්නේ කවුද... නැත්තේ කවුද කියන එක මං බලා ගන්නම්.. ඔයා ඒ ගැන වද වෙන්න වුවමනාවක් නෑ. කරුණාකරලා ෆෝන් එක තියන්න...."*

*"කෙත්මි......"*

අසිත තවත් මොන මොනවා හෝ කියන්නට උත්සහ කලද කෙත්මි ඇමතුම විසන්ධි කොට දුරකතනය මේසය මතට දැමුවාය.

හංසි කිසිවක්ම නොකියා කෙත්මි දෙස බලා උන්නේ ඇයම කතා කරන තුරුය. ඇය මේ තරම් ශක්තිමත්ව අසිත සමඟ කතා කරාවි යැයි හංසි නොසිතුවාය. එක අතකින් හංසිට සතුටක් ද දැනුණි.

*"එයා මොනවා හරි දැනගෙන වගේ හංසි...."*

*"ඔව්. ඒක මටත් හිතුනා. ඒත් කවුද එයාට මේ දේවල් කියන්න ඇත්තේ?"*

*"මටත් හිතා ගන්න බෑ... ඒත් හංසි එයා දන්නව නම් මට මේ දේවල් කිව්වේ සංදේශ් කියලා ඒ දෙන්නා අතර ප්‍රශ්නයක් ඇතිවෙයිද කියලා මට බයයි..."*

*"කෙත්මි, මේ අහපන් කෙල්ල... මං නම් එහෙම හිතන්නේ නෑ. අසිත තව ටික දවසකින් සමාධිව මැරි කරනවා. එතකොට සංදේශ් එයාගේ මස්සිනා. මං මෙහෙම කිව්වට උඹ මා එක්ක තරහා වෙන්න එපා...*

sinhalaebooks.com

*උඹ හිතනවද උඹ නිසා, උඹට මේ දේවල් කිව්වා කියලා එයා සංදේශ් එක්ක පැටලෙයි කියලා?*

*එහෙම වෙන්නේ නෑ කෙල්ලේ. අසිත කියන්නේ මොන විදිහේ කෙනෙක්ද කියලා අපි දැන් දන්නවනේ. එයා මේ වෙලාවේ ඔය දේවල් එහේ කතා කරන්නේ නෑ. එහෙම නම් එයාට උඹට කතා නොකර සංදේශ්ගෙන්ම මේවා දැන ගන්න තිබ්බානේ...”*

හංසිට පිළිතුරු දෙන්නටත් පෙරම යළිත් කෙත්මිගේ දුරකතනය නාද වන්නට විය. තිරයේ දිස් වුනේ සංදේශ්ගේ අංකයයි. එවිට නම් හංසිද කෙත්මි කී දේ ම සිතුණි..

*“මේ මොකද බං වෙන්නේ? දැන් නම් මටත් හිතෙනවා උඹ කිව්ව විදිහේ දෙයක් වෙලාවත්ද කියලා....”*

*“හෙලෝ....”*

කෙත්මිද ඇමතුමට සම්බන්ධ වූයේ දෙගිඩියාවෙනි. හවස තමා සංදේශ්ට ඇමතූ බවක්වත් දැන් ඇයට මතක නැත.

*“නංගී... ඔයා මට හවස අරන් තිබ්බා....”*

සංදේශ් කියද්දී කෙත්මිට සැනසුමක් දැනුණි. මේ කතා කර ඇත්තේ තමා හවස කතා කළ නිසාය.

*“ආ ඔව්... අයියාගෙන් මිස් කෝල්ස් ගොඩක් තිබ්බ නිසා මං අරන් බැලුවේ..”*

*“මං නිකම් ගත්තේ නංගී. ඔයා ආන්සර් කළේ නැති නිසයි මං ආයේ ආයේ අරන් බැලුවේ... මොකුත් කරදරයක්ද කියලා....”*

*“අනේ සොරි අයියේ... මං හවස ටිකක් නිදා ගත්තා. හදිස්සියේ කතා කරන්න කවුරුත් නැති නිසා ෆෝන් එක සයිලන්ට් දාලා තිබ්බේ..”*

*“ඒකට කමක් නෑ. කරදරයක් නැත්තං එච්චරයි නංගී... කොහෙද ඔයා කතා කළා කියලා මට පණිවිඩේ ලැබුණේ දැන් නේ...”*

*“අක්කට අමතක වෙන්න ඇති...”* කෙත්මි කියද්දී සංදේශ්ට සිනහවක් නැඟුණි.

*“ඇයි අයියේ හිනාවෙන්නේ?”*

sinhalaebooks.com

*"ඒ බඩ්ඩට ඔය වගේ දේවල් ලේසියකට අමතක වෙන්නේ නෑ. ඒකි අද ඔය පණිවිඩේ කෑම මේසෙදි කියන්න තියන් ඉදලා... අම්මට කියනවා අයියගේ වෙඩින් එකත් ලෑස්ති කරන්න වෙයිලු..."*

ඒ කතාවට නම් කෙත්මිට ද සිනහවක් නැඟුණි. සමාධි එහෙනම් තමාගෙන් නමද අසාගෙන අයියාව විහිළුවට ගෙන තිබේ.

*"නංගිට කියන්න... මං කොහොමත් ගෑණු ළමයි ගැන වැඩිය කැමැත්තක් නෑ. ඒක හැමෝම දන්නවා.. අද සමාධි ඕක කියද්දී ඔක්කොමලා හොල්මන් වෙලා ගියා..."*

සංදේශ් කියද්දී කෙත්මිට අළුතෙන් සිතන්නට දෙයක් ඉතුරු විය. සමාධිට ඉන්නේ අම්මාත් අයියාත් පමණි. මේ කතාවෙන් පුදුම විය යුත්තේ අම්මා පමණි. එහෙත් සංදේශ් කිව්වේ ඔක්කොමලා කියාය. ඒ කියන්නේ බැරිවෙලාවත් එතැන....

කෙත්මිට මීට ටික වෙලාවකට පෙර අසිතගෙන් ලැබුණ ඇමතුම සිහි විය. සංදේශ් ද පණිවිඩය දැන ගන්නට ඇත්තේ දැන් ය. එසේ නම් සංදේශ් ඔක්කොමලා කිව්වේ අසිතටත් එක්ක ද?

***"නංගි.... රිතූ......"***

සංදේශ් කතා කළේ කෙත්මිගේ සද්දයක් නැති නිසාය.

***"ඇහුවට මොකුත් හිතන්න එපා අයියේ. ඔක්කොමලා කිව්වේ එතන අසිතත්....."***

සංදේශ් තිගැස්සී ගියේ ය. අසිත මෙහි සිටින බවක් කෙත්මි දන්නේ කෙසේද?

***"නංගී.... ඔ...ඔයා.. කොහොමද...."***

***"හිටියා නේද අයියේ...?"***

***"ඔව්. එයත් හිටියා තමයි. ඒත් ඔයා කොහොමද ඒක දන්නේ?"***

***"මේකයි අයියේ....."***

කෙත්මි සිදුවූ සියල්ල සංදේශ්ට කීවාය. මේ ගැන ඔහුට සඟවා පලක් නැත. සමහර විට අසිත මේ ගැන ඉඩක් ලද විටක ඔහුගෙන් අසනු ඇත.

sinhalaebooks.com

"ඔයා කතා කරලා තියන විදිහ හරි නංගි. මිනිහා ඔයාගේ නම ඇහෙද්දී ගැස්සිලා මගේ දිහා බැලුවේ. මගෙන් ඔය ගැන කෙලින්ම අහන්න බැරි නිසයි ඔයාගෙන් අහන්න ඇත්තේ.."

"ම්..... මටත් හිතෙන්නේ ඒක තමයි වෙන්න ඇත්තේ. සමහර විට අයියගෙනුත් අහයි."

"ඇහුවොත් උත්තර දෙන හැටි මම දන්නවා නංගී... ඔයා දැන් ඒ ගැන හිතන්න එපා..."

sinhalaebooks.com

17.

මැයි විසිහතර වෙනිදාට හිරු උදාවුණේ ජීවිත කිහිපයකම ඉරණම් තීන්දුවත් කරපින්නාගෙනය. ඔව්... අසිතගේත් සමාධිගේත් විවාහය.

හංසි කාමරයට එද්දී කෙත්මි උන්නේ ඇඳමතට වී කල්පනා කරමිනි.

***"කෙත්මියෝ....."***

ඇය දුවගෙනවිත් කෙත්මිව වැළඳගත්තාය.

***"අද අමාරු දවසක් බව මං දන්නවා.. ඒත් ඒ දේවල් ඒ වෙන්නේ හොඳම විදිහට කියලා අපි හිතා ගමු කෙල්ලේ. අද දවස අපි හෙමීට ගෙවලා දාමු. මං දන්නවා ඔයාට අද සුබ දවසක් නෙමෙයි. ඒත් මං මගේ හොඳම යාළුවට විෂ් කරන්නම ඕනනේ... හැපී බර්ත් ඩේ කෙල්ලේ.."***

කෙත්මිගේ මුවඟ සිනහවක් නැඟුණේ මෙම ආදරණීය මිතුරිය වෙනුවෙනි.

sinhalaebooks.com

*"තැන්ක් යූ හංසි.."*

*"සුදු අක්කා... හැපි බර්ත් ඩේ...."*

රනුක් කෑගසාගෙන ඇවිත් කෙත්මිගේ ඇඳට පැන්නේය. ඒ පසු පසින්ම අම්මාත් තාත්තාත් කාමරයට ඇතුළු වූහ. කෙත්මි ඇඳෙන් බැස දෙදෙනාටම වැන්දාය..

*"හැපි බර්ත් ඩේ දෝණි....."*

කියමින් දෙදෙනාම කෙත්මිව තුරුළු කර ගත්තෝය. *"අම්මා... තාත්තා... පුළුවන් නම් මං අද කරන්න යන දේට මට සමාව දෙන්න.. හිත ගලක් කරන් ඉන්න හැදුවට මේ වේදනාව දරා ගන්න මට හරිම අමාරුයි... මට සමාවෙන්න..."* කෙත්මි අම්මාටත් තාත්තාටත් තුරුළු වී සිතින් මිමිණුවාය.

*"හරි හරි... දැන් ඉක්මනට ලෑස්ති වෙන්න. මං ඔයාලව සැලෝන් එකෙන් දාන්නද?"*

*"එපා තාත්තා. මං මගේ වාහනේ අරන් යන්නම්. සැලෝන් එකේ ටිකක් වෙලා යනවනේ. ඉවර වෙලා එහෙමම හොටෙල් එකට එන්නම්. ඔයාලා ලෑස්ති වෙලා යන්න.."*

sinhalaebooks.com

*"හරි එහෙනම්... පරිස්සමින් ඩ්‍රයිව් කරන්න සුදූ...."*

අම්මාත් තාත්තාත් පිටව ගිය පසු කෙත්මි සුසුමක් හෙලා ඇඳෙන් වාඩි වූවාය...

*"සුදු අක්කා...."*

*"ම්... ඇයි..?"*

*"තමුසේ තවත් මට හංගන්න හදන්න එපා සුදූ. මං දන්නවා ඔයා එයාට ආදරේ කරපු බව... ඒත් මට හිතා ගන්න බෑ මෙහෙම වුණේ කොහොමද කියලා නම්. කොහොම හරි... දැන් මේ දේවල් තීරණය වෙලා ඉවරයි. අපට ඒවා නවත්තන්න බෑ..."*

කෙත්මිත් හංසිත් රනුක්ට කතා කරන්නට ඉඩ දී නිහඩව සිටියෝය..

*"අක්කා මට මේක කියන්න.."*

*"මොකක්ද මල්ලී.?"*

sinhalaebooks.com

*“මේක කරන්නම ඕනද? ඔයාට විශ්වාසද අද මේ ගමන ගිහිල්ලා එතන වෙන දේවල් ඔයාට දරා ගන්න පුළුවන් කියලා? මොකද අද මේ යන්න හදන්නේ ඔයා අවුරුදු ගානක් ආදරේ කරපු... සමහරවිට අදටත් ආදරේ කරන කෙනාගේ වෙඩින් එකට සුදූ...”*

රනුක් කියන්නේ සැබෑවකි.. තමාගේ ආදරය වෙන කෙනෙකුට නීතියෙන්ම හිමිවන අයුරු බලා සිටීම... ඒ අහිමි වීම දරා සිටීම කෙනෙකුට පුළුවන්ද? හංසි ද උන්නේ මේ කතාව කෙත්මිගෙන් අසන්නටය.

*“ඔව් කෙත්මියෝ... ඔයාට දැන් වුණත් පුළුවන් මේ ගමන යනවද නැද්ද කියලා තව සැරයක් හිතන්න...”*

*“ඒක තමයි අක්කේ... මං අම්මලාව ෂේප් කරලා දෙන්නම්....”*

*“එපා මල්ලී.* හංසි, *මං අද මේ ගමන යන්නම ඕන. එදා එයාට යන්න කිව්වට මං අදටත් හිතිං එයාට ආදරේ කරනවා. ඒකයි ඇත්ත. මට එයාව අමතක කරන්න බෑ... අද මං මගේ ඇස් දෙකෙන්ම දකින්න ඕන එයා සමාධිට අයිති වෙනවා. එතකොටවත් මගේ හිත ඇත්ත තේරුම් ගනියි...”*

sinhalaebooks.com

***“ඒත් සුදූ මේකෙන් වෙන්නේ...”***

***“ඇති මල්ලී... මං යන්න තීරණය කරලා ඉවරයි.*** හංසි ***ඔයාගේ බඩු ටිකත් ගන්න.. අපි යමු.. මල්ලී ඔයත් දැන් ගිහින් ලෑස්ති වෙන්න..”***

************************

කෙත්මි හෝටලය වෙත ආවේ හිතාමතාම මදක් පමා වී ය. ඒ වන විටත් අම්මලා පැමිණ පැයකට වැඩිය. හංසි නිහඬවම කෙත්මි කරන දේවල් දෙස විමසිල්ලෙන් බලා උන්නේ ඇයට අද දවස ගෙවා දමන්නට අමාරු බව දැන උන් නිසාය.

වාහනය නතර කළ සුසුමක් හෙළූ කෙත්මි හංසි දෙසත් බලා වාහනයෙන් බැස්සාය. හංසිද ඇය අනුවම බැස උත්සව ශාලාව දෙසට ඇවිද ගියාය.

ශාලාවේ දොරටුව අසලට වී තවත් අයෙකු සමඟ මග බලා සිටින දිලූෂව දුටු කෙත්මි හෙමිහිට හිස හරවා හංසි දෙස බැලුවාය. ඇයගේ මුහුණේ සුන්දර සිනහවක් ඇඳී තිබුණි. මේ දෙදෙනා අතර කුමක් හෝ සිදුවන බව කෙත්මිට ඉව වැටුණේ මුල සිටම ය.

sinhalaebooks.com

***“ආන්න ඉන්නවා මඟ බලාගෙන...”***

***“කවුද?”***

හංසි කිසිවක් නොදන්නා අයුරින් ඇසුවාය.

***“මගේ නම් අයියා... අනිත් අයගේ නම් කවුද කියලා පොඩ්ඩක් හිතලා බලන්න වෙයි වගේ....”***

කෙත්මි බොහෝ වෙලාවකට පසු සිනාසෙමින් කීවාය. හංසි ඇයගේ උරහිසට පහරක් ගැසුවද යමක් කියාගත නොහැකි වූයේ දිලූෂ ඔවුන් අසලට ආ බැවිනි.

***“ෂා මේ දෙන්නගේ ලස්සන බලන්න එපැයි... නැද්ද සංදේශ්...?”***

දිලූෂ කියන විට කෙත්මි ඉක්මනින් හිස හරවා ඔහුත් සමඟ සිටි කඩවසම් තරුණයා දෙස බැලුවාය. එසේ නම් මේ සමාධිගේ අයියාය.

සංදේශ් ඈත සිටම කෙත්මි දෙස බලා උන්නේ අදහා ගත නොහැකිවය. අද ඇය ඒ තරම් සුන්දරය. තනි කළු පැහැති සාරියත් උරහිසෙන් මදක් පහළට කඩා හැලෙන වරලසත් ඇයට ගෙන ආවේ අමුතුම ලස්සනකි.

sinhalaebooks.com

*"හැපි බර්ත් ඩේ සුදූ..."*

දිලූෂ ඇයව වැළඳ ගනිමින් කියද්දී සංදේශ්ගේ දෙනෙත් පුදුමයෙන් විසල් විය.

*"අනේ අද ද බර්ත් ඩේ එක... හැපි බර්ත් ඩේ නංගී..."*

සංදේශ් ඇයට අතට අත දෙමින් කිවේ හදවතට නැගෙන වේදනාව සඟවාගෙනය. 'අපි විෂ් කලාට මේ කෙල්ලට අද දවස සමරන්න පුළුවන්ද ඉතිං?'

*"හංසි... පොඩ්ඩක් එනවකෝ..."*

*"කොහේ යන්න ද?"*

*"පණ්ඩිතයා නොවී එනවකෝ ටිකකට. තමුසෙව ගිලින්නේ නෑ..."*

දිලූෂ හංසිව එහාට ඇදගෙන ගියේ කෙත්මිටත් සංදේශ්ටත් කතා කරන්නට ඉඩ ලබා දෙමිනි.

*"යමු නංගි ඇතුළට"* සංදේශ් ඉස්සර වූවේය.

sinhalaebooks.com

ශාලාවේ දොරෙන් ඇතුළු වද්දීම ඇත කොණක වාඩි වී සිටින මනාල යුවල දුටු කෙත්මි එහෙම්ම ම නතර වූවාය. සංදේශ් ඇයගේ වෙනස හොඳින් අඳුනාගෙන ඇයගේ සුරත තරයේ අල්ලා ගත්තේය.

*"මට සමාවෙන්න නංගි... අපි එක්කෝ එළියට යමු. ඔයා මේක කරන්න ඕන නෑ... මං දන්නවා මේක ඔයාට ලොකු වේදනාවක්..."*

සංදේශ් කීවේ ඇයව එකවරම ඇතුළට රැගෙන ඒම ගැන සිත ඇතුලෙන් තමාටම බැන ගනිමිනි.

*"නෑ අයියේ... මං දැන් කීයටවත් ආපහු හැරෙන්නේ නෑ..."*

*"රිතූ..."*

*"අපි යමු එයාලා ළඟට"*

කියමින් කෙත්මි සංදේශ් තවමත් ඇයගේ අතින් අල්ලාගෙන සිටිද්දීම ඉදිරියට ගියා ය.

sinhalaebooks.com

ශාලාව පිරෙන්නට සෙනඟ සිටියත් සමාධි අයියාත් සමඟ ඇතුළට ආ යුවතිය හොඳින් දුටුවාය. ඇය දොර අසල නවතිද්දී අයියා ඇයගේ අතකින් අල්ලා ගන්නවා දුටු සමාධිගේ දෙනෙත් පුදුමයෙන් විසල් විය.

ගැහැණු ළමයෙක් දෙස වැරදිලාවත් නොබලන අයියා මේ තරම් සෙනගක් මැද ගැණු ළමයෙක්ගේ අතින් අල්ලාගෙන එන අයුරු අම්මා දුටුවේ නම් පපුවේ අමාරුවක් හැදෙන බව විශ්වාසය.

සමාධි අසිතගේ අතකින් අල්ලාගෙනම නැගිට්ටේ ඔවුන් වෙත යන්නටය.

*"රිතූ... මේ ඉන්නේ මගේ නංගි. සමාධි..."*

සංදේශ් ඔවුන් අසලට පැමිණ කියද්දී සමාධි ලස්සන සිනහවක් නැගුවාය. 'එහෙනම් මෙයයි රිතූ.. ලස්සන ළමයෙක්. අයියගේ තේරීම මරුනේ...'

*"පැංචී... මේ රිතූ. මගේ යාළුවෙක් ඊටත් වැඩිය අසිතලාගේ ෆැමිලි ෆ්‍රෙන්ඩ්ස්ලා..."*

සංදේශ් කියද්දී සමාධි 'ආ ඇත්තද' කියා අසන්නට මෙන් මෙතෙක් සංදේශ් අල්ලාගෙන සිටි කෙත්මිගේ සුරත දෙස බැලුවාය.

sinhalaebooks.com

දෙදෙනාටම එය සිහි වූයේ ඒ මොහොතේය. සංදේශ් ඉක්මනින් කෙත්මිගේ අත අතහරිද්දී සමාධි සිනහවක් නැඟුවේ ලැජ්ජාවෙන් රතුවූ කෙත්මි දෙස බලා ය. කෙත්මි ඉක්මනින්ම පියවි සිහයට පත්වී සමාධි අසලටම ගියාය.

*"කන්ග්‍රැජුලේෂන්ස් අක්කී"*

කෙත්මි සමාධිව වැළඳගනිමින් කීවාය. අසිත මේ වන දේවල් දෙස පුදුමයෙන් බලා සිටියේය. ඔහු සිතා උන්නේ අද කෙත්මි එන එකක් නැතැයි කියාය. සියල්ලටමත් වඩා කෙත්මි සංදේශ් සමඟින් මෙසේ ආ එක ඔහුට අදහන්නට බැරිය.

*"අයියා මොන විදිහට අඳුන්වලා දුන්නත් මං දන්නවා කෙල්ලේ ඔයා මගේ නෑනා කියලා..."*

සමාධි රහසින් කියද්දී කෙත්මි සිනහවක් පා හිස වැනුවේ එය එසේ නොවේ කියන්නට ය. නමුත් සමාධි එය පිළිනොගත් අයුරින් සිනහවක් පෑවාය.

*"මං පොඩ්ඩක් අම්මලා ඉන්න තැනට ගිහින් එන්නම් අයියේ... මං ආවා කියලා දන්නෙත් නෑ නේ තාම..."*

sinhalaebooks.com

තවත් පිරිසක් විත් මනමාල ජෝඩුව වට කර ගනිද්දී කෙත්මි එසේ කියා සංදේශ්ගෙන් වෙන්වී එහාට ගියා ය.

කෙත්මි පසුපසින්ම එළියට යන්නට සංදේශ් සිතුවද ඔහුගේ මිතුරන් පිරිසක් පැමිණ ඔහුව වට කර ගත්තෙන් ඇයව මඟහැරුණි.

******************

ටිකෙන් ටික හැන්දෑව උදා වුණේ කාටත් නොදැනීය. සැවොම ශාලාව තුළ සතුටුවද්දී රනුක් හංසිව සොයාගෙන ගියේ කලබලයෙනි. දැන් බොහෝ වෙලාවක සිට අක්කා පෙනේන්නට නැත.

හංසි දිලූෂත් සමඟ කතා කරමින් සිටිනු දකිද්දී රනුක්ගේ හිස ගිනි ගත්තේය. අක්කා ඔවුන් සමඟත් නැත.

*"හංසියෝ..."*

***"මොකද බං මේ යකෙක් දැකලා වගේ?"***

දිලූෂ ඇසුවේ රනුක්ගේ බියපත් ස්වරූපය නිසාය.

sinhalaebooks.com

***"යකෙක් නෙමෙයි. මට කියපං උඹලා දෙන්නගෙන් එක්කෙනෙක් හරි අපේ අක්කව දැක්කද?"***

***"කෙත්මි...?"***

***"සුදූ...! ඇයි සුදූ ඔයාලා එක්ක නෙමෙයිද හිටියේ?"***

***"නෑ... අපි ළඟට ආවේ නෑ..."***

***"සමහර විට සංදේශ් අයියලා එක්කද දන්නේ නෑ... යමු බලන්න."***කියමින් හංසි ඉස්සර වූවාය.

සංදේශ් උන්නේ මිතුරන් සමඟ සතුට සමරමිනි. හංසි ඔහු අසලටම යන තුරු ඔහු ඇයව නොදුටුවේය.

***"ස.. සංදේශ් අයියේ..."***

පසුපසින් ඇසුණු නුහුරු හඬට සංදේශ් හැරී බැලුවේ පුදුමයෙනි. මීට පෙර එක වරක් පමණක් මුණ

sinhalaebooks.com

ගැසුණෑද මේ රිතූගේ මිතුරිය බව හඳුනා ගැනීමට ඔහු සමත් වූවේ ය.

*"ආ... නංගි.."*

*"අයියේ අපේ කෙත්මිව දැක්කද?"*

*"රිතූ නංගි? ඇයි එයා අම්මලා ළඟට යනවා කියලා ගියානේ..."*

*"කොයි වෙලාවෙද?"*

*"දැන් ගොඩක් වෙලා..."*

*"අක්කා අපි ළඟට ආවේ නෑනේ අයියේ..."*

රනුක් කියද්දී සංදේශ් පුදුමයෙන් ඔහු දෙස බැලුවේය. වහාම මිතුරන්ට මදකට සමුදුන් ඔහු රනුක්ලා සමඟින් එකතු වූයේ කෙත්මිව සොයන්නටය.

දිලූෂ වාහන නවතා තිබූ තැනට ගියේ කෙත්මිගේ වාහනය තිබේ දැයි බලන්නටය. එය

එතැනමය. ඔහුට මද සැනසුමක් දැණුනේ කෙත්මි මෙහිම කොහේට හෝ වී ඇති බව සිතද්දී ය.

*"කාර් එක තියෙනවා. මෙහේ කොහේ හරිම තමයි ඇත්තේ..."*

*"සමහර විට බීච් එකේද දන්නේ නෑ...."*

කියමින් වෙරළ දෙසට යන්නට තනා තිබූ කුඩා පාරකින් සංදේශ් ඉස්සර වූවේය. අනෙක් තිදෙනාම ඔහුගේ පසුපසින් විය.

ඈතට යන තුරුම පැහැදිලිව පේන වෙරළ තීරයේ කිසිවෙකුත් පෙනෙන්නට නොවෙද්දී සංදේශ් ආපසු හැරුණේ ඇය කොහේට ගියාදැයි සිතමිනි.

*"දෙයියනේ..."*

අහම්බෙන් මෙන් දුටු දසුන නිසා ඔහු තිගැස්සී ගියේය. ඒ ඇය නොවේද?

කෙත්මි උන්නේ  වෙරළේ සිට මුහුදේ මද දුරක් යන තුරු ලස්සනට තනා තිබූ දිගු පාලමේ කෙලවරේය. මද දුරක් ගියද ඇය සිටින දෙස අවදානම්

sinhalaebooks.com

බව සඳහන් බෝඩ් එකක්ද තිබියදී කෙත්මි එතැනට ගියේ ඇයි?

***"මට මේක දරා ගන්න හරි අමාරුයි අම්මේ... එයා නැති ලෝකයක් ගැන මට හිතා ගන්න බෑ... පොඩි කාලේ ඉඳලා මේ වෙනකම් එයා මගේ හීනවල හිටියා. අවුරුදු විස්සකට පස්සේ මං කොහොමද එයා නැතුව ඉස්සරහට යන්නේ? මං හිතුවා පුළුවන් වෙයි කියලා. ඒත් මට ඒක කරන්න බෑ අම්මේ... තාත්තේ... මල්ලී... හංසි.. මට සමාවෙන්න. මං නිසා ඔයාලත් දුක් විඳිනවා. දැන් ඇති... සමාවෙන්න..."***

කෙත්මි පාලම මත සිටගෙන තනිවම කතා කළේ වෙරළ දෙසට පිටුපාගෙනය. ඒ නිසාම ඇය වෙරළට එන පිරිස නොදුටුවාය.

හංසිත් දිලූෂත් සංදේශ් වෙත ආවේ ඔහු ගල්ගැසී නතරවී සිටිද්දීය. ඔවුන් තවම කෙත්මිව නොදුටුවෝය. කෙත්මි දෑත් විහිදා මුහුද දෙසට බර වෙද්දී ඇයව දුටුවේ රනුක්ය

***"අක්කේ...."***

***"දෙයියනේ කෙත්මි..."***

sinhalaebooks.com

*"ඕක කරන්න එපා සුදූ..."*

රනුක්, හංසි, දිලූෂ කොතරම් කෑ ගැසුවද පලක් නොවීය. ඒ කිසිවක් කෙත්මිට ඇසුණේ නැත. ඇය ඒ වන විටත් මුහුදු රළ අතරට වැටී අවසන්ය.

*"දෙයියනේ... මොකක්ද මේ කළේ..."*

සංදේශ් ඇඳගෙන සිටි කෝට් එක ගලවා තබා සපත්තු ගලවන අතරේම මුහුද දෙසට දුවන්නට වූවේය.

*"හංසි...."*

කෙත්මි මුහුදට වැටෙනවා දුටු හංසි සිහිසුන්ව වැටුණේ දිලූෂගේ දෑතටය. දිලූෂ එහෙම්මම ඇයව වෙරළේ දිගා කර රනුක්ට ඇය ගැන බලන්නට කියා සංදේශ් ගිය දෙසට දුවන්නට වූවේය.

sinhalaebooks.com

18.

*"කෙත්මි..."*

කෙත්මිගේ ඇඳ අසලටම වී සිටි හංසි ඇය යන්තමින් දෙනෙත් විවර කරද්දී කලබලයෙන් නැඟිට්ටාය. දෑස් හැර බැලූ කෙත්මි වටපිට බැලුවේ තමා ඉන්නේ කොහෙදැයි දැන ගැනීමටය.

*"අනේ ඩොක්ටර්... එයාට සිහිය ආවා."*

හංසි රෝහල් කාමරයෙන් පිටතට දුවමින් කෑ ගැසුවාය. ඒත් සමඟම පිටත කෙත්මිගේ අම්මලා සමඟ කතා කරමින් සිටි වෛද්‍යවරයාත් පිටත සිටි පිරිසත් කෙත්මි සිටි කාමරයට ගියේ දුවගෙන වාගේය.

*"දුව... දැන් කොහොමද ඔයාට? මොකුත් අපහසුවක් දැනෙනවද?"*

වෛද්‍යවරයා ඇයට ළං වී අසද්දී ඇය හිස වැනුවේ නැතැයි කියන්නටය.

sinhalaebooks.com

***"තරුණ ළමයි මීට වඩා කල්පනා කරලා බලලා තීරණ ගන්න ඕන. තේරුනාද? හරි නම් මේක පොලීසි යන්න ඕන ප්‍රශ්නයක්."*** කී වෛද්‍යවරයා පිටව ගියේ හෙදියකට යමක් පවසමිනි.

කෙත්මි බැලුවේ තමා දෙස බලා සිටින අම්මාත් තාත්තාත් දෙසය. ඇස්වල කඳුළු පුරවාගෙන බලා සිටින ඔවුන්ව දකිද්දී කෙත්මිට දැනුණේ මහා වරදකාරී හැඟීමකි.

***"අම්මා... මට... මට... සමාවෙන්න අම්මා. අනේ... තාත්තා..."*** කෙත්මි හැඬුම් අතරින් කියද්දී අම්මාත් තාත්තාත් ඇය අසලට ළංවී ඇයගේ දෑත්වලින් අල්ලා ගත්තෝය.

***"ඔයා.. අපිව දාලා යන්නද හැදුවේ සුදූ?"***

***"ඇයි පුතේ මේ? මගේ කෙල්ල එහෙම දුර්වල කෙල්ලෙක් නෙමෙයිනේ... ඔයාට හිතේ හිරකරන් ඉන්නේ නැතුව ඒ දේවල් අපිට කියන්න තිබුණා පුතේ."***

***"එක්ස්කියුස් මී... පේෂන්ට්ගේ පේරන්ට්ස්ලාට ඩොක්ටර් ටිකක් කතා කරනවා."*** ඒ මොහොතේ එතනට ආ හෙදියක් කියද්දී කෙත්මිගේ

sinhalaebooks.com

අම්මාත් තාත්තාත් පිටතට ගියේ කෙත්මි, හංසි, දිලූෂ හා රනුක් කාමරය තුළ ඉතිරිවද්දීය.

හංසි ගොසින් කෙත්මිගේ අතක් දෝතට මැදිකර ගත්තේ හඬමිනි. රනුක්ද මේ දෙස බලා සිටියේ දුකෙනි. ඔහුත් සමඟම දිලූෂත් ඇය අසලට ඇවිද ආවේය.

*"අ... අයියේ.."*

කෙත්මිට තවත් කිසිවක් කියන්නට ඉඩක් නොතබාම දිලූෂ කෙත්මිගේ කම්මුලට පහරක් ගැසුවේ හිතේ කේන්තියට ය.

*"අනේ අයියේ..."* හංසි කෑ ගසමින් දිලූෂගේ අතක එල්ලුණාය.

*"තමුසේ පැත්තකට වෙලා ඉන්නවා."* කියා හංසිට සැර කළ ඔහු කෙත්මි වෙත ළං වූවේය.

***"තමුසෙට දැන් සතුටුද සුදූ... ආ? සතුටුද? ජේනවද අර මිනිස්සුන්ගේ ඇස්වල තියෙන කඳුළු? උඹ වෙනුවෙන් ඉන්න බැරි වුණ එකෙක් නිසා උඹ මේ සේරම අත ඇරලා යන්නද හැදුවේ? යනවා නම් පලයං. හැබැයි ඊට කලින් උඹ වහ කුප්පියක් ගෙනල්ලා***

sinhalaebooks.com

*මේ හැම කෙනාටම ටික ටික දීලා ඉදපං. මොකද මේ කාටවත් උඹ නැති ජීවිතයක් නෑ.”*

*“මට සමාවෙන්න අයියේ...”*

*“සමාව ඉල්ලලා වැඩක් තියෙද සුදූ මොනවා හරි වුණානම්? අද අර සංදේශ් හිටියේ නැත්තං... ෂිට්. කොහොමද තමුසේ ඔච්චර දෙයක් කරන්න හිතුවේවත් සුදූ. උඹට අම්මායි තාත්තායි ගැන හිතන්න බැරි වුණාද? මල්ලි ගැන? මේ... මෙකි..”*

දිලූෂ අත දිගු කලේ පැත්තකට වී ඉකිබිඳින හංසි දෙසටය. කෙත්මිත් ඒ අනුවම ඇය දෙස බැලුවාය.

*“මෙකි උඹේ ජීවිතේ නොදන්නේ මොනවද? උඹේ සහෝදරී වගේ ඉන්න එකී එක්කවත් මේවා කියලා හිත නිදහස් කර ගන්න බැරි වුණාද? උඹ ගිහින් මුහුද පනිද්දී බලන් හිටපු මෙකි සිහිය නැතුව ඇදගෙන වැටුණේ. මෝඩයි කියලා ඔහොම වැඩ කරන්න එපා බං. උඹ ඔය සෙල්ලම් කරන්නේ උඹ වටේ ඉන්න හැමෝගෙම ජීවිතත් එක්ක. අන්න ඒක මතක තියා ගනිං.”*

කේන්තියෙන් කියා ඇමූ දිලූෂ කාමරයෙන් පිටතට ගියේ තවත් සිටියහොත් මොනවා කියවේවිදැයි නොදන්නා නිසාය.

"සුදු අක්කේ... අයියා හිතේ දුකට ඔය කියවන්නේ..."

"අනේ ඔව් කෙත්මි. ඔයා දැන් ඒවා හිතන්න එපා කෙල්ලේ. ඔයා බේරුණු එකම ඇති අපට."

"මට සමාවෙන්න හංසි."

"දැන් ඒක වෙලා ඉවරයි කෙල්ලේ... කවුරු නැතත් උඹට අපි ඉන්නවා බං. මේක දරා ගන්න අමාරුයි තමයි. ඒත් අපි හිත හදා ගමු කෙල්ලේ. ඔයාට ඒක කරන්න පුළුවන්."

"කවුද මාව මෙහෙට ගෙනාවේ?"

"සංදේශ් අයියා."

"ස.. සංදේශ් අයියා? කෝ එයා?"

"එයා ගියා කෙත්මි. වෙඩින් එකේ වැඩවලට එයා ඉන්න ඕන නිසා."

*"තමුසේගේ වෙලාවට හොදේ සංදේශ් අයියා ගියේ."* රනුක් කීවේ සුපුරුදු දඟකාර හඬිනි.

*"ඒ මොකද?"*

*"හිටියා නම් අනිත් කනත් පලා ගන්න තිබ්බා. මඟදිගට බැන බැන ආවේ. මේකි මෙච්චර මෝඩියෙක්ද කියලා..."*

කෙත්මි හංසි දෙස බැලුවේ මේ ඇත්තදැයි අසන්නටය.

*"ඔව් බං. සංදේශ් අයියට හොඳටම තරහා ගිහින් හිටියේ. බුදු අම්මෝ... යකෙක් වගේ. හොඳ වෙලාවට උඹ සිහිය නැතුව හිටියේ. නැත්තං එතනම උඹව ඉවර කරනවා."*

************************

සංදේශ් තෙත් වූ ඇඳුම් මාරුකරගෙන යලිත් හෝටලයට එන විට මනාල යුවල පිටත්ව යන නැකත ළංව තිබුණි. සමාධිත් අසිතත් පවුලේ අයගෙන් සමුගනිද්දී සංදේශ්ට මැවී පෙනුණේ කෙත්මිගේ රුවයි.

*"අද රිතූගේ ජීවිතේට මොනවා හරි වුණොනම් උඹටවත් මටවත් මගේ නංගිටවත් කවදාවත් සැනසීමෙන් ඉන්න ලැබෙන එකක් නෑ අසිත.."* ඔහු තනිවම මුමුණා ගත්තේය.

*"අයියේ... කෝ අර නංගි?"*

*"මොන නංගිද පැංචි?"*

*"රිතූ අනේ... කෝ එයා? මං දැන ගොඩ වෙලාවක ඉඳලා හොයනවා."*

*"අහ්... මේ... රිතු... රිතූ මේ... අම්මලා එක්ක ගියානේ. එයාට එක්සැම් එකක් කියලා කලින්ම ගියා."*

*"හරි නරකයි. කියලවත් ගියේ නෑ මට. අල්ලා ගන්නම්කෝ මං ඇවිල්ලා.."* සමාධි කියද්දී සංදේශ්ගේ සිත ඇවිලී ගියේය.

*"මේ ඇත්ත උඹ දන්නවා නම් මොනවා වෙයිද පැංචි?"*

විවාහ උත්සවයේ වැඩ සියල්ල අවසන් කර රාත්‍රියේ සංදේශ් රෝහලට යන්නට සිතුවේ කෙත්මිව බලා එන්නටය.

හැන්දෑවේ ඇයට සිහිය ආ බව කතා කර කීවේ දිලූෂය. අම්මාටද බොරුවක් කියා සංදේශ් කෙලින්ම ආවේ රෝහලටය. කුමක්දෝ හේතුවකට ඔහුට ඇයව බැලීමට තදබල වුවමනාවක් මතුව තිබුණි.

ඒ වන විට කෙත්මිගේ අම්මාත් තාත්තාත් දිලූෂලාගේ නිවසට ගොස් තිබූ නිසා කෙත්මි අසල උන්නේ රනුක් සහ හංසි පමණි. කාමරයට ඇතුළු වූ සංදේශ් දකිද්දී කෙත්මි තිගැස්සුනේ රනුක් හවස කී කතාව නිසාය.

*"ආ... සංදේශ් අයියේ. එන්න."*

රනුක් සුහදව කතා කළේය. ඔහු නැති නම් අද අක්කාව බේරගන්නට නොලැබෙන්නට තිබූ බව මේ වන විට රනුක්ගේ සිතට තදින්ම කා වැදී තිබුණි. ඒ නිසාම රනුක්ගේ සිතේ ඔහු කෙරෙහි වූයේ ගෞරවයකි.

*"දැන් කොහොමද මෙයාට?"*

සංදේශ් කෙත්මි දෙස වරක්වත් නොබලාම රනුක් දෙසට හැරී ඇසුවේය.

sinhalaebooks.com

*"දැන් නම් අවුලක් නෑ අයියේ. හෙට ගෙදර යන්න පුළුවන් වෙයි කිව්වා."*

*"එහෙනම් කමක් නෑ."*

කී ඔහු කෙත්මි දෙස රවා බලද්දී කෙත්මි බිම බලා ගත්තේ වරදකාරී හැඟීමෙනි.

*"හංසි නංගී... ඔයාගෙ යාළුවාට කියන්න ආයෙත් ඔය වගේ මෝඩ වැඩ කරලා අහුවෙන්න එපා කියලා. කිසිම වැඩකට නැති මිනිහෙක් වෙනුවෙන් තමන්ට පෙර පිනකට ලැබුණු ජීවිතේ එක්ක සෙල්ලම් කරන එවුන් මට පෙන්නන්න බෑ. විනාස වෙන්නේ තමන්ගේ ජීවිතේ විරතරක් නෙමෙයි කියලා හිතන්න තරම් මොළයක් ඇති නේ ඔයාගේ යාළුවාට. මං යනවා.*

*බොහොම ඉස්තූතියි කියන්න මගේ නංගි වෙනුවෙන් කරපු දේවල් වලට. හැබැයි මේ වගේ දෙයක් හිතාගෙන නම් ඒක කලේ එයාට එහෙම නොකර ඉන්නයි තිබුණේ. මොනවා හරි වුණා නම් ඒ පව ගෙවන්න වෙන්නෙත් මට. මෙයාට කියන්න හංසි ආයේ කවදාවත් මට ඔය මූණ පෙන්නන්න එපා කියලා. මං හිතන් හිටියේ මගෙම නංගි වගේනේ කියලා. ඒක දැන් ඉවරයි. ආයේ කවදාවත් මගේ ඇස් ඉස්සරහට මේ වගේ අය හම්බෙන්න එපා කියලයි මං පතන්නේ. "*

sinhalaebooks.com

කී ඔහු යන්නට ගියේ තවත් වරක් කෙත්මි දෙසට නපුරු බැල්මක් හෙලාය.

*"අම්මෝ... ඒක. අක්කේ... තමුසේ ආයෙ නම් ඔය යකාට අහු වෙන්න එපා. තමුසෙව කෑලිවලට වෙන් කරයි."*

*"එයාටත් පේන්නේ මං කරපු දේවල් විතරයි."*

*"මේ කෙත්මි. ඔහොම හිටියාට සංදේශ් කියන්නේ හෙන මැරයෙක්ලු. කේන්ති ගියාම කවුද කියලා බලන්නේ නෑලු. එක පාරක් කාටදෝ ගහලා ඒ මිනිහා නොමැරි බේරුනේ නූලෙන්ලු. ඔහොම කතා කරලා බේරුණා ඇති."*

*"කවුද උඹට කිව්වේ?"*

*"වෙන කවුද ඉතිං... ටොමියා වෙන්න ඇති."* රනුක් සිනාසෙමින් කීවේ හංසි රවද්දීය.

sinhalaebooks.com

*"අනේ මේ... කටවහන් හිටපං බතලයෝ... ඒක නෙමෙයි කෙත්මි. දැන් උඹ මොකද කරන්න හිතන් ඉන්නේ? එක්සෑම් එකටත් වැඩි කාලයක් නෑ. උඹට පුළුවන්ද?"*

*"මට හිතා ගන්න බෑ* හංසි*. මගේ ඔළුව සම්පූර්ණයෙන්ම අවුල් වෙලා තියෙන්නේ..."*

*"අක්කේ මේ... තාත්තා තමුසෙව පුංචා ළඟට යවන්න හදන්නේ මං හිතන විදිහට..."*

*"ජර්මනියට?"* හංසි ඇසුවේ පුදුමයෙනි.

*"සමහරවිට..."*

*"කමක් නෑ. තාත්තා මාව යැව්වොත් මං යනවා. එයාලා කියන දේකට පිටින් මම යන්නේ නෑ."* කෙත්මි කීවේ සුසුමක් හෙලමිනි.

sinhalaebooks.com

(වසර තුනකට පසු.....)

sinhalaebooks.com

19.

*"මොන මඟුලක්ද උඹ කියවන්නේ රංග..."*

සංදේශ් කෑගැසුවේ මේසය මත තිබූ ෆයිල් කිහිපයක් ඈතට විසි වී යන ලෙස පහරක් එල්ල කරමිනි. රංග නිහඬව උන්නේ මෙය ඔහුට අමුතු දෙයක් නොවූ නිසාය. සංදේශ් කෝප වූ විට හැසිරෙන්නේ මේ අයුරින් බව ඔහු හොඳින්ම දනී.

*"මට හරියටම කියපං... මොකක්ද මෙතන වෙලා තියෙන්නේ?"*

*"අපි ඔසී වලට යවපු ෂිප්මන්ට් එක රිටන් වෙලා."*

*"රිටන් වෙලා... හේතුව?"*

*"රෝසස් වල කොලිටි එක මදි.. ඩැමේජ් කියලා රිටන් කරලා තියෙන්නේ. රෝසස් විතරක්*

sinhalaebooks.com

*නෙමෙයි ලිලීස් ටිකත් රිටන් වෙලා."*

*"කොලිටි එක මදි? ඩැමේජ්? මොන රෙද්දක්ද බං කියවන්නේ? ෆලවර් නසරි එකෙන් මොකද කියන්නේ?"*

*"එහෙන් කියනවා මල් වල අවුලක් තිබ්බේ නෑ කියලා. මට පේන විදිහට සංදේශ් පැකින්වලදී ප්‍රශ්නයක් වෙලා වගේ."*

*"ෂිට්... මේක ලොකු පාඩුක්නේ බං."*

*"ඊට වැඩිය ලොකු පාඩුවක් වෙන්න යන්නේ..."*

*"ඒ මොකද?"*

*"මේ ප්‍රශ්නේ නිසා ඔසී කම්පැනි එකෙන් අපේ ඇග්‍රිමන්ට් එක කැන්සල් කරන්න යනවා..."*

sinhalaebooks.com

*"වට්? එහෙම කරන්නේ කොහොමද? ගනිං අර මිස්ටර් ෆර්නෑන්ඩෝට කෝල් එකක්."*

*"මිනිහාට අරං වැඩක් නෑ බං. දැන් ඒ පොසිෂන් එකේ ඉන්නේ දිසානායක කියලා ශ්‍රී ලන්කන් ලේඩි කෙනෙක්ලු."*

*"කාට හරි ඉන්න එකෙක්ට ගනිං බං. මේක පොඩ්ඩක් කතා කරලා විසඳගන්න."*

*"අපි බැලුවා බං. ඒ ලේඩි අපිට ආයෙ කන්ට්‍රැක්ට් එක දෙන්න කැමතිම නෑ වගේ."*

*"මොන ***ද කියවන්නේ..."*

*"සංදේශ්... කලබල වෙලා මේක විසඳන්න බැනේ බං. අපි තව ටිකක් ට්‍රයි කරලා බලමු."*

රංග හැදුවේ සංදේශ්ව මදක් සන්සුන් කරන්නටය. මේ ඉන්න කේන්තියේ හැටියට ඔසීවලටම ගොසින් අර කාන්තාව සමඟ පැටලෙන්නට බැරි නැත.

sinhalaebooks.com

*"මේක කීයටවත් අත ඇරගන්න බෑ රංග. එහෙම උනොත් ඒක අපිට ලොකු පාඩුවක්."*

*"අපිට පැංචිව මේකට යවන්න බැරිවෙයිද?"*

*"පැංචි?"*

සංදේශ් කල්පනාවකට වැටුනේය. වසර දෙකකට පෙර සිදුවූ දේවල් වලින් පසු සමාධි යතා තත්ත්වයට පත් වී වැඩි කලක් නැත. ඇයව මෙවැනි ගමනක් තනිවම යවන්නට සංදේශ්ට සිත දෙන්නේ නැත.

*"පැංචි තාම එහෙම ගමනක් යවන්න පුළුවන් තත්ත්වෙක නෑ බං."*

*"එහෙම වුණොත්..."*

*"එක්ස්කියුස් මී සර්..."*

රංගට කතා කරන්නට ඉඩක් නොතබාම ඔෆිස් කාමරය තුළට දුවගෙන ආවේ සංදේශ්ගේ පුද්ගලික ලේකම් නිරාශාය.

sinhalaebooks.com

*"පිස්සු හැදිලද අයිසේ? ඔහොම කඩාගෙන බිඳගෙන ඔෆිස්වලට එනවද? කොහෙද තමුන්ගේ මැනර්ස්?"* සංදේශ් කෝපයෙන් කෑ ගසන්නට වූයේය.

*"ස්.. සොරි... සර්."*

*"දන් මොකටද ආවේ කියනවා."*

*"අපි ඔසී වල කම්පැනි එකට යවපු රික්වෙස්ට් එකට එයාලා මේල් එකක් දාලා තියෙනවා."*

*"මොකක්ද?"*

*"මේ කන්ට්‍රැක්ට් එක හැන්ඩ්ල් කරන මැඩම් දිසානායකට අපේ ෆ්ලවර් නර්සරි බලන්න ඕනලු සර්. ඒවා වල සිටුවේෂන් එක බලලා එයාට පුළුවන්ලු කන්ට්‍රැක්ට් එක කන්ටිනියු කරන්න."*

එය ඇසෙද්දී රංග සංදේශ් වෙත හෙළුවේ සැනසිලිදායක බැල්මකි. ගැටලුව සිතුවාට වඩා ක්මනින් විසඳා ගැනීමට ලැබෙන බව විශ්වාසය.

sinhalaebooks.com

*"හ්ම්... ඕන කරන දේවල් සේරම ලෑස්ති කරන්න. නිරාශා... සමාධි මැඩම්ට ටිකක් එන්න කියන්න."*

*"හොඳයි සර්..."*

කී නිරාශා ඉක්මනින් පිටත්ව ගියේය.

*"ලොකු දෙයක් බං. ඔය දිසානායක කියන ලේඩි හරිම ස්ට්‍රික් ලේඩි කෙනෙක් මං අහලා තියෙන විදිහට. ඔය කම්පැනි එකත් එක්ක ලංකාවේ කම්පැනි ගොඩක තිබ්බ කන්ට්‍රැක්ට් කැන්සල් කරලාලු. කිසිම චාන්ස් එකක් දීලා නෑ."*

*"ඒකි යකෝ... එන්නේ නැතැයි මටත් බලා ගන්න."*

*"මේ... උඹට මං කලින්ම කිව්වා ඔන්න. ඒ ගෑණි එක්ක එල්ලෙන්න යන්නේ නැතිව වැඩේ ෂේප් කර ගන්න බලපං."*

*"අයියා..."*

සමාධි කාමරයට එබුනේ ඒ මොහොතේය.

sinhalaebooks.com

*"එන්න පැංචි."*

*"මොකද මේ ඔයාගේ සද්දේ අයියා? නරක වචන වගේකුත් කියනවා ඇහුණා. රංග අයියා... ඔයා තමයි අයියාව නරක් කරන්නේ..."*

සමාධි කීවේ රංගව මදක් අවුස්සන්නටය.

*"අනේ මේ... මං උඹලෑ අයියාව නරක් කරපු එකක් නෑ. මූ තමයි මාවත් මරං කන්න හදන්නේ..."*

*"හරි හරි මේ... දැන් මොකද මේ යුද්දේ?"*

*"අර ඔසී වලට කම්පැනි එකේ ප්‍රශ්නේ නංගි.."*

*"මාත් මේ ඒක බල බලා හිටියේ අයියා. පැකින් වලදී මොකක් හරි ප්‍රශ්නයක් වෙලා තියෙනවා. රිටන් වුණ ස්ටොක් දෙකම මං බැලුවා. ෆ්ලවර්ස් හොඳටම ඩැමේජ් තමයි."*

*"කොහොමද එහෙම වුණේ?"*

sinhalaebooks.com

*“පේන විදිහට කවුරු හරි ප්ලෑන් කරලා කරපු වැඩක්. අපිට මේ ගැන හොයන්න වෙයි අයියේ.”*

*“රංගනයා... විකීට කොල් එකක් දීලා කියපං. මට පුළුවන් ඉක්මනට මේක හොයලා ඕන කියලා.”*

*“ඔයාට ඉතිං හැම එකටම ඔය මදාවියා තමයි මතක් වෙන්නේ...”*

සමාධි අමනාපයෙන් කට ඇදකර කියද්දී සංදේශ්ගේ මුවට නැඟුනේ සුන්දර සිනහවකි. ඒ කාලයේ සිටම සමාධිට විකීව පෙන්නන්න බැරිය.

*“මොකද හිනා වෙන්නේ?”*

*“මේ... පැංචි. මං උඹට එන්න කිව්වේ විකියා ගැන කියවන්න නෙමෙයි.”*

*“හරි ඉතිං. කියන්න.”*

*“අර දිසානායක කියන ගෑණිට අපේ ෆ්ලවර් නර්සරිස් බලන්න ඕනලු. තමුසෙට පුළුවන් නේද ඒ*

*වැඩේ හැන්ඩ්ල් කරන්න. මං ගියොත් මොන විනාසයක් වෙයිද දන්නේ නෑ ඔතනට.”*

*“ගෑණි? යසයි. ඔය කතා කරන විදිහ ඇහුණා නම් මේ ලැබුණ චාන්ස් එකත් නැති වෙනවා. මොකක්ද අයියේ... ඔයා නම් දැන් හොඳටම සවුත්තුයි.”*

*“ඇයි බං... මෙච්චර කාලෙකට මෙහෙම වුණාද? අපි මුල ඉඳලා මේ කම්පැනි එකත් එක්ක වැඩ. මේ අලුතෙන් ආපු හෝන්තුවක් නිසා බලපං ආපු ප්‍රශ්නේ...”*

*“අපේ පැත්තෙනුත් වැරැද්දක් වෙලා තියෙනවානේ අයියේ. හරි. ඔයා මේකට අත දාන්න එපා. මං මේක හැන්ඩ්ල් කරන්නම්. ඔයා නැත්තම් මොන විනාසයක් කරයිද දන්නේ නෑ තමයි.”*

කී සමාධි යන්නට ගියේ සංදේශ්ගේ වැඩවලට සිනාසෙමිනි.

*************************

sinhalaebooks.com

*"මැඩම්... අපේ මේල් එකට අර එස් ඇන්ඩ් එස් කම්පැනි එකෙන් රිප්ලයි එකක් එවලා තියෙනවා. එයාලා අපේ ඉල්ලීමට කැමති වෙලා තියෙනවා."*

*"වෙරි ගුඩ්. අපේ ශ්‍රී ලංකන් බ්‍රාන්ච් එකේ ඕපන් ඩේට් එක කවද්ද තියෙන්නේ ලීස්?"*

*"ආෆ්ටර් ත්‍රී වීක්ස් මැඩම්."*

*"ඕකේ. නෙක්ස්ට් මන්ඩේ අයිල් ගෝ දෙයා. ඉන්ෆෝම් දෙම් අබවුට් ඉට්. අයි වොන්ට් ස්පෙන්ඩ් දෙයා ඇට් ලීස්ට් වන් වීක්. ඕකේ?"*

*"ඕකේ මැම්."*

*"ආ... හංසි මැඩම්ට ටිකක් එන්න කියන්න."*

ලීස් සිනහවක් පා පිටව යද්දී ඇය බරැති සුසුමක් හෙළුවාය. වසර තුනකට පසු නැවතත් ලංකාවට යන්නට සිදුව තිබේ. ආයතනයෙන් ලංකාවේ පිහිටවන නව ශාඛාවේ ප්‍රධානියා ලෙස පත් කර ඇත්තේ තමාවය.

sinhalaebooks.com

*“එක්ස්කියුස්මී මැම්...”*

*“මෙන්න මෙහේ වරෙන් බං. මඟුලක් කියවන්නේ...”*

*හංසි* ආවේ සිනහවකින් මුව පුරවාගෙනය. මේ සිටින්නේ වසර තුනකට පෙර ලංකාවෙන් ආ තමාගේ මිතුරිය නොවේ. අදහස්වලින් මෙන්ම පෙනුමෙන්ද ඇය බොහෝ දුරට වෙනස් වී ඇත. ලෙහෙසියෙන් කෙනෙකුට ඇයව හඳුනාගන්නට නම් නොහැකි බව විශ්වාසය.

*“ලැස්ට් වෙයන් නෙක්ස්ට් මන්ඩේ ලංකාවට යන්න.”*

*“වට්? ඇයි මේ හදිස්සියේ. උඹට එහේ වැඩ බාර ගන්න තව සති තුනක් තියෙනවා.”*

*“මගේ මේල් එකට අර කම්පැනි එක රෙස්පොන්ඩ් කරලා තියෙනවා. අපිට එහෙට යන්න වෙනවා.”*

*“කෙල්ලේ.... උඹ දන්නවා නේද ඒ කම්පැනි එක කාගෙද කියලා?”*

*“ඔව්...”*

*“උඹට ප්‍රශ්නයක් නැද්ද ඒක?”*

*“හංසි... මට කොහොමත් එයාලා එක්ක ප්‍රශ්නයක් නෑ. මටත් ඕන කොහොම හරි මේ කන්ට්‍රැක්ට් එක එයාලාට බේරලා දෙන්න. ඒකයි මං ම මේකට මැදිහත් වෙන්න හිතුවේ.”*

*“උඹ කවුද කියලා එයාලාට කියනවද?”*

*“නැහැ. දැන් මාව එයාලාට අඳුරගන්න බෑ. ඒක මට විශ්වාසයි. උඹෙයි මගෙයි පවුල් දෙකේ අර විතරක් අපි දෙන්නව අඳුර ගත්තම ඇති හංසි. මේකට සුදුසු කෙනෙක් හම්බුණ ගමන් මං ආයෙත් එනවා. උඹ කැමති නම් උඹ විදිහටම ලංකාවේ නැවතියං ඊට පස්සේ.”*

*“මෝඩියේ. එහෙම වුවමනාවක් තිබ්බා නම් මං නවතින්නේ මීට අවුරුදු තුනකට කලින්. උඹ මගෙන් කුණුහරප අහගන්නේ නැතුව යන්න ලෑස්ති*

sinhalaebooks.com

*වෙයන් දැන් ඉතිං.”*

*“හැබැයි... කෝකටත් පරිස්සමින්. අර යකා ලේසි පහසු යකෙක් නෙමෙයි කියලා දන්නවානේ. ෂිප්මන්ට් එක රිටන් කරපු නිසා උඹව මරන් කන්න තරහින් ඇත්තේ.”*

*“බලමු...”*

වසර දෙකක් ජර්මනියේ සිටින පුංචි සමඟ ගත කළ මිතුරින් දෙදෙනා ඔස්ට්‍රේලියාවට පැමිණ තවමත් ගතවී ඇත්තේ වසරකි. කෙත්මිගේ අම්මලාත් මේ වන විට ඔස්ට්‍රේලියාවේ පදංචි වී සිටන නිසා දෙදෙනාටම ගැටලුවක් වූයේ නැත.

*“කෙල්ලේ මේ... මාව අඳුර ගනියිද?”*

කෙත්මිව නම් අඳුරා ගන්නට බැරි බව විශ්වාසය. ලේයර් කපා තඹ පැහැයට තැනින් තැන වර්ණ කර ඇති කොණ්ඩය. ඇස් දෙකෙහි ඇති උපැස් යුවල... විශේෂයෙන්ම වසරකට පෙර මුහුණ දුන් රිය අනතුර නිසා සුළු ප්ලාස්ටික් සැත්කමකට භාජනය කළ මුහුණ නිසා කෙත්මිගේ ස්වරූපය සම්පූර්ණයෙන්ම වෙනස් වී තිබුණි. මොනවා වුණත් ඇයගේ සුන්දරත්වයේ නම් වැඩියක් මිස අඩුවක් නොවූ බව පැහැදිලිය. නමුත් ***හංසි***

sinhalaebooks.com

දෙස හොඳින් බලන කෙනෙකුට ඇයව හඳුනා ගන්නට අපහසු නැත.

*"අපි බලමු. උඹ වැඩිය නොයා ඉඳපං. සතියයිනේ..."*

*"හ්ම්... එහෙනම් ආයේ යන්න ලෑස්ති වෙමුකෝ. මං අපේ අම්මට කියන්නම් එහෙනම්. අපිව පිළිගන්න ලෑස්ති වෙන්න කියලා."*

*"හ්ම්... කියපං කියපං. නැන්දාව බලන්නත් ආසයි. මල්ලිත් මේ දවස්වල ලංකාවේ නැති නිසා මට උඹලාගේ දිහා තමයි ඉන්න වෙන්නේ."*

කෙත්මි කීවේ සිනහවක් පාමිනි. අම්මලා මෙහි ආවාට මල්ලි කැමැත්තෙන්ම ලංකාවේ නතර වූයේ ඔවුන්ගේ ව්‍යාපාර බලා ගන්නටය.

sinhalaebooks.com

20.

***"වෙල්කම් ටු ශ්‍රී ලංකා මැඩම්..."***

හංසිලාව පිළිගන්නට ගුවන්තොටුපළට පැමිණ තිබුණේ සමාධි සහ සංදේශ්ගේ පුද්ගලික ලේකම්වරිය වූ නිරාශායි. දුටු පමණින්ම කෙත්මි ඇයව හඳුනා ගත්තද ඒ බවක් පෙන්වන්නට ගියේ නැත.

***"මේ මිස්?"***

***"ඔහ්... සොරි මැඩම්. අයිම් සමාධි. සමාධි ගුණවර්ධන. මේ ඉන්නේ නිරාශා. අපේ සෙක්‍රට්‍රි."***

***"ඔකේ. අයිම් දිසානායක. මේ හංසි. මගේ ඇසිස්ටන්."***

***"මැඩම් අපි කෙලින්ම හොටෙල් එකට යනවද? නැත්තම්..."***

sinhalaebooks.com

***"නෑ සමාධි. අපිට කෙලින්ම ෆ්ලවර් නර්සරි එකට යන්න පුළුවන් නේද?"***

***"ඕකේ මැඩම්. ප්‍රශ්නයක් නෑ. මං හිතුවේ මැඩම් අද පොඩ්ඩක් රෙස්ට් කරලා හෙට උදේම...."***

***"කමක් නෑ. අපි ගිහින්ම රෙස්ට් කරමු සමාධි."*** ඇය සුන්දර සිනහවක් පා කීවාය.

ඔවුන් නුවරඑළියට එන විට අඳුර වැටී අවසන්ය. එස් ඇන්ඩ් එස් ගෲප් එකටම අයත් බංගලාවක ඔවුන්ට නවාතැන් පහසුකම් සපයා තිබුණි. සියලු දෙනාම කාමරවලට ගියේ මදක් විවේක ගෙන රෑ කෑමට යන අදහසිනි.

***"බුදු අම්මෝ... මං හිතුවේ එයාපෝට් එකේ ඉඳලාම අර නපුරු කුමාරයා එක්ක එන්න වෙයි කියලා."***

හංසි කීවේ කාමරයේ දොර වසා දමා ඇඳට පනිමිනි.

***"මාත් හිතන් හිටියේ එහෙම තමයි. පුදුමයි ආවේ නෑ."***

"ආ... ආ... ලොකු මැඩම් බලන් හිටියේ කොල්ලාව බලන්න නේ..."

"කොල්ලා... වයසේ හැටියට දැන් නම් ළමයි දෙන්නෙක්වත් ඉන්න ඕන. කවුද දන්නේ වයිෆ් එනවට අකමැති වුණාද කියලා..."

"වයිෆ්? මං නම් හිතන්නේ නෑ."

"ඒක නෙමෙයි බං මං කල්පනා කළේ.... සමාධි අක්කා කවද්ද බිස්නස්වලට ජොයින් වුණේ?"

"ඒකේ නම් ප්‍රශ්නයක් තියෙනවා තමයි. සමාධි අක්කා බිස්නස් බලනවා නම් අසිත..."

"මෙතන මොකක් හරි අවුලක් තියෙනවා වගේ."

"කෙත්මී... මං මේ උඹට බොහොම හොඳින් කියන්නේ... ආයෙත් නම් පිස්සු නටන්න ලෑස්ති වෙන්න

sinhalaebooks.com

*එපා. උන් දෙන්නා බැඳලා අවුරුදු තුනක්. අවුලක් තියෙනවා නම් උන් විසඳගනියි. අපි අපේ වැඩේ කරගෙන ඉමු.”*

*“හරි හරි බං. මට දැන් ඒ දේවල් වැඩක් නෑ.”*

*“අන්න එහෙම වරෙන්.”*

*“මේ... වොෂ් දාන් වරෙන්. කන දෙයක් කාලා නිදා ගන්න. මට මහන්සියි බං.”*

කෙත්මි කීවේ කාමරයේ වූ සෝපාවට බර වෙමිනි.

ඔවුන් සූදානම්ව පහළට යන විටත් සමාධි ඔවුන්ව සොයන්නට එමින් උන්නාය. රාත්‍රී ආහාරය ගන්නා අතරේ ඔවුන් වැඩියෙන්ම කතා කලේ ව්‍යාපාර තොරතුරු ගැනය.

*“මිස් සමාධි... මං නම් හිතන්නේ රිටන් වුණ ස්ටොක් දෙකේ ලොකු ප්‍රශ්නයක් තියෙනවා. බැලූ බැල්මට ඒ ෆ්ලවර්ස්වලට කවුරු හරි හිතලම ලොකු ඩැමේජ් එකක් කරලා තියෙනවා.”*

sinhalaebooks.com

"මටත් ඒක තේරුණා මැඩම්. මේ වෙද්දිත් අපි ඒ ගැන හොයනවා. මීට කලින් කවදාවත් මෙහෙම දෙයක් අපේ කම්පැනි එකෙන් වෙලා නෑ."

"ඒක මාත් දන්නවා මිස් සමාධි. ඒකමයි මං මේ ගැන පෞද්ගලිකවම ඇවිත් හොයලා බලන්න හිතුවේ."

"තැන්කියු සෝ මච් මැඩම්."

"ඉට්ස් ඕකේ. මිස් සමාධි... මට එස් ඇන්ඩ් එස් කම්පැනි එක ගැන විස්තර ටිකක් කියන්න පුළුවන්ද? අයි මීන්... ඔයාලාගේ හිස්ට්‍රි එක."

"ඇත්තටම මැඩම්... මේක පටන් ගත්තේ මගේ තාත්තා. තාත්තාගෙන් පස්සේ මගේ අයියා සංදේශ් තමයි දැන් කම්පැනි එකේ ඕනර්. මං නම් බිස්නස් එකට ජොයින් වෙලා දැනට අවුරුද්දක් විතර."

"ඇයි මිස් සමාධි... මේ බිස්නස් එකට කැමති නැද්ද?"

sinhalaebooks.com

*"අනේ එහෙම දෙයක් නෙමෙයි මැඩම්. මං ඉන්ඩියාවල ඩිග්‍රී එකකුත් කලා මේ සබ්ජෙක්ට් එක ගැන. ඒත් මට පොඩි ප්‍රශ්න වගයක් ආවා. ඒ නිසා කම්පැනි එකට ජොයින් වෙන එක ටිකක් පරක්කු වුනා."*

*"ඒකට කමක් නෑ සමාධි. මං නිකම් ඇහුවේ. අපිට එතකොට හෙට නර්සරි එක බලන්න පුළුවන්නේ?"*

*"කිසිම ප්‍රශ්නයක් නෑ මැඩම්. අපි හෙට බලමු. හෙට ගොඩක් දුරට මගේ අයියාත් මෙහෙට එයි."*

ඒ කතාව ඇසෙද්දී ***හංසි*** කෙත්මි දෙස බැලුවේ දෑස් විසල් කරගෙනය. කෙත්මි දෑස්වලින් ඇයට ඉඟි කලේ සන්සුන් වන ලෙසය.

*************************

සංදේශ් රංග සමඟ නුවරඑළියට ආවේ පාන්දරය. ඒ වන විට සියල්ලන්ම නින්දේ උන්නද සමාධි උන්නේ ආලින්දයට වී මඟ බලාගෙනය. පහුගිය වසර කීපයේ වූ සිදුවීම් ඇයගේ නින්ද සදහටම සොරාගෙන

sinhalaebooks.com

තිබුනි. ඒ අඳුරු මතකවලින් මිදෙන්නට අදටත් ඇයට අපහසුය.

***"පැංචි... මොකද මේ සීතලේ එළියට වෙලා?"***

***"ඔයාලා එනකම් බලන් හිටියේ මං."***

***"කොහොමද අර මැඩම්...?"*** සංදේශ් ඇසුවේ සමච්චල් හඬිනි.

***"අයියා මේ... කට පරිස්සම් කරගන්න. මැඩම් කිව්වාට එයාට ලොකු වයසක් නෑ. මටත් වැඩිය බාලයිද මන්දා."***

***"ඈ...."***

සංදේශ් පුදුම වූවේය. මැඩම් දිසානායක කී විට ඔහු සිතා උන්නේ වයස අවුරුදු පනහක හැටක කාන්තාවක් වන්නට ඇතැයි කියාය.

***"නෑ... ඉතිං ඉතිං... කෙල්ල ලස්සනද?"***

sinhalaebooks.com

***"ලස්සනදත් අහනවා රංග අයියා... සුරංගනාවියක් වගේ... උදේට බලන්නකෝ..."***

***"හා... හා... බලමුකෝ..."***

උදෑසනින් අවදි වූ කෙත්මි සාමාන්‍ය ඇඳුමකින් සැරසී පහළට ආවේ මදක් ඇවිදින්නට සිතාගෙනය. අනිත් අය තවමත් නිදි බව බංගලාවේ පැවති නිහඬබවින්ම ඇය තේරුම් ගත්තාය. ඒ නිසාම ඇය නිහඬවම ඉදිරිපස දොර විවර කරගෙන පිටතට ආවාය. තවමත් පහවී නොගිය මීදුම් රැලි අතරින් ඇවිද යන්නට ඇයට ආවේ පුදුම ආශාවකි.

සියල්ලන්ම නින්දේ පසුවන නිසාම කෙත්මි නිදහසේ දෑත් විහිදාගෙන මීදුම අතරින් වැටුණු මාවතේ ඇවිද යන්නට වූවාය. ඇයට දැනුණේ පුදුම නිදහසකි. නුවරඑළියට ආවේ වසර හය හතකට පසුවය. දෑත් විහිදාගෙන මීදුම අතර කැරකෙමින් සිටි කෙත්මි තිගැස්සුනේ වාහනේක නළා හඬිනි.

***"පිස්සුද අයිසේ... පාර මැදට වෙලා මොන රෙද්දක් කරනවද? නටන නැටුමක් අයිනකට වෙලා නටා ගන්නවා."***

ඒ කෝපයට පත් හඬ හඳුනා ගන්නට කෙත්මිට වැඩි වෙලාවක් ගියේ නැත. එහෙනම් මෙයත් මේ ඇවිල්ලා ඉන්නේ... ඔයා විතරයි නපුරෝ අඩු වෙලා තිබ්බේ.

මෙතරම් කෑ ගහලත් ඇය එලෙසම පාර මැදට වී සිටිද්දී සංදේශ්ගේ සිතට ආවේ කෝපයකි. කොහොමත් සංදේශ්ගේ ජීවිතයේ ඔහු මෘදු වූයේ කාන්තාවන් තිදෙනෙකුට පමණි. ඒ තිදෙනා හැර ඕනෑම කාන්තාවක් ඉදිරියේ තම කෝපය දිගහරින්ට ඔහු මැලි වූයේ නැත.

***"මේ... හලෝ... කරුනාකරලා පාරෙන් අයින් වෙනවද?"***

***"සොරි."***

වරද වූයේ තමා අතින් නිසා කෙත්මි සමාව ගෙන පාරෙන් ඉවත් වූවාය.

***"කොහෙන් ආපු හෝන්තුවක්ද මන්දා... තමුන් මොනවද මෙහේ කරන්නේ?"***

***"මං මෙහෙට ආවේ බිස්නස් වැඩකට."***

***“අහ්... අර දිසානායක මැඩම් එක්ක වෙන්න ඇති එන්න ඇත්තේ... කරුණාකරලා ආපු වැඩේ කරගෙන ගියොත් හොඳයි මෙතන කෝලම් නටන්නේ නැතුව.”*** කී ඔහු වාහනය ඉදිරියට ගනිද්දී කෙත්මිගේ මුවඟට නැඟුනේ මද සිනහවකි.

“කොහෙද අප්පා ඔය යකා හිටියේ... එදා හොස්පිට්ල් එකේදි දකිනකම්ම මං දැනන් හිටියේ නෑ මෙයා ඇතුලේ මෙහෙම යකෙක් ඉන්නවා කියලා. මෙතන මං නැතුව ***හංසි***යා හිටියා නම් එහෙම බලාගන්න තිබ්බා ලෝක විනාසේ.”

***“කොහෙද බං උදේම අතුරුදහන් වුණේ?”***

කෙත්මි යළිත් කාමරයට එද්දී ***හංසි*** අවදි වී සූදානම් වෙමින් උන්නාය.

***“මං පොඩ්ඩක් වටපිටාව බලන්න ගියා.”***

***“මටත් කතා කරන්න එපැයි බං.”***

sinhalaebooks.com

*"උඹ නිදි නිසා කතා කළේ නෑ. දැන් යමන් පහළට. මං හිතන්නේ අර වසවර්තියාත් ඇවිත්."*

කී කෙත්මි නාන කාමරයට වැදුනාය.

*"මොන මඟුලක්ද මන්දා... උදේ පාන්දර මූඩ් එක කෑවා..."*

සංදේශ් නම් ගෙට ඇතුළු වූයේම ඇයට බැනවදිමිනි.

*"කාටද අයියේ බනින්නේ?"*

*"කවුද බං අර ඇවිත් ඉන්න මලසමයම."*

*"මොන සමයමද?"*

*"මොකාද මන්දා... මං එද්දී අර මීදුම අස්සේ අත් දෙකත් වනාගෙන කැරකි කැරකි හිටියේ. වැහි නැටුම් නටනවා වගේ. ඒ මදිවට සුදට සුදේ ඇඳගෙන. තව පොඩ්ඩෙන් ප්‍රෙෂර් වැඩි වෙලා මැරෙන්නේ..."*

sinhalaebooks.com

*"හංසි මිස් වෙන්න ඇති."* නිරාශා කීවේ සිනාසෙමිනි.

*"ආ... අර එන්නේ..."*

සංදේශ් උඩුමහළ දෙස බලා කියද්දී අනිත් තිදෙනාද ඒ දෙස බැලුවෝය. නිරාශාගේ මෙන්ම සමාධිගේද දෑස් විසල් වූයේ පුදුමයෙනි. කවුරුත් කිසිවක් කියන්නට පෙරම සංදේශ් ඇය ඉදිරියට ගියේ ය.

*"කොහෙද හලෝ තමුන්ගේ මහලොකු මැඩම්? වෙලාවට වැඩක් කරන්න දන්නෙම නැද්ද?"*

කෙත්මි කෙලින්ම බැලුවේ සමාධි දෙසය.

*"මිස් සමාධි... හූ ඊස් දිස්?"*

*"ස්... සොරි... මැඩම්. මේ මගේ අයියා. සංදේශ් ගුණවර්ධන. අයියේ මේ මැඩම් දිසානායක."*

*"ඔහ්... වෙරි සොරි මැඩම්. මං හිතුවේ මේ මැඩම්ගේ ඇසිස්ටන් කියලා."* ඔහු කිව්වේ කරගන්න දෙයක් නැති තැනය.

sinhalaebooks.com

***“මට වුණත් ඇසිස්ටන්ට්ට වුණත්... මිස්ට සංදේශ් කතා කරන්න ඉගෙන ගත්තොත් හොඳයි.”***

කී කෙත්මි ඔහුව මඟහැර සමාධිත් සමඟ කෑම මේසය වෙත ගියාය.

‘මේකි යකෝ... මේකි කවුද මං කතා කරන්න ඕන විදිහ කියන්න. අනේ ඇත්තමයි මේ බිස්නස් එකේ අවුල නොතිබුණා නම් කියනවා මං හොඳ එකක්.’

***“අයියේ... ඔයත් එන්න කෑම කන්න.”***

***“මෙච්චර උදෙන්... මට නම් බෑ. මං දවල් වෙලා කන්නම්.”***

***“වෙරි ගුඩ්. මං හිතුවා හරි මිස් සමාධි.”***

***“මැඩම්?”***

sinhalaebooks.com

*"තමන්ගේ ශරීරය හරියට බලාගන්න බැරි කෙනෙක් කොහොමද ෆ්ලවර් නර්සරි එකක් හරියට මැනේජ් කරන්නේ?"*

*"සොරි මැඩම්?"*

සමාධි හෙමිහිට ඇසුවේ ඇය කියන දෙය තේරුම් ගන්නට බැරි වූ නිසාය.

*"මේකයි මිස් සමාධි. මල් ගසුත් අපි වගේ තමයි. අපි වෙලාවට කනා බොනවා වගේම එයාලාට වෙලාවට පොහොර වතුර ලැබුණොත් තමයි එයාලා නිරෝගීව හැදෙන්නේ. මිස්ට සංදේශ් බ්‍රේක්ෆස්ට් එක ස්කිප් කරලා තමන්ගේ ඇඟට හානි කරගන්න එකේ මල් ගැන මොන කතාද?"*

*"අනේ සොරි මැඩම්. අයියා එහෙම තමයි. නර්සරි එක බලා ගන්නේ මම. ඒ නිසා ඒ දේවල් හරියටම වෙනවා. මට ඒක වගකීමෙන් කියන්න පුළුවන්."*

සමාධි සංදේශ්ට රවමින් කියද්දී ඔහු එතනින් ඉවත් වී ගියේ හිතට එන දේවල් කියන්නට ගියොත් පාඩු වන්නේ බිස්නස් එකට නිසාය. ඔහු කේන්තියෙන් පිටව යනු දුටුවද කෙත්මි කිසිවක් නොවූ ලෙස ආහාර ගන්නට වූවාය.

sinhalaebooks.com

උඩු මහලේ සිට මේ සියල්ල බලා සිටි හංසි උන්නේ සිනහව නවතා ගන්නට බැරිවය. කෙත්මිගේ කතාවට සංදේශ්ගේ මුහුණ ඇද වී ගිය අයුරු බලන්න ලස්සනය.

**"මේ... මැඩම්. අහක යන මී හරක් කුලප්පු කර ගන්නේ නැතුව කාලා බීලා වැඩ පටන් ගනිම්."** හංසි එවූ කෙටි පණිවිඩය දකිද්දී කෙත්මිටද සිනහවක් නැඟුණි.

***"අනේ සමාධි... සොරි කරදර කරනවට... හංසිට රූම් එකට කෑම මොනවා හරි යවන්න පුළුවන්ද? මං එයාට පොඩි වැඩක් බාර දීලා ආවේ. ඒක ඉවර වෙනකම් එයා පහළට එන එකක් නෑ."***

***"අයියෝ...ඒක මොකක්ද මැඩම්. මං වැඩ කරන කෙනෙක්ට කියන්නම්."***

උදෑසන ආහාරයෙන් පසු කෙත්මි මල් වගාව නැරඹීමට ගියේ සමාධි, නිරාශා සහ රංග සමඟය. සංදේශ් පෙනෙන්ට නොවුණත් කෙත්මි එගැන අහන්නට ගියේ නැත. අනෙක් තිදෙනා සමඟ සුහද කතාබහ කරමින් ඇය අවශ්‍ය දේවල් සොයා බැලුවාය.

sinhalaebooks.com

***“ජේන විදිහට නම් මේක හොඳට මැනේජ් කරගෙන යනවා වගේ. මට මේ මල්වලට යූස් කරන පොහොර වර්ග ගැන එහෙම බලන්න පුළුවන්ද මිස් සමාධි?”***

***“අනිවාරෙන්ම මැඩම්. ඔෆිස් එකට යමු. සේරම ඩීටේල්ස් එතන තියෙනවා.”***

***“හොඳයි.”***

කාර්යාලයට ගිය කෙත්මි දවසම ගත කළේ අදාල ලියකියවිලි පරික්ෂා කරමිනි. දිවා ආහාරයෙන් පසුවත් ඇය උන්නේ කාර්යාලයට වී එහි තොරතුරු පිරික්සමිනි. හංසි ඇයව සොයාගෙන ආවේ ඒ අතරේය.

***“එක්ස්කියුස් මී මැම්...”***

***“ඔව් කියන්න හංසි..”***

***“මැඩම්ගේ අයියාට මැඩම්ට ටිකක් කතා කරන්න ඕන කිව්වා මැඩම්.”***

sinhalaebooks.com

*"හංසි... අයියාට කියන්න මං රෑ වෙලා ගන්නම් කියලා."*

*"සොරි මැඩම්. හදිස්සියක් කියලා සර් කිව්වේ."*

*"හරි. මං බලන්නම්."*

කෙත්මි දුරකතනයත් රැගෙන මදක් පිටතට ආවේ දිලූෂ මේ හදිස්සියේ කතා කරන්නේ ඇයිදැයි සිතමිනි.

*"කියන්න අයියේ..."*

*"සුදූ... ඇයි ලංකාවට යනවා කියලා කිව්වේ නැත්තේ?"*

*"මං නොකිව්වාට ඔයාගේ නෝනා මහත්තයා කියන්න ඇතිනේ ටොමියෝ..."* ඇය කීවේ සිනාසෙමිනි.

*"ඒකිත් උඹටම හරි. මං කතා කරලා අහනකම් මට කිව්වේ නෑ. මේ අහන්න සුදූ... කරන*

දෙයක් පරිස්සමින්. මං දන්නවා ඔයා දැන් කොහෙද ඉන්නේ කියලා. මං කැමති නෑ ඔයා ඔය දේවල්වලට මැදිහත් වෙනවට. ඔයාට මතකනේ එදා හොස්පිට්ල් එකේදී...”

“අයියා... මේක මගේ ජොබ් එක. වෙන දෙයක් නෑ. මේක බිස්නස් ටුවර් එකක්. එච්චරයි.”

“හොඳයි. පරිස්සමින් කරන දෙයක්. සංදේශ්ලා සමාධිලා නරකයි කියලා මං කියන්නේ නෑ. ඒත් අරුගේ නම ගැව්ච්ච තැනකවත් ඔයා ඉන්නවට මං කැමති නෑ සුදූ. අනික සංදේශ් වුණත්...”

“හරි හරි රත්තරනේ... ඔයා බය වෙන්න එපා. හංසිත් ඉන්නවා නේ...”

“ඒකි ඉන්න එක තමයි වැඩියෙන්ම බය. මං එක්කෝ සංදේශ්ට කතා කරන්නද...”

“අයියෝ... මේ පිස්සු නම් කරන්න එපා. මං ඔයාට රෑ වෙලා කතා කරලා විස්තර කියන්නම්කෝ...”

sinhalaebooks.com

මෙ කතාබහේ අවසානය එතනින් යමින් සිටි සංදේශ්ටද ඇසුනි. ඔහු සිතුවේ මේ කතා කරන්නේ ඇයගේ පෙම්වතා වන්නට ඇතැයි කියාය.

"ඔව් ඉතිං.. කිරි කැල්ල වගේ ඉද්දි කොල්ලෙක් නැති වෙයිද? මං නම් හිතුවේ සුද්දෙක් එක්ක සෙට් වෙලා ඇති කියලා..." තමාටම කියා ගනිමින් ඔහු සූදානම් වූයේ එතනින් යන්නටය.

*"එක්ස්කියුස් මී මිස්ට සංදේශ්..."*

*"යස්..."*

*"අපිට හෙට ඔයාලාගේ අනිත් නර්සරි එකත් බලන්න පුළුවන් වෙයිද?"*

*"වෙරි සොරි මැඩම්. හෙට මට ඉම්පෝටන්ට් මීටින් එකක්. ඉතිං අපිට ඒ වැඩේ දවසක් කල් දා ගන්න බැරි වෙයිද? මැඩම්ට පුළුවන්නේ හෙට ටිකක් රෙස්ට් එකේ මේ පැත්තේ ඇවිදින්න."*

*"නො මිස්ට සංදේශ්. ඔයාගේ මීටින් නිසා මට මගේ කාලය නාස්ති කරන්න බෑ. මේ වැඩේ විතරක් නෙමෙයි මට තව වැඩ තියෙනවා. මං මගේ*

sinhalaebooks.com

*ෂෙඩියුල් එක ඔයාලාට කලින්ම මේල් කරානේ. ඔයාලාට මීටින් දා ගනිද්දී ඒක බලන්න තිබ්බා."*

*"සොරි මැඩම්. ඒත් මේ මීටින් එක අපි දැන් ටික කාලෙකට කලින් ඉඳන් දාගෙන තිබුන එකක්. ඒ නිසා ඒක වෙනස් කරන්න බෑ."*

*"වට්? මිස්ටර් සංදේශ්... මේක විහිළුවක් නෙමෙයි. මට විනාඩි පහත් ගොඩක් වටිනවා. ඔයාගේ ඔය මීටින් එකක් නිසා මං කීයටවත් මගේ වැඩේ කල් දාන්නේ නෑ."*

*"ඕකේ. මං ඒකට විසඳුමක් හොයාගෙන මැඩම්ට දන්වන්නම්."*

කී සංදේශ් ඇයගෙන් සමුනොගෙනම යන්නට ගියේ කේන්තිය පාලනය කරගෙනය.

'පුදුම ගෑනියෙක්නේ මේකි. ඇඟේ තරමටද කට... දැක්ක වෙලාවේ ඉඳලා මගේ ඇඟේ ලේ ටික පුච්චන්නමයි බලන් ඉන්නේ. අපේ නංගි කොහොම ඉහගහන් ඉන්නවාද මන්දා... මේ වෙලාවට තමයි හිතෙන්නේ බිස්නස් බල්ලාට ගියාවේ කියලා හොඳ දෙකක් කියන්න.'

sinhalaebooks.com

## 21.

*"අයියේ... මට ටිකක් කතා කරන්න ඕන ඔයත් එක්ක."*

සමාධි සංදේශ්ව හොයාගෙන ආවේ සියල්ලන් නින්දට ගිය පසුවය. ඔහු උන්නේ කාමරයේ බැල්කනියට වී පහළ ගෙවත්ත දෙස දෑස් යොමු කරගෙනය.

*"කියන්න පැංචි... මොකක්ද ප්‍රශ්නේ? අර ලොකු මැඩම් අවුලක් දැම්මද?"*

*"මොකක්ද අයියා... ඒ මනුස්සයා එක්ක එල්ලෙන්නම බලන් ඉන්න එපා. මං ආවේ වෙන දෙයක් ගැන කතා කරන්න."*

*"ඔය මැඩම් කියන එකී ආපු වෙලාවේ ඉඳලා කරන්නේ මගේ ලේ කෝප කරවන එක"*

***"අයියෝ... අයියා..."***

***"හරි හරි.. කියන්නකෝ..."***

***"රිතූ ගැන ආරංචියක් නැද්ද අයියා?"***

සංදේශ් බරැති සුසුමක් හෙළුවේ ඇයව සිහි වීමෙනි. ඒ නමවත් මතක් කරන්නට ඔහුට සිතක් නැත.

***"නැහැ. දිලූෂ කියන්නේ පවුල පිටින්ම ජර්මනියට ගියා කියලා."***

***"එයාගේ යාළුවා?"***

***"ඒ ළමයත් දැන් ඉන්නේ ඔසීවල ලු."***

***"අපිට හොයා ගන්න බැරි වෙයිද අයියේ?"***

***"අනේ මන්දා පැංචි. ඔයාගේ වෙඩින් එකෙන් පස්සේ එයා අපෙන් හැංගිලාම ගියා. ඉන්න තැනක හොඳින් ඇති. මං නම් කියන්නේ එහෙම ඉන්න දෙමු. හොයලා මොනවා කරන්නද අපි."***

sinhalaebooks.com

*"මට සමාවෙන්න අයියේ... මං නිසා හැමෝම දුක් විඳිනවා."*

*"පිස්සුද පැංචි. මොනවද මේ කියන්නේ... රිතුවත් මමවත් නෙමෙයි උඹයි දැන් දුක් විඳින්නේ..."*

*"එක අතකින් ඒ කෙල්ල බේරුණා අයියේ... ඔයා එදා මං වෙනුවෙන් කතා නොකලා නම් අද මේක වෙන්නේ එයාට."*

*"සේරම දැන ගත්තටත් පස්සේ ඔයාගේ හිතේ රිතූ ගැන පුංචියටවත් තරහක් නැද්ද නංගි?"*

සංදේශ් ඇසුවේ වසර දෙකක් තිස්සේ සමාධිගෙන් අසන්නට බැරි වුණ පැනයයි. මේ අවුරුදු දෙකටම ඇය රිතූව මතක් කළේවත් නැති තරම්ය.

*"ඒ පොඩි කෙල්ලත් එක්ක මං මොනවට තරහා වෙන්නද අයියේ... මට ඇත්තටම දුකයි එයා ගැන. මේ සිද්ධ වුණ දේවල් සමහර විට එයා දන්නේවත් නැතුව ඇති."*

sinhalaebooks.com

*"එයා තියා දිලූෂවත් ඒ දේවල් දන්නේ නෑ පැංචි. දිලූෂත් ඒ කාලෙම ලංකාවෙන් ගිය නිසා මේ දේවල් දන්නේ නෑ."*

*"අනේ මට එක පාරක් එයාව හම්බෙන්න තියෙනවා නම්... මට නැතත් මං දෙයියන්ගෙන් ඉල්ලන්නේ අයියාට එයාව මුණගස්සන්න කියලා."*

*"මට? ඒ මොකටද?"*

*"ඒ මොකටද කියලා ඔයාට එදාට තේරුම් ගන්න පුළුවන් වෙයි."*

ඔයා මොනවා කිව්වත් ඔයාගේ හිතේ තියෙන දේවල් මට හංගන්න බෑ අයියේ. ඒ ළමයාව මතක් කරද්දී ඔයාගේ ඇස් දිලිසෙන විදිහෙන් මට හැමදෙයක්ම තේරෙනවා. සමාධි තනිවම සිතුවාය.

සමාධි යන්නට ගියද සංදේශ් උන්නේ මිදුලේ අඳුරේම ඇවිද යන රුවක් වෙත දැස් යොමු කරගෙනය. අහම්බයෙන් දුටුවද ඉන්නේ කවුදැයි කියා හඳුනාගන්නට ඔහුට අපහසු වූයේ නැත.

'මේකිට මොන පිස්සුවක් ගහලද මන්දා මේ සීතලේ එළියට බැහැගෙන නටන්නේ. නොදන්න පළාතක..

sinhalaebooks.com

අම්මපා බයක් කියලා නාමයක් නෑනේ.' ඔහු සිතුවේ සුපුරුදු අමනාපයෙනි.

'මේ කෙල්ලව දැක්කම මට මොකක්දෝ හුරුවක් පේනවා...ම්... ඒත් ඉතිං කවුද? මෙහෙම හොල්මනක් නම් මට මීට කලින් කවදාවත් හම්බෙලා නෑ. සීයට දාහක් ෂුවර්. ඒ වුණත් ලංකාවේ කෙනෙක්නේ. අනික මට හිතෙන්නෙම මෙයා මං දන්න කෙනෙක් කියලානේ...'

***************

කෙත්මි උඩපනිමින් පඩි පෙල බැස ආවේ සාලයේ කිසිවෙකුත් පෙනෙන්නට නොවූ නිසා සැහැල්ලුවෙනි. හංසි උදේම ව්‍යායාම කරන්නට ගිය නිසාම කෙත්මිත් මදක් වත්තේ ඇවිදින්නට සිතුවේ ඊයේත් සංදේශ් සිටි නිසා හරියට ඇවිදින්න බැරි වූ නිසාය. අද ඔහු නැති නිසා හංසි එක්ක ටිකක් නිදහසේ ඇවිදින්නට කෙත්මි සිතුවාය.

*"ආ......"*

උඩපනිමින් ආ කෙත්මි කකුල පැටලී පහළට පෙරළුණේ සිතන්නටවත් වෙලාවක් නොතබාය.

sinhalaebooks.com

පහළටම පෙරළී කාගේ හෝ දෙපා අසල තමාව නතර වෙද්දී කෙත්මි හෙමිහිට හිස ඔසවා බැලුවේ නැඟිටින්න උත්සාහ කරමිනි. නමුත් තමා දෙස රවාගෙන බලා උන් කෙනා දකිද්දී නම් කෙත්මිට නැඟිටින්නටත් අමතක වී ගියේය. *'ඔය කලේ කෙත්මි උඹ... දැන් ඉතිං වලක් කපං වැලලියං..'*

*'හරි ෂෝක් ලොකු මැඩම්. කට විතරයි මහලොකුවට. පොඩි එවුන් වගේ.. ඇත්තමයි හොඳ වැඩේ මේකිට නම්.'* ඔහු මුහුණට නැඟෙන්නට ආ සිනහව සඟවාගෙන නිහඬවම ඉවත බලා ගනිද්දී කෙත්මි අමාරුවෙන් අත්වැට අල්ලාගෙන නැඟිටින්න උත්සාහ කළාය.

*"ආව්..."*

ඇයට කෑ ගැසුණේ වළලුකර දෙසින් ආ දැඩි වේදනාවටය. ඒ හඬට නම් සංදේශ් ඉක්මනින් හැරී බැලුවේය. මොනවා වුණත් මේ ඉන්නේ තම ව්‍යාපාර කටයුතුවලට සහයට පැමිණි කෙනෙක් නිසා ඔහු අමනාපය පසෙකලා උදව් කරන්නට සිතුවේය. නැතිනම් පාඩුව තමාටමය.

*"ආයූ ඕකේ මැඩම්?"*

sinhalaebooks.com

කියමින් ඔහු සූදානම් වූයේ ඇයට නැඟිටින්න උදව් කරන්නටය.

***"අයිම් ඔකේ මිස්ටර් සංදේශ්. ඩොන්ට් වොරි."***

කෙත්මි අපහසුවෙන් වුණත් ඔහුගේ උදව් නොලබාම නැඟිටිද්දී සංදේශ් මදක් බලා හිද යන්නට ගියේ කටින් පිටට පනින්න හදන වචන අපහසුවෙන් වළකාගෙන. 'ඒකිගේ ගණං. අනේ මට මොකෝ... ඕන රෙද්දක් කර ගත්තාවේ.'

මිදුලේ කතාවකට වැටී සිටි සමාධි මෙන්ම හංසිද හැරී බැලුවේ කාටදෝ බනිමින් සංදේශ් වාහනයට නැඟෙන දෙසය. 'කෙත්මි කිව්වා හරි. මේකා නම් යකා වැහුණු ගමන්ම තමයි.' හංසිට සිතුණාට කියන්න නොගියේ සමාධි උන් නිසාය.

***"අනේ ඒ අපේ අයියාගේ හැටි හංසි. ඔයා ගණන් ගන්න එපා. පොඩ්ඩ ඇත්තම් කේන්ති අරන් කාට හරි බනිනවා."***

හංසි සිනහවක් පා වටපිට බැලුවේ කෙත්මි තවමත් ආවේ නැති නිසාය.

***"මැඩම් තාම නෑ නේද... නිරාශා පොඩ්ඩක් බලන්න."***

සමාධිගේ කීමට බංගලාව දෙසට ගිය නිරාශා ගියාටත් වැඩි වේගයකින් ආපසු දුවගෙන ආවේ සමාධි පුදුමයෙන් බලා ඉද්දීය.

***"අනේ මිස්... ඉක්මනට යමු. අර මැඩම්..."***

***"මැඩම්?"***

***"අනේ යමු..."***

නිරාශා කලබලයෙන් කියද්දී ***හංසි*** ගේ දෙසට දිව්වේ මේ කියන්නේ කෙත්මි ගැනදැයි සිතමිනි.

***"දෙයියනේ...කෙත්මි..."***

කෙත්මි බිම වාඩි වී කකුලක් අල්ලාගෙන ඉන්නවා දකිද්දී හංසිට කෑ ගැසෙන්නට ආවත් ඇය ඉක්මනින් මුව වසා ගත්තාය. කෙත්මි ඇය දෙස අමනාපයෙන් බැලුවේ නොකිවයුතු යමක් කියවෙන්නට ගිය නිසාය.

වාසනාවකට සමාධිට එය ගනක් නොවූවත් රංගට නම් දැනුනේ අමුත්තකි. 'කෙත්මි... හොඳට අහලා පුරුදුයි ඒක..'

sinhalaebooks.com

*"අනේ මැඩම්.. මොකද වුණේ?"*

*"ලොකු ප්‍රශ්නයක් නෑ සමාධි. කකුල ටිකක් ලිස්සුවා."*

*"හොඳ ටික. රංග අයියේ... ඉක්මනට ඩොක්ටර්ට කතා කරන්න. අපේ අයියාටත් ඉක්මනට එන්න කියන්න."*

*"අනේ කරදර වෙන්න එපා සමාධි."*

************************

හදිස්සියේම සිදු වූ අනතුර නිසා වැඩ ටික ටික දිනකට කල් තබා කෙත්මි හංසිලාගේ නිවසට යන්නට තීරණය කළ නිසා එදින හැන්දෑවේම මිතුරියන් දෙදෙනා නුවරඑළියෙන් පිටත් වී ගියෝය. සංදේශ් තවමත් ආවේ නැති නිසා සමාධි බලා උන්නේ ඔහු එන තුරුය.

sinhalaebooks.com

*"පැංචි..."*

*"රංග අයියේ?"*

*"අපෙන් මොකුත් වරදක්වත් වුණාද බං... අර දිසානායක මැඩම් හදිස්සියේම යන්න ගියේ?"*

*"අපේ අයියාගේ පුස් පාට් ඇරුණම වෙන දෙයක් නම් වුණේ නෑ. හැබැයි ඉතිං ඒවත් ඒ කෙල්ල ගණන් ගත්ත පාටක් නෑ. බැලුවෙම අයියාව කපලා දාන්නනේ.."* සමාධි කිව්වේ සිනාසෙමිනි.

*"ඒක ඇත්ත. තව ටික දවසක් හිටියා නම් අරූට ප්‍රෙෂර් වැඩි වෙලා එකක් වෙනවා."*

*"අර කකුල අමාරු ඇති. ඒ නිසයි ගියේ. කොහොමත් දැන් ටික කාලයක් ලංකාවේ ඉන්න නිසා ඉක්මනට අපේ වැඩෙත් කරලා දෙන්නම් කිව්වා."*

*"ඒක හොඳයි."*

sinhalaebooks.com

සංදේශ්ගේ වාහනය ඈතින් එනවා දකිද්දී සමාධි ගෙතුළට ගියේ ගෙදර යන්නට සූදානම් වන්නටය. ආ වැඩේ මඟදී නතර වූ නිසා දැන් මෙහි සිට පලක් නැත.

රෑ කෑමෙන් පසු හංසි උණු වතුර භාජනයකුත් රැගෙන කාමරයට ගියේ කෙත්මිගේ කකුල මදක් තවා බෙහෙත් ගල්වන්නට සිතාගෙනය. කෙත්මි ඒ වන විටත් උන්නේ කකුල කොට්ටයක් මත තබාගෙන කල්පනා කරමිනි.

*“මොකෝ මැඩම් කල්පනාව?”*

*“අපරාදේ බං ආවේ... ටිකක් රෙස්ට් කරලා වැඩේ ඉවර කරගෙනම එන්න තිබ්බා අපිට.”*

*“අනේ මේ... නටන්නේ නැතුව ඉදපං. එයාලාගේ වරදක් නැති බව අපි දැක්කානේ. දැන් මෙහේ ඉදගෙන රිපෝට් එක හදලා යවමු. ඒ ඇති.”*

*“හංසි?”*

*"කෙත්මි... මේ සෙල්ලම හරියන්නේ නෑ. ඔයාට එයාලා ඉස්සරහට ගිහින් උදව් කරන්න ඕන නම් රිතූ කෙත්මිණී විදිහට එයාලා ඉස්සරහට යන්න. මං කැමති නෑ ඔය කරන වැඩේට."*

*"හංසි... මං ඇත්ත නොකියන්නේ ඒක කාටත් හොඳ නිසා. අහම්බෙන්නේ මට මේ වැඩේ හම්බුණෙත්. ඔයා කිව්වා හරි. අපි ආයේ යන්නේ නෑ. දුරින් ඉඳලා උදව් කරමු."*

*"ඒක හොඳයි... මේ.. ඒක නෙමෙයි. ඇත්තටම අර යකා උදේ උඹ පඩිපෙලෙන් වැටෙනවා දැක්කේ නැද්ද? නැත්තං දැකලත් නොදැක්කා වගේ ගියාද?"* හංසිගේ පැනයට කෙත්මිට සිනහවක් නැඟුණි.

*"ආව්... ආව්... හිනාව බලපංකෝ..."*

*"අනේ හිටපං බං."*

*"මොකෝ උනේ කියපං ඉතිං..."*

කෙත්මි සිනාසෙමින්ම සිදුවූ දේ හංසිට කියා දැමුවාය.

sinhalaebooks.com

"කෙත්මි... උඹත් දැන් ගානකට හැදිලා. යකෝ උඹට බය නැද්ද අර යක්ෂයා එක්ක එල්ලෙන්න යන්න. උඹ වෙනදට ඔහොම නෑනේ බං.."

"ඇයි උඹට මතක නැද්ද අවුරුදු තුනකට කලින් ඔය මනුස්සයා හොස්පිට්ල් එකට ඇවිත් මට දාපු පාට් එක"

"ඒක ඉතිං උඹේ වැරැද්දනේ... එදා වුණ දේවල් වලට එහෙනම් උඹ දිලූෂ අයියාගෙනුත් පලි ගන්න එපැයි. ඒකා උඹට ගැහුවත් එක්කනේ."

"අනේ මන්දා.. පලිගන්න නෙමෙයි බං. අර උඹ කිව්වාත් වගේ අහක යන මී හරක් කුලප්පු කරද්දිත් වෙනම ජොලියක් තියෙනවා."

"කෙත්මි... මේක සෙල්ලමක් නෙමෙයි හොඳද... ඔය යකා ඔහොම හරි ඉන්නේ බිස්නස් එකේ ප්‍රශ්නේ නිසා."

"අපි බලමු."

sinhalaebooks.com

කෙත්මි තනිවම සිනාසෙමින් කියද්දී කෙත්මිගේ දුරකතනයට ඇමතුමක් ආවේ සංදේශ්ගේ අංකයෙනි.

*"ලේසියෙන් මැරෙන්නේ නෑ. මෙන්න ලොක්කා ගන්නවා... කියන තැනකට වදින්නම් ඕකාව කුලප්පු කරන්නේ නැතුව කතා කරපං මගේ දෙයියෝ..."*

හංසිටද අමුතු සිනහවක් පාමින් කෙත්මි දුරකතනය අතට ගත්තාය

*"හෙලෝ.."*

*"හරි ෂෝක්නේ මැඩම්... මගේ මීටින් එක නිසා වැඩ පාඩු කරගන්න බෑ කියපු කෙනා සේරම වැඩ අතරමඟ දාලා යන්නත් ගිහින්..."* සංදේශ් කතා කරන්නේ කේන්තියෙනි.

*"මිස්ටර් සංදේශ්... මට පොඩි කරදරයක් වුනා කියලා සමාධි කියන්න ඇතිනේ. සෝ ප්ලීස්..."*

*"කරදරයක් වුණා? හහ්.. අපි නම් ඕවාට කියන්නේ හිතලම කරගන්න කරදර කියලා. මොකද*

sinhalaebooks.com

*තමුන්ට පඩිපෙලේ උඩ පනින්න කියලා අපි කවුරුත් කිව්වේ නෑනේ. මහලොකු මැඩම්. හරියට අඩියක් තියා ගන්න බෑ."*

*"මිස්ටර් සංදේශ්... මං කියන දේ ටිකක් අහන්න.."*

*"ඊට කලින් මං කියන දේ අහගත්තොත් හොඳයි මැඩම්... හෙට උදේම ඇවිත් අද කරන්න බැරි වුණ වැඩ ටික ක්ලියර් කලොත් හොඳයි. කකුල කැඩිලා නෑනේ. මං කැමති නෑ මගේ කාලය කවුරුවත් නාස්ති කරලා දානවට."*

සංදේශ්ගේ කතාව කෙත්මි අහගෙන උන්නේ ඇයගේ කේන්තිය ඉහළටම නඟිද්දීය. ඔහු මේ හදන්නේ පෙරදා තමා කී කතාවට පලිගන්නට බව පැහැදිලිය.

*"දැන් එතකොට මිස්ටර් සංදේශ් කියන්නේ.."*

*"ඔව් මැඩම්. මැඩම්ට ඇහුණ දේ තමයි මං කිව්වේ. තමුන්ට තියෙන නැටිල්ලට තැන් තැන්වල වැටිලා අතපය කඩා ගත්තාට අපේ බිස්නස් පලි නෑනේ. ඒ පාඩුව මැඩම් ගෙවනවද? ඒ නිසා කරුණාකරලා මගේ*

sinhalaebooks.com

*වැඩේ ඉවර කළොත් හොඳයි. එහෙම නොවුණොත් මම..”*

*“ඉනෆ් මිස්ටර් සංදේශ්. හෙට උදේ අට වෙද්දී මං අදාල ලොකේෂන් එකට එනවා. හැබැයි මේකත් මතක තියාගත්තොත් හොඳයි... තමුන් මට ඔය දාන සද්දවලට මට ඕන නම් තමුන්ගේ කම්පැනි එකත් එක්ක තියෙන කන්ට්‍රැක්ට් සේරම දැන්මම ඉවර කරලා දාන්න පුළුවන්... ඉඩියට්..”*

කෙත්මි කේන්තියෙන් දුරකතනය පසෙකට විසි කරද්දී හංසි ඇය දෙස බලා උන්නේ පුදුමයෙනි.

*“හංසි... හෙට පාන්දරම යන්න ලෑස්ති වෙන්න.”*

*“හෙට? අර කඳු පාරවල් වල උඹට වාහනේ ගෙනියන්න පුළුවන්ද ඔය කකුලත් එක්ක? පිස්සු නටන්න එපා. මං සමාධිට කෝල් කරලා බලන්නම්.”*

*“නැහැ. අපි හෙට පාන්දර යනවමම තමයි හංසි. මිස්ටර් සංදේශ් තවම දන්නේ නෑ මං කවුද කියලා...”*

*“ඔව් ඉතිං... දන්නේ නැති නිසානේ ඔය පුපුරන්නේ. දැනගත්තා නම් කවුද කියලා ඔය පාට් මොකුත් නෑ.”*

හංසිට කියවුණේ අතීතය සිහිවීය. කෙත්මි ඇය දෙස රවා බැලුවාය.

*“පසන් අයියා හෙට නිවාඩු කිව්වා නේද?”*

කෙත්මි ඇසුවේ හවස පසන් ඔවුන්ව බලන්න ආ මොහොතේ එවැනි කතාවක් කී බව සිහි කරමිනි.

*“ඔව් හැබැයි.”*

*“පසන් අයියා එක්ක යමු. ගිහින් හෙටම වැඩ ටික ඉවර කරගෙන එමු. හැබැයි එක පුංචි වැරැද්දක් හරි තිබ්බොත්...”*

*“තිබ්බොත්?”*

*“මං කම්පැනි එකට රිපෝට් කරනවා.”*

*“කරයි කියලා තමයි බය. එහෙම නම් උඹට එහෙදිම ඒක කරන්න තිබ්බානේ. බොරුවට කියවිල්ල*

sinhalaebooks.com

***විතරයි කාගේ කාගෙත්...”*** හංසි කෙත්මිට බැනවදිමින්ම යන්නට ගියාය.

sinhalaebooks.com

22.

උදේම පසන් සමඟ කඳපොළ පිහිටි මල් පැළ තවානට ආ කෙත්මි කෑමක් බීමක්වත් නැතිව වැඩ කරන්නට පටන් ගත්තේ සංදේශ් සමඟ තිබූ තරහටමය. සමාධි කිහිප විටක්ම ඇයගෙන් සමාව ඉල්ලුවේ සංදේශ්ගේ හැසිරීමටය. නමුත් කෙත්මි ඇයට කිසිවක් නොකීවේ ඇය මේවාට සම්බන්ධ නැති බව දන්නා නිසාමය.

*"සුදු නංගී..."*

පසන් ඇවිත් කෙත්මි ඉදිරියෙන් වාඩි වූයේ තේ කොප්පයක් ඇය ඉදිරියේ තබමිනි. හංසිත් එහා මේසයකට වී තේ බොන අයුරු කෙත්මි දුටුවේ ඒ මොහොතේය.

*"තැන්ක්යූ අයියේ. ඔයා තේ බිව්වාද?"*

sinhalaebooks.com

*"ඔව් සුදු නංගි. ඔයා කැවෙත් නැනේ. ඔය තේ එකවත් බීලා ඉන්න. බෙහෙත් ටික බොන්නත් එපැයි."*

*"ආ... මැඩම් ඇවිල්ලා ඉන්නේ... බෝයිෆ්‍රෙන්ඩ්ද මේ? හොඳයි හොඳයි."*

කොහේදෝ හිඳ ආ සංදේශ් කාර්යාලයට ඇතුල් වූවේම එසේ කියාගෙනය.

*"කොහොම හරි මිස්ටර් සංදේශ්ගේ වැඩේ ඉවර වෙන්න නේ ඕන... ඒක වෙයි."*

කෙත්මි කීවේ අමනාපයෙනි. පසන් සිනහවක් පා එළියට යද්දී හංසි බිම බලාගෙනම වැඩ කරන්නට වූයේ දෙන්නා මොන ජල්ලියක් අල්ලාවිදැයි සිතමිනි. නොකිව්වාට සමාධිත් උන්නේ ඒ සිතුවිල්ලේමය.

*"අපරාදේ මැඩම් කරදර වුණේ... අර ෆෝන් එකෙන් කිව්වා වගේ කන්ට්‍රැක්ට් එක කැන්සල් කලා නම් ඉවරනේ..."*

*"අයියේ.... ඔයාට පිස්සු හැදිලද?"* සමාධි ඇසුවේ කේන්තියෙනි.

***"මට නම් පිස්සු හැදිලා නෑ. ඒත් ඉතිං මේ වගේ පිස්සු හෝන්තු එක්ක වැඩ කරද්දි නම් හිතෙනවා කොච්චර පාඩු වුණත් මේ මඟුල් කන්ට්‍රැක්ට් ඒක ඕන නෑ කියලා."***

***"එහෙමද මිස්ටර් සංදේශ්? ඕකේ. නෝ ප්‍රොබ්ලම්. හංසි... අපි යමු."***

කෙත්මි බෑගයත් ගෙන යන්නට නැඟිටිද්දී සංදේශ් ඇයගේ අතක් දැඩිව අල්ලාගෙන ඇයට ළං වුණේ සමාධි මෙන්ම හංසිද පුදුමයෙන් බලා ඉද්දීය. ඔහු රිදෙන තරම් තදින් අත අල්ලා ගනිද්දී කෙත්මි කේන්තියෙන් ඔහු දෙස බැලුවාය.

***"ඔව්.. යනවා. ආයෙ කවදාවත් මගේ ඇස් ඉස්සරහට එන්න එපා. මං ඒක තමුන්ට මීට කලිනුත් සැරයක් කිව්වා. ඒක අමතක වෙලා වෙන්න ඇතිනේ ආයෙ එන්න ඇත්තේ..."*** සංදේශ් ඒ ටික කීවේ කෙත්මිට පමණක් ඇසෙන්නටය.

කෙත්මි ඔහු දෙස එකවරම බැලුවේ දෑස් විසල් කරගෙනය. ඔහු එය නොදුටු අයුරින් ඇයව අතහැර කාර්යාලයෙන් පිටතට ගියේ කෙත්මි ආපසු පුටුව මතටම ඇදගෙන වැටෙද්දීය.

***"මැඩම්..."***

sinhalaebooks.com

හංසි මෙන්ම සමාධිත් කෙත්මි වෙත දුවගෙන ආවේ ඇයට හදිස්සියේම සිදු වූයේ කුමක්දැයි බලන්නටය.

කෙත්මි උන්නේ සංදේශ් අන්තිමට කී වචන ගැන කල්පනා කරමිනි. 'මං ඒක තමුන්ට කලිනුත් කිව්වා. ඉන්නේ මම කියලා දැන දැනම ආයෙත් මොකටද ආවේ?' මේ කියන්නේ වසර තුනකට පෙර රෝහලේදී කියූ කතාව ගැනද? එසේ නම් ඔහු දැනටමත් තමාව අඳුනාගෙන අවසන්ද?

ඒ මොනවා වුණත් කෙත්මි මේ වන තුරුම සිතා උන්නේ සංදේශ් රෝහලේදී එසේ කිව්වේ හිතේ කේන්තියට කියාය. ඔහු තමා සමඟ මේ තරම් වෛරයෙන් සිටින බවක් ඇය නිකමටවත් සිතුවේ නැත.

*"මැඩම්..."*

*"අපි යමු හංසි. හෙඩ් ඔෆිස් එකට ඉන්ෆෝම් කරන්න මේ වැඩේට මං මිස්ටර් සුජීව ව රෙකමන්ඩ් කළා කියලා."*

කී කෙත්මි සමාධි දෙසවත් නොබලා යන්නට නැඟිට්ටේ තවත් මෙතැන සිට කරන්නට දෙයක් නැති බව තේරුම් ගත් නිසාය.

***"මැඩම්... මට සමාවෙන්න අයියාගේ මේ හැසිරීමට... මං.."***

***"සමාධි අක්කේ.."***

මෙතෙක් දවස් මිස් සමාධි කියා ඇයට කතා කළ කෙත්මි අද මෙසේ කතා කරද්දී සමාධි මෙන්ම හංසි ද ඇය දෙස බැලුවේ පුදුමයෙනි.

***"මැඩම්..."***

***"නෑ... මට ආයේ මැඩම් කියන්න එපා. ආයේ ඔයාලාගේ කම්පැනි එකත් එක්ක මං වැඩ කරන්නේ නෑ. මට කෙත්මි කියන්න. ඒ ඇති."***

***"කෙත්මි..!"***

සමාධි ඒ නම යලිත් කීවේ කොහේ හෝ ඒ නම අසා පුරුදු නිසාය. නමුත් කොතනදැයි ඇයට මතකයක් නැත.

***"ඔව්. කෙත්මි. මිස්ටර් සංදේශ්ට කියන්න මං ආයේ මේ කිසිම දේකට ඉන්වෝල් වෙන්නේ නෑ කියලා. එහෙම කියලා ඔයාලාට පාඩුවක්***

sinhalaebooks.com

*වෙන එකක් නෑ. මිස්ටර් සුජීව ඉස්සරහට දිගටම ඔයාලාත් එක්ක වැඩ කරයි. අපි යන්නම් එහෙනම්. ස්තූතියි මේ දවස් ටිකේම අපි වෙනුවෙන් කළ දේවල් වලට."*

*"කෙත්මි.."*

*"අපි යමු හංසි."*

කී කෙත්මි බෑගයත් ගෙන කකුලත් අද්දවමින් ගොස් වාහනයට නැඟුණේ සමාධි දුකෙන් බලා ඉද්දීය. ඇයට ළං වී අයියා කීවේ කුමක් වුවත් එය එතරම් හොඳ දෙයක් නොවන බව නම් විශ්වාසය.

*"අපි යන්නම් මිස් සමාධි."*

*"වෙච්ච දේවල් වලට සමාවෙන්න හංසි."*

හංසි නිහඬම ඇයගේ උරහිසට තට්ටු කර ඇවිත් වාහනයට නැඟුණාය.

sinhalaebooks.com

*"කෙත්මි... උඹ දන්නවද මොකක්ද මේ කළේ කියලා? උඹට පිස්සුද බං? මෙච්චර දවසක් උඹ මහන්සි වුණේ ඔය ටික කරගන්නද?"*

හංසි කෑගසන්නට වූයේ පසන් වාහනය මද දුරක් පදවාගෙන එන අතරේය.

*"හංසි... ප්ලීස්. මං කියපු දේ විතරක් කරන්න."*

*"උඹට ඔහොම ඔය දේවල් අත අරින්න බෑ කෙත්මි."*

*"බැරි නෑ හංසි. මට ඕනම දෙයක් අතඅරින්න පුළුවන්. අවුරුදු තුනකට කලින් කලා වගේම. මං ආයෙමත් මුල ඉඳන් පටන් ගන්නවා."*

*"මොන පිස්සුවක්ද බං මේ? ආයේ පාරක් කල්පනා කරලා බලපං කෙත්මි. මේක ඔෆිස් එකට ඉන්ෆෝම් කරපු ගමන් වෙන දේ උඹ දන්නවා. මේ වැඩේ විතරක් නෙමෙයි කෙත්මි... මේක කළොත් උඹේ පොසිෂන් එකට කෙලින්ම මිස්ටර් සුජීව ව රිප්ලේස් කරනවා. එතකොට උඹට මොකද වෙන්නේ?"*

ඒ කතාව ඇසෙද්දී නම් මෙතෙක් වෙලා මේ කතාවට නිහඬව සවන් දුන් පසන් ක්ෂනිකව කෙත්මි දෙසට හැරී බැලුවේය.

*"සුදු නංගි... මොනවද මේ හංසි කියන්නේ? ඔයා මේ මහන්සියෙන් ගොඩනඟා ගත්ත තැන එක මොහොතකින් විනාශ කරගන්නද හදන්නේ?"*

*"මට කොහොමත් ලංකාවේ ඉන්න හිතක් නෑ අයියේ. මේ වැඩ ටික මිස්ට සුජීවට බාර දීලා මට ආපහු යන්න තිබ්බොත් හොඳයි. හංසි... උඹට මං මිස්ටර් සුජීව එක්ක වැඩ කරන්න හදලා දෙන්නම්. උඹ අම්මලා එක්ක දිගටම ඉඳපං. මං මිස්ටර් සුජීවගේ පොසිෂන් එකට යනවා කියලා හිතලා ඉවරයි."*

*"ඉවරද උඹ කියවලා? උඹ නම් හැදෙන එකියක් නෙමෙයි කෙත්මි. කලබල වෙලා තීරණ ගන්න එක කවදද උඹ නතර කරන්නේ?"*

*"ප්ලීස් හංසි... දැන් ඇති. ඔෆිස් එකට හෙට වෙද්දිවත් මේල් එක යවන්න. උඹට බැරි නම් ඒකත් මං කරන්නම්. මගේ කකුල සනීප වුණ ගමන් මං ආයෙත් යනවා."*

sinhalaebooks.com

කේත්මි එසේ කියා අසුනට බර වී දෑස් වසා ගත්තේ කාටවත් කිසිවක් කියන්නට ඉඩක් නොතියාමය. ඇය මේ තීරණය ගෙන අවසන්ය. ලංකාවට පැමිණ අනවශ්‍ය ප්‍රශ්නයක් දා ගත්තා යැයි සිතෙන්නේ දැන්ය.

සංදේශ්ගේ හැසිරීම ඇයගේ සිත බොහෝ රිදවා තිබුණි. ඇයව හඳුනාගත් විට ඇය ඔහුගෙන් බලාපොරොත්තු වූනේ උණුසුම් පිළිගැනීමක් මිස මෙවැනි තරහක් නොවේ. ජීවිතයේ සිටි තවත් වැදගත්ම චරිතයක් අහිමි වූවාක් වැනි වේදනාවක් ඇයට දැනුණි.

**************************

පසු දින සමාධි ගෙදර ආවේ රංගත් සමඟය. සංදේශ් හවස කාර්යාලයෙන් පිටවී කොළඹ ඇවිත් තිබුණේ ඔවුන් දෙදෙනාද එහි දමාය. සංදේශ්ගේ හැසිරීම ගැන ඇය උන්නේ කේන්තියෙනි. ගෙදරට වාහනය මිදුලේ නතර කරද්දීම ඇය දුටුවේ උඩුමහළට වී බලා සිටින ඔහුවය.

***"ඔය ඉන්නේ බලාගෙන..."*** කියමින් ඇය වාහනයෙන් බැස්සේ තරහිනි.

*"නංගී... උඹ දැන් ඌට කෑගහන්නේ නැතුව පොඩ්ඩක් කතා කරලා බලපං."* රංග කීවේ අයියාගේත් නංගීගේත් තරම දන්නා නිසාය.

*"ඔයා කියන්නේ මෙයාව නලවන්න කියලද? කොහොමද මෙහෙම බිස්නස් කරන්නේ? හරියට මනුස්සයෙක්ට කතා කරන්නවත් දන්නේ නැතුව."*

කී ඇය  රංග දෙසටත් රැවුමක් පා කර ගෙතුළට ගියේ රංගත් ඇය පසුපසින්ම යද්දීය.

*"අයියේ...."*

සමාධිගේ කෝපී හඬට සංදේශ්ගේ මුවෙහි නැඟුණේ සිනහවකි. ඔහු මෙය බලාපොරොත්තුවෙන් උන්නේය.

*"මොකද?"*

*"තමුසේ හිතන් ඉන්නේ මහා වීරයෙක් කියලාද? මනුස්සයෙක්ට හරියට කතා කරන්නවත් දන්නේ නැති කෙනෙක්ද මගේ අයියා?"*

*"පැංචී... අදාල කෙනාට අදාල විදිහට කතා කරන්න මම දන්නවා. මේ කන්ට්‍රැක්ට් එක නැති වුණා කියලා අපි බංකොලොත් වෙන්නේ නෑ. ඒ නිසා ආයේ ඔය ගැන කතා නොකර ඉන්නවා."*

*"ඇයි මං කතා නොකර ඉන්නේ? අපි බංකොලොත් වුණත් මට කමක් නෑ අයියේ. ඒත් මට දැන ගන්න ඕන අර කෙල්ලත් එක්ක ඔයාට ඔය තරම් තියෙන තරහා මොකක්ද කියලා. මං මේ ටිකේම බලාගෙන හිටියේ ඔයා කරපු දේවල්. අච්චර කකුලේ වේදනාවක් තියාගෙනත් ඒ කෙල්ලව ගෙදර ඉන්න දෙන්නේ නැතුව ගෙන්නලා... ආවට පස්සේ මොනවද ඒ කියෙව්වේ ඔයා?"*

*"ඒකි ගැන කතා කරන්න එපා. මං ඒකිව මගේ ජීවිතෙන් අයින් කරලා දැම්මේ මීට අවුරුදු තුනකට කලින් පැංචි. ඒකි.. ඒකිට මං එපා කියලා තියෙද්දිත් ආයෙමත් මගේ ඉස්සරහට ආවා... උඹ නොදන්නවා වුණාට මීට අවුරුදු තුනකට කලින් ඒකි කරන්න ගියපු දේ කලා නම් උඹටවත් මටවත් අද මේ තරම්වත් සැනසීමේ ඉන්න බැරි වෙනවා පැංචි..."*

සමාධි ඔහු දෙස බලා උන්නේ පුදුමයෙනි. මීට අවුරුදු තුනකට කලින්? මේ කියන්නේ මොනවාද? ඇය පුදුමයෙන් රංග දෙස බැලුවේ ඔහුගෙන් පිළිතුරක් අපේක්ෂාවෙනි.

sinhalaebooks.com

සංදේශ් කියන්නේ මොනවා ගැනදැයි රංගට අමතක නැත. එදා එතැන ඔහුද උන්නේය. නමුත් මේ ගැන සමාධිට කියන්නට බැරි එදා සංදේශ්ට වූ පොරොන්දුව නිසාය. නමුත් රංග නිහඬව ඉවත බලා ගනිද්දී මෙයට ඔහුත් සම්බන්ධ බව නම් සමාධි හොඳින්ම තේරුම් ගත්තාය.

***"රංග අයියේ ඔයත්? ඒ කියන්නේ ඔයාලා දෙන්නම කෙත්මිව කලින් ඉඳලා දැනන් හිටයාද?"*** සමාධිගේ මුවින් ඒ නම පිට වෙද්දී සංදේශ් වේගයෙන් ඇය වෙත හැරුණේය.

***"උඹ කොහොමද පැංචි දන්නේ ඒ ඉන්නේ කෙත්මි කියලා?"*** සමාධි පෙරදින හැන්දෑවේ සිදු වූ සිදුවීම ඔහු හා කීවේ මෙහි අගක් මුලක් සොයා ගන්නට ඕනෑ නිසාමය.

***"එහෙනම් පිලිගත්තා තමන් කවුද කියලා..."***සංදේශ් මුමුණා ගත්තේ තමාටමය.

***"මට ඇත්ත කියන්න අයියේ... මොනවද මේ වෙන්නේ? ඒ ළමයට ඒ විදිහට කතා කරන්න තරම් ඔයාට එයා මොනවද කළේ?"***

sinhalaebooks.com

***"නංගි.... අපි ඒ ගැන වෙන වෙලාවක කතා කරමු."***

***"නෑ රංගයා. පැංචිත් දැන් මේවා දැනගන්න ඕන. මොකද එදා ඒ දේ වුණා නම්... මං විතරක් නෙමෙයි මේකිත් විඳවනවා."***

***"සංදේශ්... උඹටත් මං මේ කියන්නේ. දැන් ඔය දේවල් අතඇරලා දාපං බං. ඒ කෙල්ල එදා කළ දේට අපිට මොකුත් කියන්න බෑ.. ඒකි හිටපු තත්වේ මට වඩා හොඳට උඹ දන්නවා. මං හිතුවේ නෑ බං උඹ ඔය සිද්ධියට ඒ කෙල්ලගෙන් මේ තරම් පළි ගනියි කියලා."***රංග කීවේ මේ දවස් ටිකේම කියන්නට බලා උන් දේය. ඔහුටත් කෙත්මි ගැන දැනුනේ දුකකි.

***"ඔව්. මං ඒක දන්නවා. ඒක තමයි එදා මං ඒකිව අතඇරියේ. ඒත්... ඒ සිද්ධිය මතක්වෙන වාරක් වාරයක් ගානේ මාව පිච්චෙනවා යකෝ... පිච්චෙනවා. එදා ඒ කරපු දෙයින් ඒකි මට දුන්නේ සුළුපටු ගින්දරක් නෙමෙයි. මගෙන් කවදාවත් ඒ කරපු දේට සමාවක් නෑ බං."***

***"අයියේ... කරුනාකරලා මට කියන්න මොනවද මේ ඔයාලා කියවන්නේ? අවුරුදු තුනකට***

*කලින් මොනවද වුණේ? ඇයි මේ තරම් කේන්තියක්? කෙත්මි ඔයාට කරපු වැරැද්ද මොකක්ද?"*

*"කෙත්මි... හහ්... කෙත්මි කිව්වාම නොදන්නවා වුණාට ඒ කවුද කියලා උඹත් දන්නවා නංගි."*

*"මං දන්නවා? නෑ... මං කවදාවත් එහෙම නමක් අහලා නෑ. මීට කලින් මට එයාව හම්බෙලාත් නෑ."*

*"ඔව්. ඔයා දැක්කේ ඔය රූපේ නෙමෙයි."*

*"අයියේ... ප්ලීස්. මට දැන්වත් ඇත්තටම මේ වෙන්නේ මොනවද කියනවද? කෙත්මි..."*

*"කෙත්මි? හහ්..."*

# 23.

*"කෙත්මි... හහ්... කෙත්මි නෙමෙයි ඒකි."*

*"එහෙනම් කවුද?"*

*"රිතූ... රිතූ කෙත්මිණී දිසානායක. හහ්... මහලොකු දිසානායක මැඩම්."*

සංදේශ් කී කතාවට සමාධි පුදුමයෙන් දෑස් විසල් කරගත්තාය. ඇයට සිහි වුනේ කෙත්මි පෙර දින හවස ඇයට කටපුරා අක්කේ කියා කතා කළ අයුරුය.

*"දෙයියනේ... එතකොට... ඒ රිතූද?"*

*"ඔව්. ඒ රිතූ. ඒකි හිතන්න ඇත්තේ මට අඳුරගන්න බැරිවෙයි කියලා. මූණ වෙනස් වුණාට මට*

*ඒකිව අඳුරගන්න බැරිකමක් නෑ."* සංදේශ් කීවේ කට කොනකින් සිනාසෙමිනි.

*"ඒත් අයියේ... ඒ රිතූ නම්... ඇයි ඔයා එයත් එක්ක මේ තරම් තරහින්?"*

සංදේශ් කතා නොකරම දෑස් තදින් පියා ගත්තේ ඒ සිදුවීම මතක් වී ඇඟ සීතලවී යද්දීය.

සමාධි ඔහු දෙසම බලා උන්නද ඔහු කතා කරන පාටක් නැත. රංග ඔහු දෙස බැලුවේ දුකෙනි. ඒ සිදුවීම සිහිවන වාරයක් පාසා ඔහු විඳවන අයුරු රංග මේ අවුරුදු තුන පුරාම හොඳින් දිටුවේය. ඒ නිසාම ඔහු සංදේශ්ගේ උරහිසට තට්ටු කළේ ඔහුව සන්සුන් කරන්නටය.

*"නංගී... මං කියන්නම් හැමදේම."*

කී රංග කතා කරන්නට වූයේ සංදේශ් මේ ඉන්නේ ඒ කතාව කියන්න තරම් සුදුසු තත්ත්වයක නොවන නිසාය.

*"ඒක වුණේ ඔයාගයි අසිතගෙයි වෙඩින් එක දවසේ..."*

*"අසිත. බල්ලා... ඌ තමයි මේ හැම එකකටම මුල..."*

sinhalaebooks.com

***"අයියේ..."***

සමාධි මදක් නිවුණු හඬින් කතා කළේ සංදේශ්ට ඔහුගේ නම ඇසුණත් කේන්ති බව දන්නා නිසාමය.

***"එදා මොකක්ද වුණේ රංග අයියේ? එදා තමයි මං ඉස්සෙල්ලාම රිතූව දැක්කේ. පිටත් වෙන්න හදද්දී ආයෙත් පාරක් මට එයාව බලන්න ඕන කියලා හිතුවත් එයා කලින්ම ගිහින් තිබුණා."***

***"ඒ වෙද්දී එයා හිටියේ ඔයත් එක්ක කතා කරන්න පුළුවන් තත්ත්වෙක නෙමෙයි නංගි."***

***"ඒ කිව්වේ?"***

***"සමාධි. කලබල නොවී මේක අහන්න නංගි. ඔයා දැන් දන්නවානේ රිතූට අරූ එක්ක තිබුණ සම්බන්ධෙ ගැන. ඒ වගේම එදා වෙනකම් වුණ හැම දෙයක්ම වගේ?"***

රංග අසද්දී සමාධි හිස වැණුවේ දුක්බරවය. ඒ සියල්ල ඇය දැනගත්තේ මීට ටික කලකට පෙරය. එදා සංදේශ් ඒ දේවල් කීවේ නොකියා බැරිකමටය.

*"ඔයාට හිතා ගන්න පුළුවන්නේ එදා ඒ කෙල්ල ඉන්න ඇත්තේ මොන වගේ ප්‍රෙෂර් එකකද කියලා? එදා අනික ඒ ළමයාගේ බර්ත්ඩේ එකලු. පව් පුංචි කෙල්ල."* රංග දුකින් කියද්දී සංදේශ් ඔහු දෙස රවා බැලුවේය.

*"උඹ වෙච්ච දේ විතරක් කිව්වා නම් ඇති. නැත්තං උඹ දුක් වෙවී ඉදපං... මම ම කියන්නම් පැංචිට."*

*"මූ යකෝ... උඹට ඒ කෙල්ලව පෙන්නනත් බෑ. අපිට ඒකී ගැන කතා කරන්නත් බෑ. අනේ බං කාටද උඹ මේ බොරු කරන්නේ?"*

රංග කී කතාවට සමාධි මදක් හඬින් සිනාසෙද්දී සංදේශ් එතැනින් යන්නට ගියේ දෙදෙනාටම හොඳහැටි රවමිනි.

*"රංග අයියේ... එදා මොකද වුණේ?"*

*" රිතූ එදා හැදුවේ අපි හැමෝම දාලා මේ ලෝකෙන් යන්න නංගී. පව්... කෙල්ලට ඒ වුණ දේවල්*

දරාගන්න බැරිම තැන වෙන්න ඇති එහෙම තීරණයක් ගත්තේ..”

“මොකක්? ඔයා කියන්නේ එදා රිතූ...”

“ඔව් නංගි. එදා දවල් වෙද්දී රිතූ පේන්න හිටියේ නැති නිසා එයාගේ යාළුවයි මල්ලියි එයාව හොයන්න ගත්තා. රිතූ නෑ කිව්ව පාර අපිත් එක්ක හිටපු සංදේශුත් කලබලෙන් ගියේ කෙල්ලට මොකද වුණේ බලන්න. මුල ඉඳලාම සිද්ධිය දැනන් හිටපු නිසා මාත් ගියා බලන්න. හොටෙල් එක පුරාම බැලුවත් එයා හිටියේ නෑ.”

“එතකොට?”

“අන්තිමට අපි ගියේ බීච් එක පැත්තට. කොහේට හරි වෙලා අඬනවද බලන්න.”

“ඉතිං?”

sinhalaebooks.com

*"උඹට මතකද නංගී අර ටිකක් මුහුදට වෙන්න හදලා තිබ්බ පාලම? අර උඹලාගේ ප්‍රී ෂූට් එක කළේ?"*

*"ඔව්. මට මතකයි. එදා පොටොග්‍රැපර් කිව්වේ එතනින් වැටිලා කීප දෙනෙක්ම මැරුණා කියලා.."*

*"හ්ම්... අපි යද්දි රිතූ හිටියේ ඒ පාලමේ කෙලවරටම ගිහින් නංගි."*

*"මොකක්?"*

*"ඔව්. ඒකි අපිට හිතන්නවත් වෙලාවක් තිබ්බේ නෑ නංගි."*

*"මො...මොනවා?"*

*"ඔව්. එදා රිතූ එතනින් පහළට පැන්නා."*

ඒ ඇසෙද්දී සමාධි ලොකු හුස්මක් ගත්තේ ඒ තැන කෙතරම් භයානකදැයි කලින් අසා තිබුණ නිසාමය.

sinhalaebooks.com

*"පව්... රිතූගේ යාළුවා ඒක දැකලා එතනම සිහිය නැතුව ඇදන් වැටුණා. ඒ දැකපු දේත් එක්ක ආපු ෂොක් එකට අපි කාටවත් කරන්නේ මොනවද කියලා හිතා ගන්න බැරිවුණා. ඒත් සංදේශ් අපි හැමෝටම වඩා ඉක්මන් වුණා. ඌ පිස්සෙක් වගේ පාලම දිගේ දුවගෙන ගිහින් මුහුදට පැන්නේ..."*

*"දෙයියනේ..."*

*"එදා සංදේශ් විනාඩියක් හරි පරක්කු වුණා නම්... උඹලා දෙන්නාට යන්න වෙන්නේ හනිමූන් නෙමෙයි. අර කෙල්ලගේ මළ ගෙදර."*

ඒ වෙලාවේ රිතූගේ හිතේ තිබූ වේදනාව සමාධිට හිතා ගන්න අපහසු නැත. ඇයගේ දෑසට කඳුළු ඉනුවේ රිතූ වෙනුවෙනි.

*"ගොඩට අරන් එද්දිත් කෙල්ලට සෑහෙන්න වතුර පෙවිලා. සිහියක් තිබ්බෙත් නෑ. මට දකිද්දි හිතුණේ අපි පරක්කු වැඩිද කියලා. සංදේශ් වෙඩින් එකේ වැඩත් පැත්තක දාලා රිතූව අරන් හොස්පිටල් දිව්වේ. ගියපු ගමන් ගත්තේ අයිසීයූ එකට. මට හොඳට මතකයි නංගි අපේ එකාට එදා සැනසිල්ලේ හුස්මක් ගත්තේ කෙල්ලට කරදරයක් නෑ කියලා ඩොක්ටර් කිව්වට පස්සේ..."*

*"ඇයි දෙයියනේ මට මෙච්චර දෙයක් වෙලත් හැංගුවේ?"*

*"උඹේ සතුට වෙනුවෙන් නංගි. උඹේ සතුට වෙනුවෙන් සංදේශ් හැමදේම තනියම දරා ගත්තා. මොනවා වුණත් උෟ දුකින් හිටියේ රිතූ නංගි ගැන. නිතරම කිව්වේ මගේ නංගිගේ සතුට වෙනුවෙන් ඒ වගේම පොඩි කෙල්ලෙක්ට මං මෙහෙම ගින්දරක් දුන්නානේ කියලා. එහෙම හිටපු උෟට එදා ඇස් දෙකටම ඒ දේ දැක්කට පස්සේ උෟ මාර විදිහට ෂොක් වුණා නංගි. අදටත් උෟට ඒක මතක් කරන එක කොච්චර අමාරුද කියලා ඔයා දැක්කානේ?'*

*"ඒකද එහෙනම් අයියා අර කෙල්ලත් එක්ක තරහින් ඉන්නේ?"*

*"ඔව්. තමන්ගේ නංගි වගේ සලකපු කෙල්ල එහෙම දෙයක් කරගන්න ගියාම උෟට මොනවා හිතෙන්න ඇතිද? එදා මොනවා හරි වුණා නම් සංදේශ්ට කවදාවත් සැනසීමක් නැති වෙන්න තිබ්බා. මොනවා වුණත් හැබැයි මූ එදා කෙල්ලට සිහිය ආවට පස්සේ හොස්පිට්ල් එකටම ගිහින් හොඳට අමතලා ඇවිත් තිබ්බා."*

*"අර අසනීප ළමයට?"*

*"අයියා ගැන දන්නේ නෑ වගේ කතා කරන්න එපා බං. හිතේ ආවේගෙට උඹ බැනලා විතරක් ආපු එක ලොකු දෙයක්. එදා මූ කියලා තිබ්බා රිතූට කවදාවත් ආයේ එයාගේ ඇස් ඉස්සරහට එන්න එපා කියලා. ඇත්ත. ඒකිව දකින වාරයක් ගානේ මූ පිච්චෙනවා. ඒක මං තරම් වෙන කවුද දන්නේ.."*

*"ඒ මොනවා වුණත් රිතූ හරි පව් රංග අයියේ... ඒ කෙල්ල වයසට වැඩිය දුක් විඳිනවා. මං කෙල්ලට ටිකක් කතා කරන්න ඕන."*

*"කවුරුවත් කාටවත් කතා කරන්නේ නෑ. පැංචි... මං මේ උඹට හොඳින් කියන්නේ. ආයෙත් මේ දේවල් වලට ඒකිව ඇදගන්නේ නැතුව ඒකිට ඒකිගේ පාඩුවේ ඉන්න දීපං. හැබැයි ඒකිට කතා කරන්න ගිහින් මේ අයියව නරක මිනිහා කරගන්න එපා."*

එකවරම සංදේශ් කෑගසද්දී රංගත් සමාධිත් දෙදෙනාම නිහඬ වූවෝය.

*"පැංචි... දැන් වුණේ මොකක්ද කියලා දන්නවානේ. හැම දෙයක්ම දැන් වෙලා ඉවරයි.*

sinhalaebooks.com

*මෙතනින් එහාට අපේ ජීවිත වල රිතූ කියලා කෙනෙක් නෑ. එච්චරයි."*

**********************

හංසිත් කෙත්මිත් මදක් නිදහසේ ඇවිදින්නට ආවේ කලකට පසුවය. වැඩ ටික සුජීවට බාර දුන් කෙත්මිත් හංසිත් ටික දිනක් නිවාඩු ලබා ගත්තේ මද විවේකයක් ගත කරන්නටය. දෙදෙනා අද ආවේ මීට අවුරුදු තුනකට පෙර සමාධිගේත් අසිතගේත් විවාහය පැවති හෝටලයටය.

කෙත්මි වෙරළේ නතර වී බලා උන්නේ තමා එදා ජීවිතයම අතහැර දැස් පියා ගන්නට සිතා ඇවිද ගිය පාලම වෙතය. එදා සිතූ ලෙසම ජීවිතය අවසන් වුණා නම්... හංසිට පවා ඒ දෙස බලද්දී ඒ දිනය සිහිවී සුසුමක් හෙළුණි.

*"දෙන්නත් එක්ක නිදහසේ ටිකක් ඇවිදිමු කියලා ඇයි බං මෙතනටම ආවේ?"*

sinhalaebooks.com

***"එදා කරන්න ගිය දේට මට සමාවෙයන් හංසි... ඒත් මට අද හිතෙන්නේ ම සංදේශ් අයියා එදා මාව බේර නොගත්තා නම් හොඳයි කියලා..."***

***"කෙත්මී...."***

හංසි කෙත්මි දෙසට හැරුණේ කෑ ගසාගෙනය.

***"උඹට මේ මොනවා වෙලාද කෙත්මී... උඹට තවමත් ඕන මැරෙන්නද? ඒකත් අර අසිත වෙනුවෙන්? මට කියපං කෙත්මී... උඹ තාමත් ඌ ගැනද හිතන්නේ?"*** හංසි කේන්තියෙන් කෙත්මිගේ උරහිසෙන් අල්ලා සොලවමින් ඇසුවාය.

***"කවදාවත් නෑ හංසි. අසිතට ආදරේ කරපු කෙත්මි මීට අවුරුදු තුනකට උඩදි මෙතනදි මැරුනා."***

***"එහෙනම් මොනවද කියන්නේ?"***

***"මට ඒක කියා ගන්න තේරෙන්නේ නෑ හංසි. එදා හොස්පිට්ල් එකේදි එයා මට කෑගහලා යද්දී මං හිතුවේ ඒ වෙලාවේ හිතේ කේන්තියට කෑ ගැහුවට ඒක අමතක කරයි කියලා. ඒත්..."***

sinhalaebooks.com

***"ඒත්?"***

***"අවුරුදු තුනකට පස්සේ තාමත් එයා මට වෛර කරනවා මං එදා කරන්න ගිය දේට. ඒක මගේ ඇස් ඉස්සරහම පෙනෙද්දී... එදා මට තමන්ගෙම නංගිට වගේ සලකපු කෙනා අද මට මෙහෙම වෛර කරද්දී... අපරාදේ හංසි මං එදා බේරුණේ... එදා එයා මාව මරණයෙන් බේරගත්තට අද මං මේ හැම දෙයක් එක්කම නොමැරී මැරෙනවා."***

කෙත්මි කීවේ කටහඬ බිඳී යද්දීය. ඇත්තෙන්ම සංදේශ්ගේ හැසිරීම කෙත්මිගේ සිත බොහෝ රිදවා තිබුණි. ඒ ඇයි දැයි කියා හරියටම කියන්නට ඇයටත් හිතා ගන්නට බැරිය.

***"කෙත්මී..."***

***"මං ආයේ ලංකාවට ආවේ මෙහෙම දෙයක් බලාපොරොත්තුවෙන් නෙමෙයි බං... මට ඒ හැමදේම අමතක කරලා අලුතින් පටන් ගන්නයි ඕන වුණේ"***

කෙත්මි මේ කියන දේවල් ඔස්සේ ගොඩක් දේවල් හිතා ගන්නට ***හංසි***ට අපහසු වූයේ නැත. මොහොතකට පෙර ***හංසි*** බය වුණේ කෙත්මි තවමත්

sinhalaebooks.com

අසිත ගැන දුක්වෙනවා යැයි සිතාය. නමුත් මේ කියන දේවල් අසද්දී ඇයට දැනුණේ මද සැනසීමකි. ඇයට දැන් අසිත ගැන වගක් නැති එකම ලොකු දෙයකි.

***"හැමදෙයක්ම කාලය විසඳලා දෙයි බං... අපි ටිකක් කලබල නොවී ඉවසීමෙන් බලන් ඉමු."***

***"හ්ම්... එදා ඉඳන් වෙනස් නොවී මට ඉන්න එකම හයිය උඹ හංසි. ඔයා මගේ සහෝදරී."*** කෙත්මි කීවේ ඇයව වැළඳගනිමිනි.

***"ආහ්..."***

කෙත්මිට එකවරම කෑ ගැසුණේ ඇගේ ඇගේ කුමක් හෝ තදින් වදිද්දීය. හංසිත් කෙත්මිත් වටපිට බැලුවේ සිදුවූයේ කුමක්දැයි බලන්නටය.

***"බබා.... බලන්න ඔයා ඒ මොකක්ද කළේ? යන්න ගිහින් ඒ ආන්ටිට සොරි කියලා බෝලේ අරන් එන්න."***

මදක් එහායින් සිටි තරුණ මවක් ඔවුන් වෙත ඇවිද එමින් කියද්දී පුංචි බෝනික්කියක් වැනි සුරතල් දියණියක් ඔවුන් දෙසට දුවගෙන එන්නට විය. අවුරුදු තුනක් පමණ වූ ඇය දෙස බලා උන්නේ ආදරයෙනි.

sinhalaebooks.com

***"තොලී ආන්තී. බබා ආන්තිව ඉන්නවා දැත්තේ නෑ අලේ.."***

ඇය වචන ගලපමින් කියද්දී හංසිටද සිනහවක් නැඟුනේ ඒ හුරතලයටය. කෙත්මි ඇය අසලම දණගසා ගත්තේ ඇය වෙත ළං වෙමිනි.

***"අනේ ඒකට කමක් නෑ පැටියෝ. ආන්ටිට රිදුනේ නෑ."***

***"ආන්තී නෝතී. බොලු කියනවා. අම්මි කීන්නේ බොලු කියන්නේ නෝති බබාලා කීලා..."***

***"බොරු නෙමෙයි ඒන්ජල්. ආන්ටිට රිදුණේ නෑ."***

***"ඒන්දල්..! අපේ සැල මාමි කීන්නෙත් ඒම.."***

***"සැර මාමි?"***

***"අනේ සොරි නංගි... මෙයාට පුදුම දැඟලිල්ලක්නේ තියෙන්නේ.."*** ඔවුන් අසලට ආ

sinhalaebooks.com

දැරියගේ අම්මා කියන්නට වූයේ බිම දණගසාගෙන සිටි කෙත්මි දෙස බලාගෙනය. කෙත්මි හිස එසවූයේ සිනහ මුසු මුහුණෙනි.

නමුත් ඇය දෙසම බලා සිටි රුව දකිද්දී කෙත්මිගේ දෑස් පුදුමයෙන් විසල් වන්නට විය.

*"සශී අක්කා..."*

කෙත්මිගේ ආමන්ත්‍රණයෙන් අශිනි මොහොතක් ඇය දෙසම බලා උන්නාය. තමාගේ නම අශිනි වූවත් පුංචි කාලයේ සිටම ඇයට 'සශි' කියා ඇමතුවේ එකම එක කෙනෙක් පමණි. රූපයෙන් වෙනස් වූවත් ඉන්න කෙනා අඳුනා ගන්නට ඒ ටිකම ඇතිය.

*"දෙයියනේ... සුදු නංගි... ඔයා..?"*

අශිනි වහා ඉදිරියට පැන කෙත්මිව වැළඳ ගත්තේ හංසිත් දියණියත් පුදුමයෙන් මෙන් බලා ඉද්දීය.

*"කොහෙද දෙයියනේ මෙච්චර කල් ගිහින් හිටියේ? මං උඹව පුළුවන් තරම් හෙව්වා..."*

*"අක්කලා ඇවිත් ගොඩක් කල්ද?"*

sinhalaebooks.com

***"දැන් අවුරුදු දෙකකට වැඩියි නංගි. මේ හංසි ද?"*** ඇය ඇසුවේ හංසි දෙස බලමිනි.

***"ඔව් අක්කේ. හංසි, මේ ඉන්නේ අශිනි අක්කා. අ.. අ.."***

කෙත්මි ඉතිරිය නොකියා නතර කළේ තවමත් ඒ නම කියන්නට තරම් සිතට සවියක් නොවද්දීය. ඇය කියන්නට ගිය දේ හංසිට නොතේරුණත් අශිනි තේරුම් ගත්තාය. ඇය කෙත්මිගේ උරහිස මත අතක් තැබුවේ ඒ නිසාය.

***"මං කියන්නම් සුදූ. හංසි නංගි, මං අසිතගේ අක්කා."***

***"අම්මී... ආන්ටිව අඳුලනවද?"***

***"ඔව් බබා. මේ ඉන්නේ ඔයාගේ සුදු පුංචි නේ.."***

***"තුදු පුංචී... ඒ වුණාට අම්මි පොතෝ එකේ හිටියේ මෙයා නෙමෙයිනේ අලේ.."***

sinhalaebooks.com

ඇය කෙත්මි දෙස හොඳින් බලා කියද්දී තිදෙනාටම සිනහවක් නැඟුණි. කෙත්මි පහත් වී ඇයව වඩා ගත්තාය.

*"පුංචී දැන් ටිකක් වෙනස් වෙලානේ ඒන්ජල්..."*

*"ඔයා එක්ක කතා කරන්න දේවල් ගොඩක් තියෙනවා සුදු නංගි. දෙන්නාත් එක්ක යමු අපේ දිහා. ටිකක් ඉඳලා හවස් වෙලා යමු."*

*"අක්කේ... මේ... එහේ..."*

කෙත්මි සිතනා දෙය තේරුම් ගත් අගිනි දුක්බර සිනහවක් පෑවාය.

*"එහේ නෙමෙයි දරුවෝ අපි දැන් ඉන්නේ... අයියා කොහොමත් අසිතගේ වැඩවලට කැමැත්තක් නැති නිසාම අපි තුන්දෙනා වෙනම ගෙදරක ඉන්නේ. යමු යමු. කාලෙකින් හම්බුණෙත්."*

කෙත්මි හංසි දෙසත් බලා ඇයට එකඟ වුණේ බෑ කියන්නට බැරිකමටය. අසිත මොන දේවල් කලත් අගිනි පුංචි කාලයේ සිටම කෙත්මිට සැලකුවේ තම

sinhalaebooks.com

නැඟනිය ලෙසය. අසිත කල කී දේවල් නිසා ඇයගේ සිත බිඳින්නට කෙත්මිට සිතක් නැත.

කෙත්මිත් හංසිත් සිතා උන්නේ හෝටලයක නවතින්නට වුවද අශිනිත් එක්ක එය කරන්නට වන්නේ නැති බව හංසිටද තේරුණි. නමුත් හංසි නිහඬවූයේ කෙත්මි මේ ගමනට අකමැත්තක් නොපෙන්වූ නිසාමය.

sinhalaebooks.com

24.

කෙත්මි කල්පනාවට වැටුණේ දින දෙකකට පෙර අශිනි හමුවූ අවස්ථාවේ කී දේවල් ගැනය. ඒ දේවල් කෙත්මිට පමණක් නොව හංසිට පවා අදහා ගන්නට බැරි විය.

*"මට නම් ඒකා මගේ මල්ලි කියලා කියන්නත් ලැජ්ජයි සුදූ. ඔයාගේ වාසනාවකට ඒකාගෙන් ඔහොම හරි බේරුණේ. අර සමාධි පව්. මං ලංකාවට එද්දිත් සේරම දේවල් වෙලා ඉවරයිනේ. අම්මත් මේ දේවල් අපිට හැංගුවා."*

*"අක්කේ?"*

*"සුදූ... අසිතත් එක්ක ඇවිත් සමාධි නංගි පුදුම දුකක් වින්දේ. මං දන්නේ නෑ මගේ මල්ලී කොහොමද ඒ වගේ තිරිසනෙක් වුනේ කියලා. ඒ කෙල්ලට පුදුම වදයක් දුන්නේ. වහලියකගෙන් වගේ වැඩ ගත්තා අම්මා එක්ක එකතු වෙලා."*

*"මොකක්?"*

sinhalaebooks.com

"ඔව් නංගි. අපි ලංකාව එද්දී කෙල්ල දිහා බලන්න දුකයි. වැහැරිලා ගිහින්. තුවාල කැලැල් අතපයවල. මං මට පුළුවන් උපරිමයෙන් කෙල්ල වෙනුවෙන් හිටියා. ඒත් මටත් කරන්න පුළුවන් සීමාවක් තියෙනවානේ. ඒත් එක දවසක් සංදේශ් මේ හැමදේම දැනගෙන තිබ්බා. එදායින් සේරම වෙනස් වුණා. සංදේශ් වගේ අයියා කෙනෙක් ඉන්න නිසාම අර අහිංසකී බේරුණා.."

"එතකොට ඒ දෙන්නා..."

"ඔව් සුදූ. බැඳලා අවුරුද්දක් යන්නත් කලින්ම ඒ දෙන්නා වෙන් වුණා. සමාධි ඒත් මේ නරුමයාට තිබ්බ ආදරේට ඌ කරන හැමදෙයක්ම ඉවසගෙන ඉන්න හැදුවේ. මායි සංදේශුයි පුළුවන් තරම් කිව්වා... ඒත් එයාටම ඒ තීරණේ ගන්න වුණ දවසක් ආවා. මං ඒ සිද්ධිය මතක් කරන්නවත් කැමති නෑ. සමාධි අවුරුද්දක් විතර යනකම් හිටියේ රෝද පුටුවකට වෙලා බලා ගත්ත අත බලාගෙන. දෙයියනේ කියලා දැන් කෙල්ල හොඳින් ඉන්නවා."

"කෙත්මි..."

sinhalaebooks.com

කෙත්මි හංසිගේ හඬින් කල්පනාවෙන් මිදුණාය. ඇය කල්පනා කරන්නේ මොනවා ගැනදැයි හංසිට අමුතුවෙන් කියන්නට දෙයක් නැත. ඇය සුසුමක් හෙලා කෙත්මි අසලින් වාඩි වූවාය.

*"අපි නොහිටපු අවුරුදු තුනට ගොඩක් දේවල් වෙලා හංසි..."*

*"එක අතකින් ඒවා දකින්න අපි නොහිටපු එකත් හොඳයි කෙල්ලේ.."*

*"සමාධි අක්කා පව්... අශිනි අක්කා කියපු විදිහට පුදුම දුකක් එයා විඳලා තියෙන්නේ..."*

*"ඒක නම් මටත් හිතුණා. කතාබහ කරපු දවස් දෙකතුනට මං දැනගත්තා එයා හරිම අහිංසක කෙල්ලෙක් කියලා."*

*"හංසි... මට එයත් එක්ක ටිකක් කතා කරන්න හිතෙනවා."*

*"ඒත් කෙල්ලේ... ඒකෙන් හොඳක් වෙයිද? සමාධි අක්කා පරණ දේවල් මොකුත්ම දන්නේ නෑ..."*

sinhalaebooks.com

*“ඒ දේවල් එයා දැනගන්න ඕනත් නෑ හංසි.”*

*“එතකොට?”*

*“බලමු. මට එයාට කොල් එකක් අරන් දියම්.”*

කෙත්මි කීවේ ඇගේ දුරකතන අංක තිබුණේ හංසි ළඟ නිසාය. හංසිත් දුරකතනය ගෙන ඇය අතට දුන්නේ කුමක් කරන්නට යනවාදැයි සිතමිනි.

*“හෙලෝ...”*

*“සමාධි අක්කේ...”*

*“දෙයියනේ... රිතූ නංගී...”*

සමාධි ඇයව ඒ නමින් අමතද්දී නම් කෙත්මි තිගැස්සී හංසි දෙස බැලුවාය. ඇය එය දැනගත්තේ කෙසේද? එහෙනම් සංදේශ් ඇයට ඒ ගැන කියා ඇත.

*“අක්කේ... ම..ම”*

sinhalaebooks.com

*"ඇයි කෙල්ලේ හැංගුවේ.. මටවත් කියන්න බැරි වුණාද ඔයා කවුද කියලා?"*

සමාධි ඇසුවේ වටපිට බලමිනි. සංදේශ්ට බැරි වෙලාවත් මේ කතාව ඇහුණොත් හොඳ නැටුමක් නටන බව විශ්වාසය.

*"අනේ මට සමාවෙන්න අක්කේ.."*

*"මං මේ ඔයාට කතා කරන විදිහක් හිත හිත හිටියේ නංගී.."*

*"ඇ...ඇයි අක්කේ?"*

*"මේ අහන්න... හෙට උදේ දහය වෙද්දී ඔයාට අපේ ඔෆිස් එක ළඟ තියෙන කොෆී ෂොප් එකට ටිකක් එන්න පුළුවන්?"*

*"පුළුවන් අක්කේ. ඒත්..."*

*"රිතූ ප්ලීස්. මට ඔයත් එක්ක කතා කරන්න ඕන නංගි."*

sinhalaebooks.com

***"අක්කේ... අයියා ඒකට කැමති වෙන එකක් නෑ."***

***"කවුද එයාට කියන්නේ? ඔයා සද්ද නැතුව එන්න ළමයා..."***

සමාධි සිතන්නත් කලින් ඇයගේ අතින් දුරකතනය ඇදී යද්දී ඇය පිටුපස හැරී බැලුවේ දෑස් විසල් කරගෙනය. 'මං ඉවරයි දෙයියනේ... මෙයා කොයි වෙලාවෙද ආවේ?'

දුරකතනය සියතට ගත් සංදේශ් එය කනේ තබා ගත්තේ සමාධිට නිහඬවන ලෙස ඉඟි කරමිනි. මේ කිසිවක් නොදත් කෙත්මි දිගටම කතා කරන්නට වූවාය.

***"අක්කේ... අවුරුදු තුනකට කලින් මගේ අතින් වුණ දෙයක් නිසා අයියා මාත් එක්ක ගොඩක් තරහින් ඉන්නේ තාමත්. එයා මට කවදාවත් සමාවක් දෙන එකක් නෑ..."***

***"ඔව්... ඒක නම් ඇත්ත. තමුන් ඒක තේරුම් ගත්තා නම් ලොකු දෙයක්. කරුණාකරලා අපේ ජීවිත වලින් ඈත් වෙලා ඉන්නවා කෙත්මිණී..."***

sinhalaebooks.com

සංදේශ් දැඩි හඬින් කියා ඇමතුම විසන්ධි කරද්දී කෙත්මි තිගැස්සුණාය.

'කෙත්මිණී?' හැමෝම කෙත්මි කියා කතා කරද්දී සංදේශ් පමණක් ඇය ආසම 'රිතූ' කියන නමින් කතා කරද්දී හැමදාමත් කෙත්මිට දැනුනේ අමුතුම සතුටකි. නමුත් අද ඔහු මෙසේ තම සම්පූර්ණ නමින් තමාව අමතන්නේ ඒ තරම්ම ඔහු තම නමටත් වෛර කරන නිසා නොවේද? කෙත්මිට හැඬුනේ ඔහුගේ නපුරුකම දරාගන්නට බැරිවය.

**********************

*"තමුසෙව නම් මකවලාවත් හදන්න බෑ සුදූ.."*

කෙත්මි සමාධිව මුණ ගැසී ආපසු නිවසට ගොඩවන විටම ඇසුණ කටහඬට තිගැස්සී ඒ දෙස බැලුවාය. සාලයේ සෝපාව මතට වී රවාගෙන බලා උන් රනුක්ව දකිද්දී ඇයට සිනහවක් නැඟුණි.

*"මල්ලී... තමුසේ අද එනවා කියලා කිව්වේවත් නෑ..."*

sinhalaebooks.com

*"ඔව් ඔව්... කිච්චා නම් තොරන් බැඳලා නේ පිළිගන්නේ... අනේ නිකං ඉන්නවා හලෝ..."*

*"මොකද බං මේ ආපු ගමන් යකා වැහිලා?"*

*"යකා... මං කියන්නේ නෑ සුදූ තමුසෙට මගේ යකා ගැන.."*

*"කියන දෙයක් තේරෙන්න කියපං බං..."*

කෙත්මි කීවේ ඔහු ඉදිරියේම වූ පුටුවකට ඇද වැටෙමිනි.

*"මොකද බං මේ උඹලා දෙන්නා... ඈ බතලයෝ... පටන් ගත්තාද ආපු ගමන්?"*

අම්මාත් සමඟ කුස්සියේ සිටි හංසි සාලයට ආවේ දෙදෙනාටම බනිමිනි.

*"උඹත් කට වහන් හිටපං හංසියෝ..."*

රනුක් කීවේ කේන්තියෙනි. මිතුරියන් දෙදෙනා මුහුණෙන් මුහුණ බලා ගත්තේ පුදුමයෙනි. ඔහු මේ තරම් කේන්තියෙන් ඉන්නේ ඇයි?

*"දැන් සනීපයිද තමුසෙලා දෙන්නට? ඔය ටික කරගන්නනේ සති දෙකකට කලින්ම ආවේ නේද? අපේ එකී නම් කවද්ද මොලේ ඇති වැඩක් කළේ... හංසි අක්කේ තමුසෙටවත් බැරි වුණාද මේ ගොනීට තේරුම් කරලා දෙන්න. තමුසේ ඉන්න නිසයි මං මෙහෙම හරි බය නැතුව හිටියේ."*

*"රනුක්... මෙතන බොරුවට කෑගහලා ගෙදර මිනිස්සු බය කරන්නේ නැතුව කියනවා මොකද වුණේ කියලා..."*

*"මොකද වුණේ කියලා මගෙන්ද අහන්නේ? ඇවිල්ලා සතියක් යන්නත් කලින් කරගෙන තියෙන දේවල් එකින් එක මං කියන්න ඕනද? මං තමුසෙලා දෙන්නට කලින්ම කිව්වා එස් ඇන්ඩ් එස් එකත් එක්ක ඔය වැඩවලට යන්න එපා කියලා. එකෙක්වත් ඇහුවද?"*

රනුක් මේ තරම් කෑගහන්නේ සිදුවූ දේවල් ආරංචි වී ඇති නිසා බව පැහැදිලිය. හංසි නිහඬ වූයේ ඒ නිසාය. පුළුවන් කමක් තිබුණා නම් ඇයත්

sinhalaebooks.com

කෙත්මීව නවත්වන්නට දෙවරක් සිතන්නේ නැත. මේ ආ ගමනෙන් වුණේ නැති ප්‍රශ්නයක් ඇති වූ එකය.

*"සුදූ අක්කේ... තමුසෙව අම්මලා එහෙට යැව්වේ මීට අවුරුදු තුනකට කලින් මෙහේ වුණ දේවල් වලින් තමුසෙව ඈත් කරන්න. තමුසෙට අළුතෙන් පටන් ගන්න අවස්ථාවක් හදලා දුන්නා. තමුසේ මොනවද කළේ? අවුරුදු තුනක් තිස්සේ ආපු ගමන ලංකාවට ඇවිත් දවස් දෙක තුනෙන් ආපහු මුලටම වැටුණා."*

*"රනුක්. මේ අහන්න මල්ලී. මං මේ කිසිම දෙයක් හිතන්නේ බලන්නේ නැතුව කරන දේවල් නෙමෙයි. මට මෙහේ ඉන්න හිතක් නැති නිසයි මං මේ සේරම වෙන කෙනෙක්ට බාර දීලා ආපහු යන්න හිතුවේ. මට එහේ සැනසීමේ ඉන්න පුළුවන්."*

*"අවුරුදු තුනක් තමුසේ සැනසීමේ හිටපු හැටි මාත් දැක්කානේ. අනිත් එක හරි ආසාවෙන් නේ සුදූ ඔයා ආපහු ආවේ... දැන් මෙහේ ඉන්න හිතක් නෑ කියන්නේ ඇයි කියලා මම දන්නේ නෑ කියලද හිතන්නේ?"*

*"මල්ලී..."*

sinhalaebooks.com

*“නෑ අක්කේ. ඔයා කියපු දේවල් අහපු කාලේ ඉවරයි. දැන් මං කියන දේ අහන්න. මං දවස් දෙකක් දෙන්නම්. ඔයා රිසයින් වෙන්න ඕන.”*

*“රිසයින් වෙන්න?”*

*“මොනවද මල්ලී මේ කියවන්නේ?”*

හංසිද ඇසුවේ කේත්මි මෙන්ම පුදුමයෙනි.

*“හංසියෝ... ඔයාටත් ඒ ටිකම තමයි. ආයේ දෙන්නා රට යන්නේ නෑ. දෙන්නා එක්ක නටන්න ලෑස්ති වෙන්න එපා. මං අම්මලාටයි දිලූෂ අයියටයිත් කතා කලා. ඔයාලාට දුන්න කාලේ ඉවරයි. දැන් ලෑස්ති වෙන්න සුදූ දෙන්නා එක්ක අපේ බිස්නස් එක බාර ගන්න. ලබන සතියේ ඉඳලා ඔයාලා දෙන්න ඒ ගැන බලන්න ඕන.”*

*“ඒත්...”*

*“ඒත් මේත් නෑ සුදූ. මටත් මේවා තනියම කරන්න බෑ. තමුසේ හිටපු තත්ත්වෙත් එක්ක මං*

sinhalaebooks.com

*අමාරුවෙන් උනත් මේවා ඇදගෙන ආවා. දැන් ඇති. දවස් දෙකක් ඇතුළත දෙන්නා රිසයින් වුණේ නැත්තං ඒකත් මං බලා ගන්නම්.”*

*“මේ අහන්න රනුක්. අපි මේ ගැන හිමීට කතා කරමුකෝ මල්ලී..”*

කෙත්මි නිවුණ හඩින් කතා කලේ රනුක්ව මදක් සන්සුන් කරන්නටය.

*“සුදූ අක්කේ... හිමීට කතා කරන්න දෙයක් ඉතුරු වෙලා නෑ. මං දැන් කියලා ඉවරයිනේ කරන්න ඕන දේ. මං මේ ගෙදර යන්නෙත් නැතුව මෙහෙට ආවේ. ගිහින් ලෑස්ති වෙන්න මාත් එක්කම ගෙදර යන්න.”*

*“දැන්?”*

*“දැන් තමයි. යමු. හංසි අක්කටත් ජීවිතයක් තියෙනවානේ බං. ගෙදර මිනිස්සු එක්ක ඒකිටත් ටිකක් පාඩුවේ ඉන්න දීපං. තමුසේ නිසා ඒකිත් මොන කට්ටක්ද කන්නේ...”*

sinhalaebooks.com

*“රනුක්. එහෙම කියන්න එපා මල්ලී. මට ඔයාලාත් මගේ පවුලේ අය. ඒ ගෙදර තනියම ඉන්නේ නැතුව දෙන්නටම මෙහේ ඉන්න කියලා අපේ අම්මාත් කිව්වා. අපිට කියලා වෙන කවුරුත් නෑනේ.”*

*“ඔයාලා අපිට පිට අය නෙමෙයි හංසියෝ. ඒක අපි දන්නවා. ඒත් අපි දෙන්නා ගෙදර යන්නම ඕන. සුදු අක්කා එක්ක මට මේ අවුරුදු තුනේම ඉන්න බැරි වුණා මේ වැඩ නිසා. මං එයත් එක්ක ටිකක් හිටියොත් හොඳයි කියලා හිතෙනවා. ඒ නිසා අද අපි යන්නම්. තමුසෙට ඉතිං ඕන වෙලාවක එහේ දොර ඇරලානේ.”*

කියමින් රනුක් බැලුවේ කල්පනා කරමින් සිටින කෙත්මි දෙසය. ඔවුන් දෙදෙනා කතා වුණ දෙයක්වත් ඇයට ඇසෙන්නට නැතැයි රනුක්ට නිකමට සිතුණි. ඔහු ඇයව *හංසිට* පෙන්නුවේ දෑස්වලිනි.

*“අක්කේ...”*

*“අහ්...”*

*“ඔතනට වෙලා මනෝ්ගහන්නේ නැතුව වරෙන් බං යන්න. මං තමුසෙගේ බෑග් එක වාහනේට*

sinhalaebooks.com

*දැම්මා. නැන්දාට කියලා ගිහින් නගිනවා මගේ වාහනේට.”*

*“මගේ කාර් එක..”*

*“ඒක ගන්න මං ඩ්‍රයිව කෙනෙක් එවන්නම්. තමුසේ ඉන්න විදිහට වාහනයක් ගෙනියන්න දෙන්නත් බයයි. හංසියෝ මේ... ඔයැයිටත් දැන් වාහනයක් දක්කන්ට ඉගෙන ගන්ට කාලේ හරි ඈ...”*

ඔහු කීවේ හංසිට ඇසක් වසමිනි.

*“කෙත්මි මේ... අපි නොහිටපු ටිකට මේකා හොඳටම සවුත්තු වෙලා ඈ... බලපංකෝ ලොකු තාත්තා වගේ කියවන ලස්සන. ඔහොම ඉඳපංකෝ... දැන් අපි දෙන්නා ඉන්නවානේ...”* හංසි කීවේ ඔහුට රවමිනි.

කෙත්මි හංසිගේ නිවසේ අයට සමුදී රනුක්ගේ කාරයේ වම්පස අසුනට බර වුණේ සුසුමක් හෙළමිනි. රනුක්ට එය හොඳින්ම ඇසුණි.

sinhalaebooks.com

*"සුදු අක්කේ... ප්ලීස්. ආයේ ඒ වගේ වැටෙන්න එපා බං. අපිට බලන් ඉන්න බෑ. අවුරුදු ගාණක් විඳෙව්වානේ. දැන් ඇති."* ඔහු කීවේ දුක්බරවය.

*"නෑ මල්ලී. මං අයේ වැටෙන්නේ නෑ. ආයෙත් මං අළුතෙන්ම පටන් ගන්නවා."*

*"අම්මලාත් ආයේ එයි. අපි නැතුව එයාලාට ඉන්නත් බෑ. ඉස්සර වගේ අපි හැමෝම සතුටින් ඉමු සුදූ. ඔය විදිහට අපෙන් ඈත් වෙලා ඉන්න හිතන්න එපා."*

*"මට සමාවෙන්න මල්ලී."*

*"සුදූ... තමුසේ ආපහු යන්න දඟලන්නේ ඇයි කියලා මං දන්නවා. අපි ඌව හිමීට ශේප් කරගමු. ඒක කරන්න පුළුවන් ඔයාටම තමයි."*

එසේ කියූ රනුක් සිනහවක් පා වාහනය පදවන්නට වූවේය. කෙත්මිට සිහිවුණේ සමාධිගේ වදන්ය.

*"නංගි... මට මිස්ට සුජීවත් කතා කළා. ඔයා මේ අපේ අයියාගේ වැඩ නිසා ඔයාගේ අවස්ථා සේරම නැති කරගෙන ආපහු යන්නද හදන්නේ? ඒක*

*කරන්න එපා රිතූ. අයියා කේන්තියෙන් ඉන්න එක ඇත්ත. ඒ කේන්තිය කවදාහරි නිවන්න පුළුවනුත් ඔයාටම තමයි නංගි. මට ඒක විශ්වාසයි. ඒ දවස වෙනකම් එයා කරන කියන ඒවා නොදැක්ක ගානට ඉන්න. එයා එක්ක වැඩ කරන්න ඕන සිස්ටම් එක මං කියලා දෙන්නම් ඔයාට. මොනවා නැතත් ඔයත් එක්ක මං ඉන්නවා."*

සමාධි කී කතා ටික මතක් වී කෙත්මිගේ මුවට සිනහවක් නැඟුණි. ඇය කියනවාක් මෙන් කරන්නට ඇය සිතා ගත්තේ දැන් කොහොමත් ආපසු යන්නට ඉඩක් නොලැබෙන බව විශ්වාස නිසාය.

*"මල්ලී..."*

කෙත්මි හදිස්සියේම කතා කළේ යමක් සිහිවීය. මේ අවුරුදු තුනේ අංජලීත් ඇයත් දිලූෂත් ලංකාවේ නොසිටියාට රනුක් සිටියේ මෙහිය.

*"ඒ ගමන මොකද?"*

*"තමුසේ මේ දේවල් දැනන් හිටියද මල්ලී?"*

*"මොනවද?"*

sinhalaebooks.com

*"සමාධි අක්කාට වුණ දේවල් ගැන?"* රනුක්ට සිනහවක් නැඟුණි.

*"මං ඒත් බැලුවා මොකද පරක්කු කියලා... අශිනි අක්කාව හම්බුණා කියලා ආරංචි වුණ ගමන් මං හිතුවා සේරම දැනගන්න ඇති කියලා."*

*"ඒ කියන්නේ ඔයා දැනන් හිටියා? ඇයි මට..."*

*"කොහොමද අක්කේ කියන්නේ? තමුසේ ඌ මත්තේ මැරෙන්න ගිය එකී. මං මේවා කොහොමද කියන්නේ? අම්මලාටවත් කිව්වේ නෑ තමුසේ දැන ගනියි කියලා. මොනවා වුණත් තමුසේ බේරුණා අක්කේ. සමාධි අක්කා පව්."*

කෙත්මි එතනින් එහාට කිසිවක් අසන්නට නොගියේ තවත් ඒ ගැන කතා කරන්නට සිත නොදුන් නිසාය.

sinhalaebooks.com

25.

සමාධි තම කාර්යාල කාමරයේ වීදුරු අතරින් බලා උන්නේ දැඩි කල්පනාවකට වැටී ඉන්න සංදේශ් දෙසය. මීට ටික වෙලාවකට පෙර රිතූ වෙනුවට කටයුතු කරන සුජීව ඇවිත් ඔහුව හමුවුණේය.

අනිවාරෙන්ම මේ කල්පනා කරන්නේ ඇය ගැන බව සිතන්නට දෙයක් නැත. ඇයට නොදැනීම මද සිනහවක් නැඟුණේ ඔහුගේ මේ වැඩවලටය.

*"මොකද බං තනියම හිනා වෙන්නේ?"*

රංග කාමරයට ආවේ ඇයගේ මුහුණේ ඇඳුණු සිනහව දෙසම බලාගෙනය.

*"මේ රංග අයියේ... අර බලනවාකෝ අපේ අයියා..."*

*"ඉතිං..? උඹ දැන් මොකද හිනා වෙන්නේ?"*

sinhalaebooks.com

*"ඔය අහස පොළව ගැටගහන්න කල්පනා කරන්නො මොනවා ගැන කියලද හිතන්නේ?"*

*"අර මිස්ට සුජීව ඇවිත් ගියා නේද? ඒ කන්ට්‍රැක්ට් එකේ අවුලක්ද දන්නේ නෑ බං.. උඹ හිනා වෙනවා. යමං බලන්න."*

*"යමු යමු. හැබැයි ඕන ඔට්ටුවක්. අපේ අයියා ඔය කල්පනා කරන්නේ රිතූ නංගි ගැන."*

*"ඒ පාර ඒකාව විහිළුවට ගත්තද බං..."*

*"හා... ඔයාට විශ්වාස නැත්තම් ගිහින් බලමු."*

සමාධි ඉස්සර වී සංදේශ්ගේ ඔෆිස් රූම් එක දෙසට යද්දී රංගත් ඇය පසුපසම ඒ දෙසට ගියේ සිදුවී ඇත්තේ කුමක්දැයි බලන්නටය. එකවරම සමාධි දොර අරිද්දී ඔහු තිගැස්සී කල්පනාවෙන් මිදුණේය.

*"අයියේ... මොකද මේ? මං බලාගෙන අර මිස්ට සුජීව ඇවිත් ගියපු වෙලාවේ ඉඳලා කල්පනා කරන්නේ...'*

*"ඒකනේ බං. කන්ට්‍රැක්ට් එකේ මොකුත් අවුලක්ද?"*

*"කන්ට්‍රැක්ට් එකේ වැඩේ නම් හරි බං."*

*"එහෙනම් මොනවද බං ඔච්චර කල්පනා කරන්නේ?"*

*"මං මේ කල්පනා කරේ අර පිස්සු හෝන්තුවට මොකද වෙලා තියෙන්නේ කියලා"*

සමාධිට ඒ කතාව ඇසෙද්දී නැඟුණ සිනහව ඇය අපහසුවෙන් සඟවා ගත්තාය. රංගට නම් තවමත් එය වගක් නැත.

*"කවුරු ගැනද කියන්නේ?"*

*"අර උඹලාගේ මහ ලොකු දිසානායක මැඩම් ගැන.."*

ඒ ඇසෙද්දී රංග සමාධි දෙස බැලුවේ ඇය මේ ගැන කලින්ම කීවේ කෙසේදැයි සිතමිනි.

sinhalaebooks.com

*"ඇයි දැන් රිතූ නංගීට මොකද වෙලා තියෙන්නේ?"*

සමාධි කිසිවක් නොදන්න ලෙස ඇසුවේ ඔහුගෙන්ම සියල්ල දැන ගන්නටය.

*"ඒකිට පිස්සු බං. මං එදා ඒකිට කිව්වේ කන්ට්‍රැක්ට් එක කැන්සල් කරන්න කියලා මිසක් වෙන එකෙක් එවන්න කියලා නෙමෙයිනේ. මඟුලක් කරලා තියෙන්නේ.."*

*"කොහොමහරි අපේ වැඩේ හරිනේ බං."*

*"අපේ වැඩේ හරි. ඒත් උඹලා දන්නවාද ඒ කම්පැනි එකෙන් ලංකාවේ අලුත් බ්‍රාන්ච් එකක් ඕපන් කරනවා ලබන සතියේ. ඒකේ හෙඩ් විදිහට තමයි ඒකිව ඔය ලංකාවට එවලා තියෙන්නේ."*

*"මරුනේ යකෝ... කෙල්ල දක්ෂයි."* රංග කීවේ සතුටිනි.

*"මරු වෙන්න තිබ්බා ඒ ගොන් මොලේ මීට වැඩිය හොඳට වැඩ කලා නම්. උඹ දක්ෂයි කිව්වට ඒකිගෙත් කට විතරයි. මොළේ නෑ."*

sinhalaebooks.com

*“මොකක්ද බං කියන්නේ?”*

*“ඒකි ගොන් ගහක්. එදා අපේ වැඩේ කැන්සල් නොකර මිස්ට සුජීවට දීලා තියෙන්නේ මේ වැඩෙත් එක්කම ඒකිට ලැබෙන්න තිබුණ පොසිෂන් එක ඌට යන බව දැන දැනමයි.”*

*“මොකක්? ඒ කියන්නේ අපේ කන්ට්‍රැක්ට් එක නිසා ඒ කෙල්ලට ලැබෙන්න තිබ්බ පොසිෂන් එක නැති වුණා කියලද?”* ඒ කතාවට නම් සංදේශ් රංග දෙස රවා බැලුවේය.

*“අපි නිසා ඒකිට මොකුත් නැති වුනේ නෑ. ඒකි විහින් ඒවා නැති කරගත්තා.”*

*“ඒත් අයියේ..”*

*“ඉනෆ්. අපිට ඒකිට මොලේ දෙන්න බෑනේ. අපි එයාගෙන් උදව් ඉල්ලුවේ නෑ. එයාම හිතලා කරගත්ත දේවල් ගැන අපි හිතන්නවත් දුක් වෙන්නවත් ඕන නෑ. උඹලාත් දැන් ගිහින් වැඩක් කර ගනිල්ලා.”*

sinhalaebooks.com

*"මොකට කියනවද ඉතිං... අපි නම් එහෙම හිතුවේ, දුක් වුනේ නෑ. නේද රංග අයියේ...?"*

*"ඒක තමයි බං මාත් බැලුවේ... අහස පොළව ගැටගහන්න වගේ ඒ කෙල්ල ගැන කල්පනා කර කර හිටපු එකා අපිට කියනවා හිතන්න එපාලු. අනේ අම්මපා මේවට නම් මේ මේස පුටුවලටත් හිනා..."*

රංග කීවේ මහ හඬින් සිනාසෙමිනි. ඔහුගේ සිනාවට සමාධිත් එකතු වුණේ සංදේශ්ටද සිදුවූ දෙය සිහි වෙද්දීය.

*"මගෙන් මොකුත් අහගන්නේ නැතුව පලයව් තොපි දෙන්නම එළියට."*

සංදේශ් ලැජ්ජාව වහගන්නට කෑගසද්දී දෙදෙනාව එළියට ආවේ සිනාසෙමිනි.

සති දෙකක් ගෙවී ගියේ වේගයෙනි. රනුක්ගේ බල කිරීමට රැකියාවෙන් ඉවත් වූ කෙත්මි සහ හංසි ඔවුන්ගේ ව්‍යාපාර බාර ගත්තෝය. රනුක් අනෙකුත් ව්‍යාපාර ගැන බලද්දී මිතුරියන් දෙදෙනා සාප්පු සංකීර්ණයේ පාලන කටයුතු බාර ගෙන කරගෙන

sinhalaebooks.com

යන්නට වූහ. සංදේශ් නම් සිතා උන්නේ සුජීව කී ලෙසටම කෙත්මි හා හංසි නැවතත් රට ගොස් ඇතියි කියාය.

කෙත්මි කලින් සේවය කල ආයතනයේ ලංකාවේ නියෝජිත ආයතනය විවෘත කිරීමේ උත්සවයට කෙත්මිටත් ආරාධනා ලැබුණි. සේවයෙන් ඉවත් වූවත් ආයතනය තුළ ඇයට තිබෙන්නේ ඉහළ පිළිගැනීමකි. හංසිට ගෙදර වැඩක් වැටී තිබුණ නිසාම කෙත්මිට උත්සවයට යන්න වුණේ රනුක් සමඟිනි.

*"සුදූ මේ…"*

රනුක් රහසින් කතා කළේ වාහනයෙන් බැස හෝටලය දෙසට යන අතරේය.

*"මොකෝ..?"*

*"අර බලනවාකෝ අපි දෙන්නා දිහා කට්ටිය කට ඇරන් බලන් ඉන්න හැටි…"* කෙත්මිට නැඟුනේ සිනහවකි.

*"ෂෝක් කපල් එක කියලා හිතනවා ඇති."*

sinhalaebooks.com

*"රෙද්ද... මං තමුසෙට කිව්වා සුදූ මෙහෙම මැච් කරලා ඇඳලා ඕක වෙයි කියලා. දැන් බලනවා මට කෙල්ලෙක්වත් යාළු කරගන්න වෙන්නේ නෑ තමුසෙත් එක්ක."*

ඔහු කුටු කුටු ගගා බනිද්දී කෙත්මිට හිනාය. දෙදෙනාටම ඇඳුම් තේරුවේ කෙත්මිය. ඇය තද නිල් පැහැති සාරියකින් සැරසෙද්දී රනුක්ට සූදානම් කලේ ඒ පාටින්ම ඇඳුමකි. ඔය බොරුවට බැන්නාට පොඩි කාලේ ඉදන් දෙදෙනාම එකවගේ ඇඳගෙන ගමන් යන්නට ඔහු කැමති බව කෙත්මි දැන උන්නාය.

*"අඩේ... බලපංකෝ අර ජෝඩුව..."*

උත්සවයට පැමිණ සිටි පිරිස අතරින් දොරටුව පෙන්වමින් රංග පැවසුවේ මිතුරෙකු සමඟ කතාවට වැටී සිටි සංදේශ්ටය. ඒ හඬට සමාධිද ඉක්මනින් හැරී බැලුවාය.

*"වට්? එතකොට මෙයා ආයේ ගිහින් නැද්ද?"*

*"ගියා නම් මෙතන ඉන්න විදිහක් නෑනේ අයියේ."*

sinhalaebooks.com

සමාධි අමනාපය මුසු හඬකින් කියා ඔවුන් දෙසට ඇවිද යද්දී රංග සංදේශ්ට ලං වුණේ රනුක් දෙසම බලාගෙනය.

*"කවුද බං අර හැන්ඩි කොල්ලා? මං නම් හිතුවේ අර එදා ආවේ මෙයාගේ බෝයි කියලා."*

*"උඹට මතක නැද්ද බං... ඔය ඒකිගේ මල්ලි. රනුක්. මං දන්න විදිහට මෙහේ බිස්නස් සේරම හැන්ඩ්ල් කරන්නේ කොල්ලා."*

*"අම්මට යකෝ... මේ මල්ලිද එතකොට. මල්ලි නොවුණා නම් මැච්න් කපල් එක නේද?"*

ඒ කතාවට රංග දෙසට හැරී රවා බැලූ සංදේශ් එතනින් ඉවතට ගියේ කෙත්මි ඔවුන්ව දකින්නට පෙරය.

*"රිතූ නංගී... මං බැලුවා ඒත් මොකද පරක්කු කියලා. කෝ අද හංසි?"*

*"අනේ ටිකක් ලේට් වුණා අක්කේ. හංසිටත් අද වෙන වැඩක් වැටිලානේ."*

sinhalaebooks.com

*"හොඳ ටික... අර සැලූන් එකක් අස්සට රිංගගෙන... ඒකෙන් එළියට ගන්නම කොච්චර වෙලා ගියාද මට... අනේ ඇත්තමට මේ කෙල්ලෝ නම්..."*

රනුක් හෙමිහිට කියූ දෙය ඇසී සමාධිට සිනහවක් නැඟුණි.

*"කවුද කෙල්ලේ මේ හැන්ඩ්සම් කොල්ලා?"*

*"මේ අපේ මල්ලි අක්කේ. රනුක්. මල්ලී, ඔයා සමාධි අක්කාව දන්නවානේ?"*

රනුක් සමාධිත් සමඟත් සිනහවක් පා මදක් එහාට ගියේ ඔවුන්ට කතාබහ කරන්නට ඉඩ හරිමිනි. ඒ අතරේ කෙත්මි වටපිට බැලුවේ සමාධි උන්නාට සංදේශ් පෙනෙන්නට නැති නිසාය. එහෙනම් ඔහු ඇවිත් නැද්ද? ඇවිත් නැත්තම් අද දවස සැනසීමේ ඉන්නට පුළුවනි.

*"අපේ අයියවද කෙල්ලේ බැලුවේ?"*

*"න්..නෑ. මං මේ.."*

sinhalaebooks.com

***"අයියා ආවා. ඔය කොහෙට හරි වෙලා ඇති. ඔයා බය නොවී ඉන්නකෝ. මේක එයාගේ පාටි එකක් නෙමෙයිනේ."***

කාලය ගෙවී ගියේ ඉබි ගමනෙනි. කෙත්මිට ආයතනයේ එකට වැඩ කළ අයත් සමඟ කතා බහ කරන්නට සිදුවුණෙන් සමාධි ගොස් රංගලා අසලින් වාඩි වූවාය. බොහෝ වෙලාවක් කතාබහ කරමින් සිටි කෙත්මි මදක් ශාලාවෙන් පිටතට ආවේ වොෂ්රූම් එකක් සොයාගෙනය.

වොෂ්රූම් එකෙන් පිටතට ආ කෙත්මි එතැනම ගල් වුනේ ඒ දෙසට ඇවිදගෙන එන රුව දකිද්දීය. අද දවසටම ඔහුව දකින්නේ දැන්ය. කළු පැහැති කෝට් කිට් එකට ඔහුව තවත් කඩවසම්ව පෙනෙද්දී ඇයට ඔහුගෙන් නෙත් ඉවතට ගන්නට සිතක් නොවීය.

***"තමුන්ට නම් කියන සිංහලක් තේරෙන්නෙම නෑ නේද?"***

***"මං... මං මොනවද කළේ?"***

sinhalaebooks.com

*"මං දැන් දෙපාරක්ම කිව්වා තමුන්ට. මගේ ඉස්සරහට එන්න එපා කියලා."*

*"මිස්ට සංදේශ්. මං ආවේ මට ඉන්වයිට් කරපු පාටි එකට. එහෙම නැතුව ඔයාව බලන්න නෙමෙයි. මේ මං කලින් වර්ක් කරපු කම්පැනි එක. එයාලා මට ඉන්වයිට් කළා. ඉතිං මං ආවා. මටත් වුවමනාවක් නෑ හිත හිතා එක එක්කෙනාට පේන්න එන්න."*

*"කලින් වර්ක් කරපු කම්පැනි එක? ඇයි දැන් මේ කම්පැනි එකේ නෙමෙයිද?"*

*"ඒක මගේ පර්සනල් දෙයක් මිස්ට සංදේශ්."*

ඇය එසේ කියද්දී සංදේශ්ට සිතුණේ ඇහුව මෝඩකම කියාය.

*"මොකක්හරි. ඒකත් හොඳයි. තමුන්ව ආයේ මට ඔෆිෂියලි මුණගැහෙන එකක් නෑ එහෙනම්. තමුසෙව දකිද්දී මට එන කේන්තිය පාලනය කරගන්න බෑ කෙත්මිණී. ඒ නිසා කරුණාකරලා මගෙන් ඈතට වෙලා ඉන්න බලනවා. මං මේ අවසාන වතාවට කියන්නේ.."*

sinhalaebooks.com

*"මිස්ට සංදේශ්... තමුන්ට මගෙත් එක්ක ඔච්චර වෛරෙන් ඉන්න දෙයක් මම කලා කියලා මං හිතන්නේ නෑ. එනිවේ... ඔයා කැමති එහෙම නම් කිසිම ප්‍රශ්නයක් නෑ. හැබැයි කෝකටත් මං ඔයාට පොඩි උපදෙසක් දෙන්නම්.."*

*"උපදෙසක්?"*

*"ඔව්. මේකයි... ඔය විදිහට කේන්ති ගන්න එක ඔයාගේ සෞඛ්‍යයට එච්චර හොඳ නෑ මිස්ටර්. අම්මාට කියලා කොහිල අල ටිකක්වත් උයාගෙන කෑවොත් මොකද ඔය ගතිය ඇරිලා යන්න."*

කෙත්මි මද සිනහවක් කට කොණේ මවාගෙන කියද්දී සංදේශ්ගේ අත කෝපයෙන් මිට මෙළවුණේය. නමුත් ඔහු ඊට කිසිවක් කියන්නට පෙරම එතැනට පැමිණි යුවතියක් ඔහුගේ අතේ එල්ලෙද්දී කෙත්මි ඇය දෙස බලා කට ඇද කලාය.

'ඈ බොල... මේ මේකාගේ වයිෆ්ද? පුදුම සක්කරවට්ටමක් නේ. බලපල්ලාකෝ ඇදන් ඉන්න එක. ඒකත් නැතුව ආවා නම් ඔයිට හොඳයි. දෙන්න හිතෙනවා එකක්. හෝව් හෝව් කෙත්මියෝ... උඹ මොකද මේ කේන්ති ගන්නේ අනුන්ගේ ඒවට? නිකම් හිටපං බං...' කෙත්මි තනිවම හිතන්නට වූවාය.

sinhalaebooks.com

***"කවුද අයියේ මේ? ඔයා දන්නවද මෙයාව?"***

ආශා ඇවිත් අතේ එල්ලෙද්දී කේන්තියක් දැණුනද කෙත්මිගේ මුහුණ වෙනස්වනු දකිද්දී සංදේශ්ට සිතුනේ ඇයව ටිකක් අවුස්සන්නටය.

***"අනේ මං නම් දන්නේ නෑ ආශා. අපේ නංගි එක්ක නම් කතා කරනවා දැක්කා. මේ මිස් උඩ බලන් ඇවිත් මගේ ඇඟේ හැප්පුණා බබා. මං ඒත් කිව්වේ ඇස් දෙක පොඩ්ඩක් චෙක් කරගන්න කියලා."***

සංදේශ් කියන දේවල් කෙත්මි අසා උන්නේ පුදුමයෙනි. එහෙම දෙයක් වුණේ කොයි වෙලාවෙද?

***"අයියෝ... ඔයාට තේරෙන්නේ නැද්ද අයියේ.. මේ කපටි කෙල්ලොන්ගේ බොරු මායම්. හැන්ඩ්සම් කොල්ලෙක් දැක්කම බලෙන්ම ඇවිත් ඇඟේ එල්ලෙන්න හදන්නේ.."***

'හැන්ඩ්සම්? කොහෙද දන්නේ නෑ හැන්ඩ්සම්.. පුහ්... වැඩේමයි මේ ඊරි යකාගේ ඇඟේ එල්ලෙන්න මට.' කෙත්මි සිතුවේ දෙදෙනාටම රවමිනි.

***"ජරා ගෑණු. මේ වගේ තැන්වලට එන්නෙම ඕවට තමයි."***

***"එක්ස්කියුස් මී මිස්. දැනගෙන කතා කළොත් හොඳයි."*** කෙත්මි එවර නම් කතා කළේ කේන්තියෙනි.

***"දැනගෙන තමයි කතා කරන්නේ. අපි යමු අයියේ. මේ වගේ අය ඉන්න තැනකවත් ඉන්න හොඳ නෑ."***

ඔවුන් දෙදෙනා ඉවත්ව යන දෙස කෙත්මි බලා උන්නේ ඉහවහා ගිය කෝපයෙනි.

ඇය එහෙම්ම ම උත්සව ශාලාවට පැමිණ මේසයකින් වාඩි වූයේ සංදේශ්ට හොඳහැටි හිතින් බනිමිනි. ඇය සිටි තැනට සංදේශ්ලාගේ මේසය හොඳින් පෙනුණි. සමාධිත් ආශාත් ඇයට පිටුපා වාඩි වී සිටි නිසා දෙදෙනාම ඇයව නොදුටුවද කේන්තියෙන් පුපුරන කෙත්මිව රංග හා සංදේශ් හොඳින්ම දුටුවෝය.

***"අර මොකද බං?"***

රංග ඇසුවේ සමාධිලාට නොඇනෙන්නටය. සංදේශ් ඊට පිළිතුරක් නොදී ඉවත බලාගෙන සිනාසුණේය.

sinhalaebooks.com

කෙත්මි කේන්තියටම මේසය මත වූ බීම එකක් ගෙන එක හුස්මට බිව්වාය. බිව්වේ මත්පැන් වීදුරුවක් බව සිතන්නට දෙයක් නැත. මීට පෙර වරක් දෙවරක් පාටි වලට ගොස් බී තිබුණ නිසා එය ඇය හඳුනා ගත්තාය. මීට පෙර වීදුරුවකට වඩා නොබී තිබුණද හිතේ කේන්තියටම ඇය අසලින් ගිය වේටර්වරයෙකු අමතා තවත් වීදුරුවක් ගෙන්වා ගත්තාය.

**'මට ජරා ගෑණි කියන්න ඒකි කවුද? ඈ බං කෙත්මි.. උඹ ජරා ගෑණියෙක්ද බං? අර මහලොකු සංදේශ්... ර්ර්ර්... මට ජරා ගෑණි කියනකම් බලන් හිටපු ලස්සන. මට ජරා ගෑණි කියලා තමුන්ලා දෙන්නා ලොකු වැරැද්දක් කර ගත්තේ... ෂික්... මගේ *හංසියා* හිටියා නම් ඕකුන් දෙන්නාට හොඳ දෙකක් කියනවා.... අනේ ඇත්තමට මේ ර්රි යකාව මට මරන් කතහැකි එන කේන්තියට...'** කෙත්මි තවත් වීදුරුවක් මුවෙහි තබාගන්නා අතරේ සිතින් බනින්නේ සංදේශ්ටය.

මේ වෙලාවේ කෙත්මිට නවත්වන්නට කෙනෙක් අසල නොවූ නිසාම ඇය හිතු හැටියේ බොන්නට වූවාය. රනුක් ළඟපාතක නොවූ නිසා ඇය උන්නේ තනිවමය. නමුත් එහා මේසයේ සිටි රංගගේ දෑසට ඇයගේ ක්‍රියාව හසුවන්නට වැඩි වෙලාවක් ගියේ නැත.

***"සංදේශයා... මේ.. අර බලපං අර කෙල්ල බොන බීමන.."***

රංග කීවේ පුදුමයෙන් ඇය දෙසම බලාගෙනය. ඔහු පෙන්වන්නට පෙරම සංදේශ් එය දුටුවේය. මොහොතක්වත් ඇයගෙන් දෑස් ඉවතට නොගෙන මෙතෙක් වෙලා ඔහු ඇය දෙස බලා උන්නේ කේන්තියෙනි.

***"අපිට මොකද බං... බීලා පුරුදු හින්දානේ බොනවා ඇත්තේ. අවුරුදු ගානක් පිටරට හිටපු එවුන්නේ."***

***"උඹට පේන්නේ ඒ වගේද? මට නම් පේන්නේ එහෙම එකක් නෙමෙයි. පුරුදු එකෙක් ඔහොම බොනවද බං? වතුර බොනවා වගේ.. ඒ මදිවට කුටු කුටු ගගා තනියම කියවනවත් එක්ක. අර බලපං..."***

රනුක් ඇය වෙත ආවේ ඒ මොහොතේය. සමාධිත් ආවේ ඇයට කතා කරන්නටය. නමුත් හිස් මත්පැන් වීදුරු කීපයක් වටකරගෙන ඇය සිටි අයුරු දකිද්දී සමාධිගේද දෑස් විසල් විය.

***"සුදූ...."***

sinhalaebooks.com

රනුක් කතා කලේ හැකි තරම් කේන්තිය පාලනය කරගෙනය. ඒ ගමන ඇය මේ නටන්නට යන්නේ මොන පිස්සුවක්දැයි ඔහුටත් හිතාගන්නට බැරිය. ඔහු කතා කළද කෙත්මිට ඇසුණ පාටක් නැත.

***"සුදූ..... දැන් ඇති. නවත්තනවා ඔය බීම. බේබද්දෙක් වගේ බොන්නේ... පිස්සු හැදිලද?"***

නමුත් කෙත්මි නවත්වන පාටක් නැත. ඇය රනුක් දෙස බලා මද සිනහවක් පා තවත් වීදුරුවක් අතට ගත්තාය. සමාධි හා රනුක් මුහුණෙන් මුහුණ බලා ගත්තේ ඇයගේ හැසිරීමටය. ඒත් සමඟම,

sinhalaebooks.com

26.

***"රිතූ.... මං මේ බොහොම හොඳින් කියන්නේ... දැන් නවත්තනවා ඕක."***

මෙතෙක් වෙලා ඈතට වී බලා සිටි සංදේශ් වේගයෙන් ඔවුන් අසලට පැමිණ කීවේ රනුක්ටත් මේ මොහොතේ ඇයව පාලනය කරගන්නට බැරි බව පෙනුන නිසාය. කෙත්මි හිස ඔසවා ඔහු දෙසත් රනුක් දෙසත් බලා සිනහවක් පෑවාය.

***"ස්... සොරී... ඔයාට වැරදිලා මිස්ට... ක..කවුද රිතූ? හහ්.. ම..ම.. කෙ..ත්මි..ණී. අයිම් නොට් රිතූ... අන්ඩර්ස්ටෑන්ඩ්?"*** කියමින් ඇය අතවූ වීදුරුව මුවට ළං කර ගත්තාය.

ඒත් සමඟම ඉක්මන් වුණ සංදේශ් එය උදුරාගෙන එක හුස්මට බී දැමුවේ ඇයට බොන්නට දෙයක් ඉතිරි නොකරය.

***"හො...ර්..රා... තමුන්ට... මම..."***

sinhalaebooks.com

*"සුදූ... දැන් ඇති. එනවා යන්න ගෙදර. මදැයි තමුසේ එක්ක පාටි එකකට ආවා. ඇත්තමයි පුදුම වදයක්නේ දෙන්නේ.. මෙහෙම පිස්සු නටන බව දන්නවා නම් මං එන්නෙත් නෑ තමුසෙට එන්න දෙන්නෙත් නෑ."*

රනුක් එසේ කියමින් ඇයව නැඟිට්ටව ගන්නට උත්සාහ කලේය.

*"මල්ලී..."*

මෙතෙක් වෙලා මේ සියල්ල දෙස බලා සිටි සමාධි කතා කළේ මේ මොහොතේය.

*"දැන් හංසිත් නැති එකේ මෙයාව ඔයාට තනියම කන්ට්‍රෝල් කරගන්න බෑ. ඒ නිසා මෙයාව මං අපේ ගෙදර ගෙනියන්නම්. චේන්ජ් කරවලා වොෂ් එකක් දම්මන්න හරි මට පුළුවන්නේ."*

*"ඒත් අක්කේ..."*

*"බය වෙන්න එපා මල්ලී. ඔයා මං කවුද කියලා දන්නවානේ. මං ඔයාගේ අක්කාව බලා ගන්නම්."*

sinhalaebooks.com

*"ඒත්..."*

රනුක් බැලුවේ සංදේශ් දෙසය. මේ මොහොතේ ඇයත් සමඟ ගැහැණු ළමයෙක් සිටින එක හොඳය. නමුත් සංදේශ්ගේ නිවසට ඇයව ගෙන යනවා කියන්නේ කුමක් වේවිදැයි සිතන්නට බැරිය. රනුක් සිතන දේ සමාධිට තේරුම් ගන්නට අපහසු වූයේ නැත.

*"අයියේ ප්ලීස්... තමුසේගේ දුෂ්ටකම් නවත්ත ගන්නවා දැන්වත්. තමුසේ නිසා තමයි මේ සේරම. රංග අයියේ... මල්ලී... දෙන්නාත් එක්ක උදව් කරන්න මට කෙත්මිව වාහනේට ගන්න."*

සමාධි කියද්දී වෙන කරන්නට දෙයක් නැති නිසාම රනුක් කෙත්මිව තම ගතට වාරු කරගෙන සංදේශ්ගේ වාහනය වෙත ගියේ රංගත් පසුපසින් එද්දීය. සංදේශ් නම් උන් තැනටම වී බලා උන්නේය.

*"මොනවද තවත් බලන් ඉන්නේ? යමු අයියේ..."*

සමාධි ඔහුගේ අතින් ඇදගෙන යන්නට වූවාය. කෙත්මිව ඔවුන් සමඟ පිටත් කර රනුක් වාහනයට නැඟුනේ සුසුමක් හෙළමිනි.

'සමාධි අක්කා හොඳයි තමයි. ඒත් හංසියා හිටියා නම් අද මං තමුසෙව කීයටවත් අද යවන්නේ නෑ අක්කේ.

තමුසේ දවසින් දවස පිස්සු කෙලින්නේ නැතුව පොඩ්ඩක් ඉන්න බලනවා අක්කේ... මට නම් තමුසේ ගැන හරි බයයි.'

රංග කෙත්මිව කාරයෙන් බස්සවන්නට හදද්දී ඇයව දෝතට ඔසවා ගත් සංදේශ් ගෙතුළට ගෙනැවිත් ඇයව සෝපාව මත තබා හැරුණේ කාමරයට යන්නටය. රංගට පෙර ඔහු ඇයව ඔසවා ගනිද්දී රංගට මෙන්ම සමාධිට නැඟුණේ අපූරු සිනහවකි.

*"ඊර්... අර ගෑණි... ම..ට.. හහ්..."*

යන්නට ගිය සංදේශ් හැරී බැලුවේ වෙරිමතේ කාටදෝ බනින කෙත්මි දෙසය. සමාධිත් එය ඇසුන නිසා ඉක්මනින් ඇය වෙත ආවාය.

*"මොන ගෑණිද නංගි...?"*

*"අර... සක්ක..ර..වට්..ටම... බාගෙට... ඇඳ..ගෙන.. මෙතන... ඊර්ර්... මට..."*

කෙත්මි කියන්නට ආ දෙය නවතා තමා අසලට සිටින සමාධි දෙස හොඳින් බැලුවාය.

*"ස.. සමාධි අක්කේ... අනේ..."*

sinhalaebooks.com

කෙත්මි අඬන්නට මෙන් කියද්දී සමාධි ඇයගේ උරහිස වටා අතක් දමාගෙන ඇය වෙත ළං වූවාය. සංදේශ් උන්නේ ඇය ඒ ගමන නටන්නට යන පිස්සුව මොකක්දැයි සිතමිනි. රංගට නම් මේවාට හිනාය.

***"අනේ ඇයි නංගි... කියන්නකෝ ඉතිං.. මොකද වුණේ? කවුරු ගැනද කියන්නේ?"***

***"මට..මට... උන් දෙන්නාව... මරන්න ඕන..."***

කෙත්මි කියද්දී සමාධි හා සංදේශ් ඇය දෙස බැලුවේ දැස් විසල් කරගෙනය. රංගගේ මුවින් බකස් ගා සිනහවක් පැන්නේ ඒ කතාවටය.

***"ඒයි... හිනා..පාල... මං තමුසෙවත් මරනවා..."*** ඇය කීවේ රංග දෙසට අතක් දිගු කරමිනි.

***"පැංචි... මෙන්න මේ හොල්මන වෙරිමරගාතේ කියවනවා. එක්කන් ආවානම් ගෙනිහින් බලා ගන්නවා අපිට වද නොදී. රංගයා... උඹත් ඔය විගඩං බල බලා ඉන්නේ නැතුව ගිහින් නිදා ගනිං..."*** සංදේශ් කීවේ කෙත්මිගේ මේ විකාර වැඩ නිසා හිතට නැගෙන කේන්තිය වැඩි වන්නට පෙරය.

sinhalaebooks.com

*"අක්කේ... ඒ...ඒ... ගෑණි... ඒ ගෑණි... මට ජ..රා ගෑණි කිව්වා... මං... මං... ජරා ගෑණියෙක්ද? ආ... අක්කේ... මං ජරා ගෑණියෙක්ද?"*

කෙත්මි අඬමින් කී කතාවට සමාධිගේ දෑසට කඳුළු පිරුණි.

*"පිස්සුද නංගි... ඔයා එහෙම කෙනෙක් නෙමෙයි කියලා හැමෝම දන්නවා. හොඳ ළමයා වගේ මට කියන්න... කවුද ඔයාට එහෙම කිව්වේ?"*

සමාධි ඇසුවේ ඇය වෙරිමතේ මේවා කියෙව්වට හොඳ සිහියෙන් ඉන්න විටක මේවා කියන්නේ නැති බව දන්නා නිසාමය.

*"මං.. ජ..රා.. ගෑණියෙක් නෙමෙයි නම්... අ..ර ඊරී යකා.. ඇයි.. ඇ..යි ඒක ඇහිලාත්.. සද්ද නැතුව ගියේ..."*

කෙත්මි හඬමින් කියද්දී සංදේශ් තිගැස්සුනේ පාටියේදී වූ සිදුවීම සිහිපත් වූ නිසාය. ඒ සිද්ධිය ඔහුට මේ වන තුරුම අමතක වී තිබුණි.

*"කවුද කියන්නකෝ නංගි? අනික කවුද ඊරි යකා?"*

***"ආ...ශා... ඔව්. ආශා. ඊරි යකාගේ මහලොකු බ..බා..."***

ඒ කතාවට නම් සංදේශ්ටත් සිනහවක් නැගෙද්දී සමාධි ඔහු දෙස රවා බැලුවාය. ආශාත් සමඟ ඔහු කොහෙදෝ ගොස් සිනාසෙමින් නැවත ආ අයුරු සමාධිට මතකය.

***"අයියේ... මේ කතාවේ කොණක තමුසෙත් ඉන්නවා නේද?"***

***"අනේ මට වෙන වැඩ නෑනේ.."***

කියූ සංදේශ් කාමරයට ගොස් දොර වසා ගත්තේ සියුම් රිදුමක් හිතට දැනෙද්දීය. කෙත්මි මේ ලෙසින් බිව්වේ හිතේ වේදනාවට බව ඇයගේ හැසිරීමෙන්ම ඔහු තේරුම් ගත්තේය.

'තමුසෙට ඒ වචනෙට ඒ තරම් රිදුනද රිතූ? ඇත්ත. මාත් ඒ වෙලාවේ තමුසෙට රිද්දන්න ඕනවට කටවහන් හිටියට ඒක ටිකක් සැර වැඩියි තමයි. පොඩ්ඩක් ඉන්නවා... තමුසේ මටද එතකොට ඊරි යකා කිව්වේ?'

sinhalaebooks.com

*"රංග අයියේ... නංගිව රූම් එකට ගෙනියමුද?"*

රංග කිසිවක් නොකියා සමාධිට උදව් කරන්නට වූයේ සංදේශ් ගිය දෙසත් බලමිනි.

*"ඇත්තමයි අයියේ මට නම් හිතෙන්නෙම මේක අපේ අයියාගේ වැඩක්"*

*"නොකිව්වාට මටත් හිතුණා. අනිවාරෙන්ම අර කිව්ව ඊරි යකා ඌ වෙන්න ඕන..."*

*"ෂා... හිනාපාලට ල..ලකුණු... සීයයි..."*

කෙත්මි එකවරම කෑගැසුවේ සමාධිටත් සිනහවක් නැගෙද්දීය.

*******************

උදෑසනම හංසි සංදේශ්ලාගේ නිවසට ආවේ කෙත්මිව රැගෙන යන්නටය. කෙත්මිත් සමඟ යන්න සූදානම් වූවද සමාධිගේ බලකිරීමට ඇය කෙත්මිත් සමඟ උදේ කෑමට නතර වූවාය. කෙත්මි නම් තවමත් ඉන්නේ

හෝන්දු මාන්දු ගතියෙනි. පෙරදා රැයේ සිදුවූ කිසිවක් ඇයට තවම මතක නැත. ඒ ගැන හංසිගෙන් ඇසුවද ඇය කීවේ යන ගමන් කියන්නම් කියාය. ඒ නිසාම ඇය නිහඬව බලා සිටියාය.

සංදේශ් හා රංග ඔෆිස් යාමට සූදානම්ව පිටතට ආවේ ඒ මොහොතේය. කෙත්මි ඔවුන්ව නොදුටුවේ ඇය ඔවුන්ට පිටුපා සිටි නිසාය. සමාධිගේ මුවට නම් දෙදෙනා දකිද්දී ආවේ අමුතුම සිනහවකි.

***"ආ... හිනාපාල... ඔය ඊරි යකා එක්ක කෑම කාලාම යන්න."***

සමාධි සිනහව තද කරගෙන කියද්දී කෙත්මි මෙන්ම හංසිද බැලුවේ ඇය කතා කරන්නේ කාටදැයි කියාය.

***"සමාධි අක්කේ.... ඇයි එහෙම කියන්නේ? එයාලාට කේන්ති යයි."***

කෙත්මි රහසින් මෙන් කියනවා ඒ වන විට ඔවුන් වෙත ඇවිද ආ රංගට ඇසෙද්දී ඔහුට සිනහව නවතා ගන්නට බැරි විය. සමාධිත් එයට එකතු වූයේ මිතුරියන් දෙදෙනා පුදුමයෙන් බලද්දීය. සංදේශ් නම් කෑම මේසයට වාඩි වූයේ ඔවුන්ට රවමිනි.

sinhalaebooks.com

*"නවත්ත ගනිල්ලා බං. එක එක බේබද්දියෝ ගෙවල් අස්සේ දාගෙන උඹලා දෙන්නත් මෙතන විගඩම් නටන්න ගත්තද?"* සංදේශ් කීවේ කෙත්මි දෙස කෙලින්ම බලමිනි.

ඒ කතාව කීවේ තමාට බව සිතා ගන්නට ඇයට අපහසු වූයේ නැත. සේරටම මුල ඔහුය. දැන් තවත් හදන්නේ තමාට රිදවන්නටය. පෙරදා රැයේ හොඳ සිහියෙන් සිටියා නම් කීයටවත් මේ ගමන එන්නේ නැත. ඇය සිතින් රනුක්ට බැන්නේ තමාව මෙසේ එවූ එක ගැනය.

මොහොතක් සංදේශ් දෙස රවාගෙන බලා සිටි ඇය පුටුව පසුපසට කර නැගිට්ටේ අසිහියෙන් හෝ මෙහි එන්නට වීම ගැන පසුතැවෙමිනි.

*"හංසි.... අපි යමු."*

*"අනේ නංගී.... කෑම ටික කාලා යන්න."*

සමාධි කීවේ සංදේශ්ට හොඳහැටි රවමිනි.

*"සොරි අක්කේ. මට දැන් යන්න ඕන. ඊයේ රෑ මාව බලා ගත්තට ගොඩක් පිං. මං නිසා කරදරයක් වුණා නම් සොරි. අපි යමු හංසි..."*

sinhalaebooks.com

*"නංගී..."*

*"පැංචී... යනවා නම් යන්න දෙනවා. මොකටද බලෙන් තියා ගන්නේ?"*

සංදේශ් එසේ කියද්දී කෙත්මි ඔහු දෙසට හැරුණේ සමච්චල් සහගත සිනහවක් නඟාගෙනය.

*"ඔව් මිස්ට සංදේශ්. මං යනවා. කොහොමත් ඉතිං මං වගේ ජරා ගෑණු ඔයාගේ ගෙදරට විනාඩියකට හරි එන එක හරි නෑනේ. අනික ඔයාගේ අර බබා... එයා ආවොත් එහෙම හිතයි මං මේ බලෙන් ඔයාගේ පස්සෙන් ආවා කියලා."*

එසේ කියූ ඇය හංසි දෙස බලා ඉඟි කර නිවසින් පිටතට ගියේ සමාධිගේ උරහිසට තට්ටුවක් දමමිනි. හංසිත් ඒ සමඟම 'යන්නම්' කියා පිටතට ගියාය.

කෙත්මි ඊයේ වෙරි මතේ බාගෙට කී කතාව කුමක්ද කියා වැටහෙන්නේ දැන්ය. සමාධි පමණක් නොව රංගද සංදේශ් දෙස බැලුවේ අමනාපයෙනි.

*"මං හිතුවා හරි... අයියේ... ඔයා ආශා එක්ක එකතු වෙලා ඒ කිව්වේ ගෑණු ළමයෙක්ට කවදාවත්*

sinhalaebooks.com

*කියන්න හොඳ නැති දෙයක්. අනික මොකක්ද ඒ කෙල්ලට එහෙම කියන්න තරම් එයා කළේ?"*

*"මං ඒක...."*

*"හිතුවේ නෑ කියන්න නම් එපා. ඔයා හිතන්න නැතුව ඇති. හැබැයි ඒ කෙල්ල ඒක මතක්වෙන වාරයක් ගානේ විඳවයි. ආශා එහෙම කිව්වා නම් තමුසෙට තිබ්බා ඒක හරි ගස්සන්න. මට කවුරු හරි එහෙම කිව්වා නම් ඔයා සද්ද නැතුව ඉන්නවද?"*

කේන්තියෙන් කියා ඇමූ සමාධි කාමරයට ගියේ මිතුරන් දෙදෙනා කෑම මේසයේ තනි වද්දීය.

*"එහෙනම් රිතූ ඊයේ කේන්තියෙන් පුපුර පුපුර හිටියේ ඒකයි. උඹ සේරම දැනගෙනත් මේ වෙනකම් සද්ද නැතුව හිටියා."*

*"හ්ම්..."*

*"මොන තරහක් තිබ්බත් ඒ දේ කෙල්ලෙක්ට සැර වැඩියි මචං. ඊයේ කෙල්ල අර විදිහට බිව්වේ හිතේ දුකට. බලපං දැන් වුණත් කිව්ව දේවල්... මෙක මතක තියා ගනිං... ගෑණු ලේසියෙන් ඔය වගේ දේවල් අමතක*

*කරන්නේ නෑ. උඹ දැන් ලෑස්ති වෙලා හිටපං... අනිවාරෙන් දකින තැන කෙල්ල ඔය කතාව අදිනවා."*

කෙත්මි හංසිට පෙරදින රැයේ ඇය බීමත් වන්නට පෙර සිදු වූ සියල්ල කිව්වේ නිවස වෙත යන අතරේය. ආශා කී කතාවත් එය කියද්දී සංදේශ් නිහඬව සිටි බවත් කියද්දී හංසිටද නැඟුණේ කෝපයකි.

*"ෂිට්... මම හිටියා නම් පෙන්නනවා කවුද ජරා ගෑණි කියලා."*

*"කොහොමත් මාත් ඉන්නේ ආයේ වෙලාවක හම්බෙනකම් තමයි. මහ ලොකු බබා... හහ්.."*

*"ඒකි සංදේශ් අයියාගේ නැන්දාගේ දූවලු."*

*"උඹ කොහොමද දන්නේ?"*

*"උඹ ඊයේ රෑ හොඳ ජල්ලියක් අල්ලලා තියෙනවා. අතරින් පතර ඒකිගේ නමත් උඹ කියවලා.*

*මට සමාධි අක්කා කිව්වේ."*

*"දෙයියෝ... මං තව මොනවා කියෙව්වද දන්නේ නෑ..."* ඇය කීවේ අතක් හිස මත තබාගෙනය.

*"උන් දෙන්නව මරන්න ඕන කියලා ඇඬුවලු... අර ගොබ්බයෝ දෙන්නටත් නම් දෙකක් දැම්මා කිව්වා. මට ඒ මොනවද කියලා අහගන්න බැරි වුණා..."*

*"හැ...?"*

*"හ්ම්... හැබැයි අර ජෝඩුව හිටපු හැටියෙන් කියන්න පුළුවන්... අක්කා අර කිව්ව නම් දෙක තමයි උඹ කියන්න ඇත්තේ..."*

*"මොක... ඈ... හිනාපාලයි... ඊරි යකායි?"*

කෙත්මි තමාටම කියා ගනිද්දී හංසි මහ හඩින් සිනා සෙන්නට වූයේ ඒ නම් කියද්දී ඔවුන්ගේ මුහුණු ඇද වී ගිය අයුරු සිහිවීය.

කෙත්මිගේ දුරකතනය නාද වන්නට වූයේ ඒ අතරේය. ඇය දුරකතන තිරය දෙස බලා ඊළඟට බැලුවේ

හංසි දෙසය. හංසි ඇයි කියා ඇසුවේ දෑස්වලිනි. කිසිවක් නොකී කෙත්මි ඇමතුමට සම්බන්ධ වූයේ ඇයට රවමිනි.

*"හෙලෝ..."*

*"ආ.... මැඩම්... දැන් වෙරි බැහැලා වගේ..."*

*"වෙරි? කාටද වෙරි?"* ඇය කීවේ කිසිවක් නොදන්නා අයුරෙනි.

*"සුදූ මේ.... තමුසේ හිතන්නේ මං මෙහෙට වෙලා නිකම් උඩ බලන් ඉන්නවා කියලද?"*

*"ඒක නම් මාත් හරියටම දන්නේ නෑ. කොහොමත් ටිකක් හොයලා බලන්න වෙයි ඔහේ මුල් ඇදලා වගේ නතර වෙලා ඉන්නේ ඇයි කියලා..."* ඇය කීවේ ඔහුව තව ටිකක් කේන්ති කරවමිනි.

*"සුදූ.... තමුසෙව මාව විහිළුවකට ගත්තද ඒ ගමන? නැත්තං තාම වෙරිද? අනේ ඇත්තමයි ළඟ හිටියා නම් ගහනවා එකක් කන පැලෙන්න."*

sinhalaebooks.com

*"හැමෝටම පුළුවන් ඔච්චර තමයි. එක්කෝ බනියි. නැත්තං ගහයි."*

ඇය කියද්දී ඇමතුමේ එහාපස සිටි දිලූෂට සුසුමක් හෙළුණි. හංසිත් ඇයගේ අතකින් අල්ලා ගත්තේ දුක්බරවය.

*"මේ අහනවා සුදූ... අපි තමුසෙට ගහන්නේ බනින්නේ තමුසෙට තියෙන ආදරේට. මං දන්නවා නංගි උඹ ඉන්න තත්ත්වේ. මං ඉක්මනට ලංකාවට එනවා උඹව ඔහොම තනියම තියන්න බෑ. එතකම් පිස්සු නටන්නේ නැතුව ඉන්නවා. හංසිටයි අර පොඩි එකාටයි බෑ තමුසේ එක්ක ඔට්ටු වෙන්න."* දිලූෂ කීවේ ආදරයෙනි.

sinhalaebooks.com

27.

සංදේශ් බැල්කනියට වී කල්පනා කරමින් උන්නේ කෙත්මි ගැනය. එදා පාටියේදී වූ සිදුවීම ඔහුගේ සිතට බරකි. සමාධිත් රංගත් කොතරම් කීවද කෙත්මිගෙන් සමාව ඉල්ලන්නට ඔහුගේ ආඩම්බර හිත නැමෙන්නේ නැත. කෙත්මි එදා බීමත්ව තමාටත් ආශාටත් බැන්න අයුරු සිහිවී ඔහුට සිනහවක් නැඟුණි.

'අනේ බං රිතූ... උඹ මාව මරන්නද හදන්නේ? කරන්න පුළුවන් දෙයක් එපැයි කියන්න. මගෙත් වැරැද්දක් තියෙන නිසා කටවහන් හිටියා මිසක්... වෙන එකෙක් ඕක කිව්වා නම් ඌ ඉවරයි මෙලහට.'

ඒ මොහොතේ සංදේශ්ගේ දුරකතනයට ඇමතුමක් ආවේ ඔහුගේ ළඟම සේවයෙකු වූ වික්‍රීගෙනි. සංදේශ් ඇමතුමට සම්බන්ධවීමට පෙර මදක් වටපිට බැලුවේ සමාධි ළඟ පාතක ඉන්නවාදැයි කියාය. ඇයට නම් වික්‍රීව පෙන්නන්නම බැරිය.

*"බොස්.."*

sinhalaebooks.com

*"කියපං විකී. උඹ අර සිද්ධිය ගැන බැලුවාද?"*

*"බැලුවා බොස්. බොස්ලාගේ සැකේ හරි. ඒක ප්ලෑන් කරලා කරපු වැඩක් තමයි."*

*"කවුද මේක පිටිපස්සේ ඉන්නේ?"*

*"මිනිහා හැංගිලා ගේම දීලා තියෙන්නේ බොස්. අඩු තරමේ මේක ඇතුලේ ඉඳලා වැඩේ කරපු එවුන්වත් දන්නේ නෑ කවුද මිනිහා කියලා."*

*"ෂිට්... විකී... වැඩි කල් ගන්න බෑ. මේක කලේ කවුද කියලා මට හොයලා ඕන."*

*"දවස් දෙකක් දෙන්න බොස්. මං මිනිහව බොස්ගේ ළඟට ගේනවා."*

සංදේශ් දුරකතනය තැබුවේ කේන්තියෙනි. කිහිපවරක්ම පිටරට යැවූ මල් ප්‍රතික්ෂේප වූයේ ඒවාට කවුරුන් හෝ හානි කර තිබූ නිසාය. මෙය

sinhalaebooks.com

පසුපස ඉන්නේ කවුදැයි තවමත් සොයාගන්නට බැරිවීම ගැන ඔහු ඉන්නේ කේන්තියෙනි.

*"සංදේශ්..."*

*"රංගයා..."*

*"විකී නේද කතා කළේ?"*

*"ඔව් බං. තාම බැරි වුණානේ මේක පිටිපස්සේ ඉන්න එකාව හොයාගන්න. බලපං දැන් සති කීයක් ගියාද?"*

*"කලබල නොවී අපි බලමුකෝ තව ටිකක්. මොකා වුණත් මේක කරන්නේ අපිව වට්ටන්න බලාගෙන. මොකද අපේ ෂිප්මන්ට් රිටන් වුණාට ඒ ඕඩර් තාම තියෙන්නේ අපිට."*

*"අනේ මන්දා බං.."*

sinhalaebooks.com

*“මේ යමං දැන් කන්න. අන්න අර බෝම්බේ මාව එච්චේ උඹව එක්කන් එන්න කියලා.”* රංගන කීවේ සිනහවක් පාමිනි.

*“ඔව් ඔව්...ඒකිටත් අර හෝන්තුව ලොකු වෙලා. අන්තිමට මේ අයියා තමයි හැම එකටම වැරදිකාරයා.”*

*“අඩෝ... සංදේශ්. උඹ ඕවා හිතන්න එපා බං. මොනවා වුණත් මෙතන නංගි කියන කතාවෙත් ඇත්තක් තියෙනවානේ බං.”*

*“අනේ ඇත්තමයි අරකි ගිය රටකට වෙලා ඉන්නේ නැතුව ආවානේ මෙතන...”*

සංදේශ් තනිවම කුටු කුටු ගාමින් පහළට ගියේ රංගව එතැනම දමාය. ඔහුගේ මේ වැඩවලට රංගට නම් හිනාය.

****************************

කෙත්මි උදේම ෂොපින්මෝල් එකට ගියේ හංසිවත් අරගෙනමය. මහල් පහකින් යුතු එහි පස්වන මහලේ ඔවුන්ගේ කාර්යාලය පිහිටා තිබුණි.

මෙතරම් කාලයක් රනුක් මෙහි වැඩ කටයුතු සොයා බැලුවද දැන් සියල්ල පැවරී ඇත්තේ කෙත්මිටත් හංසිටත්ය.

දෙදෙනාම තම තමන්ට වෙන් වූ ඔෆිස් කාමර තුලට වී වැඩ පටන් ගත්තේ පහුගිය ටිකේම වැඩක් කරගන්නට නොවූ නිසාය.

*"ගුඩ් මෝර්නිං මැඩම්.."*

වැඩ කරමින් සිටි කෙත්මි හිස ඔසවා බැලුවේ ඒ හඬටය. ඒ ටිකට ඔහු පුටුවක් ඇද අසුන්ගෙනත් අවසන්ය. කෙත්මිගේ මුවට නැඟුණේ සිනහවකි.

*"ගුඩ් මෝර්නිං පසන් අයියේ... උදේම මොකෝ මේ පැත්තේ?"*

*"ඇයි අපි මෙහේ එන්න හොඳ නැද්ද?"*

*"අනේ... කවුද එහෙම කිව්වේ... මං බැලුවේ ඉතිං අද ඔයා ඔෆිස් ගියේ නැද්ද?"*

*"අද ගියේ නෑ හලෝ.."*

sinhalaebooks.com

*"කෙත්මි මේ..."*

ඔවුන් දෙදෙනා කතා කරමින් සිටින අතර එකවරම ෆයිල් කිහිපයකුත් උස්සාගෙන ඇතුළට ආ හංසි කියන්නට ගිය දේ නතර කර ගත්තේ කෙත්මි ඉදිරියේ අසුන්ගෙන සිටි පසන්ව දැකය.

*"ඈ... මේ මොකද මේ?"*

*"ඇයි හංසි?"*

*"පසන් අයියත් දැන් මෙහෙද වැඩ කරන්නේ?"*

*"සිරාවට අහන්නේ... මට මෙහේ ජොබ් එකක් ගන්න බැරි වෙයිද සුදු නංගී? ස්ටෝ කීපර් හරි කමක් නෑ..."*

කෙත්මි මෙන්ම හංසිද ඔහු දෙස බැලුවේ පුදුමයෙනි. ඔහු නම් උන්නේ තනිවම සිනාසෙමිනි.

*"මේ යකාට මොනවා වෙලාද කෙත්මි ඒ ගමන?"*

sinhalaebooks.com

***"ඒකනේ... පසන් අයියේ ඔයා අපි දෙන්නව බයිට් එකට ගත්තද?"***

***"පිස්සුද සුදූ නංගි. විහිළුවක් කළේ මං. මේ මං මේ අඳුරන නංගි කෙනෙක් මෙහේ වැඩ එයාව පොඩි වැඩකට හම්බෙන්න ආවේ. ඒ ගමන් ඉතිං ඔයාලාට කතා නොකර යන එක හරි නැති නිසා ආවේ බලන්න. මං යන්නම් එහෙනම්.."***

මිතුරියන් දෙදෙනාම තමා දෙස විමසිල්ලෙන් බලද්දී පසන් යන්නට සූදානම් වූයේ කලබලයෙනි.

***"ඔහොම ඉන්න. ඔයාලාගේ නංගි කෙනෙක් මෙහෙ වැඩ කරනවද? කලින් කියන්න එපැයි අනේ අපිටත්."***

***"න්...නෑ.. මේ එහෙම මේ.."***

***"නම මොකක්ද අයියේ එයාගේ?"***

***"එයාගේ නම ත..තරුදි.."***

***"තරුදි?"***

sinhalaebooks.com

*"ඔව් බං. මේ මට පරක්කු වෙනවා. මං යනවා හොඳේ."* කියූ පසන් මිතුරියන් දෙදෙනා තවත් යමක් අසන්නට පෙරම එතනින් පිට වූවේ ය.

*"ඈ බං... ඒකේ නම් මොකක් හරි අවුලක් තියෙනවා.."*

*"ඒකනේ බං. මට නම් හිතෙන්නෙම මොකක් හරි සිලිං බිලිං එකක් වගේ කෙත්මි."*

*"කවුද බං තරුදි කියන්නේ? කෙල්ල ලස්සනයිද?"*

*"ම්... ලස්සනයි හැබැයි. අහිංසක කෙල්ල."*

*"මොන සෙක්ෂන් එකේද වැඩ?"*

*"මට මතක විදිහට සෙකන්ඩ් ෆ්ලෝ එකේ තියෙන රෙස්ටුරන් එකේ මැනේජර් බං තරුදි කියන්නේ."*

sinhalaebooks.com

හංසි එය කියා අවසන්වනවාත් සමඟම කෙත්මි අසුනින් නැඟිට්ටේ සිනහවකින් මුව සරසාගෙනය.

*"ඒ ගමන කොහේද යන්නේ?"*

*"උඹත් වරෙන් හංසි..."*

*"උඹ ඔය යන්න හදන්නේ තරුඳිව බලන්න කියලනම් කියන්න එපා."*

*"ඒකට තමයි බං. ඉක්මනට වරෙන්කෝ. නැත්තං මේ කුතුහලයත් එක්ක මට දවසම වැඩක් කරගන්න වෙන්නේ නෑ."*

කී කෙත්මි ඉස්සර වෙද්දී හංසිත් ඇය පසුපසින්ම පැමිණ විදුලි සෝපානයට නැඟුණාය.

*"ගුඩ් මෝනිං මැඩම්.."*

ඔවුන් රෙස්ටුරන් එකට යද්දී තරමක සෙනඟක් එහි විය. එනමුත් ඔවුන් දෙදෙනාව හඳුනාගත් සේවකයෙක් ඔවුන් අසලට පැමිණ කතා කළේය.

sinhalaebooks.com

*"ගුඩ් මෝර්නිං. ඔයාලාගේ මැනේජර් කෝ?"*

*"මැඩම්... මිස් ඇතුලේ ඔෆිස් එකේ ඉන්නවා. අර ඉන්නේ."*

ඔහු අත දිගු කර පෙන්වූයේ වීදුරුවකින් වෙන් වී තිබූ කුඩා කාර්යාල කාමරයයි. එහි මේසයක වාඩි වී මොනවාදෝ ලියමින් සිටි යුවතිය දකිද්දී කෙත්මි හංසි දෙස බලා සිනහවක් පෑවාය.

*"එක්ස්කියුස් මී..."*

කෙත්මිගේ හඬට ඇය කරමින් සිටි වැඩය නවතා හිස ඔසවා බැලුවාය. කෙත්මිව දකිද්දී ඇය ඉක්මනින් වාඩි වී උන් අසුනින් නැගිට්ටාය.

*"අනේ මැඩම්... එන්න ඇතුළට. මට පණිවිඩයක් එව්වා නම් මං උඩට එනවානේ මැඩම්."*

*"තරුදි කොහොමද මාව අඳුර ගත්තේ? මතක විදිහට නම් මට මීට කලින් තරුදිව මුණගැහිලා නෑ."*

*"අනේ.. මැඩම්ව අඳුරගන්න බැරිද මට... රනුක් සර්ගේ ඔෆිස් එකේ මැඩම්ගේ ලොකු ෆොටෝ එකක් එල්ලලා තියෙන්නේ..."*

*"හෑ... මේ අපේ මල්ලී..."*

මිතුරියන් දෙදෙනා මුහුණින් මුහුණ බලා ගත්තේ පුදුමයෙනි. ආවත් හරි රනුක්ගේ ඔෆිස් කාමරයට යන්නට වෙලාවක් නොතිබූ නිසාම දෙදෙනාටම එය මගහැරී තිබුණි.

*"ඔව් මැඩම්.."*

*"හොඳයි හොඳයි... අපි දෙන්නා මේ නිකම් කට්ටිය අඳුර ගන්නත් එක්ක පහලට ආවේ. තරුදි වැඩ කරගෙන යන්න. අපි පස්සේ වෙලාවක හම්බෙලා කතා කරමුකෝ."*

*"හොඳයි මැඩම්."*

කෙත්මි තරුදිට සිනහවක් පා පිටතට ආවේ සතුටිනි. කතාබහින්ම තරුදි අහිංසක යහපත් යුවතියක් බව ඇය තේරුම් ගත්තාය.

sinhalaebooks.com

***"කෙත්මි මේ..."***

***"මොකද හංසි?"***

හංසිගේ මදක් බියපත් කටහඩ නිසා කෙත්මි ඇයගේ මුහුණ දෙස හොඳින් බැලුවාය. ඇය බලා සිටින්නේ රෙස්ටුරන් එකේ කෙලවරක ඇති මේසයක් දෙසය. කෙත්මිත් ඒ දෙසට නෙතු හැරෙව්වේ හංසි බය වූයේ කාටදැයි බලන්නටය.

***"දෙයියනේ..."***

ඒ මේසයේ සිට නැඟිට එන කෙනා දකිද්දී කෙත්මිගේ හෘදස්පන්දනය පවා වේගවත් වූයේ ඔහුව යළිත් දකින්නට බලාපොරොත්තු නොවූ නිසාමය.

***"අපි යමු බං දකින්න කලින්. තව කවුද එකියක් එක්කනේ ඉන්නේ අළුත් වයිෆ් වෙන්න ඇති..."***

හංසි ඉක්මන් වූයේ ඔහු ඔවුන් දෙදෙනාව දකින්නට පෙර සැඟවෙන්නටය.

කෙත්මි නම් බලා උන්නේ පුදුමයෙනි. හංසි නොදන්නවාට ඇයව කෙත්මි දැන උන්නාය. නමුත් ඇය මොහු සමඟ කරන්නේ කුමක්ද කියා කෙත්මිට සිතා ගන්නට බැරිය.

sinhalaebooks.com

*"හංසි... දැන් උඹ එළියට යන්න ගියොත් උඹව අඳුර ගනියි. උඹ ඉක්මනට ආපහු තරුදිගේ ඔෆිස් එකට පලයන් දකින්න කලින්."*

*"එතකොට උඹ?"*

*"මාව දැක්කට අඳුරන්න බැනේ බං. නම කිව්වොත් මිසක්. මං හෙමීට ඔෆිස් එකට යන්නම්. උඹ පොඩ්ඩක් මෙයාලා යනකම් ඉඳලා වරෙන්."*

*"ඒත්..."*

හංසි කියා අවසන්වීමටත් කලින්ම කෙත්මි රෙස්ටුරන්ට් එකේ දොරටුව දෙසට යන්නට ඉස්සර වූවේය. අංජලී ඉක්මනින් තරුදිගේ කාර්යාලයට ගියේ ඇයව ඔහු දකින්නට පෙරය.

*"ඒයි... ඔහොම ඉන්නවා..."*

කෙත්මි නතර වුණේ ඒ හඩටය. කෙත්මි සිනහ මුවින්ම හැරී බැලුවාය.

*"තමුන් නේද එදා පාටි එකේදි අපේ අයියාගේ ඇඟේ එල්ලෙන්න ආවේ... චීප් ගර්ල්."*

sinhalaebooks.com

*"මිස්ට වැරදීමක් වෙලා... මට මිස්ගේ අයියාගේ ඇඟේ එල්ලෙන්න කිසිම වුවමනාවක් නෑ."*

*"මොන අයියෙක්ද ආශා?"*

ඔහු ඇසුවේ මේ දෙදෙනාගේ කතාවේ අගක් මුලක් සොයාගන්නට බැරිවය. මේ ඉන්නා ගෑණු ළමයාගේ යම් හුරුබවක් දැණුනද කවුදැයි කියා ඔහුට සිහිවූයේ නැත.

*"අපේ සංදේශ් අයියා අසිත. මේ වගේ ගොඩේ ගෑණු හිතන් ඉන්නේ මේකප් ටිකක් උලාගෙන ලස්සනට ඇඳන් ආවා කියලා අපේ අයියා වගේ සල්ලිකාරයෝ මෙයාලාට අහුවෙයි කියලා."*

*"අහ්... මෙයාද ඔයා ඒ කිව්වේ?"*

අසිත ඇසුවේ කෙත්මි වෙත සමච්චල් සිනහවක් පාමිනි.

*"මිස්... මං මේ බොහොම හොඳින් කියන්නේ... නොදන්න දේවල් ගැන කතා කරන්නේ නැතුව තමන්ගේ වැඩේ කරගෙන ගියා නම් නේද හොඳ?"*

sinhalaebooks.com

*"නොදන්න දේවල්! මං මොනවද හලෝ නොදන්නේ? තමුසෙලා වගේ ජරා ගෑණු... මෙතනටත් ආවේ කවුරු හරි සල්ලිකාර කොල්ලෙක් අල්ලගන්න වෙන්න ඇති."*

කියන්නට දේවල් දහසක් කටට ආවද කෙත්මි හිතාමතාම තම කට පාලනය කර ගත්තේ මෙතන සෙනඟ ඉදිරියේ එලෙසින් කතා කිරීම තමාගේ ප්‍රතිරූපයට මෙන්ම ව්‍යාපාරයටද කැලලක් වන නිසාමය.

*"මැඩම්... මොකක් හරි ප්‍රශ්නයක්ද?"*

තරුදි ඔවුන් අතරට ආවේ හංසිගේ කීමටය. සිදුවන්නේ කුමක්ද කියා හරියටම නොදැන උන්නත් කුමක් හෝ ගැටලුවක් බව කාර්යාලයේ සිටි ඔවුන් දෙදෙනාටම පෙනුණි.

*"මැඩම්? මේ කොහෙවත් යන ජරා ගෑණුන්ට මොකටද ළමයෝ මැඩම් කියන්නේ?"* ආශා තරුදිගෙන් ඇසුවේ කෙත්මි වෙත යළිත් සමච්චල් සහගත සිනහවක් පාමිනි.

*"එක්ස්කියුස් මී මිස්. ඔයා කවුද කියන්න නම් මං දන්නේ නෑ. වචන පාවිච්චි කරද්දී ඔයිට වඩා ටිකක් පරිස්සම් වුණොත් හොඳයි."*

sinhalaebooks.com

***"හහ්... මගේ වචන ගැන හොයන්න තමුන් කවුද?"***

***"මං නම් මේ රෙස්ටුරන්ට් එකේ මැනේජර් මිස්. එතකොට මේ ඉන්නේ ඔයා කිව්වා වගේ කොහේවත් යන කෙනෙක් නෙමෙයි. මේ ඉන්නේ දිසානායක ගෲප් එකේ අනාගත අයිතිකාරි. එයාගෙම තැනකට ඇවිත් කාලා බීලා... එයාටම ඔහොම කතා කරන එක එච්චර ශිෂ්ටසම්පන්න නෑ නේද මිස්?"***

තරුදිගේ කතාවට කෙත්මිගේ මුවහට සිනහවක් නැඟුණි. අහිංසක පාටට හිටියට ඇය අහිංසකම නැති බව නම් පැහැදිලිය. නමුත් මේ කතාව මෙතැනින් දුර ගෙනියන්නට කෙත්මිට වුවමනා වූයේ නැත.

***"තරුදි... දැන් ඇති. මේ අයට තව වුවමනා මොනවා හරි තියෙනවා නම් කරලා දීලා යවන්න. මං යනවා."***

කී කෙත්මි ආශා සහ අසිත දෙසට හැරී සිනහවක් පා යන්නට ගියේ ඔවුන් දෙදෙනාම පුදුමයෙන් ඇය දෙස බලා සිටිද්දීය.

sinhalaebooks.com

# 28.

***"අහ්... මෙන්න ඔයාගේ අර මැරයා කතා කරනවා."***

කාර්යාලයේ සංදේශ්ට ඉදිරියේ වාඩි වී ලිපිගොනුවක් සකසමින් සිටි සමාධි නොනවත්වා නාදවන සංදේශ්ගේ දුරකතනය දෙස බලා කීවේ අමනාපයෙනි. සංදේශ් ඇයට ඇදකරමින් ඇමතුමට සම්බන්ධ වූවේය.

***"කියපං විකී..."***

***"බොස්... ආශා මිස් අසිතත් එක්ක රෙස්ටූරන්ට් එකකට යනවා අපේ එකෙක් දැකලා තියෙනවා."***

***"මොකක්? ඒකි මොනවද ඌ එක්ක කරන්නේ?"***

සංදේශ් තරමක කෝපයෙන් කියද්දී සමාධි හිස ඔසවා බැලුවාය. සංදේශ්ගේ මුහුණ දකිද්දී සමාධිට හිතුනේ කුමක් හෝ ගැටලුවක් බවය.

*"උඹ කොහෙදිද විකී දැක්කේ? අනික මං උඹට කිව්වේ උන් ගැන හොයන්න නෙමෙයි..."*

*"ඒක ඇත්ත බොස්. ඒත් මෙතන අවුලක් දැක්ක නිසයි කියන්න හිතුනේ. අනික..."*

*"අනික?"*

ඊළඟට විකී කී දෙයට නම් සංදේශ් පුටුවෙන් පවා නැඟිට්ටුනේ ඉබේටමය. සමාධිත් ඔහු දෙස බැලුවේ මදක් බියපත්වය.

*"බොස් රිතූ මැඩම් එතනට ඇවිත් තියෙනවා ඒ වෙලාවේ.."*

*"මොකක්? එයා මොනවද එතන කරන්නේ? උන් එයාව දැකලාද විකී? මොකුත් ප්‍රශ්නයක් වෙලාද?"*

sinhalaebooks.com

සමාධිට විකී කියන දෙයක් නැසුණත් සංදේශ් මේ තරම් වදවන්නේ කවුරුන් ගැනද කියා සිතා ගන්නට බැරිය.

*"බොස්... ඒක දිසානායක ගෲප් එකෙන් කරන ෂොපින් මෝල් එක. රනුක් සර් වෙනුවට දැන් එතන බලන්නේ මැඩම්..."*

*"වට්? ඒ කියන්නේ එයා ඔසීවල සේරම දමලා ගහලා දිසානායක ගෲප් එක ගැන බලන්න පටන් අරන්ද?"*

*"ඔව් බොස්. අද තමයි මැඩම් මෙතනට ආපු දෙවෙනි දවස. අර දෙන්නා ඉද්දීම රිතූ මැඩම් රෙස්ටුරන්ට් එකට ඇවිත් තියෙනවා. ඒ විතරක් නෙමෙයි බොස්..."* විකී ආශා කල කී දේවල් ගැනද සංදේශ්ට කීවේය.

*"ෂිට්... මේ ***. අපේ පවුලේ එකියක් කියන්නත් ලැජ්ජයි බං. මට මේක කියපං... අරූ මැඩම්ව අඳුරගත්තද?"*

sinhalaebooks.com

***"ඒ වෙලාවේ නම් නෑ බොස්. හැබැයි ඌ ඉක්මනටම දැනගනියි මේ යන විදිහට."***

***"උඹ කෝකටත් ඇහැ ගහගෙන ඉදපං. එයාගේ ආරක්ෂාව ගැන පොඩ්ඩක් වැඩියෙන් බලපං. ඔය මිනිහාව ආයේ එයා දකින්නවත් ඕන නෑ.."***

සංදේශ් සුසුමක් හෙලා දුරකතනය තැබුවේ ඇසිපිය නොහෙලා තමා දෙස බලා සිටින සමාධි දෙස බලාගෙනය. දැන් ඉතිං ඇයගේ නිමක් නැති ප්‍රශ්න වලට උත්තර දෙන්න වෙන බව ඔහු දනී.

කෙත්මි කාර්යාලයට වී උන්නේ උදෑසන සිදුවීම යලිත් සිහිකරමිනි. ඒ මොහොතේ ඔහු තමාව අදුනා නොගත් බව සැබෑය. නමුත් ඔහුව දකිද්දී තමාගේ හිත ගැස්සී ගිය අයුරු ඇයට සිහිවිය. ඔහු ඇයගේ ප්‍රථම ප්‍රේමයයි. ඉතිං දකින විට හිත ගැස්සීම අහන්නත් දෙයක්ද?

හංසි කෙත්මිව සොයාගෙන උඩට ආවේ කලබලයෙනි. ඒ මොහොතේ හදිස්සි වැඩකට ඇයට පිටතට යන්නට සිදු වූ නිසා හංසි ඉක්මනින් ආවේ කෙත්මි ඉන්නා තත්ත්වය දන්නා නිසාමය. යන්නට පෙර ඇය තරුදිටද කියා ගියේ කෙත්මි ගැන මදක් බලන ලෙසය.

sinhalaebooks.com

*“කෙත්මි...”*

*“ආහ්... ඔයා ආවද හංසි... ගිය වැඩේ හරිද?”*

*“ඒක නම් හරි. උඹට අවුලක් නෑ නේද කෙත්මි?”*

*“අවුලක් නෑ කියන්නම බෑ බං. මං ආයේ එයාව දකින්න බලාපොරොත්තු වුණේ නෑ. අවුරුදු ගානක් අමාරුවෙන් එකතු කරගත්ත හිත ආයෙත් විසිරිලා යනවා වගේ දැණුනා.”*

*“කෙල්ලේ... අපි දන්නවානේ දැන් ඌ මොන වගේ සතෙක්ද කියලා? දැන් ඌ ගැන හිතන්න එපා.”*

*“ඒත් හංසි... එයා මොනවද ආශා එක්ක කරන්නේ?”*

*“ආශා? ආශා කිව්වේ මේ... අර එදා ...”*

sinhalaebooks.com

*"ඔව්. එයා තමයි. සංදේශ් අයියාගේ නැන්දාගේ දුව."*

*"ෂික්... දන්නවා නම් තරුදිව එවන්නේ නෑ... මං ම ඇවිත් ඒකිට හොඳ දෙකක් කියනවා."*

*"ඒක දැන් ඉවරයිනේ. ආයේ එහෙම වුණොත් මාත් කටවහන් ඉන්නේ නෑ. ඒත් හංසි සමාධි අක්කට අච්චර දෙයක් කරපු අසිතත් එක්ක ඇයි ආශා?"*

*"අප්පටසිරි... ඒකත් ඇත්ත තමයි..."*

*"අපි බලමුකෝ බං. මොනවා වුණත් මේක දැන්ම අපේ මල්ලිටවත් අයියාටවත් කියන්න එපා. මට කොහොමත් පොඩි සැකයක් තියෙනවා මේ දෙන්නව දැක්ක වෙලාවේ ඉඳලා..."*

*"කෙත්මි... කරන දෙයක් පරිස්සමින් කෙල්ල. ඌ මොන වගේ සතෙක්ද කියලා දන්නවානේ."*

හංසි කීවේ තරමක තිගැස්මෙනි. බැරි වෙලාවත්... ඔහු යළිත් කෙත්මිට ළං වෙන්නට උත්සහ කළොත්...?

sinhalaebooks.com

*******************

හවස පහත් පසු වී තිබුණද කෙත්මි උන්නේ තරුදිගේ ඔෆිස් එකට වී ඇයත් සමඟ ගිණුම් වගයක් පිරික්සමිනි. සතියට දෙකට තරුදි හංසිටත් කෙත්මිටත් බොහෝ හිතවත් වී උන්නාය. තිදෙනාම එකතු වී හවස්වරුවේ ගිණුම් පිරික්සන්නට වූයේ රටේ නැති වැල්වටාරම් කතා කරමිනි. පහත් පසුවී ඇති බවවත් ගෙදර යා යුතු බවත් කාටවත් ගාණක් නැත.

තරුදිගේ දුරකතනය නාදවන්නට වූයේ ඇය ෂොෂ්රූම් එකට ගිය අතරේය. තරුදිගේ පුටුවේ අසුන්ගෙන සිටි කෙත්මි හිස ඔසවා දුරකතනය දෙස බැලුවේ හංසිද කරමින් සිටි වැඩේ නවතා එයට එබෙද්දීය.

***"අඩ්ඩේහ්... මෙන්න සුදු මහත්තයා කතා කරනවා මේකිගේ..."***

හංසි කීවේ කට කොණකට සිනහවක් නඟාගෙනය.

sinhalaebooks.com

නමුත් තිරයේ වූ අංකය හරිහැටි දකිද්දී කෙත්මිගේ දෑස් විසල් විය. 'සුදු මහත්තයා' කියා සේව් කර තිබුණද ඒ අංකය කෙත්මිට හොඳින් හුරුය. දුරකතනය ඉක්මනින් අතට ගත් කෙත්මි හංසිට නිහඬ වන ලෙස පවසමින් එය කනේ තබා ගත්තාය.

***"තරූ.... මොනවද කරන්නේ සුදූ එන්නේ නැතුව? මං දැන්  පැය බාගයක් තිස්සේ මෙතන. තව ටිකකින් අර ජෝඩුවත් එළියට එයි. මං තව විනාඩි පහයි බලන්නේ... තමුසේ ආවේ නැත්තං මං ඔතන ඉඳියි..."***

එහා පසින් ඇමතුම විසන්ධි වී ගියත් කෙත්මි එය කනේ තබාගෙනම හංසි දෙස බලා උන්නේ සිදුවන දේ අදහා ගන්නට බැරිවය. දෙදෙනාම සිතුවේ ඇය පසන්ගේ පෙම්වතිය කියා වුවත්.. ඒ ඇසුණ හඬ පසන් අයියාගේ නොවේ. දැන් ඇසුණ කටහඬ කෙත්මි ඊට වඩා හොඳින් හඳුනයි. ඒත්... එය සැබෑවක්ද?

***"මොකද බං?"***

***"න්.. නැහ් මේ..."***

sinhalaebooks.com

*“මොකෝ කෙත්මි බය වෙලා... සුදු මහත්තයා මොකෝ කියන්නේ? කිස් එකක්වත් දුන්නද උඹ ඔය තරම් බය වෙන්න..”*

හංසි අසන විටම ඇසුනේ දොර අගුල කරකැවෙන හඬයි. ඉක්මනින් තරුදිගේ දුරකතනය තැබූ කෙත්මි හංසිට ඉඟිකලේ නිහඬවන ලෙසය.

*“ඇයි මැඩම්...?”*

තරුදි ඇසුවේ ඔවුන්ගේ වෙනසක් දැනෙද්දීය.

*“න්.. නෑ මොකුත් නෑ තරුදි. ඉතුරු ෆයිල් එකත් බලලාම ගියොත් ඔයාට ලේට්ද?”*

*“අනේ නෑ මැඩම්...”*

*“මේ ටික අදම ඉවර කරමු කෙත්මි. යන ගමන් අපි මේ කෙල්ලවත් ගෙදරින් දාගෙන යමු..”*

හංසි කියද්දී සිනහවක් පා වාඩි වූ තරුදි දෙස මොහොතක් බලා සිටි කෙත්මි ෆයිල් එකට එබුණේ තොල්පට සපාගෙන ඔරලෝසුව දෙසද බලමිනි.

sinhalaebooks.com

*"තරුදි පසන් අයියව දන්නේ කොහොමද?"*

කෙත්මි ඇසුවේ ෆයිල් එකටම දෑස් යොමාගෙනය. කෙත්මි මේ සැරසෙන්නේ කුමක් හෝ හොර වැඩකට බව නම් හංසිට ඇයගේ හැසිරීමෙන්ම තේරුණි.

*"අහ්.. පසන් අයියා. අපේ ලොකු තාත්තාගේ පුතානේ මැඩම්. ඇයි මැඩම්?"*

*"න්.. නැහ්.. මට දවසක් පසන් අයියා කිව්වා තරුදිව එයා දන්නවා කියලා. ඒකයි බැලුවේ.."*

කෙත්මිට කියා කට ගන්නට ලැබුණේ නැත. එක්වරම කාමරයේ දොර ඇරගෙන කවුරුන් හෝ ඇතුලට ආවේ කාටදෝ බැණවදිමිනි.

*"සුදූ... මං කිව්වානේ තමුසෙට විනාඩි පහයි දෙන්නේ කියලා. මේකට වෙලා මොන රෙද්දක්..."*

ඔහු කියාගෙන ආ දෙය එකවරම ගිල ගත්තේ තරුදිගේ පුටුවේ වාඩි වී දොර දෙස බලා සිටින කෙත්මිව දකිද්දීය.

ඇය ඉදිරියේ අසුනේ සිටි තරුදි බියපත් දෑසින් බලා සිටිනවා ඔහු දුටුවේ පසුවය. හංසි නම් උන්නේ කටත් ඇරගෙනය. ඒසී කළ ඔෆිස් එක තුළත් තමාට දාඩිය දමා ඇති බවක් ඔහුට දැණුනි.

*"අ.. අක්..කා.. මං.. මේ.."* රනුක් ගොත ගැසුවේ කියා ගන්නට දෙයක් නැතිවය.

*"දොරට තට්ටු කරලා එන්න දන්නේ නැද්ද බූරුවෝ... තව ඩිංගෙන් ප්‍රෙෂර් වැඩි වෙලා මැරෙන්නේ.."* හංසි පපුවට අතකුත් තබාගෙනම රනුක්ට බැන්නේ තරුදි ඉන්න බවත් නොතකාය.

*"මේ මහත්තයාට මැනර්ස් එහෙම අළුතෙන්ම කියලා දෙන්න වෙයි වගේ නේද?"*

කෙත්මි ඇසුවේ කිසිම කලබලයක් නැතුවය. ඇයගේ සන්සුන් මුහුණ දකිද්දී හංසි බැලුවේ පුදුමයෙනි. වෙනදාට නම් මේ වගේ දෙයක් කල පසු රනුක්ට අනිවාරෙන්ම වෙන්නේ ගුටි කන්නටය.

*"සොරි අක්කා... මං දැනන් හිටියේ නෑ ඔයාලා ඉන්නවා කියලා.."* රනුක් කීවේ බිම බලාගෙනය.

*"හෑ... එතකොට මේ බතලයා සුදූ කියාගෙන ආවේ උඹට නෙමෙයිද කෙත්මි?"* හංසි ඇසුවේ පුදුමයෙනි. ඇය හිතන් උන්නේ රනුක් බැණගෙන ආවේ කෙත්මිට කියාය.

*"හංසි. අපිත් දැන් ගෙදර යමු. ඉතුරු ටික හෙට බලමු. ඔයත් යන්න තරුදි. එක්කන් යන්න ඇවිල්ලනේ..."* කී කෙත්මි ෆයිල් එක වසා දමා නැඟිටිද්දී තරුදි ඇය දෙසත් හංසි දෙසත් බැලුවේ බියපත් දෑසිනි. රනුක්ද උන්නේ කිසිවක් සිතා ගන්නට බැරිවය.

*"මැඩම්...මේ..."*

*"ඔෆිස් එක වහලා යන්න තරුදි. අපි යමු හංසි."*

කියාගෙන දොර දෙසට ආ කෙත්මි ඇය දෙස බියපත්ව බලා සිටින රනුක් අසල මදක් නතර වුණේ හංසිත් ඔවුන් වෙත එද්දීය.

*"පරිස්සමින් ඔයාගේ සුදූව ගෙදරටම ගෙනිහින් බස්සවලා ගෙදර එන්නකෝ සුදූ මහත්තයා..."* කියූ කෙත්මි යන්නට ගියේ හංසි දෑස් විසල් කරගෙන රනුක් දෙසත් තරුදි දෙසත් බලද්දීය.

sinhalaebooks.com

*"රනුක්....?"*

*"හංසියෝ... අනේ අර බෝම්බේ නිෂ්ක්‍රීය කරලා දියන් මගේ මැණිකේ..."* රනුක් කීවේ කෙත්මි ඉන්නේ අමනාපයෙන් බව දැනගෙනය.

*"ඒ කියන්නේ උඹලා දෙන්නා...?"*

*"හංසි මැඩම්... අපි... මේ.."* තරුදි ගොත ගසන්නට වූවාය.

*"තරුදි.. ඔයා දැන් පරිස්සමින් ගෙදර යන්න. අපි හෙට නිදහසේ කතා කරමු. සුදු මහත්තයෝ.. උඹ මේ කෙල්ලව බස්සලා වරෙන්කෝ ගෙදර.."*

කී හංසි යන්නට ගියේ රනුක් ඇය යන දෙස බලා කට ඇද කර ගනිද්දීය. දැන් ඉතින් දෙදෙනාගෙන්ම විසුමක් වන්නේ නැති බව ස්තීරය.

sinhalaebooks.com

29.

***"මං කියන්න තමයි හිටියේ හංසියෝ..."***

රනුක් කීවේ සාලයේ සෝපාවට බර වී ඔහු දෙස රවාගෙන බලා සිටින හංසිටය. තරුදිව නිවසට දමා ඔහු ගෙට ගොඩවෙද්දීම හංසිගේ තියුණු දෑස් වලට හසුවිය. විනාඩි පහක් පමණ ගියද ඇයගේ බැල්ම වෙනස් නොවූ තැන රනුක් කීවේ හැඬුම්බර හඬකිනි.

***"කවද්ද? උඹලාගේ කසාදෙන් පස්සේද?"***

හංසි ඇසුවේ ටිකක් තදිනි. උඩුමහලේ සිටි කෙත්මිත් පහළට ආවේ ඒ මොහොතේය.

***"ආ.... සුදු මහත්තයා. සුදූව බස්සලා ආවද?"***

***"සුදූ... මං ඔයාට.."***

sinhalaebooks.com

***"නෑ... නෑ... අවශ්‍ය නෑ. දැන් මං නෙමෙයිනේ සුදූ. දැන් සුදූ කෙනෙක් ඉන්නවානේ. මං අක්කා... ඒ ඇති."*** කෙත්මි කීවේ නෝක්කාඩුවක් විලසිනි.

***"අක්කා... හැමදාමත් ඔයා මගේ සුදූ අක්කා තමයි. මට සමාවෙන්න සුදූ මේ ගැන කලින් කියන්න බැරි වුණාට. මං... මං තරුදිට ආදරේ කරනවා අක්කා..."***

***"අපි බිස්නස් බාර අරගෙනත් දවස් ගානක් වුණා. යාළුවෝ වගේ ඉදලත් තමුසෙට මේක අපිට කියන්න බැරි වුනාද?"*** හංසි ඇසුවේ අමනාපයෙනි.

***"හංසියෝ... සුදූ... අනේ පොඩ්ඩක් අහන්නකෝ... තරූ ගැන දැන්ම ඔයාලාට කියන්න මට බය හිතුණා.."***

***"ඒ මොකද?"*** කෙත්මි නිහඬවම ඉද්දී හංසි ඇසුවාය.

***"තරුදිව ඔයාලා පිළිගනියිද කියලා මට බය හිතුණා."*** ඔහු කීවේ බිම බලාගෙනමය.

sinhalaebooks.com

*"ඇයි ඒ කෙල්ල දුප්පත් කෙල්ලෙක් නිසාද? නැත්තම් ඔයාට වැඩිය අවුරුද්දක් වැඩිමල් නිසාද?"* කෙත්මි අහද්දී රනුක් මෙන්ම හංසිත් ඇය දෙස බැලුවේ පුදුමයෙනි.

*"අක්කේ?"*

*"කෙත්මියෝ..."*

*"මට එදා තරුදිව හම්බුණ මුල්ම දවසේ හිතුණා තරුදි ගැන ටිකක් හොයලා බලන්න. ඒ හොයද්දියි මං මේවා දැනගත්තේ..."*

*"මං කලේ නොගැලපෙන දෙයක් නම් මට සමාවෙන්න අක්කේ... ඒත් තරුදිට මොකුත් කියන්න කරන්න එපා. ඒ කෙල්ල අහිංසකයි. මේ සම්බන්ධෙ වුණත් පටන් ගත්තේ මගේ වුවමනාවට.."*

රනුක් කීවේ බිම බලාගෙනය. කෙත්මිගේ මුහුණ එතරම් හොඳ නැත. ඔහු බය වූයේ ඔහු නිසා තරුදිට රැකියාවත් අහිමිවී යාදෝ කියාය.

sinhalaebooks.com

ඔහුගේ කතාවට නැඟෙන්නට ආ සිනහව කෙත්මි අපහසුවෙන් නවතා ගත්තද හංසි නම් මහ හඬින් සිනාසෙන්නට විය. රනුක්ගේ මුහුණ තවත් ඇද වී ගියේ ඒ හිනාවටය.

*"මේ බලපංකෝ කෙත්මියෝ අපේ බතලයාට වෙලා තියෙන දෙයක්... මූ සත්‍ය ප්‍රේම භෘංග රාජයා වෙලා ඒ ගමන.."*

*"ඒක තමයි මාත් බැලුවේ... අම්මලාට කියන්න තියෙන්නේ මෙයා මෙහෙට වෙලා කරන සෙල්ලම්.. අපි පොඩියි කියලා හිතන් හිටියාට පොඩි නෑ..."*

*"අක්කේ... අනේ..."*

*"මොකද දැන්?"*

*"ඔයා ඇත්තටම තරුට කැමති නැද්ද අක්කේ?"*

***"මං මොකටද අකමැති වෙන්නේ... මට දුක ඒ අහිංසක කෙල්ල තමුසෙට අහුවෙච්ච එක ගැන. මං දැක්කානේ අර වෙලාවෙත් කතා කරපු ලස්සන.."***

***"අක්කේ...."***

රනුක් කෑගසමින් කෙත්මිගේ ඇඟට පනිද්දී හංසිද බලා උන්නේ සිනාසෙමිනි. බොරුවට කෑගැසුවාට කෙත්මි තරුදිට උඩින්ම කැමති බව හංසි දැන උන්නාය.

***"මාව අතඇරපං බලතයෝ... හුස්ම හිරවෙයි මගේ.."*** කෙත්මි කීවේ අපහසුවෙන් රනුක්ගේ ග්‍රහණයෙන් මිදමිනි.

***"මං තමුසෙට ආදරෙයි සුදූ..."***

කී රනුක් කෙත්මිගේ කොපුලක් සිපගෙන කාමරයට දුවන්නට විය.

***"ඔව් ඔව් අපි කළුයිනේ..."*** හංසි කෑගැසුවාය.

***"තමුසෙටත් ආදරෙයි බං. ඒ වුණාට කිස් දෙන්න ගිහින් ටොමියාගෙන් ගුටි කන්න බෑ මට. අපේ සුදූටත්***

sinhalaebooks.com

*තව ටික දවසයි ඉතිං...”* ඔහු කීවේ මඟ නතර වී දෙදෙනාම දෙස බලමිනි.

*“මොකක්ද බං ඒ කතාව?”*

*“හංසියෝ... මෙයා මේ හදිස්සියේම අර ෆ්ලවර් ඕඩර් එකක් අල්ලගෙන ඔසී ඉඳලා ලංකාවට ආවේ ඇයි කියලා ඔයා නොදන්නවා වුණාට මං දන්නවා... මස්සිනාගේ හැටිත් මං දන්නවා... දැන් මේ මොන සෙල්ලම් දැම්මත් තව ටික දවසක් යද්දී බලන්නකෝ නයයි මුඟටියයි වගේ කෙලගන්න දෙන්නා හැලයායි සීදේවියි වගේ ආදරෙන් ඉන්න ලස්සන.”*

*“මොනවද මල්ලි තමුසේ කියන්නේ?”* කෙත්මි ඇසුවේ ඔහු දෙස රවා බලමිනි.

*“අඩෝ අඩෝ... කවුද බං ඒ හැලයා? අපේ ඊරි යකාවත්ද?”* හංසි ඇසුවේ මහ හඬින් සිනාසෙමිනි.

*“අපි බලමුකෝ හංසියෝ... ඔයාටත් හොඳ හොඳ සෙල්ලම් බලන්න පුළුවන් වෙයි ඉස්සරහට...”*

sinhalaebooks.com

*******************

සංදේශ් උන්නේ රංගත් සමාධිත් සමඟ ඉදිරි වැඩකටයුතු කීපයක් පිළිබඳව කතා කරමිනි. එක සීරුවට ඔහුගේ දුරකතනය නාද වෙද්දී සංදේශ් ඒ දෙස බැලුවේ කේන්තියෙනි. වරක් ඇමතුම කට් කලද යලි යලිත් ඇමතුම් එද්දී ඔහු එය කනේ තබා ගත්තේය.

*"මොකද මනුස්සයෝ වෙලා තියෙන්නේ? කට් කරන්නේ වැඩක් නිසා කියලා තේරුම් ගන්න බැරිද?"*

*"සොරි සර්... වැදගත් දෙයක් කියන්න කතා කළේ. මේක පරක්කු කරන්න බෑ..."*

*"කියන දෙයක් ඉක්මනට කියනවා විකී..."*

*"....................."*

sinhalaebooks.com

***"මොකක්? කොයි වෙලාවෙද?"*** ඔහු ඇසුවේ මදක් කලබලයෙනි.

***"..................."***

***"එතකොට මැඩම් ඔෆිස් එකේ ඉන්නේ තනියමද දැන්?"***

***".............."***

***"උඹ පොඩ්ඩක් ජේන මානෙන් ඉදපං විකී. මං විනාඩි දහයෙන් ඔතන."*** සංදේශ් දුරකතනය තැබුවේ පුටුවෙන් නැඟිට වාහනයේ යතුර අතට ගන්නා අතරේය.

***"කොහෙද බං මේ නැට්ට ගිනි ගත්ත හනුමා වගේ දුවන්නේ?"*** රංග ඇසුවේ සමාධිත් පුදුමයෙන් ඔහු දෙස බලද්දීය.

***"පොඩි හදිස්සියක් බං. මං ඇවිත් කියන්නම්.."***

***"මාත් එන්නම් එහෙනම්."***

***"නෑ... උඹ නංගි එක්ක මෙහේ වැඩ ටික බලපං."*** කී සංදේශ් යන්නට ගියේ ඔවුන්ට සිතන්නවත් ඉඩක් නොතියාය.

සමාධි රංග දෙස බැලුවේ බැරෑරුම් මුහුණෙනි. විකී මේ කතා කර කර අයියාට විස්තර කියන්නේ කොහේ ඉන්න මැඩම් කෙනෙක් ගැනද? අනිත් අතට අයියාට මේ තරම් කලබල වෙන්නට තරම්...

***"රංග අයියේ... අපේ අයියා මේ ඒ ගමන විකී එක්ක නටන සෙල්ලම මොකක්ද?"***

***"ඒක තමයි බං මාත් මේ කල්පනා කළේ.... පහුගිය ටිකේ නම් අර අපේ ෂිප්මන්ට් එකේ ප්‍රශ්නේ ගැන බලන්න කියලා විකියාට දීලා තිබ්බා. ඒත් දැන් මොකක්ද අර මැඩම් කෙනෙක් ගැන කිව්වේ?"***

***"ඒකනේ අයියේ. දවසකුත් විකී කතා කර ඔය මැඩම් කෙනෙක් ගැන මොනවාදෝ කිව්වා... මං ඇහුවට හිමීට ලිස්සලා ගියානේ මෙයා..."***

sinhalaebooks.com

*"බැරි වෙලාවත් මූ කෙල්ලෙක් පස්සෙවත් යන්න පටන් අරන්ද?"*

*"කෙල්ලෙක්? මේ අපේ අයියාට? ඔයා විහිළු කරනවද රංග අයියේ..."*

සමාධි ඇසුවේ සිනාසෙමිනි. ඇය කියන කතාවෙත් වරදක් නැත. සංදේශ්ට එදා සිටම ගැහැණු ළමුන් ඇලජික්ය.

*"අනේ මන්දා බං ඒ ගමන මොනවා කරන්න යනවද කියලා. අයියාට කෙල්ලෙක්වත් හොයලා දෙනවාකෝ හිනා වෙවී ඉන්නේ නමුසෙත්."*

*"මං එයාට කෙල්ලෙක් හොයලා දීලා ඉවරයි. බාරගන්නවද නැද්ද කියන එක එයාගේ තීරණයක්. හැබැයි ඉතිං වෙන කෙනෙක්ට නම් මගේ නෑනා වෙන්න ලේසි වෙන්නේ නෑ."*

සමාධි කීවේ මදක් බැරෑරුම් හඬිනි. රංගට නම් ඇය ගැන දැනුණේ පුදුමයකි.

*"තමුසේ ඔය කියන්නේ රිතූ ගැන නේ... මට නම් තමුසේ ගැන පුදුමයි බං. කොහොමද ඔහොම කරන්නේ?"*

sinhalaebooks.com

*"කොහොමද?"*

*"ඇයි බං... අවුරුදු තුනකට කලින් එකම කොල්ලට ආදරේ කරපු කෙල්ලො දෙන්නෙක් නේද උඹලා දෙන්නා... හිතේ පුංචියටවත් තරහක් නැද්ද?"* රංග අසද්දී සමාධි සුන්දර සිනහවක් පෑවාය.

*"ඒක අපි දෙන්නම දැනගෙන කරපු දෙයක් නෙමෙයි. හරිනම් රිතූ නංගියි මාත් එක්ක තරහා වෙන්න ඕන. එයා පුංචි කාලේ ඉඳලා ආදරේ කරපු කොල්ලව මං උදුර ගත්ත එකට... රිතූට මගෙත් එක්ක කිසිම තරහක් නෑ. ඔයා දන්නවද අයියේ... මං අසිතට ආදරේ කරපු එකෙන් වුණේ එකම එක හොඳක් විතරයි."*

*"ඒ මොකක්ද?"*

*"අපේ ජීවිත වලට රිතූ ළං වුණ එක. විශේෂයෙන් අපේ අයියාගේ ජීවිතේට. දැන් ඔය මොන තරහක් පෙන්නුවත් අයියා රිතූට කැමතියි."*

*“උඹ කියන දෙයක් තමයි පැංචි ඉතිං.... මිනිහාට කොහොමත් රිතූ නංගි එක්ක අමුතු එකක් තියෙන බව නම් මටත් පේනවා.”*

*“අමුතු එකක්?”* සමාධි ඇසුවේ සිනාසෙමිනි.

*“හ්ම...”*

*“මේ... අයියේ..”*

*“ඇයි?”*

*“ඔයාට තාම නැද්ද එහෙම කා ගැනවත් අමුතු එකක්?”*

සමාධිගේ පැනයට රංගගේ මුහුණේ අමුතුම මනමාල සිනහවක් නැඟී ආවේය. එය දකිද්දී සමාධිත් හිනාය.

*“අම්මෝ මෙයාගේ මනමාල පාට... කවුද කෙල්ල? මං දන්න කෙනෙක්ද?”*

sinhalaebooks.com

***"මේ මේ.... ගිහින් වැඩක් කරගනින් බං. ආවා මෙතන."*** කියමින් රංග නැඟිට යන්නට ගියේ සමාධි තනිවම සිනාසෙද්දීය.

sinhalaebooks.com

30.

කෙත්මි උන්නේ ඇයගේ ඔෆිස් රූම් එකට වී ලියවිලි වගයක් පරික්ෂා කරමිනි. මද අසනීප ගතියක් දැනුණ නිසාම ඇය අතශ්‍යාවශ්‍ය කටයුතු කීපයකට හංසිත් සමඟ තරුදිව පිටත යැව්වාය. සේවකයෙකු ලවා කෝපි කෝප්පයක් ගෙන්වාගත් ඇය එය බොන අතරේම ලිපි ගොනුව බලන්නට වූවාය.

එක්වරම දොර ඇරගෙන කවුරුන් හෝ ඇතුලට එද්දී කෙත්මි හිස ඔසවා බැලුවේ අමනාපයෙනි. හංසි ආවත් එන්නේ දොරට තට්ටු කිරීමෙන් පසුවය. බනින්නට කට හදාගෙන උන්නද පැමිණ සිටි පුද්ගලයා දකිද්දී කෙත්මිගේ සිත තිගැස්සී ගියේ ඇයටත් හොරාය. ඔහු සිනහවක් පා ඇය ඉදිරියෙන් වාඩි වූයේ ඇය යමක් කියන්නටත් පෙරයි.

***"ඉතිං සුදූ.... ඔයා ගොඩක් වෙනස් වෙලානේ... මට එදා හම්බුණ වෙලාවේ අඳුරගන්නත් බැරි වුණා..."***

sinhalaebooks.com

*"එක්ස්කියුස් මී මිස්ටර්. මං කාගෙවත් සුදූ කෙනෙක් නෙමෙයි. අනික තමුන් කවුද? මොකටද මේ කඩාගෙන බිඳගෙන මගේ ඔෆිස් රූම් එකට ආවේ?"* කෙත්මි ඇසුවේ හැකිතාක් හිත පාලනය කරගනිමිනි.

*"ඔහ්... මැඩම්. රිතූ කෙත්මිණී දිසානායක මාව අඳුරන්නේ නැද්ද එතකොට? ඔයා ප්ලාස්ටික් සර්ජරි කරලා මූණ වෙනස් කළාට මගේ මූණ නම් අවුරුදු තුන හතරකට කලින් තිබුණ විදිහම තමයි සුදූ..."*

*"විකාර කියවන්නේ නැතුව ආවේ මොකටද කිව්වොත් මට ලේසියි මිස්ටර්."* කෙත්මි කීවේ දිගහැරගෙන උන් ලිපි ගොනුව වසා දමමිනි.

*"ආවේ ඉතිං බලලා යන්න. කොහෙද ඉතිං ලංකාවට ආවට මාව බලන්නවත් ආවේ නෑනේ... දැන් ඉතිං අපි දෙන්නට කාගෙන්වත් බාධාවක් නෑනේ බබා. ආරංචි ඇතිනේ මං සමාධිගෙන් වෙන් වුණා කියලා. ඉතිං අපට පුළුවන් ආයෙත් අළුතෙන් පටන් ගන්න. මං දන්නවා තාම ඔයා මට ආදරෙයි කියලා."*

sinhalaebooks.com

*"මොකක්? තමුන් මේ ආවේ පරණ සම්බන්ධකම් ආයේ පටන්ගන්න හිතාගෙන නම්... වෙරි සොරි අසිත. ඒක වෙන්නේ නෑ. කරුණාකරලා ආපු අතක් බලාගෙන ගියොත් හොඳයි."*

කෙත්මි කියද්දී අසිත මහ හඬින් සිනාසෙන්නට වූවේය. මේ වෙලාවේ හංසිවත් මෙතන නොසිටීම ගැන කෙත්මිට දැනුණේ අපහසුතාවයකි.

*"අනේ අනේ කෙල්ලේ... ඔයා සැහෙන්න දියුණු වෙලානේ... මේ අර මගෙයි සමාධිගෙයි වෙඩින් එක දවසේ මං නැතුව ඉන්න බැරි දූකට මුහුදට පැන්න කෙල්ල නේද ඇත්තටම..."*

කෙත්මිගේ අතමිට මෙළවුණේ ඉබේටමය. අසිතට තමාත් තමාගේ ආදරයත් විහිළුවකි. එදා තමන්ව බේරාගත් සංදේශ්ට කෙත්මි යළිත් වරක් සිතෙන් පින් දුන්නාය. මෙවන් මිනිසෙකු වෙනුවෙන් මැරෙන්න ගිය එකත් මෝඩ කමකි.

*"ඒක තමයි මගේ ජීවිතේ මං කරපු ලොකුම මෝඩකම. තමුන් වගේ ජරා මිනිහෙක් වෙනුවෙන් එහෙම දෙයක් කරන්න හිතපු එක ගැනත් මං පසුතැවිලි වෙනවා අසිත. මගේ ළඟින් හිටි මට ආදරේ මිනිස්සු මට නැති වුණ එක විතරයි එකෙන් වුණේ. අපරාදේ තමුසේ වගේ එකෙක් වෙනුවෙන් මං නාස්ති*

sinhalaebooks.com

*කරපු කඳුළු... තමුසෙට ආදරේ කරපු මෝඩ කෙල්ල එදා මැරුණා. දැන් එයා නැහැ."*

*"ෂා..ෂා... රට රටවල් වල ඇවිදලා ඇවිත්... දැන් මැඩම්ගේ කටට හොඳට පණ තියෙනවා නේද? හොඳයි හොඳයි. නරක නෑ..."*

*"මං දැන් එක පාරක් කිව්වා. කරුණාකරලා මෙතනින් යන්න. මේක මගේ ඔෆිස් එක. තමුන් එක්ක විකාර කතා කරනවට වඩා මට මෙතන ඕන තරම් වැඩ තියෙනවා."*

*"ඔෆිස් එක තමයි. ඉතිං මොකද බබා... ඔයාගේ කියන්නේ මගේ වගේ තමයි නේ. වැඩවලට නම් මටත් උදව්වක් දෙන්න බැරියැ... අනික ඔයත් කැමති ඇතිනේ මාව ෆියුචර් හස්බන්ඩ් විදිහට මෙතන ඉන්න අයට හඳුන්නවලා දෙන්න..."*

අසිත ගානක්වත් නැතිව කියද්දී කෙත්මි වාඩි වී සිටි පුටුවෙන් නැඟිට්ටේ කේන්තියෙනි.

*"සිකියුරිටි එකට කෝල් කරන්න කලින් කරුණාකරලා එළියට යනවා අසිත. ෆියුචර් හස්බන්ඩ්? හහ්... කවුරු කාගෙද?"*

sinhalaebooks.com

අසිතත් පුටුවෙන් නැඟිට කෙත්මි අසලට ආවේ ඔහුගේ බැල්ම හමුවේ කෙත්මි අඩියක් පසුපසට තබද්දීය.

*"කවුරු කාගෙවත් නෙමෙයි... මං තමුසෙගේ. ලැස්ති වෙලා ඉන්නවා කෙත්මි. ඉක්මනින්ම මං තමුසෙව මං ළඟට ගන්නවා. එතකොට තමුසෙට මේ කරන කියන දේවල් වලට ගොඩක් විඳවන්න වෙයි..."*

*"මැරුණත් මං තමුන් ළඟට එන්නේ නෑ අසිත. අන්න ඒක හොඳට මතක තියා ගන්නවා. තමුසේ වගේ තිරිසනෙක්ට කාලයක් තිස්සේ ආදරේ කරපු එක ගැන මට මං ගැනම තියෙන්නේ ලැජ්ජාවක්. මගේ පෙර පිනකට මං තමුසෙගේ ඇත්ත දැනගත්තේ..."*

කෙත්මි සමච්චල් සහගත සිනහවකින් කියද්දී අසිත කේන්තියෙන් කෙත්මිගේ ගෙල පාමුලින් අල්ලා ඇයව තමා අසලට ඇදගත්තේ ඇය වේදනාවෙන් ඇඹරෙද්දීය.

*"මොකක්ද බැ*** උඹ කිව්වේ..? උඹ දන්නේ නෑ මගේ හැටි තාම. කියපු වචනයක් ගානේ විඳවන්න ලැස්ති වෙයන්. අර එකියක් තාම විඳවනවා. ඒකිගේ කියන හැම දෙයක්ම නැත්තටම නැති කරලා*

sinhalaebooks.com

*දාන්න මං පටන් අරන් ඉවරයි. උඹත් ලෑස්ති වෙයන්. මගෙන් කිසිම ගැලවීමක් නෑ... උඹට මාත් එක්ක එන්නම වෙන තැනට මං උඹව ගන්නවා. බලන් ඉදපං..."*

*"මාව අතඅරිනවා අසිත. මං තමුසෙට බය නෑ. බය වෙන්න මං වැරදි කළේ නෑ. වැරදි කළේ තමුසේ..."*

කෙත්මි වේදනාවෙන් කෑගසද්දී අසිත ඇයව තවත් තදින් අල්ලාගෙන බිත්තියට තද කොට ඇය වෙත ලං වූවේය. ඔහුගේ දෑසේ වූ බැල්ම දරාගත නොහැකි තැන කෙත්මි දෑස් වසාගත්තේ වේදනාවටම කඳුළක් ගලා යද්දීය.

*"අහකට වෙයන් පාහර බ***"*

එකවරම ඇසුණ කටඩත් සමඟ අසිත පසුපසට ඇදී යද්දී කෙත්මි ගෙලත් අල්ලාගෙන බිත්තිය දිගේම රූටාගෙන ගොස් බිම වාඩි වූවාය.

*"අහ්.... මස්සිනා... උඹ මොකද මෙහේ?"*

අසිත ඇසුවේ තවමත් ඔහුගේ ටී ශර්ට් කරෙන් අල්ලාගෙන වියරුවෙන් බලා සිටින සංදේශ්ගේ මුහුණ දෙස බලමිනි.

sinhalaebooks.com

***"උඹ ඒ ගමන මේ කෙල්ලවත් අල්ලාගත්තද උඹේ සෙල්ලම් පෙන්නන්න?"***

***"මං මේකිට සෙල්ලම් පෙන්නුවා කියලා උඹට තියෙන අමාරුව මොකක්ද? ඇයි උඹ මේකිගේ බොඩි ගාර්ඩ්ද?"***

***"උඹට කැමති විදිහකට හිතාගන්න පුළුවන්. දැන් මෙතනින් පලයං මගෙන් මැරුම් නොකා. ආයෙත් මේ පැත්තේ ඇවිත් තිබුණොත් හරි... මේ කෙල්ලට කරදර කරලා තිබුණොත් හරි..."***

***"ඇයි උඹ මට මොනවා කරන්නද මිනිහෝ..? උඹේ නංගිව මගේ කරේ එල්ලන්න ඕනවට උඹ මැදට පැනලා සේරම විනාස කළේ නැත්තං අදටත් මේකි මගේ. එහෙනම් මේ දේවල් සේරම මගේ. තාමත් මං පරක්කු නෑ... බලන් ඉදපං..."*** අසිත කියද්දී සංදේශ් ඔහුගේ මුහුණ මැදටම පහරක් එල්ල කළේ ඔහුව ඇදගෙන වැටෙද්දීය.

***"සර්... අපි මූ ගැන බලා ගන්නම් සර්. සර් මැඩම් ගැන ටිකක් බලන්න"***

sinhalaebooks.com

විකී එසේ කියා අසිතවත් රැගෙන පිටතට යද්දී සංදේශ් තවමත් බිම වාඩිවී බලා සිටින කෙත්මි අසලට ළං වූවේය. ඇය ඉන්නේ මේ හදිසි සිදුවීම නිසා ඇති වූ කම්පනයෙන් බව පැහැදිලිය.

***"රිතූ.... දැන් සේරම හරි. රිතූ... කෝ හොඳ ළමයා වගේ නැඟිටින්න."***

කී ඔහු කෙත්මිව නැඟිට්ටවාගෙන යළිත් ඇයව පුටුවෙන් වාඩිකරවූවේය. අසනීප ගතියත් මේ වුණු සිදුවීමත් නිසා කෙත්මි උන්නේ සුදුමැලිවී ගොසිනි. ඇයගේ දෑස් බොඳවී ගොසිනි.

***"රිතූ... ඔයා අසනීපෙන්ද? ඇයි මේ සුදුමැලි වෙලා? රිතූ.... නංගි.."***

සංදේශ් තවත් මොන මොනවාදෝ ඇසුවත් පිළිතුරු දෙන්නට තරම් සිහියක් ඇයට නොවීය. දෑස් නිලංකාර වී යනු දැනෙද්දී ඇය තමා අසලම සිටගෙන සිටි සංදේශ්ගේ ඇඟට හිස බරකර ගත්තාය.

***"රිතූ... රිතූ.... දෙයියනේ මොකද වුණේ?"***

සංදේශ් ඉක්මනින් කෙත්මිව ඔසවාගෙන ගියේ ඇයගේ කාමරයට යාබදව තනා තිබූ විවේක කාමරයටය. කෙත්මිව ඇඳේ හාන්සි කල ඔහු ඉක්මනින් වතුර වීදුරුවක් රැගෙන ආවේය.

sinhalaebooks.com

වතුර ස්වල්පයක් අතේ තවරාගෙන ඔහු කෙත්මිගේ මුහුණ අතගෑවේ කලබලයෙනි. හදිස්සියේම ඇයට මේ කුමක් වූවාද? සුළු මොහොතකින් කෙත්මිගේ මුව සෙලවෙනු දකිද්දී ඔහුට සැනසුම් සුසුමක් හෙළුණේ නොදැනීමය.

*"ව.. ව..තු..ර.."*

කෙත්මි මුමුණද්දී සංදේශ් වතුර බිඳක් අතට ගෙන ඇයගේ මුවෙහි තැවරුවේය. පසුව මදක් ඇයට එසේ ඉන්නට හැර පහලට දිව ගිය සංදේශ් විනාඩියෙන් ආපසු ආවේ ඇයට ශීත කල දොඩම් යුෂ වීදුරුවක්ද රැගෙනය.

ඔහු එද්දී කෙත්මි හිසට අතකුත් තබාගෙන ඇඳේ වාඩි වී උන්නාය. ඉක්මන් ගමනින් ඇය වෙත පැමිණි ඔහු ඇයට බීම වීදුරුව දිඟු කලේය.

*"ආ... මේක බීලා ඉන්න."*

ඔහු කියන පමාවට කෙත්මි බීම වීදුරුව හිස් කළේ දැණුන අධික පිපාසයටය.

*"තෑන්ක් යූ මිස්ටර් සංදේශ්..."*

'අයියා කිව්වොත් ලොකු කතා ටිකක් දිග ඇරගනියි මෙතන' කෙත්මි තනිවම සිතුවාය.

sinhalaebooks.com

'මේකිගේ ලොකුකම අඩු වෙයි යෑ මොනවා කළත්. අයියා කිව්වොත් තත්ත්වෙට හොඳ මදි ඇති මැඩම්ගේ...' සංදේශ් හිතින් මුමුණාගත්තේය.

***"දැන් මොකද තමුන්ට? මොකුත් අසනීපයක්ද? නැත්තං අරූට බය වුණ පාරද කලන්තේ දැම්මේ? අර බොඩිගාඩ්ලා දෙන්නව යවපු දිහාක තමුන්ටත් යන්න තිබ්බානේ. තනියම මේකට වෙලා හිටියේ..***"

කෙත්මිට කියාගන්නට දෙයක් නැත. මාසික වේදනාවන් නිසා ඇය උදේ සිටම උන්නේ අපහසුවෙනි. ඒ මදිවාට අසිතගේ ක්‍රියා නිසා අපහසුව වැඩි වූ බව ඔහුට කියන්නේ කෙසේද?

***"මොකද මැඩම් ඒ ගමන ඇඹරෙන්නේ?"***

***"න්...නෑහ්... මං අද ටිකක් අසනීපෙන් ඉන්නේ. ඒකයි එයාලාව යවලා නතර වුණේ.. අනික මේක මගේ ඔෆිස් එක. මොකටද බය වෙන්නේ?"***

***"බය වෙන්නේ... එදා බය නැතුව උඹ ඉස්සරහට ගියානේ... නිකමට හරි හිතන්න තිබ්බා***

sinhalaebooks.com

*තමුසෙව හොයන් ආයේ එයි කියලා. හරි ඒක පස්සේ බලමු. අසනීපයි කිව්වේ... බෙහෙත් මොකුත් ගත්තාද?"*

ඔහු අසද්දී කෙත්මි හිස වැනුවේ 'නැතැ'යි කියන්නටය.

*"එහෙනම් එනවා යන්න දැන්. බෙහෙත් ටිකක් අරගෙන ගෙදර ගිහින් දාන්න."*

*"බෙහෙත් ඕන නෑ... පුළුවන් නම් මාව ගෙදරින් දාන්න. ඒ ඇති."*

කෙත්මි කීවේ වාහනය හංසි රැගෙන ගිය නිසාය. කොහොමත් සංදේශ් සමඟ ගමනක් යන්නට ඇයට බයක් සැකක් නැත. නපුරුකම් කලාට ඔහු ආදරණීය අයියා කෙනෙකි.

*"අසනීපයක් තියෙනවා නම් බෙහෙත් ටිකක් ගන්නේ නැතුව මොන රෙද්දක් කරනවද? හිතුවක්කාර නොවී මෙන්න මෙහේ එනවා රිතූ යන්න."*

සංදේශ් ඇගේ අතින් ඇදගෙනම පහළට ගොස් ඇයව ඔහුගේ වාහනයට දමා දොර වැසුවේ ඇයට කිසිවක් කියන්නට ඉඩක් නොතබමිනි.

sinhalaebooks.com

***"අයියේ... මේ... මේක මේ බෙහෙත් ගන්න තරම් අසනීපයක් නෙමෙයි. මේ.. ගෑණු ළමයින්ගේ අසනීපයක්. මාව ගෙදරින් දැම්මනම් ඇති."***

සංදේශ් අනෙක් පසින් වාහනයට නඟිද්දී කෙත්මි කීවේ ලැජ්ජාවෙන් රතුවූ මුහුණ බිමට හරවාගෙනය. නොකිව්වොත් දැන් ඔහුත් සමඟ බෙහෙත් ගන්න යන්න වෙන බව විශ්වාසය. ඇය මේ කියන්නේ කුමක් ගැනදැයි වැටහෙද්දී සංදේශ්ගේ මුවඟට සිනහවක් නැඟුණි.

***"ඒක කලින්ම කිව්වා නම් ඉවරනේ මාව වටේ යන්නේ නැතිව."***

***"එහෙම කියන්න පුළුවන්ද ඔයා කොල්ලෙක් නේ. අනික කියන්න දුන්නායෑ... මරන්න ගෙනියන හරකා වගේ මාව ඇදන් ඇවිත් වාහනේට දා ගත්තේ... අනේ මන්දා සමාධි අක්කි කොහොම ඉන්නවද කියලා මේ යකා එක්ක..."*** අන්තිම ටික තමාටම කියා ගත්තත් එය සංදේශ්ට ඇසුණ බව නම් විශ්වාසය.

***"ආ... ඒ ගමන කටට පණ ඇවිත් තියෙන්නේ ලොකු මැඩම්ගේ..."***

ඔහු ඇය දෙසට හැරී කියද්දී කෙත්මි තොලත් සපාගෙන ඉවත බලා ගත්තාය. මේ වැඩවලට නම් සංදේශ්ට හිනාය.

*"මේ... කෝකටත් යන ගමන් බෙහෙත් ටිකක් ගමු. තමුසෙ සුදුමැලි වෙලා ඉන්නේ. ඒ මදිවට කලන්තෙත් දාලා වැටුණානේ."*

*"ඒ... නිකම්. ඒ වෙලාවේ ටිකක් කලබල වුණානේ. දැන් ඒ ගැන බය වෙන්න දෙයක් නෑ."*

*"තමුසේ දවල්ට කාලද ඉන්නේ රිතූ?"*

සංදේශ් ඇසුවේ මදක් සැකයෙනි. දැන් දහවල් කෑම වෙලාවත් පසුවී ගොසිනි. මෙවැනි දවස්වලට සමාධිත් කෑම බීම අප්පිරියා කරන බව සිහිවී ඔහු ඇසුවේ ඇයගේ වත දෙසම බලාගෙනය. මුහුණ දකිද්දීම පිළිතුර ඔහු සොයා ගත්තේය.

*"න්... නෑ..."*

*"උදේට කෑවද?"*

*"න්... නෑ... කන්න බෑ. අප්පිරියයි. මං කොෆී එකක් බිව්වා..."*

sinhalaebooks.com

*"කොහී එකකින් දවසක් ජීවත් වෙන්න තමුසේ මොකෙක් කියලද හිතන් ඉන්නේ... කන්න පුළුවන් දෙයක් කියනවා. කාලාම ගෙදර යං."*

*"ඕන නෑ අයියේ... මට දැන් කන්න බෑ..."*

*"රිතූ... මගෙත් එක්ක සෙල්ලම් කරන්න ලෑස්ති වෙන්න එපා. කන දෙයක් කියන්න බැරිනම් එනවා මාත් එක්ක යන්න. අරන් දෙන දෙයක් කාලා මිසක් ගෙදර යාමක් නෑ අද."*

කියූ සංදේශ් රෙස්ටුරන්ට් එකක් අසල වාහනය නවතා බැස්සේ කෙත්මි පුදුමයෙන් ඔහු දෙස බලා ඉද්දීය. මෙතෙක් දවසක් තමා සමඟ කේන්තියෙන් සිටි ඔහුට අද වෙස් පෙරලී ඇති සෙයකි.

31.

සංදේශ් කෙත්මිව නිවසට ගෙන ආවේ ඇයට බලෙන්ම කෑම කවාගෙන ඔහුගේ මිතුරු වෛද්‍යවරයෙක් ළඟට ගොස් බෙහෙත්ද අරන් දීමෙන් අනතුරුවය. සාලයේ සෝපාවට බර වූ කෙත්මි එහි ඇන්දට හිස බර කරගෙන බැලුවේ ඇය ඉදිරියෙන් අසුන්ගත් සංදේශ් දෙසය.

කෙත්මිගේ කට ඇදවී ගියේ යන්නට වගක්වත් නැතිව දුරකතනයට ඇස් යොමා සිටින ඔහුව දකිද්දීය. වොෂ් එකක් දාගෙන ටිකක් නිදා ගන්නට ඕනා වුවත් ඔහු සිටියදී ඒ එකක්වත් කරන්නට බැරිය.

***"ඒ ගමන මොකද මාව කන්න වගේ බලන් ඉන්නේ? ගිහින් වොෂ් එකක් දාගන්නවා."***

සංදේශ් කීවේ දුරකතනයෙන් දෑස් ඉවතට නොගෙනය. 'මේ යකාට මගේ හිත කියවන්න පුළුවන්ද මන්දා... ඒත් මෙයා මෙතන ඉඳගෙන ඉද්දී මට පුළුවනෑ වොෂ් දාන්න යන්න.'

sinhalaebooks.com

*"කන් ඇහෙන්නේ නැද්ද හලෝ ඒ ගමන? ගිහින් වොෂ් එකක් දාන් එනවා. ඔහොම බලන් හිටියට මං දැන්ම යන්නේ නෑ..."* සංදේශ් නැවතත් කියද්දී කෙත්මි බැලුවේ ඇස් දෙකත් ලොකු කරගෙනය.

*"මෙච්චර වෙලා කරපු උදව් වලට ඔයාට ගොඩක් තැන්ක්ස් අයියේ... දැන් මට ප්‍රශ්නයක් නෑ. ඔයා යන්න. ඔයාටත් වැඩ ඇතිනේ..."*

*"මගේ වැඩ ගැන මං බලා ගන්නම්. තමුන් ගිහින් වොෂ් එකක් දාන් එනවා."*

*"ඔයාගේ බබා දැනගත්තොත් බැනුම් අහන්න වෙයි. ජරා ගෑණුන්ගේ ගෙවල්වලටත් ආවා කියලා..."*

කෙත්මි ඉවත බලාගෙන කියද්දී සංදේශ්ගේ මුවේ ඇඳුණේ අපූරු සිනහවකි. රංග කීවාක් මෙන් ඇය එය අමතක කර නැත.

*"මං කාගේ ගෙදර ගියත් කාටවත් ඒක ප්‍රශ්නයක් නෙමෙයි. අනේ මන්දා මේ ගෑණු. වචනයක්*

*වරදින්න බෑ හිතේ තියාගෙන පළිගන්නවා... අනික මං තමුසෙට එහෙම කිව්වේ නෑ..”*

*“ඔව්... ඔයා කිව්වේ නෑ... ඔයාගේ බබා කියනකම් සද්ද නැතුව බලන් හිටියේ...”*

කියූ කෙත්මි සෝපාවෙන් නැඟිට්ටේ කාමරයට යන්නටය. දැන් මොහු කීයටවත් යන්නේ නැති බව විශ්වාසය. ඒ නිසාම වොෂ් එකක් දමා ඉක්මනින් ඇඳුමක් දමාගෙන එන්නට සිතා ඇය පඩිපෙළ නඟින්නට වූවාය.

*“මං කියපු නැති දෙයක් අල්ලගෙන බොරුවට පිප්පුවට මට කරන්න දෙයක් නෑ. මතක තියාගත්තොත් හොඳයි මට තාම බබෙක් නෑ කියලා...”* සංදේශ් කීවේ ඔහුට ගස්සාගෙන යන කෙත්මිට සිනාසෙමිනි.

හංසිත් තරුදිත් කලබලයෙන් නිවසට ආවේ රනුක්ගේ ඇමතුමකටය. අසිත ඔෆිස් එකට ආ බවත් කෙත්මි අසනීපව ගෙදර ගිය බවත් කීවේ ඔහුය. එහෙම්ම ම හංසි නිවසට ආවේ තරුදිවත් රැගෙනමය. නමුත් මිදුලේ නැවතී තිබුණ වාහනය දකිද්දී ඇයගේ දෑස් පුදුමයෙන් විසල් වී ගියේය.

sinhalaebooks.com

'මේ.. සංදේශ් අයියාගේ වාහනේ නේද? මෙයා මොකද මෙහේ... බැරි වෙලාවත් සමාධි අක්කාවත් ආවද?'

තරුදිවත් කතාකරගෙන ගෙතුළට ආ හංසි තනිවම සාලයේ අසුන්ගෙන දුරකතනය එබීගෙන සිටින සංදේශ්ව දැක එතැනම නතර වූවාය. සංදේශ්ට නම් මේ හැසිරීම් දකිද්දී හිනාය. 'මුං ඔක්කොම එකයි. පිස්සු නැත්තං ෂෝක්. අරකට දෙවෙනි නෑ නැනලා දෙන්නා..'

***"හරි ෂෝක් ජෝඩුව... දැන්ද එන්නේ යාළුවට මොකද වුණේ බලන්න?"***

***"සංදේශ් අයියේ... ඔයා කොයි වෙලාවෙද ආවේ? කෝ කෙත්මි?"***

***"ඇයි රනුක් කිව්වේ නැද්ද විස්තරේ? මං නොහිටින්න අරූ තමුසෙලාගේ කෙත්මිව උස්සගෙන ගිහන් මෙලහට. මං යනවා. මෙන්න මේ බෙහෙත් ටික දෙන්න අර හොල්මනට..."*** කී සංදේශ් ඔහු අතේ තිබූ බෙහෙත් කවර කීපය මේසය මතින් තබා යන්නට නැඟිට්ටේය.

sinhalaebooks.com

*"අනේ තැන්ක් යූ අයියේ... රනුක් අපිට කිව්වේ නෑ කෙත්මි අයියා එක්ක ආවේ කියලා. අපි හිතුවේ නෑ අසිත ඒ වෙලාවේ..."*

*"හංසී... අසිත කියන්නේ ඔයාලා හිතනවට වැඩිය නරක මිනිහෙක්. ඒ නිසා පරිස්සමින්. අන්න අර ලෙඩ හොල්මනටත් ඒක කියලා තියන්න."*

කී ඔහු යන්නට ගියේ හංසී පුටුවකට බර වී සුසුමක් හෙළද්දීය. රනුක් කී දේවල් වලින් අසිත ගැන දැන සිටි නිසා තරුදිත් උන්නේ මදක් තිගැස්මෙනි. ඔහු බයක් සැකක් නැතිව ඔෆිස් එකටම ඇවිත් කෙත්මිට කරදර කරන්නට තරම්...

කෙත්මි ඉක්මනින් වොෂ් එකක් දාගෙන පහළට ආවේ සංදේශ් යන්නට ගිය බව නොදැනය. ඔහුට තේ එකක් දෙන්නට කියා සුනීතාට කියන්නටත් බැරි වූ නිසා ඇය ආවේ ඔහුට තේ එකක් හදා දෙන්නට සිතාගෙනය. පහළට එද්දී සාලයේ වාඩි වී කතා කරමින් සිටි තිදෙනා දකිද්දී කෙත්මි පුදුමයෙන් දෑස් විසල් කර ගත්තාය.

*"ඔයාලා... මොකද මේ තුන් දෙනාම..."*

කෙත්මිගේ හඬ ඇසෙනවාත් සමඟම පුටුවේ නැඟිට මුලින්ම ඇය වෙත දුවගෙන ආවේ රනුක්ය.

sinhalaebooks.com

කෙත්මිගේ අත් දෙකෙන්ම අල්ලාගෙන ඉහළ සිට පහළටම බැල්මක් හෙළුවේ කලබලයෙනි.

*"සුදූ... තමුසෙට කරදරයක් නෑ නේද අක්කේ..."*

*"මොකද මෝඩයෝ මේ? මට මොකුත් වුණේ නෑ. කවුද ඔයාලාට..."*

අසන්නට ගිය පැනයට පිළිතුර සිතට ආ බැවින් ඇය ඒ ගැන නොඅසා උන්නාය. මේ ගැන කියන්නට ඇත්තේ සංදේශ්ය.

*"කෝ මෙහේ වරෙන් කෙත්මී... මේ බෙහෙත් ටික බීපං... අර ලොකු මහත්තයා මගීන් මහට කියලා ගියා බෙහෙත් ටික දෙන්න කියලා. ආ.. බීලා ඉදපං."* හංසි කීවේ කෙත්මිව පුටුවකින් වාඩි කරවා ඇය අතේ බෙහෙත් පෙති කීපයකුත් වතුර වීදුරුවකුත් තබමිනි.

*"ඇයි දැන් මේ ඔයාලා බය වෙලා ඉන්නේ? අනික කෝ සංදේශ් අයියා?"*

sinhalaebooks.com

*"අපි ආවට පස්සේ එයා ගියා. බය වෙන්නේ නැද්ද කියපංකෝ... ඔෆිස් එකේ වුණ දේවල් අපි සීසීටීවී චෙක් කරලා බැලුවා."*

හංසි කියද්දී කෙත්මි සුසුමක් හෙළුවාය. එහෙනම් සිදු වූ සියල්ල මොවුන්ට රහසක් නොවේ.

*"අක්කේ..."*

රනුක් ඇය අසලින් වාඩි වී කර වටා අතක් දමා ගනිද්දී කෙත්මි ඔහුගේ උරහිසකට හිස බර කරගත්තාය. තමත් ඒ මොහොතේ කම්පනය පහව ගොස් නැත. අසිත හැසිරුණේ වියරුවෙනි.

*"වෙලාවට මල්ලී සංදේශ් අයියා ආවේ..."*

ඇය හෙමිහිට මිමිණුවේ ඒ මොහොත යළිත් වරක් සිහි කර දෑස් පියාගනිමිනි.

*"රනුක්... අපි මේ ගැන පොලීසියට කියන්න ඕන. ඔෆිස් එකටම ඇවිත් මැඩම්ට මෙහෙම කරන්න දෙන්න බැනේ. අනික අපිට සාක්ෂි තියෙනවානේ.."*

තරුදි කීවේ තරමක ආවේගයෙනි. ගෙවුණු මාසයටම කෙත්මි මෙලෙස කම්පනයෙන් සිටිනවා ඇය දැක තිබුණේ නැත. ඇය මෙහෙම ඉන්නවා බලන්නත් දුකය.

sinhalaebooks.com

*"මං ගියා තරූ. සිසිටීවී රෙකෝඩ්ස් ටිකත් දීලා සේරම විස්තරේ කියලා ආවේ..."*

*"සුනීතා ආන්ටී...."*

කෙත්මි හඬනඟා කතා කළේ නිවසේ වැඩට සිටි කාන්තාවටය. කතා කරන පරක්කුවට ඇය දුවගෙන ආවාය.

*"සුදු බේබි?"*

*"අපිට කූල් මොනවා හරි හදලා දෙන්නකෝ ආන්ටි."*

*"ඉන්න බේබි. මං ඉක්මනට හදන් එන්නම්."*

කියා සුනීතා යන්නට ගිය පසු රනුක් මදක් එහාට ගියේ ඇමතුමක් ගන්නටය. තරුදිත් හංසිත් කෙත්මිව මැදි කරගෙන වාඩි වූවෝය.

*"අපෙත් වැරැද්ද හංසි මැඩම්. අපිට මැඩම් ළඟ කවුරු හරි තියලා යන්න තිබ්බා."*

*"කවද්ද තරුදි ඔය මැඩම් කියවිල්ල නවත්තන්නේ? මේක ඔෆිස් එක නෙමෙයි. අනික ඉතිං මං ගාව කෙනෙක් තියලා යන්න මං පොඩි බබෙක්ද?"* කෙත්මි ඇසුවේ සිනහවක් නංවාගෙනය.

*"හිනා නෙමෙයි කෙත්මි. එදා ඔය මිනිහා හම්බුණ වෙලාවෙදිම අපි හිතුවානේ උඹව හොයන් එයි කියලා... අපිට මීට වැඩිය පරිස්සම් වෙන්න තිබ්බා. සංදේශ් අයියා අපටත් බැනලා ගියේ."*

*"එයා ඉතිං බනින්නේ නැත්තේ කාටද.. පරිස්සම් වෙන්න කියලා මොනවා කරන්නද හංසි තවත්...? අනික කවුද හිතුවේ එයා ඔය විදිහට හැසිරෙයි කියලා.."*

*"මොනවද දැන් ඌ කියන්නේ?"*

*"දැන් සමාධි අක්කා නැලු. අපි දෙන්නට කරදර කරන්න කවුරුත් නෑ කියන්නේ..."*

*"මොකක්?"*

හංසි කෑගසා මෙන් අහද්දී කෙත්මි අසිත කී දේවල් සියල්ලම ඔවුන් සමඟ කීවාය.

*"ඔය මිනිහා මැඩම් පස්සේ එන්නේ මැඩම්ලාගේ බිස්නස් එකයි සල්ලියි නිසා."* තරුදි කීවේ කේන්තියෙනි.

*"මටත් තේරුණා ඒක කතාවෙන්ම. ඇත්තටම ඒ වෙලාවේ මං තනියම එතන මොනවා කරන්නද? බැනලා එලවගන්න හැදුවට ගියෙම නෑ. දෙයියෝ එව්වා වගේ සංදේශ් අයියා ආවේ..."*

කෙත්මි කීවේ සුසුමක් හෙළමිනි. රනුක් නම් එය ඇසී ඇය දෙස බැලුවේ සිනහවක් නංවාගෙනය.

*"දෙයියා වෙලාවටම වැඩියේ ඉතිං දෙයියාගේ ඔත්තුකාරයෝ ඒ තරම්ම හොඳ නිසා තමයි. මොනවා වුණත් මිනිහා ඉන්නකම් මට තමුසේ ගැන බය වෙන්න දෙයක් නෑ."*

*"ඔත්තුකාරයෝ..?"*

නොකිවයුතු යමක් කියවුණ බව රනුක්ට සිහියට ආවේ කෙත්මිගේ පැනයත් සමඟය.

*"න්.. නෑ... මේ..."*

sinhalaebooks.com

***"මොකද බතලයෝ ගොත ගහන්නේ? මොනවද ඒ ගමන හංගන්නේ?"*** හංසි ඇසුවේ දැස් කුඩා කර ඔහුට බැල්මක් හෙලමිනි.

***"නෑ... නෑ... සංදේශ් අයියා අසිතයා ගැන බලන්න මිනිස්සු ටිකක් දාලා... උන් තමයි නිව්ස් එක දීලා තියෙන්නේ ඔයාගේ ඔෆිස් එකට උෟ ආවා කියලා."*** රනුක් ඉක්මනින් කියා දැමුවේ තිදෙනාම ඔහු දෙස බලා හිඳිද්දීය.

***"ඒක මිසක්... ඒත් ඉතිං අසිත මගේ ඔෆිස් එකට අවා කියලා එයා ඇයි..."***

***"අනේ මෝඩ අක්කේ... අපි නොදන්නවට උෟ මොකාද කියන්න සංදේශ් අයියා දන්නවා. මිනිහා තමුසේ එයාගේ නංගි කියන තැනට දාගෙනනේ ඒ කාලේ සැලකුවේ. නංගිට කරදරයක් කියලා දැනෙද්දී මොන අයියාද සද්ද නැතුව ඉන්නේ.. ඒකයි එන්න ඇත්තේ දුවගෙන.... අනික.."***

***"මොනවද අනික?"***

sinhalaebooks.com

*"නෑ මොකුත් නෑ..."*

*"නෑ... නෑ.. කියනවා.."*

*"නෑ ඉතිං... තරහා වෙලා කියලා ඔයත් හෙන දුකෙන්නේ හිටියේ. දැන් ඉතිං මිනිහා තරහා පැත්තක දාලා ආවනේ. කන්න බොන්න අරන් දීලා බෙහෙත් අරන් දීලා පරිස්සමින් ගෙදරටම ගෙනත් දැම්මා. හිතේ තරහක් තියෙනවා නම් ඔය තරම් දේවල් කරන්නේ නෑනේ. ඒ ගැන හිතලා සතුටු වෙනවා.."*

රනුක් කියද්දී කෙත්මිගේ කොපුල් රතුවී ගියේ ලැජ්ජාවටය. එසේ නම් ඔහු සියල්ලම රනුක්ට කියා ඇත.

sinhalaebooks.com

32.

*"වික්... මිනිහා ගැන ඇහැ ගහගෙන හිටපං. මැඩම්ගේ ආරක්ෂාවට කවුරු හරි දාපං. මිනිහා කොයි වෙලාවේ හරි ආයේ එනවා."*

සංදේශ් කීවේ දහවල් සිදුවීම යළිත් සිහිවෙද්දීය. අසිත යළිත් හදන්නේ කෙත්මිට ලං වෙන්නටය. ඒ ඇයට ඇති ආදරයකට නොවේ.

*"හරි බොස්. ඒ ගැන බය වෙන්න එපා. අපිට සමාධි මිස් ගැනත් බලන්න වෙයි බොස් ටිකක්..."*

*"නංගි ගැන බය වෙන්න දෙයක් නෑ වික්. නංගි ළඟ නිතරම මං හරි රංග හරි ඉන්නවා."*

*"හරි බොස් එහෙනම්.."*

සංදේශ් දුරකතනය තබා බැල්කනියේ වැටට බර වී පහළ බැලුවේය. අඳුර මැදින් ඔහුට පෙනෙන්නේ රතු වී ඇති කෙත්මිගේ මුවයි. ඇයගේ කෝලම් සිහි වෙද්දී ඔහුට තනිවම හිනාය. බෙහෙත් අරන් දෙන්නට ගොසින් කළ යුද්ධය ඔහුට යළිත් වරක් සිහි විය.

sinhalaebooks.com

***"අනේ අයියේ... මට බෙහෙත් එපා."***

***"පිස්සු නැතුව එනවා යන්න. මෙතන මගේ යාළුවෙක් ඉන්නේ..."***

***"අනේ මේ... මට නම් බෑ. කටක් ඇරලා කියන්න පුළුවන්ද? මට ලැජ්ජයි."*** ඇය කීවේ සංදේශ්ගේ අත ගසා දමමිනි.

***"මෙන්න මෙහේ එනවා රිතූ. ලේඩි ඩොක්ටර් කෙනෙක් ඉන්නේ..."*** ඒ සේ කී පසු ඇය හිසත් නමාගෙන ඔහු සමඟ ආවේ පුංචි ළමයෙක් වගේය.

***"සංදේශ්... මැරි කලා කියලා කිව්වේවත් නෑ... වයිෆ් නම් හරි ලස්සනයි."***

සදීපා කියනවිට රිතූ රතුවූ අයුරු සිහිවී සංදේශ්ගේ මුහුණේ අපූරු සිනහවක් නැඟී ආවේය.

***"ආච්... ආච්... මූණේ තියෙන මනමාල පාට මෙයාගේ... කවුරු ගැනද ඒ හිතුවේ?"***

sinhalaebooks.com

සමාධි කතා කළේ ටිකක් වෙලා සංදේශ් දෙස බලා සිටීමෙන් අනතුරුවය. සංදේශ් ඒ සිනහවෙන්ම සමාධි දෙස බැලුවේය.

*"හිතුවෙද? හිතුවේ කෙල්ලෙක් ගැන."*

*"ඈ... අයියා... තමුසෙට උණද හලෝ?"*

සමාධි ඇසුවේ ඔහුගේ ගෙලට අතක්ද තබා බලමිනි.

*"ඇයි දැන් මට කෙල්ලෙක් ගැන හිතන්න බැරිද පැංචි?"*

*"නෑ ඉතිං. මෙච්චර කල් හිතන්න කිව්වත් හිතපු නැති කෙනානේ. ඔහොම කතාවක් මං මේ ඔයාගේ කටින් ඇහුවාමයි අයියා."*

*"එහෙම තමයි ඉතිං. හැමදාම එක විදිහට ඉන්න බෑනේ. මාත් කියලා පිළිවෙලක් වෙන්න එපැයි."*

*"කවුද දැන් ඔය කෙල්ල? අර දවල් නැට්ට ගිනි තියාගෙන දිව්වේ එයාව බලන්නද?"*

*"ඔව්... එයා ටිකක් අසනීප වෙලානේ... මං ගියා ටිකක් බලලා බෙහෙත් අරන් දීලා එහෙම එන්න."*

*"කවුද කියනවාකෝ අයියා... තමුසේ විකීට කියලා විශේෂ ආරක්ෂාවක් දීලානේ තියෙන්නේ කෙල්ලට.."*

*"තමුසෙත් හෙන රොයිටරේ නේද පැංචි. නොදන්න දෙයක් නෑ බලන් ගියාම."*

*"මට කියන්න අයියා... ඔයා දැන් හිතුවේ රිතූ නංගි ගැනද? ඔයා ගියේ එයාව බලන්නද? එයා අසනීප වෙලාද අයියා?"*

සමාධි අසද්දී සංදේශ් අපහසුවෙන් මුහුණේ හැඟීම් සිරකරගෙන ඇය දෙස රවා බැලුවේය. සමාධිට බොරු කරන්න ලේසි නැති බව ඔහු දනී.

*"පිස්සුද පැංචි... මොකද මේ රටේ කෙල්ලෙක්ට ඉන්නේ එයා විතරද? මං කියලා තියෙනවානේ එයා ගැන කතා එපා කියලා... එයාට මොනවා වුණත් මට මොකද?"* කී සංදේශ් යන්නට ගියේ තවත් ඇය සමඟ කතා කලොත් තමාව අසුවන නිසාය.

sinhalaebooks.com

*"මට බොරු කියන්න තමුසෙට බෑ අයියා. මතක තියා ගන්නවා... හැංගි හැංගි වෙස් බැන්දට නටන්න ස්ටේජ් එකට නගින්නම වෙනවා..."*

****************

කෙත්මි උන්නේ ඇඳට වී දහවල් සිදුවීම ගැන කල්පනා කරමිනි. අසිත කියූ කතා තවමත් ඇයගේ සවන් තුළ දෝංකාර දෙමින් ඇසේ. ඔහු කියූ එක කතාවක් නිසා ඇයට කුමක් හෝ අමුත්තක් දැණුනි.

*"...අර එකියක් තාම විඳවනවා. ඒකිගේ කියන හැම දෙයක්ම නැත්තටම නැති කරලා දාන්න මං පටන් අරන් ඉවරයි. උඹත් ලෑස්ති වෙයන්. මගෙන් කිසිම ගැලවීමක් නෑ.."* අසිත ඒ කිව්වේ සමාධි ගැනද? එසේ නම් ඇයට ඔහු තවමත් කරදර කරනවාද?

*"කෙත්මී.... මොකක්ද කල්පනාව?"*

හංසි ඇසුවේ කෙත්මිගේ ඇඳට පනිමිනි. කොහේ හෝ සිට ඇවිත් ඇඳට පනින පුරුද්ද ඇය තවමත් නවතා නැත.

sinhalaebooks.com

*"ඇත්තටම උඹ ඕක තාම නැවැත්තුවේ නැද්ද? බලපං දවසක මගේ කොන්දත් කඩනවා."*

*"පිස්සුද... මං බතලයාට ඒ කාලෙම කිව්වා උඹට හොඳ හයිය ඇඳක් හදවලා තියන්න කියලා. මේක කැඩෙන්නේ නෑ..."*

*"උඹත් එක්ක කතා කරලා මට දිනන්න පුළුවන්ද ඉතිං..."*

*"හරි හරි... කියපංකෝ දැන්... මොනවද මේ හෝ ගාලා කල්පනා කරන්නේ."*

*"අසිත මට දවල් කිව්වා 'ඒකිගේ කියන හැම දෙයක්ම නැත්තටම නැති කරලා දාන්න පටන් අරන් ඉවරයි' කියලා."*

*"කවුද දැන් ඒකි?"*

*"මාත් මේ කල්පනා කළේ ඒකයි හංසියෝ... මට හිතෙන්නේ ඇයි ඒ සමාධි අක්කා කියලා...?"*

sinhalaebooks.com

*"සමාධි අක්කා... වෙන්න පුළුවන්.."*

*"ඔයා කියන්නේ බිස්නස් එකේ ප්‍රශ්නෙද?"*

කෙත්මි ඇසුවේ ඇයට සිතුණු දේම හංසිටත් සිතී ඇති බව දැනෙද්දීය.

*"හ්ම්... මතකද එදා සමාධි අක්කා කිව්වා. බිස්නස් එක තියෙන්නේ ඒ දෙන්නටම කියලා. එදා අපි ඇවිත් මෙක ගැන නොබලන්න මෙලහටත් එයාලාගේ කන්ට්‍රැක් සේරම කැන්සල් වෙලා... කෝටි ගානක පාඩුවක්. ඒ වගේ කම්පැනීස් දෙක තුනක් එයාලාගෙන් අයින් වුණා කියලා හිතන්න..."*

*"එහෙම වුණොත් එයාලාගේ බිස්නස් එක සම්පූර්ණයෙන්ම කඩන් වැටෙනවා... ඒ කියන්නේ ඒක පිටිපස්සේ ඉන්නේ අසිතද?"*

*"අපිට එහෙම ම කියන්නත් බෑ කෙල්ල.."*
හංසි කීවේ සුසුමක් හෙලා කෙත්මිගේ උරහිස මතින් අතක් තබමිනි.

*"බැරිත් නෑ හංසියෝ.."*

sinhalaebooks.com

කෙත්මි කීවේ හදිස්සියේ මතක් වූ යමක් නිසාය. හංසි ඇය දෙස බැලුවේ විමසිල්ලෙනි.

*"මේ දේවල් වලට පිට කෙනෙක්ට ඇඟිලි ගහන්න අමාරුයි හංසි. විශේෂයෙන් අච්චර ඩැමේජ් එකක් කරන්න තරම්..."*

*"ඔව්. ඉතිං..."*

*"අසිත වෙඩින් එකට කලින් ඉඳන්ම ඔය කම්පැනි එකට ගිහින් තියෙනවා සංදේශ් අයියා එක්ක. මේක ලේසියෙන්ම කරන්න පුළුවන් අසිතට. සමාධි අක්කාව මැරි කළාට පස්සේ අනිවාරෙන් සමාධි අක්කාගේ දේවල් බලන්න ඇත්තේ එයා."*

*"ඒක එහෙමනම්... අසිත එතනින් නවතින එකක් නෑ කෙත්මි."*

*"ඔව්. අනිවාරෙන්ම. ඒ විතරක් නෙමෙයි. අපිට අපේ බිස්නස් ගැනත් මීට වැඩිය බලන්න වෙනවා. අසිත අද මට කළේ තර්ජනයක්... කිසිම වෙලාවක මේවා වැටෙන්න දෙන්න බෑ. ඒ වගේම හංසි ඔයා..*

*මල්ලී.. තරු... මම අපි හතර දෙනාම වෙනදට වැඩිය පරිස්සම් වෙන්න වෙනවා.”*

කෙත්මි කියන කතාව හංසිට තේරුම් ගන්න අපහසු නැත. අසිත ඊළඟට කුමක් කරයිද කියන්නට බැරිය.

*“මේ ගැන සංදේශ් අයියා එක්ක කතා කරන්න වෙයි කෙත්මි. එයා මේවා දන්නවද?”*

*“නැහැ. අද මට එයාට මේවා කියාගන්න වුණේ නෑ හංසි. ඉක්මනටම එයත් එක්ක කතා කරන්න වෙයි. ඒත් කලබල වෙලා බෑ. සංදේශ් අයියා අනික් ගමන මොනවා කරයිද කියන්න බෑ. අපිට මේක හරියටම හොයාගන්න වෙනවා.”*

*“ඒ කොහොමද? කෙත්මී... මොනවා කරත් මතක තියා ගනිං අපි කෙල්ලෝ දෙන්නෙක්. අසිත කියන්නේ මොන වගේ මිනිහෙක්ද කියලා දැන් දන්නවානේ... ඌ එක්ක අපි දෙන්නට තනියම හැප්පෙන්න බෑ...”*

*“බලමු. මං ඉක්මනට හැම දෙයක්ම හොයා ගන්නවා. එතකම් පරිස්සමින් ඉමු.”*

කෙත්මි කීවේ මේසය මත තිබූ බෙහෙත් කවරයත් වතුර වීදුරුවත් ළඟට ගනිමිනි.

*"හැමදාම කියනවා වගේ... හිතන තරම් යකා කළු නෑ බං... ලොක්කා බොරුවට උඹට පාට් එක දැම්මට දැන් උඹත් එක්ක තරහක් නෑ..."*

හංසි කීවේ බෙහෙත් කවරය කෙත්මිගෙන් උදුරාගෙන බෙහෙත් ටික තෝරමිනි. කෙත්මිට සිනහවක් නැඟුණේ දවාලේ ඔහු හැසිරුණු අයුරු සිහිවෙද්දීය.

*"යකෝ... මටත් කියලා හිනාවෙයං බං තනියම හිනා වෙන්නේ නැතුව..."*

*"සංදේශ් අයියා අද ආවේ මගේ වෙලාවට බං... පච්... මට කලන්තේ දැම්ම වෙලාවේ එයා බය වුණා. තව පොඩ්ඩෙන් මාව හොස්පිටල් ඇඩ්මිට් කරනවා."*

*"මිනිහත් මාර ඩැල් එකක් තමයි බලන් ගියාම. අපි ආවේ නැත්තම්... කීයට හරි එනකම්ම උඹත් එක්ක ඉඳලා යන්නේ. එක අතකින් අපරාදේ..."*

sinhalaebooks.com

***"මොකක්ද අපරාදේ?"*** කෙත්මි ඇසුවේ දැස් කුඩා කරමින් හංසි දෙස බලාය.

***"නෑ ඉතිං... අපි තව ටිකක් පරක්කු වුණානම් දෙන්නා එක්ක වැට් එකක් දාගෙන ඉන්න තිබුණානේ... පහුගිය කාලේ රණ්ඩු වෙවී හිටියා මිසක් එහෙම කතාවක් දාන්න බැරු වුණානේ දෙන්නටම."***

***"අනේ මේ... අර බතලයට ඇහෙන්න එහෙම ඕවා කියන්න එපා. වචනයක් එහෙමෙහේ වෙන්න බෑ මාව බයිට් එකට ගන්නවා.."***

***"මේ.... මට නම් හිතෙන්නේ කෙත්මි සංදේශ් අයියාගෙයි අපේ බතලයාගෙයි මොකක් හරි අපි නොදන්න හිතවත්කමක් තියෙනවා..."***

හංසි කීවේ දවල් රනුක් කී කතාත් සිහිපත් කරගෙනය. මේ සැකය කෙත්මිටත් දැනෙමින් තිබුණි.

***"මටත් ඒක තේරුණා. අපි බලමුකෝ.."***

33.

පසුදා කෙත්මිත් හංසිත් ඔෆිස් යන්නට සූදානම්ව පහළට එනවිට සාලයේ කතා කරමින් සිටි දෙදෙනා දකිද්දී දෙදෙනාම මුහුණෙන් මුහුණ බලාගත්තේ පුදුමයෙනි. ඔවුන්ගේ අඩි සද්දයට හැරී බැලූ රනුක්ට හීරාන්තව සිටින දෙදෙනාව දකිද්දී සිනහවක් නැඟුණි.

*"සුදූ අක්කී... ඉක්මනට එනවා හලෝ... බලනවා සංදේශ් අයියා ඇවිත් දැන් පැය බාගයක් විතර..."*

*"මං කොහොමත් දැනගෙනම තමයි බං ආවේ. ගෑණු කවද්ද ගමනක් යන්න ඉක්මනට ලෑස්ති වුණේ?"*

සංදේශ් කීවේ කෙත්මි හා මිතුරිය දෙස බලා සමච්චල් සිනහවක් නංවාගනිමිනි.

***"අපි දන්නේ නැනේ ඉතිං... අනික මේ උදේම?"*** කෙත්මි ඇසුවේ ඔවුන් වෙත ඇවිදගෙන එමිනි.

***"සුදු අක්කී... අයියා ඇවිත් තියෙන්නේ ඔයා ඔෆිස් යනවා නම් එක්කන් යන්න."***

රනුක් කියද්දී කෙත්මි සංදේශ් දෙස බැලුවේ දෑස් විසල් කරගෙනය. හංසිත් බලා උන්නේ පුදුමයෙනි.

***"අනේ... අයියා ඇයි කරදර වුණේ... මට වෙනදා වගේ හංසිත් එක්ක යන්න පුළුවන්. වෙහිකල් එක තියෙනවානේ..."***

***"අපෝ ඔව්.... ඔයාගේ වෙහිකල් එක තියෙනවා... ඔයාට හොඳට ඩ්‍රයිව් කරන්නත් පුළුවන්.. ඔයාගේ බොඩිගාර්ඩුත් ඉන්නවා කියලා මම දන්නවා."*** සංදේශ් කීවේ ඇද කරගෙනය.

***"එහෙනම්..."***

***"සුදු අක්කී... අයියා එක්ක අදට යන්න. ඔයාලාට පොලීසියටත් යන්න වෙනවා උදේම. ඔයා අයියා එක්කම යන එක හොඳයි. මං හංසියාවයි තරුවයි***

sinhalaebooks.com

*ඔෆිස් එකෙන් දාන්නම්."* රනුක් කීවේ අවසන් තීරණය ලෙසිනි.

තවත් වාද කරන්නට දෙයක් නැති තැන කෙත්මි සංදේශ් පසුපසින්ම ගොස් ඔහුගේ වාහනයට නැඟුනේ හංසි රනුක් සමඟ නවතිද්දීය. සංදේශ් වාහනයට නැඟ ඇය දෙස මොහොතක් බලා උන්නේය. කෙත්මි උන්නේ දුරකතනයේ කිසිවක් ටයිප් කරමිනි.

*"රිතූ..."*

*"ම්..."*

ඇය දුරකතනයෙන් ඇස් ඉවතට නොගෙනම ඇසුවාය. මොහොතක් බලා සිටි සංදේශ් ඇය අතේ තිබූ දුරකතනය උදුරාගත්තේ කෙත්මි ඔහු දෙස හැරී බලද්දීය.

*"කතා කරද්දී මූණ දිහා බලලා උත්තර දෙන්න පුරුදු වෙනවා. උදේ පාන්දර බලන්න බැරි තරම් අවුලක් මගේ මූණේ නෑ මං දන්න විදිහට..."* සංදේශ් කීවේ අමනාපය මුසු හඬිනි.

*"සොරි අයියේ..."*

sinhalaebooks.com

*"දැන් තමුසෙට කොහොමද රිතූ? බෙහෙත් ටික බිව්වද?"*

*"දැන් අවුලක් නෑ අයියේ. ඊයේ පොඩ්ඩක් ෂොක් එකත් එක්ක එහෙම වෙන්න ඇත්තේ."*

*"හ්ම්..."*

සංදේශ් වාහනය පදවන අතරේම ඩෑෂ්බෝඩය මත තිබූ කවරයක් ගෙන කෙත්මිගේ උකුලෙන් තැබුවේ ඇය ප්‍රශ්නාර්ථයක් රැඳි මුහුණින් ඔහු දෙස බලද්දීය.

*"කන්න. තාම උදේට කෑවේ නෑනේ... පොලීසියට ගිහින් ඔෆිස් එකට යද්දි පරක්කු වෙයි."*

*"අනේ කමක් නෑ අයියේ. අයියා කෑවද?"*

*"මට පස්සේ කන්න පුළුවන්. යන තැනක කලන්තේ දාලා වැටෙන්නේ නැතුව තමුසේ කනවාකෝ ඕක."*

කෙත්මි හෙමිහිට අතේ තිබූ කවරය දිගහැරියේ ඔහු බනින්නට පටන් ගන්න පෙරය.

sinhalaebooks.com

එහි වූ චීස් සැන්ඩ්විච්වර්ස් කිහිපයත් ස්ට්‍රෝබෙරි කිරි එකත් දකිද්දී කෙත්මිට නැඟුණේ අපූරු සිනහවකි. චීස් සැන්ඩ්විච් සමඟ ස්ට්‍රෝබෙරි කිරි ඇය කැමතිම කෑම වර්ග අතර ඉහළින්ම ඇති දේවල්ය. නොදැනුවත්ව හෝ සංදේශ් ගෙනැවිත් ඇත්තේ තමා කැමති දේවල්ය.

***"ඕක දිහා බලාගෙන හිනාවෙලා ඉවර නම් දැන් කන්න."*** සංදේශ් කීවේ වාහනය පදනව අතරේ නෙත් කොණින් ඇය දෙස බලමිනි.

*"තැන්ක්යූ අයියේ..."*

කී කෙත්මි සැන්ඩ්විච් එකක් මුවට ලං කර ආපසු හැරී බැලුවේ වාහනය පදවන සංදේශ් දෙසය. ඔහුත් තවම උදේ කෑම ගෙන නැත. එසේ තිබියදී තනිවම කන්නට බැරිය.

කෙත්මි අතේ වූ සැන්ඩ්විච් එක වාහනය පදවන සංදේශ්ගේ මුව අසලට ලං කළේ ඔහු පුදුමයෙන් හිස හරවා බලද්දීය. ඇය හිසින් 'කන්න' යැයි ඉඟි කරද්දී ඔහු මොහොතක් බලා හිඳ සැන්ඩ්විච් කැබැල්ලක් කෑවේ මද සිනහවකින් මුව සරසාගෙනය.

මාරුවෙන් මාරුවට ඔහුටත් කවමින් සැන්ඩ්විචර්ස් ටික කෑ කෙත්මි ඊළඟට අතට ගත්තේ ඔහු ගෙනැවිත් තිබූ ස්ට්‍රෝබෙරි කිරි එකයි. මෙතෙක් වෙලා නිහඬවම ඇයට ඉඩදුන් සංදේශ් එය දකිද්දී නම් කට ඇද කර ගත්තේය.

***"අපෝ අපෝ මේ... ඔය ජරාව නම් මට පොවන්න ලෑස්තිවෙන්න එපා රිතූ."***

***"ඇයි අනේ?"***

රිතූ ඇසුවේ මිතුරෙකුගෙන් අසනවාක් මෙනි. ටික දිනකට පෙරත් දෙදෙනා උන්නේ රණ්ඩුකරමින් බව දැන් දෙදෙනාටම වගක් නැත.

***"ඕවා බොන්න බෑ. අන්න අර පිටිපස්සේ සීට් එක උඩ තියෙන වතුර බෝතලේ අරන් දෙන්න මට."***

***"වතුර වගේද අප්පා මේවා... ස්ට්‍රෝබෙරි මිල්ක් කොච්චර රසයිද.."*** කෙත්මි කීවේ වතුර බෝතලයේ මූඩිය විවරකර සංදේශ් අතේ තබමිනි.

***"මං ස්ට්‍රෝබෙරි වලට කැමති නෑ..."***

***"රියලි? චුට්ටක් බීලා බලන්න අනේ රසයි."*** කෙත්මි කීවේ කිරි එක ඔහුගේ මුව අසලට ලං කරමිනි.

***"ඕක අහකට ගන්නවා රිතූ... නැත්තම් මං මේකෙන් එළියට විසිකරනවා ඕක..."***

සංදේශ් කීවේ කේන්තියෙනි. ස්ට්‍රෝබෙරි සුවඳත් ඇතිය. ඔහුට ඒ සුවඳ එද්දීත් වමනයට එනබව කියා මැය ඉදිරියේ ලැජ්ජාවන්නට සිතක් නැත.

***"අනේ... එපා නම් මට මොකද... ඔයාට පින නෑ අනේ මෙච්චර රස කිරි එකක් බොන්න.."***

කෙත්මි තනිවම කියවමින් කිරි එක බොද්දී සංදේශ් රවා බැලුවේය.

***"අපරාදේ වතුර බෝතලයක් අරන් දෙන්න තිබ්බේ. වැඩි හොඳට මාත් අරන් දුන්නා මල පරාව...ඈක්කා..."*** සංදේශ් සිතින් මුමුණා ගත්තේ ස්ට්‍රෝබෙරි වල සුවඳ නොදැනෙන්නට ඒසී එක වසා දමා ජනේලයකුත් විවර කර ගනිමිනි.

sinhalaebooks.com

*"මොනවද අප්පා... ඇයි ඒසී එක ඕෆ් කලේ? මේ හුළඟට කොණ්ඩෙත් අවුල් වෙනවා.."* කෙත්මි කීවේ ඔහුට රවමිනි.

*"රිතූ මේ... මගේ කුණුහරුප අහගන්නේ නැතුව ඉන්නවා. අවුල් වෙන්ඩම කොණ්ඩේ... බලන් ගියාම අපේ නංගි හොඳයි තමුසෙට වඩා."*

*"ඒක ඇත්ත. සමාධි අක්කි මට වැඩිය හොඳයි කියලා මාත් දන්නවා."*

*"මේ රිතූ.. කාලා බීලා ඉවර නම් මට මේක කියනවා..."* සංදේශ් ඇසුවේ මදක් බැරෑරුම් ස්වරයෙනි.

*"මොකක්ද?"*

*"ඊයේ අරූ මොනවද ඇවිත් කිව්වේ? ඒකා අර විදිහට හැසිරෙන්න තමුසේ මොනවද කිව්වේ?"*

sinhalaebooks.com

*"හ්ම්... එයා ඇවිත් තියෙන්නේ අපි දෙන්නාගේ එෆෙයාර් එක ආයෙත් පටන්ගමු කියන්න. දැන් කාගෙන්වත් බාධාවක් නැල්ලූ..."*

*"ඉතිං හොඳයිනේ... මොකටද උඹට කැගහලා එලවාගන්න හැදුවේ? ඔයාටත් කොහොමත් උඹව අතඇරගන්න බැරුවනේ හිටියේ. එදා වුණත්..."*

*"අයියේ ප්ලීස්... ඒ සිද්ධිය ගැන මතක් කරන්නවත් මම කැමති නෑ. ඒක මගේ මෝඩකමට මං කරපු දෙයක්. අදටත් මං ගොඩක් පසුතැවෙනවා එහෙම කරන්න හිතපු එක ගැන. ඒ වගේම ඔයාට පිං එදා මාව බේර ගත්තට..."*

*"තමුන් උඹගෙන් බේරුණ එක ගැන සතුටු වෙනවා රිතූ. උඹ මහ තිරිසනෙක්... ටික කාලෙකට හරි මගේ නංගිව උඹ වගේ එකෙක් ළඟ තියන්න වුණ එක ගැන මට මං ගැනම කේන්තියි. අදටත් සමාධි ඒ දේවල් මතක් කර කර දුක් වෙනවා... මගේ සුරංගනාවිට උඹ පුදුම වදයක් දීලා තිබ්බේ..."*

සංදේශ් කීවේ වාහනය පසෙකට කර නවතා කෙත්මිගේ දෑසට එබීගෙනය. කොයිතරම් දැඩි පුද්ගලයෙකු වුණත් සමාධිට වූ දේ සිහි කරද්දී ඔහුගේ දෑස් තෙත්වී යන අයුරු කෙත්මි හොඳින්ම දුටුවාය.

sinhalaebooks.com

"මං දන්නවා අයියේ... කලබල වෙන්නේ නැත්තම් මං ඔයාට තව දෙයක් කියන්නද?"

"මොකක්ද රිතූ?"

"අසිත තාමත් සමාධි අක්කිව අතඇරලා නෑ කියලයි මට හිතෙන්නේ. ඒ දවස්වල වුණ දේවල්වලට එයා තාමත් තරහින් ඉන්නේ..."

"ඌට මං ඉන්නකම් මගේ පැංචිට මොකුත් කරන්න බෑ රිතූ. තමුසෙත් බය නොවී ඉන්නවා. සමාධි විතරක් නෙමෙයි තමුසෙටත් මං ඌට ලං වෙන්න දෙන්නේ නෑ."

"අයියේ... ඔයා කියන කතාව හරි. ඒත් ඔයත් දන්නවානේ අසිත කියන්නේ අපි හිතන මනුස්සයා නෙමෙයි කියලා... එයා ර්යේ කේන්තියෙන් කියෙව්වා.."

"මොනවද?"

sinhalaebooks.com

සංදේශ් අසද්දී කෙත්මි අසිත කී දේවල් සියල්ලම ඔහුට කීවේ පෙරදා හංසි කීවාක් මෙන් මේ දේවල් තනිව කරන්නට තමාට බැරි නිසාමය.

*"එතකොට ඔයාට හිතෙන්නෙත් මට හිතෙන දේමද රිතූ?"* සංදේශ් ඇසුවේ මදක් කල්පනා කරමින් සිටය.

*"ඔව් අයියේ... ගොඩක් දුරට ඒ හැමදේම පිටිපස්සේ ඉන්නේ අසිත වෙන්න පුළුවන්."*

*"ඔව්... වෙන්න පුළුවන්. හැබැයි ඒක එහෙම නම් මේක තමයි මිනිහාගේ අවසානය රිතූ..."*

*"අයියේ... කලබල නොවී අපි තව ටිකක් හොයලා බලමු මේ දේවල් ගැන."*

*"මං දැනටමත් ගොඩක් දේවල් හොයාගෙන ඉවරයි රිතූ... අපි බලමු . අපේම එකෙක් මේවාට උඹට උදව් කරනවා. නැත්තම් මේක කරන්න ලේසි නෑ..."*

sinhalaebooks.com

***“බැරි වෙලාවත් ඒ කෙනා ඔයාගේ අර බබා නම් මොකද කරන්නේ?”*** කෙත්මි ඇසුවේ අසිතත් ආශාත් රෙස්ටුරන්ට් එකේ කතා කරමින් සිටි අයුරු සිහිකරමිනි.

කෙත්මිගේ කතාවට සංදේශ් මහ හඬින් සිනාසෙන්නට වූයේ ඇය ඔහුට රවා ඉවත බලා ගනිද්දීය.

***“මං ඊයෙත් තමුසෙට කිව්වා රිතූ... මට තාම බබාලා නෑ. බබාලාට හරියන අම්මා කෙනෙක් තාම හම්බුණේ නෑ... ඔන්න ඔයා කැමති නම්... මට පුළුවන් සලකලා බලන්න... මොකද කියන්නේ?”***

සංදේශ් කීවේ ඒ කතාවට කෙත්මි ලැජ්ජාවෙන් රතු වී යද්දීය. ඇය තවත් යමක් කියන්නට නොගියේ ලැජ්ජාවටමය.

***“මං දන්නවා රිතූට ආශාවයි අසිතවයි එදා මීට් වුණා කියලා. මං ඒ ගැනත් හොයන්න අරන් ඉවරයි. අපි බලමු.”***

sinhalaebooks.com

34.

හංසි කෙත්මිව හොයාගෙන ඔෆිස් එකට එන විට කෙත්මි උනේ කල්පනාවකය. උදේ පොලීසියට කට උත්තරයක් ලබා දීමෙන් පසු සංදේශ්ගේ මිතුරු පොලිස් නිළධාරියෙක්ද හමු වී දෙදෙනාම ආවේ කෙත්මිගේ ඔෆිස් එකටය. පහලින් වාහනයෙන් බැස තනිවම එන්නට සූදානම් වුණත් සංදේශ් ගියේ කෙත්මිගේ ඔෆිස් එකට පැමිණ ඇය සිය අසුනේ වාඩි වී වැඩ පටන් ගන්නාතුරුත් හිඳය.

ඔහුගේ වැඩ මතක් වෙද්දී කෙත්මිටත් හිනාය. මේ ඉන්නේ ටික දිනකට ඉහතදී උන් නපුරා නොවේ. ආදරණීය අයියා කෙනෙකි. ඔහුගේ මේ වෙස් පෙරළීම නම් සිතා ගන්නටත් අපහසුය. උදේ වාහනයේ එද්දී කී කතාව මතක් වෙද්දී නම් ලැජ්ජාවටම කෙත්මිගේ කොපුල් රත් පැහැ විය.

***“අපොයි... එච්චරටම රතු වෙන්න මොනවද බං උදේ වුණේ?”***

sinhalaebooks.com

කෙත්මි ගැස්සුණේ ඇය ඉදිරියේ අසුන්ගෙන සිනාසෙමින් සිටින හංසිගේ හඬටය. ඇය මෙතනටම එනතුරුත් නොදුටුවේ කල්පනාව එතරම් ගැඹුරු නිසාද?

***"ඕ... ඔයා කොයි වෙලාවෙද ආවේ?"***

***"අර මොන මොනවදෝ මතක් වෙලා රතු වෙන්න වුට්ටක් කලින්..."***

***"එහෙම දෙයක් නෑ හංසි.."***

***"අනේ නිකම් ඉදපං බං... මං නොදන්න කෙත්මිනේ උඹ... මොනවා වුණත් මට හරි සතුටුයි බං...."***

***"ඒ මොකද ඒ?"*** කෙත්මි ඇසුවේ පුදුමයෙනි.

***"උඹ මගේ සහෝදරී... උඹට හරියනවා නම් මං තරම් වෙන කවුද සතුටු වෙන්නේ... පහුගිය ටිකේ මං උඹ ගැන හරි බයෙන් හිටියේ... සංදේශ් අයියා***

sinhalaebooks.com

*යකා මෝඩ් එක ඕෆ් කරපු එක ලොකු දෙයක්...*" හංසි කියාගෙන යද්දී කෙත්මිට සිනහවක් නැඟුණි.

*"එයාගේ යකා මෝඩ් එක නිතරම ඔන් ඕෆ් වෙනවානේ බං. ඒකට වෙලාවක් කලාවක් නෑ... මට කියන්නකෝ ඇයි ඔයා මං ගැන බයෙන් හිටියේ කියලා..?"*

*"මාස ගානකට කලින් උඹ ආයෙත් ලංකාවට එද්දී... මම බය වුණා... ආයෙමත් අසිතගේ මතකත් එක්ක උඹ පරණ තත්ත්වෙටම වැටෙයි ද කියලා. ඒත් එදා අසිතගේ අක්කව මීට් වුණ දවසේ මං තේරුම් ගත්තා දැන් තත්ත්වේ වෙනස් කියලා...*

*ඊට පස්සේ මං බය වුණේ දැන් ඔයාගේ හිත නතර වෙලා තියෙන කෙනා ගැන. එයාට අසිතට වැඩිය ලොකු බලපෑමක් ඔයාගේ ජීවිතේට කරන්න පුළුවන් කියලා මං දන්නවා. කොහොමහරි... ඒ කෙනාගේ හිත නතර වෙලා තියෙන්නෙත් ඔයා ළඟ කියලා දැනෙද්දී මට හරි සැනසීමයි."*

හංසි කියන දේවල් කෙත්මි අසා උන්නේ මඳ සිනහවකින් මුව සරසාගෙන ඇය වෙත ආදරණීය බැල්මක් හෙළමිනි. විහිළු කර කර පිස්සු නැටුවාට ඇය තමාටත් මල්ලිටත් ආදරණීය සොයුරියකි.

"දැන් ඔයා කියන විදිහට මගේ හිත නතර වෙලා තියෙන... එයාගේ හිතත් මගේ ළඟ නතර වෙලා තියෙන.. එයා කවුද?"

"අනේ පව්... උඹ බබානේ. වරෙන් උකුලේ තියලා නළවන්න. මොනවා නැතත් අර යකාටම ගැළපෙනවා.."

"මොන යකාද හංසියෝ... ඇයි එහෙම කියන්නේ?"

"යකාද? යකා සංදේශ්. සංදේශ් සාක්‍ය ගුණවර්ධන. උඹලා දෙන්නම කරන්නේ උගුරට හොරා බෙහෙත් බොන එක. අර බතලයා කියනවා වගේ දැන් ඉතිං ඇති ඔය හැංගිමුත්තම් සෙල්ලම. මට ඊයේ සමාධි අක්කිත් කෝල් කළා.."

"සමාධි අක්කී... අනේ මට කතා කරන්නවත් බැරි වුණා. උඹ මට කිව්වේවත් නෑනේ හංසි. අක්කී මොකද කිව්වේ?"

*"මොනවා කියන්නද? ඊයේ අර යකා නැට්ට ගිනිගත්ත හනුමා වගේ දුවගෙන ආවේ මොකක් හරි ප්‍රශ්නයක් වුණාද ඇහුවා..."*

*"එයා මේ දේවල් ගැන දන්නේ නැතුව ඇති හංසි. පච්.. සංදේශ් අයියා වුණත් කොහොමද කටක් ඇරලා මේවා එයාට කියන්නේ..."*

*"සුදූ....."*

කෙත්මිගේ කතාවට තිත තබමින් රනුක් කෙත්මිගේ ඔෆිස් එක තුළට ආවේ කෑගසාගෙනමය. ඒ හඬට කෙත්මිත් තිගැස්සෙද්දී හංසි හැරී බැලුවේ පපුවට අතකුත් තබාගෙනටය.

*"මොනවද බූරුවෝ කරන්නේ... එදත් මං කිව්වා තට්ටු කරලා වරෙන් කියලා... උඹේ වැඩ නිසා මං කොයි වෙලේ හරි හාට් ඇටෑක් හැදිලා මැරෙන්නේ..."* හංසි සුපුරුදු පරිදි කේන්තියෙන් බැනගෙන යන්නට වූවාය.

*"මොකද රනුක් මේ... පාර වැරදුණාද? ඔයාගේ සුදූගේ ඔෆිස් එක තියෙන්නේ සෙකන්ඩ් ෆ්ලෝ*

*එකේ..''* කෙත්මි කීවේ කලබලයෙන් පුටුවක් ඇදගෙන වාඩි වෙන රනුක් දෙස බලා සිනාසෙමිනි.

*''දෙන්නම කියවලා ඉවර නම් මං කියන එකත් අහනවද ටිකක්...''*

*''හරි හරි කියන්න...''*

*''අක්කී... රමණී ආන්ටි අම්මිලාට කෝල් කරලා... අම්මිලා බය වෙලා මට කතා කළා...''*

රනුක් කියද්දී කෙත්මිගේ ඇස් උඩ ගියේ පුදුමයෙනි. අසිතගේ අම්මා.. අම්මලාට කතා කළේ ඇයි? ඔවුන් සමඟ තිබූ හිතවත්කම් අතහැරුණේ ඒ දවස්වලමය.

*''රමණී ආන්ටි? ඒත් ඇයි?''*

*''තමුසෙව අරූට ජෝඩු කරන්න කතා කරලා තියෙන්නේ... පුතා ඔයාට ගොඩක් ආදරෙයිලු කියන්නේ... තමුසෙත් ඌට මැරෙන්න ගියානේ.. දෙන්නව එකතු කරමු කිව්වාලු...''* රනුක් කීවේ කෙත්මිගේ දැත් මිට මෙළවෙද්දීය. අසිත එහෙමනම් කිව්වා වගේම වැඩ පටන් අරන් ඇත.

sinhalaebooks.com

*"ඉතිං අම්මලා මොකද කියලා තියෙන්නේ?"* හංසි ඇසුවේ කෙත්මිටත් පෙරය. එය ඇසෙද්දී නම් රනුක්ට අපූරු සිනහවක් නැඟුණි.

*"ඔයා දන්නවානේ බබෝ... අපේ මිස්ටර් ජගත් දිසානායක සද්දේ වහලා හිටියට කෙලින් වැඩ කියලා.."*

*"තාත්ති මොනවද මල්ලි කියලා තියෙන්නේ?"*

කෙත්මි ඇසුවේ මදක් බිඳුණු ස්වරයෙනි. තමා ඔහු වෙනුවෙන් වසර තුනකට පෙර කරන්නට ගිය දේ නිසා බැරි වෙලාවත් තාත්තා මේ යෝජනාවට කැමති වෙයිද? තමාගේ සතුට වෙනුවෙන් ඔහු නොකරන දෙයක් නැති බව කෙත්මි දනී.

*"තාත්තා පොල්ලෙන් ගහන්නා වගේ රමණී ආන්ටිට කිව්වලු ' එක සැරයක් කසාද බැඳලා... ඒ කෙල්ලට දසවධ දීලා දික්කසාද වුණු තිරිසනෙක්ට අපේ කෙල්ලව දෙන්න තරම් අපේ කෙල්ලට අහේනියක් නෑ රමණී' කියලා."*

sinhalaebooks.com

රනුක් කියද්දී කෙත්මිට සැනසුම් සුසුමක් හෙළුණේත් හංසි මහ හඬින් සිනාසෙන්නට වූයේත් එකවරමය.

*"අම්මෝ කෙත්මි... මොනවා නැතත් තාත්තා ඇඬෙන්නම කියලා තියෙනවා ගෑණිට..."*

*"ඒත් හංසියෝ... ඊට පස්සේ ගෑණි කිව්වලු 'කොහොමත් පුතා මේක අතඅරින එකක් නෑ... කලින්ම කියලා හොඳින් විසඳගන්න බැලුවේ... ඔයාලා කතා කරන්නේ එහෙමනම් පුතා එයාගේ විදිහට එයාට ඕන දේ කර ගනියි' කියලා."*

*"මොකක්?"*

කෙත්මි මිමිණුවේ අඳුරුව ගිය මුහුණෙනි. හංසිගේ මුහුණේ මොහොතකට පෙර තිබුණ එළිය වෙනුවට ඇඳී ආවේ බියක සේයාවකි.

*"අපි මොකද කරන්නේ මල්ලී?"*

හංසිගේ වදන්වලින්ම ඇයගේ තිගැස්සීමේ තරම ඔහු තේරුම් ගත්තේය. නැතිනම් ඇය ලේසියකට තමාට මල්ලී කියන්නේ නැත.

sinhalaebooks.com

*“මටත් හිතා ගන්න බෑ. අපි කලින්ම පොලීසියට ගිය එකත් හොඳයි. අම්මිලා අනිද්දා රට තියෙන ෆ්ලයිට් එකේ එනවා කිව්වා... ටොමියාත් එයාලා එක්ක එනවා කිව්වා.”*

*“අම්මිලා පව්... මං නිසා එයාලාව සැනසීමක් ඇත්තෙම නෑ...”*

*“එහෙම කියන්න එපා අක්කී. අපේ මුළු පවුලෙම සැනසීම ඔයා... ඔයාට මෙහේ කරදරයක් තියෙද්දී අම්මිලාට එහේ ඉන්න බෑ. අවුරුදු තුනකට කලින් එයාලා ඔයා වෙනුවෙන් එහේ ගියා වගේම දැන් ආයෙත් ඔයා වෙනුවෙන් එනවා...”*

*“අම්මලා එන එක හොඳයි කෙත්මි..”*

*“අනිත් දේ... ඔය දෙන්නා පුළුවන් නම් මේ දවස් දෙක තුනේ ඔෆිස් එකට නෑවිත් ඉන්න... අම්මියි තාත්තියි එනකම් මං ඔයාව පරිස්සම් කරගන්න ඕන අක්කී.”* රනුක් කියද්දී කෙත්මි නිහඬවම හිස වැණුවේ ඔහු කියන කතාවේත් වරදක් නැති නිසාමය. ඇයටත් දැන් දැන් දැනෙන්නේ බියකි. අසිත මොන සෙල්ලමකට සැරසෙනවාදැයි කියන්නට දන්නේ නැත.

රනුක් පිටත්ව ගියේ හවසට දෙදෙනාටම සංදේශ් සමඟින් නිවසට යන ලෙස මඟින් මඟට කියමිනි. ඔහු ගිය පසු කෙත්මි අත්‍යාවශ්‍ය වැඩ කිහිපයකම ෆයිල් ටිකක් දිගහැර ගත්තේ ටික දිනක් යන තුරු ඔෆිස් එකට නැවිත් ඉන්නට තීරණයක් ගෙනය.

*************

රමණී කෙත්මිගේ අම්මලාට කතා කළ මොහොතේ ඔවුන් කී දේවල් අසිත අසා උන්නේ කෝපයෙන් ඇවිලෙන නෙත් වලිනි. සුළු මොහොතකට පෙර ඔහු පොලීසියට ගොස් ආවේ කෙත්මි ඔහුට විරුද්ධව දමා තිබූ පැමිණිල්ල නිසාය.

*“මං උඹට ඒ කාලෙම කිව්වා අසිත ඔය කෙල්ලව අතඇරගන්න එපා කියලා. කොහෙද... උඹටත් අර සමාධි කියන එකී ලොකු වුණා...”*

*“මං ඔවුන් දෙන්නවම අතඅරින්නේ නෑ අම්මා... කෙත්මි මගේ අතේ හිටපු එකී. මේ සේරටම මුල අර සංදේශ් කියන එකා. ගානට මං ගේම ගහන් එද්දී මූ සේරම කෙත්මිට කියලා මගේ ප්ලෑන් සේරම විනාශ කළා...”*

sinhalaebooks.com

*"දැන් මොකක්ද කරන්න හිතන් ඉන්නේ?"*

රමණී අහද්දී අසිතගේ මුවෙහි ඇඳීගියේ මහ එපා කරපු සිනහවකි.

*"කෙත්මිව මං මගේ ළඟට ගන්නවා අම්මා. දිසානායකලාගේ සේරම දේවල් මට ලැබුණාට පස්සේ ඒකිට මොනවා වුණත් මට වැඩක් නෑ... හැබැයි මගේ අතේ හිටපු කිරිල්ලී අර සංදේශ් කියන එකාගේ අතේ වහන්න දෙන්නෙත් නෑ මං."*

*"කරන දෙයක් කල්පනාවෙන් කරනවා අසිත. දැනටමත් ඒකි පොලිස් පොතේ උඹේ නම ලියවලා ඉවරයි..."*

*"ඒකි සේරම කරන්නේ අර සංදේශ් කියන එකාගේ හයිය අරන්... මට විරුද්ධව පොලිසි යන්න... හහ්... ඒකි ළඟදීම මේ කරපු දේවල් වලට ගොඩක් විඳවයි අම්මා. ගොඩක් විඳවයි."*

*"මොනවා හරි ඉක්මනට කරනවා. අර ජෝඩුව ඉන්න දිහාකින් ආයේ ලංකාවට ආවොත් අපිට කිසිම දෙයක් කරගන්න වෙන්නේ නෑ. මේ පොඩි එවුන්*

sinhalaebooks.com

*එක්ක සෙල්ලම් කරන තරම් ලේසි නෑ ජගත් දිසානායක එක්ක හැප්පෙන එක. ඒකමයි මං හොඳින් කතා කරලා බැලුවේ මේක කරගන්න...”*

*“උන් දෙන්නා අයේ එද්දී ගොඩක් දේවල් වෙලා ඉවර වෙලා තියෙයි අම්මා...”* කී අසිත දුරකතනය ගෙන ඇමතුමක් ගත්තේ ඔහුගේ සහචරයෙකුවය.

*“වස්තු... අරකිව උස්සපං...”*

*“බොස්...?”*

*“පැය විසිහතරක් ඇතුළත ඒකි අපේ පොට් එකේ ඉන්න ඕන වස්තු.”*

sinhalaebooks.com

## 35.

*"ඕකේ එහෙනම්... මේක තමයි මගේ ප්ලෑන් එක. මං කැමතියි මේ ගැන ඔයාලාගේ අදහසුත් දැනගන්න."*

විනාඩි තිහක් පමණ කල විස්තර කල ප්‍රසන්ටේෂන් එක නිමා කරමින් කියූ සංදේශ් මීටින් එකේ සිටි පිරිස දෙසට හැරුණේය. සතියකට වරක් ගන්නා කම්පැනි මීටින් එකට රංග, සමාධි, නිරාශා සමඟින් ආයතනයේ ඉහළ නිළධාරීන් කිහිප දෙනෙක්ම පැමිණ සිටි අතර අද සංදේශ්ගේ විශේෂ ආරාධනයෙන් සුජීවද එහි පැමිණ සිටියේය.

සංදේශ් ඔවුන් වෙත හැරුණේ ඔවුන්ගේ අදහස් බලාපොරොත්තුවෙන් වුවත් සියලු දෙනාගෙම දෑස් තවමත් රැඳී තිබුණේ ඔහුට පසුපසින් ඇති ස්ක්‍රීන් එකටය. සමාධි නම් උන්නේ අපහසුවෙන් රංගට මුවා වී සිනහව වළකාගෙනය. රංගත් සිනාසෙමින්ම බිම බලා ගත්තේ සංදේශ්ගෙන් මුහුණ සඟවමිනි. නිරාශා නම් උන්නේ කටත් ඇරගෙනය. සුජීවත් ඇයට දෙවෙනි වූයේ නැත.

sinhalaebooks.com

*"සර්... මැඩම් හරි ලස්සනයිනේ.."*

සමාධි අසලම වාඩි වී සිටි තරංග කියද්දී සමාධිගේ සිනහව පිටට පැන්නේ සංදේශ් ඇය දෙස රවා බලද්දීය. ඊළඟට ඔහු බැලුවේ තරංග දෙසය.

"වට?"

සංදේශ් ඇසුවේ සිදුවන්නේ කුමක්දැයි තවමත් ඔහුට තේරුමක් නොවූ නිසාය. රංග දෙස බලද්දී ඔහු දෑසින් පෙන්වූයේ පසුපසින් ඇති ස්ක්‍රීනයයි.

හිස හරවා ඒ දෙස බැලූ සංදේශ්ට සිදුවී ඇති දෙය තේරුණේ දැන්ය. ලැප්ටොප් පරිගනකයේ ස්ක්‍රීන් එකට දමා තිබූ රිතූගේ පින්තූරය ස්ක්‍රීන් එකේ ලොකුවට වැටී ඇත.

'විලිලැජ්ජාවයි... මං ස්ක්‍රීන් එක ෂෙයා කරලා තියෙද්දිද ටැබ් එක ක්ලෝස් කළේ... ෂිකේ.. දැන් ඉතිං මුන්ට මේක ඇති මගේ ඉතුරු ජීවිත කාලෙම මාව බයිට් එකට ගන්න..' සංදේශ් ඉක්මනින් පරිගනකය වසා දමා මද සිනහවක් නංවාගෙන යළිත් හැරුණේය.

*"අපරාදෙනේ සර් අපේ මැඩම් මේ ප්‍රොජෙක්ට් එක මට දුන්නේ... මැඩම්ටම ලස්සනට කරගෙන යන්න තිබ්බා."*

sinhalaebooks.com

සුජීව කීයද්දී සංදේශ් සිනහවක් පෑවේ කරගන්නට දෙයක් නැති තැනය. ඔහුගේ මූණ නම් බලන්නට ලස්සනය. හිතුහැටියට හිනාවෙන්නට බැරිව සමාධි නම් උන්නේ ඉවත බලාගෙනය. නිරාශාත් කට පියාගෙන උන්නේ අපහසුවෙනි.

*"ඒ අර මිස්ටර් ජගත් දිසානායකගේ දුව නේද? දැන් දිසානායක ගෲප් එක බලන්නේ ඒ ළමයානේ... හොඳයි හොඳයි..."* ආයතනයේ මුල්කාලයේ සිටම වැඩකළ සංදේශ්ගේ පියාගේ මිතුරෙකු වූ ආනන්ද කීවේ සිනාසෙමිනි.

*"ඕකේ... ඕකේ... අපි ඒ ගැන පස්සේ කතා කරමු. දැන් ආයෙත් අපේ වැඩේ ගැන කතා කරමු. සංදේශ්.."*

රංග කතා කළේ සංදේශ් වැටුණ අපහසුවෙන් ඔහුව මුදවා ගනිමිනි. ඉන්පසුව පැයක් පමණ දිගට කරගෙන ගිය සාකච්ඡාවෙන් පසු සියල්ලන් පිටවී ගියේ සමාධි, රංග, නිරාශා සහ සංදේශ් පමණක් එහි ඉතිරි වෙද්දීය.

*"මං කිව්වා රංග අයියේ එක පණ්ඩිතයෙක්ට.. හැංගි හැංගි වෙස් බැන්දට නටන්න වෙන්නේ එළියේ කියලා.. ඔය කරගත්තේ"*

sinhalaebooks.com

සමාධි කීවේ කඳුළු එනතුරුම සිනාසෙමිනි. සංදේශ් පුටුවට බර වී නියපොත්තක් හපමින් ඇය දෙස බලා උන්නේ කරගන්නට දෙයක් නැතුවය.

*"අනේ මන්දා... සර් අර දවස්වල මැඩම් එක්ක රණ්ඩුවුණ විදිහට මම නම් හිතුවෙම නෑ..."*

*"නිරාශා.."*

*"ස්... සොරි සර්... මං යන්නම්.."*

නිරාශා ඉක්මනින් යන්නට ගියේ සංදේශ්ගෙන් බැනුම් අසන්නට පෙරය. එය දුටු සමාධිට තවත් හිනාය.

*"ඒකීට කෑගහලා වැඩක් නැනේ ඉතිං. මොකෝ ඒකී බොරුද කිව්වේ? පැංචි කොච්චර කිව්වත් මං විශ්වාස කළෙත් නෑ යකෝ..."*

*"අනේ නිකම් ඉඳපං රංගයා... ලස්සන නිසා ෆොටෝ එක දා ගත්තා මිසක් එහෙම දෙයක් හිතලා මං ඒක දා ගත්තේ නෑ..."*

sinhalaebooks.com

*"අම්මෝ අයියා... ඔයා තමයි දවසකටත් මිනිහා... ඇයි දෙයියනේ... දකින දකින තැන අර කෙල්ලව කන්න හදනවා ඇස් දෙකට පේන්න එන්න එපා කියලා. එයාට එන්න එපා කියලා මෙයා එයාගේ ෆොටෝස් වොල්පේපර් එකටත් දාන් බල බලා ඉන්නවා."*

*"පැංචි..."*

*"ඇයි දැන් බොරුද මං කියන්නේ? රංග අයියේ මෙයා අර විකීට කියලා සිකියුරිටි දාලා තියෙන මැඩම් කවුද දන්නවද?"*

*"රිතූද?"*

*"ආයෙත් අහලා... එදා අර පස්ස කැඩිච්ච කඩියා වගේ දුවලා තියෙන්නේ රිතූව බලන්න. ඔෆිස් එකේදී අසනීප වුණ රිතූට බෙහෙත් අරන් දීලා.. කන්න බොන්න අරන් දීලා.. ගෙදරට ගිහින් දාලා... හංසිලා එනකල්ම මුරටත් ඉඳලා ඇවිත් තියෙන්නේ...."*

සමාධි කියද්දී සංදේශ් බැලුවේ ඇස් දෙකත් හීනි කරගෙනය. සමාධිට මේවා කීවේ කවුද?

sinhalaebooks.com

*"තමුසෙට කවුද ඕවා කිව්වේ?"*

*"හංසි. ඇයි දැන් බොරුද?"*

*"නෑ... නෑ... ඇත්ත. ඔය සේරම ඇත්ත. දැන් සතුටුද උඹලා දෙන්නට?"*

*"ඒ... ඒ කියන්නේ උඹ රිතූ නංගිට..."*

*"හ්ම්..."* කියූ සංදේශ් යන්නට ගියේ තවත් හිටියොත් මොවුන්ගෙන් විසුමක් වෙන්නේ නැති තැනය.

*"අම්මෝ... අද නම් පාටියක් දාන්න ඕන රංග අයියේ... මං දැන්මම යනවා ගෙදර.."*

සමාධි දඩිබිඩි ගා පුටුවෙන් නැඟිට්ටේ ඉක්මනින් ගෙදර ගොස් හවස් වී කෙත්මිවත් බලන්නට යන්න සිතාගෙනය.

*"මේකට හැදිච්ච කුලප්පුවක් යකෝ.."*

sinhalaebooks.com

*"එහෙම නැතුව බෑ අයියෝ... මේ සුබ ආරංචිය අපේ කුක්කාගේ ඉඳලා හැමෝටම කියන්න ඕන. හවසට රිතූව බලන්න යන්නත් ඕන මං..."*

*"ඔහොම ඉන්නවා මං ගිහින් දාලා එන්නම් එහෙනම්."*

*"පිස්සුද අප්පා... ඔයත් ගියාම වැඩ කරන්නේ කවුද මෙතන? මං කැබ් එකක් දාන් යන්නම්. මෙතන ඉඳලා විනාඩි විස්සනේ ගෙදරට."*

සමාධි උඩපනිමින් යන දෙස රංග බලා උන්නේ සිනාසෙමිනි. කාලයකට පසු ඇය අද ඉන්නේ සැබෑම සතුටකිනි.

************

සංදේශ් හැන්දෑවේ කෙත්මිලාගේ නිවසට ගියේ රනුක්ගේ ඇමතුමකටය. අසිතගේ අම්මා කී දේවල් රනුක් ඔහුට කීවේ ඒ මොහොතේය. සියල්ල අසා සිටි සංදේශ් ඊළඟට බැලුවේ හංසිත් සමඟ මිදුලට වී මොනවාදෝ කියවන කෙත්මි දෙසය. ඔවුන් දෙදෙනා

එළියට ගියේ රනුක්ට සංදේශ් සමඟ නිදහසේ කතාකරන්නට වුවමනා බව කී නිසාය.

*"දැන් රිතූ මොකද කියන්නේ මල්ලී?"*

*"සුදු අක්කී ඔය හිටියට ටිකක් බය වෙලා ඉන්නේ අයියේ. මං කිව්වේ ටික දවසක් යනකම් ගෙදරට වෙලා ඉන්න කියලා."*

*"ඔව් ඒක හොඳයි. අසිත කියන්නේ විශ්වාස කරන්න පුළුවන් එකෙක් නෙමෙයි. ඌට මුල ඉඳලම ඕන වුණේ ජගත් අංකල්ගේ සල්ලි... රිතූගේ මොකක්ද වාසනාවකට අපේ සමාධි මේ කතාව මැද්දට නොඑන්න ගොඩක් දේවල් වෙනස් වෙලා..."*

*"සමාධි අක්කිත් පව් අයියේ... මට හරි දුකයි එයාට වුණ දේවල් ගැන. මං දන්නවා එයා ඔය විදිහට හරි අරුගෙන් නිදහස් වුණේ අයියා හිටපු නිසා කියලා."*

*"සමාධිට දැන් ප්‍රශ්නයක් නෑ බං... අපි බලමු මේ ප්‍රශ්නේ ඉවර කරගන්න විදිහක්. අංකල්ලා අනිද්දා නේද එන්නේ?"*

*"ඔව්. ඒ එක්කම දිලූෂ අයියාත් එනවා කිව්වා අයියේ."*

*"උෟ එන එකත් හොඳයි. අපි බලමුකෝ මොකද වෙන්නේ කියලා... කෝකටත් රිතූ විතරක් නෙමෙයි හංසිටත් මේ ටිකේ පරිස්සමින් ඉන්න කියලා..."*

*"ඇයි අපි විතරක්... අපේ මල්ලිගේ සුදූටත් ටිකක් පරිස්සම් වෙන්න කියන්න වෙනවා. දැන් ඉතිං එයත් අපේ කෙනෙක්නේ.."*

හංසිත් සමඟ ගෙතුළට ආ කෙත්මි කීවේ රනුක් අසල වාඩිවී ඔහුගේ හිසකෙස් අවුල් කරමිනි.

*"අපෝ අක්කේ.... තමුසෙලා දෙන්නටත් ඉන්න බෑ නේද අපි මෙතන කතා කරද්දී... කොහොම හරි එනවා හොට දාන්න."*

*"හොට? මං කියන්නේ නෑ තොට. මෝඩ බතලයා."* කී හංසි රනුක්ගේ හිසටත් පහරක් ගසාගෙන කුස්සිය දෙසට ගියේ බොන්නට දෙයක් හදන්න කියන්නය.

sinhalaebooks.com

*"ඔන්න බලන්න අයියේ... මූං දෙන්නම එකයි. මං වගේ අහිංසකයෙක් මේ මාර දූතිකාවෝ දෙන්නා එක්ක මේ ගෙදර ඉන්න එකම ලොකු දෙයක්..."*

*"මං දැන් ආවොත් පෙන්නනවා උඹට මාර දූතිකාව මොන වගේද කියලා..."* හංසි කුස්සියේ සිටම කෑගසද්දී සංදේශ් සිනාසෙමින් බැලුවේ කෙත්මි දෙසය.

*"පරිස්සමින් ඉන්න රිතූ. තනියම කොහෙවත් යන්න එන්න එපා ටික දවසක් යනකම්වත්."* කෙත්මි හිස වැණුවේ හා කියන්නටය.

*"අනේ වාසනාවන්... සංදේශ් අයියා ළඟ හරි මෙයා ඔය වගේ අහිංසක පාටට ඉන්නවා බලන්න මටත් වාසනාවක් ආවා එහෙනම්."*

රතුක් කීවේ මහ හඬින් සිනාසෙමිනි. කෙත්මි ඔහුට රවමින් ඔහුව කෙනිත්තුවේ සංදේශ් ඉන්න නිසා කිසිවක් කියාගත නොහැකිවය.

*"ආව්... ඔය නියපොතු ටික කපාගනිං යක්ෂණියේ... මගේ අත හිල් වුණාද කොහෙද?"*

sinhalaebooks.com

රනුක් අතත් අතගාමින් බනිද්දී කෙත්මි ඔහුට ඇද කළාය. සංදේශ් සිනාසෙමින්ම බලා උන්නේ සමාධිගේ වැඩ සිහිවෙද්දීය.

*"අයියේ මේ... මෙයා එක්ක මීටරේ දුරින් ඉන්න හොඳේ... ඔයත් සපාකෑම්... කෙනිත්තීම්... සීරීම්... පහුරුගෑම්වලට ලක් වෙන්න පුළුවන්."*

*"අපෝ... අපේ ගෙදරත් ඔය ජාතියේ එකක් ඉන්නවානේ ඉතිං... මාත් බේරිලා ඉන්නේ හරි අමාරුවෙන්."*

*"එහෙනම් ඉතිං... ඔයාගේ ඉදිරි අනාගතේ ගැන තීරණ ගද්දී දෙපාරක් නෙමෙයි දහපාරක් හිතලා බැලුවත් කමක් නෑ..."*

රනුක් දෑසින් කෙත්මිව දක්වමින් සංදේශ්ට කියද්දී කෙත්මි ඔහුගේ අතකට පහරක් ගැසුවාය.

ඒ සමඟම මේසය මත තිබූ සංදේශ්ගේ දුරකතනය නාදවන්නට වූවේය. ඇමතුම විකීගෙන් බව දකිද්දී සංදේශ් ඉක්මනින් ඇමතුමට සම්බන්ධ වූවේ ඔහු කතා කරන්නේ කුමක් හෝ වැදගත් දෙයකට බව දන්නා නිසාමය.

sinhalaebooks.com

***"ඔව්... කියපං විකී..."***

***"බොස් කොහෙද ඉන්නේ බොස්?"***

***"කියපං... මං රිතූලාගේ ගෙදර ඉන්නේ"***

***"බොස්... ...."***

***"මොකක්?"***

සංදේශ් කෑගසාගෙනම පුටුවෙන් නැඟිට්ටේ පුදුමයෙන් මුහුණින් මුහුණ බලාගත් කෙත්මිත් රනුකුත් ඔහු අනුවම නැඟිටිද්දීය.

sinhalaebooks.com

36.

***"ඔව් බොස්... සමාධි මිස් තාම ගෙදර ඇවිත් නෑ..."***

***"ඒක වෙන්නේ කොහොමද විකී... නංගි ඔෆිස් එකෙන් ගියේ දවල් මාත් ඔෆිස් එකේ ඉද්දී. දැන් හතටත් කිට්ටුයිනේ.."***

සංදේශ් කියද්දී කුමක්දෝ අනතුරක සේයාවක් දැනුණ කෙත්මි ඔහු අසලටම විත් ඔහුගේ තදින් මිට මෙළවුණ අතක් අල්ලාගත්තේ වෙන කිසිම දෙයක් ගැන නොසිතාය.

***"උඹට හොඳටම විශ්වාසද විකී..?"***

***"ඔව් බොස්...."***

***"හරි... මං මේ දැන් එනවා.. උඹ පොඩ්ඩක් රංගත් එක්ක බලපන්..."*** සංදේශ් කලබලයෙන්

දුරකතනය තබා තම අතක එල්ලී සිටි කෙත්මි දෙස බැලුවේය.

*"ඇයි අයියේ?"*

*"රිතු... පැංචි ගෙදර ගිහින් නෑ.."*

*"මොකක්?"*

*"අක්කා තනියමද..."*

*"ඔව් රනුක්. වෙනදට මං හරි රංගයා හරි එක්ක යන්නේ. අද දවල් කලින්ම ගෙදර යනවා කියලා කැබ් එකක ගියේ. විනාඩි විස්සේ දුරනේ කියලා... හවස මෙහේ එන්නත් ඕන කිව්වා."*

*"දැන් මොකද කරන්නේ...?"*

*"මං දැන් යන්න ඕන රනුක්."* කී සංදේශ් ළඟට බැලුවේ තවමත් තමාගේ අතේ එල්ලී සිටින කෙත්මි දෙසය. ඔහු කතා කලේ ඇයගේ හිස මතින් අතක්ද තබමිනි.

sinhalaebooks.com

***"රිතූ... පරිස්සමින් ගෙදරටම වෙලා ඉන්නවා හරිද? මං ගිහින් එන්නම්..."***

***"පරිස්සමින්"*** කෙත්මි ඔහුගේ අතත් අතහරිමින් මිමිණුවාය.

***"අයියේ.. මාත් එන්නද?"***

***"එපා රනුක්. මේ දෙන්නා තනියම දාලා කොහෙවත් යන්න එපා. මං මේක ගැන බලන්නම්."***

**************

සමාධි යන්නට ඇතැයි සිතුණ සෑම තැනකම ඇවිද්දත් ඇය ගැන ආරංචියක් නොවෙද්දී සංදේශ් මෙන්ම රංගද උන්නේ කරගන්නට දෙයක් නැතිවය. විකී පැමිණි වාහනය ඔවුන් අසල නැවතුණේ ඒ මොහොතේය. දැන් රාත්‍රී දොළහත් පසුවී ගොසිනි.

sinhalaebooks.com

***"වික්... උඹලට මොකුත් තොරතුරක් ලැබුණද?"*** සංදේශ්ට පෙර ඇසුවේ රංගය. නමුත් වික්ගේ මුහුණේ එතරම් සුබදායක බවක් නැත.

***"නැහැ බොස්... මට පේන්නේ මිස්ව කවුරු හරි කිඩ්නැප්කරලා..."***

***"මොකක්?"***

***"බොස්... මේ වෙලාවේ අපි කලබල වෙලා බෑ... අසිත පස්සෙත් මගේ සෙට් එකක් ඉන්නවා. සැක හිතෙන දෙයක් වුණොත් උන් මට කතා කරනවා."***

***"වික්... උඹලා දිගටම හොයපං... සංදේශ් අපි යමන් පොලීසියට. කවීෂයාට කෝල් එකක් දෙන්නම් මං..."*** රංග කීවේ යළිත් වාහනයට නැඟෙමිනි. සංදේශ් ඔහු අනුවම වාහනයට නැඟුණේ කලයුතු යමක් සිතට නොඑද්දීය.

මේ අතරේ කෙත්මිලාගේ නිවසේ කිසිවකුටත් නින්දක් නොවීය. කෙත්මිත් හංසිත් ආලින්දයේ පුටු දෙකකට බරවී කල්පනා කරමින්

sinhalaebooks.com

උන්නේ සමාධිට වූ දෙයක් ගැනය. රනුක් එළියට ආවේ ඔවුන් දෙදෙනාව සොයාගෙනය.

*"සංදේශ් අයියා කතා කළාද මල්ලී?"* කෙත්මි ඇසුවේ ඔහුව දකින පමාවටය.

*"මං දැන් කෝල් එකක් ගත්තා සුදූ. සමාධි අක්කා කොහේවත් නැලු. අයියායි රංග අයියායි දැන් පොලීසියට යනගමන් කිව්වා."*

*"මට නම් හිතාගන්න බෑ එකපාරටම මොනවා වුණාද කියලා..."*

*"ඒකනේ හංසියෝ... අයියලා කියන්නේ අක්කව කිඩ්නැප් කරලා කියලා. එහෙම දෙයක් කරන්න ඉතිං ඉන්නේ..."* රනුක් එතැනින් නතර වී සුසුමක් හෙළුවේ කෙත්මි දෙස බලමිනි.

*"අසිත..."* ඇය මුමුණාගත්තේ තමාටමය.

*"අසිත? අසිත මොකටද සමාධි අක්කව අරන් යන්නේ? ඌට දැන් ඕන එයාව නෙමෙයි කෙත්මි උඹව..."*

sinhalaebooks.com

*"අන්න ඒක තමයි හංසියෝ මාත් මේ කල්පනා කළේ... ඒත් ඉතිං අසිත නෙමෙයි නම් කවුද ඉන්නේ ඔහොම දෙයක් කරන්න..."*

රනුක් කීවේ ඔවුන් අසලින්ම පුටුවක් ඇදගෙන වාඩිවෙමිනි.

*"අපි නොදන්න කොයි තරම් දේවල් ඇතිද බං එයාලාගේ ජීවිතවල... බිස්නස් වර්ල්ඩ් එකේ උඩින්ම ඉන්න මිනිස්සුනේ..."*

*"අනේ මන්දා... මට නම් බය හිතෙනවා මල්ලී. සමාධි අක්කාට මොකුත් කරදරයක් නැත්තම් එච්චරයි."*

*"බය වෙන්න එපා... සංදේශ් අයියා සමාධි අක්කිව හොයාගන්නවා."*

*"මං යනවා රූම් එකට.."* මදක් කල්පනා කරමින් සිටි කෙත්මි පුටුවෙන් නැඟිට්ටේ රනුක් මෙන්ම හංසිත් පුදුමයෙන් ඇය දෙස බලද්දීය.

කෙත්මි කාමරයට යද්දී හංසිත් ඇය පසුපසින්ම කාමරයට ආවේ ඒ ගමන ඇය කුමක් කරන්නට යනවාදැයි සිතාගන්නට බැරිවය. කාමරයේ දොර වසා දැමූ කෙත්මි දුරකතනය අතට ගෙන හොඳ හුස්මක් ගත්තේ හිත සන්සුන් කරගන්නටය.

*"කෙත්මී... උඹ මොකක්ද කරන්න හදන්නේ?"*

*"මට විශ්වාසයි හංසි. මේක පිටිපස්සේ අසිත ඉන්නවා..."*

*"හරි. ඉන්නවා කියමු. දැන් උඹ මොකක්ද කරන්නේ? කාටද ඔය කතා කරන්න යන්නේ?"*

*"විශාල්ට..."*

කී කෙත්මි දුරකතනය කනේ තබා ගත්තේ හංසි ඇය දෙසම බලාඉද්දීය. එදා අසිත පැමිණි දිනයේ සිට අසිත ගැන තොරතුරු සොයන්නට කෙත්මි විශාල්ට බාරදුන් බව හංසි දනී. විශාල් දිලූෂගේත් අසිතගේත් ඒ කාලයේ ළඟම මිතුරෙකි.

*“නංගී...”* විශාල් ඇමතුමට සම්බන්ධවූයේ ටිකක් වෙලා ගෙනය.

*“අයියේ... සොරි මේ රෑ ඔයාට ඩිස්ටර්බ් කළා නම්...”*

*“සමාධිව කිඩ්නැප් කරලා... එහෙමනේ?”* විශාල් එහාපසින් කියද්දී දෙදෙනාගේම දෑස් විසල් වූයේ පුදුමයෙනි.

*“ඔයා...”*

*“කෙත්මි... ඔයාලා තුන්දෙනා පුළුවන් තරම් ඉක්මනින් ගෙදරින් අයින් වෙන්න. හෙට උදේ වෙන්න කලින්...”*

*“මොකක්...”*

කෙත්මි කියනවාත් සමඟම පහළින් ඇසුණේ විශාල කලබලයකි. හංසිත් කෙත්මිත් මුහුණින් මුහුණ බලාගත්තේ බියපත්වය.

*“දෙයියනේ මල්ලී....”*

කෙත්මි අතේ තිබූ දුරකතනයත් අතහැර එළියට දුවද්දී හංසිත් ඇය පසුපසින්ම දුවගෙන එද්දීය.

*"එපා..."*

වේගයෙන් පඩිපෙළ බැහැගෙන ආ කෙත්මිට කෑගැසුණේ පහළ සිටි මැර පෙනුමැති මිනිහෙක් රනුක් දෙසට දිගු කරගෙන සිටි පිස්තෝලය දකිද්දීය. තවත් එවැනිම මිනිසුන් දෙදෙනෙක් රනුක්ව අල්ලාගෙන උන්නේ හෙලවෙන්නවත් බැරි ලෙසය.

*"සුදූ... ඔයාලා එන්න එපා. මට මේක බලාගන්න පුළුවන්. අතඇරපියව් යකුණේ මාව..."* රනුක් කෑගැසුවේ ඔවුන්ගෙන් මිදෙන්නට දඟලමිනි.

හදිස්සියට දුරකතනයත් අතහැරී ගිය බව සිහිවෙද්දී කෙත්මි බැලුවේ පඩිපෙළ මැදක ගල්ගැසී බලා ඉන්නා හංසි දෙසය. කෙත්මිගේ ඉඟිය තේරුම්ගත් හංසි ආපසු හැරී කාමරයට දුවන්නට වූවාය.

*"අල්ලාගනිං අරුන් දෙන්නාව..."*

පහළ සිටි එකෙක් කෑගසද්දී පඩිපෙළ දිගේ දිවගිය එකෙකු හංසිගේ කොණ්ඩයෙන් ඇදගෙන පහළට ආවේ ඇය කෑගසද්දීය.

sinhalaebooks.com

*"අත ඇරපං මිනිහෝ... ආච්...මට රිදෙනවා... මේවා යකඩ නෙමෙයි..."* හංසි කේන්තියත් බියත් එකට කැටිකර කෑගසද්දී කෙත්මි උන්නේ තවකෙකුගේ ග්‍රහණයට නතුවීය.

*"අත ඇරපං මිනිහෝ මගේ අක්කලාව... උඹලට මොනවද ඕන?"*

*"ඕනේ මෙන්න මේකිව..."*

එකෙක් මහ හඬින් සිනාසෙමින් කියද්දී කෙත්මිගේ මුව රෙදි කැබැල්ලකින් වැසී ගියේ අමුතුම සැරක් නහයට දැනෙද්දීය. ඒත් සමඟම සියල්ලම අඳුරු වී යද්දී කෙත්මිට සිහිනයෙන් මෙන් ඇසුණේ හංසිත් රනුකුත් කෑගසන හඬය.

*"සුදූ..."*

*"දෙයියනේ කෙත්මී...."*

sinhalaebooks.com

37.

සමාධි උන්නේ ඇය ඉදිරියේ සිනාසෙමින් සිටින රුව දෙස රවාගෙනය. පෙරදා දහවලේ ඇය ගෙදර යන්නට ගත් කැබ් රථය මඟින් නවතා ඇයව බලෙන්ම වාහනයකට දමාගෙන ආවේ ඇය කෑගසද්දීය. එළිවනතුරුම ඇය උන්නේ අඳුරු කාමරයකය. උදෑසන ඇයව ගෙනැවිත් මේ පුටුවේ තබා බැඳ දැම්මේ ඇයව රැගෙනා ආ පුද්ගලයෙකි.

*"අහ්... මැඩම් මටද මේ රවන්නේ?"*

ඔහු ඇසුවේ ඇය අසලට ලංව ඇයගේ මුව වසා තිබූ රෙදි පටිය පසෙකට කරමිනි.

*"මගේ මුළු ජීවිතේම විනාස කරලා දාලා... තමුන්ට තව මොනවද මගෙන් ගන්න තියෙන්නේ?"*

*"මොනවද බබා ගන්න නැත්තේ?"* ඔහු කීවේ මහ හඬින් සිනාසෙමිනි.

*"අසිත ප්ලීස්... මට යන්න දෙනවා. අයියා දැනටමත් මාව හොයනවා ඇති..."*

*"ඔව් ඔව්... අයියා පාරක් පාරක් ගානේ ගිහින් අන්න නංගිව හොයනවා."*

*"හහ්... මේ පාර නම් අයියාගෙන් බේරෙන්න හම්බෙයි කියලා හිතන්න එපා. අයියාට මාව හෙයාගන්න වැඩි වෙලාවක් යන්නේ නෑ..."*

*"මැඩම්ගේ කටේ සද්දේ නම් තාම එහෙමමයි නේද? මහලොකු අයියා මෙතනට එන්න කලින් මට මගේ වැඩ ටික ඉවරකරගන්න පුළුවන්... වස්තූ.... ඕකිවත් ගෙනෙන් මෙහාට.."*

අසිත කෑගසා කියද්දී වස්තු නමැති පුද්ගලයා දෑත් එක්කර ගැට ගසන ලද තරුණියක් ගෙනැවිත් සමාධි අසලම බිමට තල්ලු කළේ ඇය බිම ඇද වැටෙද්දීය.

*"දෙයියනේ රිතූ..."*

සමාධිට කෑගැසුණේ මළානිකව ඇද වැටුණු රිතූව අඳුනාගනිද්දීය. රිතූ අපහසුවෙන් වුණත් දෑස් හැරියේ හුරුපුරුදු කටහඬක් ඇසෙද්දීය.

sinhalaebooks.com

*"රිතූ... නංගී...."*

*"හහ්... හහ්.. හා... අන්න බලපං වස්තූ... මගේ වයිෆ්ලා දෙන්නා කොච්චර සමඟියෙන් වැඩ කරනවද කියලා..."* අසිත කීවේ මහ හඬින් සිනාසෙමිනි.

*"අසිත... තමුසෙට මොනවද ඕනේ කියනවා මිනිහෝ... ඇයි මේ ළමයව මේවට ගාවගන්නේ?"*

*"එයා නැතුව කොහොමද බබා... ඔයා එක්ස්... එයා නෙක්ස්ට්... ඔයත් දැන් දන්නවානේ ඉතිං මේ මගේ වැලිකෙළියේ පෙම්වතිය කියලා..."*

*"ෂික්... ඒ කෙල්ල පසුතැවෙනවා එහෙම වුණ එක ගැන. අපිට යන්න දෙනවා මිනිහෝ..."*

සමාධි දෑහලුවේ බැඳ දමා ඇති ලණුපොටවල් මදක් හෝ ලිහිල් කරගන්නටය. කෙත්මි බොඳවූ දෑස් අතරින් දුටුවේ ඔවුන් වෙත ඇවිද එන අසිතගේ රුවයි.

*"අ... සි...ත..."*

sinhalaebooks.com

***"අහ්... නැඟිට්ටද නෝනා මහත්තයා."***

අසිත කෙත්මිගේ කෙටි කොණ්ඩයෙන් ඇද ඇය ඉහළට ඔසවා ගත්තේ ඇයට කෑගහන්නවත් සිහියක් නොවෙද්දීය. හිස පුපුරන්නට මෙන් දැනෙන වේදනාව ඇය දරා උන්නේ අසීරුවෙනි. අසිත වියරු වැටුණු දෑස් වලින් ඇයගේ දෑස් වලටම එබුණේය.

***"මං උඹට එදාම කිව්වා... විඳවන්න ලෑස්ති වෙලා ඉඳපං කියලා... මට විරුද්ධව පොලීසිත් ගියානේ... දැන් ලෑස්ති වෙයං ජීවිත කාලෙම මං ළඟට වෙලා විඳවන්න..."***

***"අසිත... ඔය ළමයාව අතඅරින්න..."***

***"අම්මෝ අසිත... මොකද මේ සද්දේ?"***

කියාගෙන ඔවුන් සිටි කාමරය තුළට ආ රුව දකිද්දී සමාධියේ දෑස් විසල් වී ගියේ මේ සිදුවන්නේ කුමක්දැයි සිතාගන්නට බැරි වෙද්දීය.

සමාධි දෙස බලා සමච්චල් සහගත සිනහවක් පෑ ඇය ඇවිද ආවේ අසිතගේ අතකට සිරවී සිටි කෙත්මි

sinhalaebooks.com

අසලටය. කෙත්මි සිටින අයුරු දකිද්දී ඇට දැනුණේ සතුටකි.

***"අහ් මේ ඉන්නේ... මහ ලොකු මැඩම්. ආසාවෙන් බලන්න ඉන්න ඇති සංදේශ් අයියාගේ කරේ එල්ලෙන්න... දැන් ඉතිං ඔය හම්බෙලා තියෙන්නේ නියම අයිතිකාරයාව..."***

***"ආශා...!"***

***"අනේ මගේ නෑනෝ... ඔයාට මොකද මේ වුණේ?"*** ඇය ඇසුවේ උපහාසාත්මක මුවින් සමාධිට ළං වෙමිනි.

***"ආශා... තමුන්.."***

***"හා... හා... ඔය තරම් කේන්ති ගන්න එපා. ඔයාටත් ඉතිං මේ මට වඩා කොහෙවත් ඉඳන් ආපු මෙකිව ලොකු වුණානේ නේද? දැන් ඉතිං තමුන්ගෙත් අවසානේ තමයි..."*** ආශා ඇයට රහසින් මෙන් කීවේ සමාධි කේන්තියෙන් ඉවත බලාගනිද්දීය.

sinhalaebooks.com

*"වස්තු... ගිහින් අර රෙජිස්ටාර්කාරයාව එක්කන් වරෙන්... තවත් මොකටද වෙලා ගන්නේ.."*

*"ඒත් බොස් මේ කෙල්ලට තාම සිහියක් නෑ හරියට..."*

වස්තු කීවේ හරිහැටි ඇස් දෙකවත් ඇරගෙන ඉන්න බැරි කෙත්මි දෙස බලමිනි. ඒ කියන පමාවට ආශා මේසය මත තිබූ වතුර වීදුරුවක් ගෙන ඇයගේ මුහුණට හැලුවේ ඇය තිගැස්සී දෑස් හරිද්දීය.

*"ඒ මිනිහා එද්දී මෙකිට සිහිය එයි. තමුසේ ගිහින් එක්කන් එනවා..."*

*"උඹලා මොනවද කරන්න යන්නේ ඒ ගමන?"* සමාධි ඇසුවේ ගැලවෙන්නට දඟලමිනි.

*"ඔන්න ඕකිගේ කට බැඳලා දාපං ආශා.."* කී අසිත හැරුණේ කෙත්මි වෙතය.

*"පේනවා නේද... උඹේ ආදරණීය අක්කා... සංදේශ් සාක්‍ය ගුණවර්ධනගේ පණ. ඒකී පණ පිටින් ආපහු ඒකිගේ අයියා ළඟට යනවා දකින්න ඕන නම්... ලෑස්ති වෙයන් මාව කසාද බඳින්න."*

sinhalaebooks.com

*"රිතූ එපා.... අයියා ඔයාට ගොඩක් ආදරේ කරනවා නංගි... ඕකට කැමති වෙන්න එපා... මට මොනවා වුණත් කමක් නෑ... මගේ අයියා වෙනුවෙන්.. ඕක කරන්න එපා රිතූ..."* සමාධි කෑගසද්දී ආශා ඉක්මනින් ඇයගේ මුව වසා දැම්මේ කෙත්මිගේ දෑසට කඳුළු නැගෙද්දීය.

*"අ.. අක්කාට.. යන්න.. දෙනවා... මිනිහෝ..."*

*"ඒකිට යන්න දෙන්න නම් උඹ මං කියපු දේ කරපං... එතකොට ඒකිට යන්න පුළුවන්..."*

කී අසිත කෙත්මිව එතනම අතහැර පිටතට ගියේ ආශාත් සමඟිනි. බිම වැටුණු කෙත්මි දෙස සමාධි බලා උන්නේ ඇස් දෙකේ කඳුළු පුරවාගෙනය. කෙත්මි අපහසුවෙන් අපහසුවෙන් බඩගාගෙන මෙන් සමාධි අසලට ළං වූවාය.

*"අක්කී... බය වෙන්න එපා. අයියලා ඉක්මනටම අපිව හොයාගනියි."*

sinhalaebooks.com

***************

***"ෂිට්... වික්... මං උඹට කිව්වා නේද මොනවා වුණත් මැඩම්ව ගාඩ් කරපං කියලා... බලපං දැන් වෙලා තියෙන දේ..."***

සංදේශ් ගිගිරුවේ කෝපයෙන් කෙත්මිලාගේ සාලයේ එහේ මෙහේ ඇවිදිමිනි. පොලීසියෙන් පැමිණ රනුක්ගෙනුත් හංසිගෙනුත් ප්‍රකාශයක් රැගෙන ගියේ මොහොතකට පෙරය. කෙත්මිව පැහැරගෙන ගිය පිරිස සමඟ ගැටෙද්දී වැදුණ පහරකට ඔහුගේ හිස තුවාල වී තිබුණි.

සංදේශ් මෙහි එන විට ඔහු උන්නේ සිහිසුන්ව බිම වැටීය. හංසිව පුටුවක තබා ගැට ගසා තිබුණි. රනුක්ගේ තුවාල වලට රංග බෙහෙත් දමද්දී හංසි තවමත් ඉන්නේ සිදු වූයේ කුමක්දැයි සිතාගන්නට බැරිවය.

***"බොස්..."***

දුරකතන ඇමතුමක සිටි වික් දුවගෙන ආවේ රනුක් අසල සිටි සංදේශ් වෙතය.

***"කියපං..."***

sinhalaebooks.com

*"බොස්... ඉක්මනට යමු.. මට නිව්ස් එකක් ආවා..."*

සංදේශ් විකී පසුපසින්ම දිවගොස් වාහනයට නැගුණේ රනුක් රංගත් සමඟ වාහනයට නැඟෙද්දීය. හදිස්සියේම යමක් සිහිවුණාසේ හංසිත් දුවගෙන ඇවිත් රනුක්ගේ වාහනයට නැඟුණාය.

*"නංගි ඔයා..."*

රංග පසුපස අසුනට ගොඩ වුණ හංසි දෙස බැලුවේ දෑස් විසල් කරගෙනය.

*"ඉක්මනට යමු අයියේ... එයාලාව මඟ ඇරෙයි."* හංසි කෑගසද්දී රංග වාහනය පණගන්නා ගෙන විකීගේ වාහනය පසුපස යන්නට විය.

*"හංසි අක්කේ... ඔයාට කොහොමද?"* රනුක් ඇසුවේ පසුපස හැරී බලමිනි.

*"අවුලක් නෑ... අරුන් බැඳලා දාලා තිබුණ පාරවල් ටිකක් රිදෙනවා විතරයි. ෂික්... මෙවුන් කෙත්මිව කොහේ අරන් ගියාද මන්දා..."*

sinhalaebooks.com

*"සිකියුරිටි එකේ හිටපු උන් දෙන්නාවත් ඌ සල්ලිවලට අරන්...ෂිට්.. මං අක්කලාගේ පරිස්සම ගැන මීට වැඩිය හිතන්න තිබ්බා..."*

රනුක් කීවේ රිදුම් දෙන හිස එක අතකින් තද තර ගනිමිනි.

*"ඌ ප්ලෑන් කරලා ගේම ගැහුවේ.. මුලින්ම සමාධි... අපි සමාධිව හොය අතරේ ඌට රිතූ නංගිව කොටුකර ගන්න ලේසි වුණා..."*

රංග කීවේ වාහනයේ වේගය තවත් වැඩි කරමිනි.

sinhalaebooks.com

38.

වස්තු රැගෙන ආ රෙජිස්ටාර්වරයා ඉදිරියේ අසිත වාඩි වී බලා උන්නේ ආශා කෙත්මිව රැගෙන එන තුරුය. සමාධි උන්නේ ඔහු දෙස වියරු බැල්මක් හෙලාගෙනය. ඇයට අඩු තරමේ කෑ ගසන්නටවත් නොහැකිය. මේ දෙය කීයටවත් සිද්ධ වෙන්නට දෙන්න නම් බැරිය.

*'බෑ... මේක වෙන්න දෙන්න එපා. අනේ දෙයියනේ මට උදව් කරන්න... මාව ඇපේට තියාගෙන මේ තිරිසනා අර ළමයාගේ ජීවිතේ විනාස කරන්න යන්නේ... අනේ මේක වෙන්න දෙන්න එපා. එයා මගේ අයියාගේ... අනේ අපිට උදව් කරන්න.. මං දන්නවා අයියා අපිව හොයන් එනවා කියලා... එතකම්වත් මේ දේ වෙන්න දෙන්න එපා. ඒ වෙනකම් අපිව ආරක්ෂා කරලා දෙන්න'*

කෙත්මි උන්නේ සමාධිට නොදෙවෙනි තත්ත්වයකය. තමාව බැඳ දමා ඇති බැමි ආශා අතින් එක එක ලිහී යන්නේ තමාව පෝරකය වෙත ගෙන යන්නට

බව කෙත්මි හොඳින් දනී. ඇයගේ දෑසින් ගිලිහුණ කඳුලක් කම්මුල් තෙමමින් ගලා ගියේය.

පෙරදා රැයේ තමාව රැගෙන ආ පසු මල්ලීටත් හංසිටත් කුමක් වූවාද දන්නේ නැත. තවත් පැත්තකින් සමාධිය. තමා මෙයට අකමැති වන්න වන්න විඳවන්නට වෙන්නේ ඇයටය. ඇයට අනතුරක් කර තමා බේරී පලක් නැත.

***'ඒත් එහෙම කියලා මට අසිත කියන දේට කැමති වෙන්න බෑ. පණ පිටින් ජීවිතේ අපායකට ඇදලා දාන්න පුළුවන්ද? ඊට සැපයි මං මැරිලා යනවා. සමාධි අක්කිට කිසි දෙයක් වෙන්න දෙන්නත් බෑ... මං මොකද කරන්නේ? අනේ දෙයියනේ මට මේකෙන් ගැලවෙන්න මාර්ගයක් පෙන්නලා දෙන්න..'***

***"ආශා... ඔන්න ඕකිව ඉක්මනට අරං වරෙන්...."***

අසිතගේ කටහඬ ඇසෙද්දී කෙත්මි ගැස්සී ගියාය. ආශා අවසාන ලණුවත් ලිහා දමා කෙත්මිගේ වැළමිට අසලින් අල්ලා ඇයව නැඟිට්ටවා ගත්තාය.

sinhalaebooks.com

***“වරෙන් ඉතිං යන්න... තමුසෙගේ මනමාලයා ඉවසිල්ලක් නැතුව බලන් ඉන්නවා අන්න..”*** ආශා කීවේ උපහාසාත්මක හඬිනි.

ආශා කෙත්මිව බලෙන්ම ඇදගෙන යද්දී සමාධි බලා උන්නේ හඬමිනි. කෙත්මිටත් කරගන්නට දෙයක් නැත. බලෙන්ම ඇයව අසිත අසලින් වාඩි කරවා ආශා ගියේ සමාධි අසලටය. ඇය දෙස සිනාමුසුව බලා හිඳ ඇයගේ නිකට අසලින් තදින් අල්ලාගෙන හිස ඔසවා ගත්තේ සමාධි කේන්තියෙන් දෑස් ඉවතට හරවද්දීය.

***“ඉතිං මගේ නැනෝ.... ඔන්න එහෙනම් බලන් ඉන්න... ඔයාගේ නැනා කරගන්න බලන් හිටපු කෙනාව ඔයාගේ එක්ස් හස්බන්ඩ්ට අයිති වෙන්නයි යන්නේ....”***

ආශා මහහඬින් සිනාසෙද්දී මදක් ඒ දෙස බලා සිටි අසිත රෙජිස්ට්‍රාර්වරයා දෙස බලා යමක් ඉඟි කළේය. ඒ ඉඟියත් සමඟම ඔහු අසල තිබූ විශාල පොත අසිතත් කෙත්මිත් වෙත හැරවූවේය.

***“මෙන්න මෙතනින් අත්සන් කරන්න...”***

ඔහු කියන පමාවට අත්සනක් තැබූ අසිත පෑන කෙත්මි අසලට ලං කළේය.

කෙත්මි අසිත තැබූ පෑන දෙස වරක් බලා සමාධි දෙස බැලුවාය. අපහසුවෙන් වූවත් සමාධි හිස වනන්නේ 'එපා' කියන්නට බව කෙත්මි දනී. ඇය යලිත් වරක් පෑනත් පොතත් දෙස බලා සුසුමක් හෙළුවාය.

*"කොච්චර කල්පනා කළත් උඹට මගෙන් ගැලවීමක් නෑ කෙත්මි. මෙන්න මෙතනින් අත්සන් කරපං..."*

*"මට බෑ..."*

කෙත්මි කීවේ වස්තුත් රෙජිස්ට්‍රාර්වරයාත් තිගැස්සෙන තරමේ ස්ථිර හඬකිනි.

*"මොකක්ද උඹ කියන්නේ?"*

*"ඇයි කන් ඇහෙන්නේ නැද්ද? මං කිව්වේ මට බෑ කියලා..."*

*"මගෙන් මැරුම් නොකා මෙතනින් අත්සන් කරපං කෙත්මි..."*

අසිත කීවේ දත්මිටි කමිනි. ඔහු එසේ කියද්දී කෙත්මි කට කොනකට සිනහවක් නඟා ගත්තාය.

sinhalaebooks.com

*"මරන්න. කිසිම ප්‍රශ්නයක් නෑ. එතකොට කොහොමත් මගේ අම්මිගෙයි තාත්තිගෙයි දේවල් ගන්න ලැබෙන්නෙත් නෑ. ඉතිං මරපං මාව... තවත් මොනවද බලන් ඉන්නේ?"*

*"කට වහගනිං කෙත්මි..."*

අසිත ගිගිරුවේ කේන්තියෙන් කෙත්මිගේ බාහුවක් තදකර අල්ලාගනිමිනි.

*"මට උඹව මරන්න බෑ... හැබැයි අන්න අරකිව මරන්න මට පුළුවන්. මොකද කියන්නේ? ඒකිව නිදහස් කරලා යවනවද... නැද්ද කියලා තීරණය කරන්න වෙන්නේ උඹටම තමයි..."*

*"මං මේක කරත් තමුසේ සමාධි අක්කිව නිදහස් කරයිද ? හිතන් ඉන්නේ මං මෝඩයෙක් කියලද අසිත?"*

අසිත කෙත්මි දෙස මොහොතක් බලා උන්නේ කෝපයෙන් ගිනි ගන්නා දෑස්වලිනි.

*"ආශා..."*

sinhalaebooks.com

ඔහු ගිගිරුවේ කෙත්මිගේ දෑස් දෙසම එක එල්ලේ බලාගෙනය. ආශාගේ අතින් සමාධියේ මුව වසා තිබූ රෙදිකඩ ඉවත් වී ගියේ ඇසිල්ලෙනි.

කෙත්මිගේ ගෙල පාමුලින් තදින් අල්ලා ගත් අසිත ඇයව ඔවුන් දෙසට හැරවූයේ කෙත්මිගේ බෙල්ලෙන් දැඩි වේදනාවක් දැනෙද්දීය.

*"හොඳට බලන් ඉදපං එහෙනම්... ආදරණීය අක්කියාට වෙන දේ..."*

*"ම...ට.. ඕන දෙයක් වුණාවේ රිතූ. ඔයා ඕක අත්සන් කරන්න එපා. අයියා ඔයා වෙනුවෙන් බලන් ඉන්නවා... ඕක කරන්න හිතන්නවත් එපා..."*

*'චටාස්..'*

ආශාගේ අතක් වේගයෙන් සමාධියේ කොපුළක් මත පතිත වූයේ කෙත්මිගේ දෑස්වලට කඳුළු පිරෙද්දීය.

*"මොකක්ද උඹ කියන්නේ? සංදේශ් අයියා අරකී වෙනුවෙන් බලන් ඉන්නවද? හහ්... බලන්*

sinhalaebooks.com

*ඉදපං උඹට වෙන දේ...''* ආශා යළිත් වරක් අත එසවූයේ සමාධිට ගහන්නටය.

*''එපාහ්...''*

කෙත්මි කෑගැසුවද පලක් වූයේ නැත යළිත් වරක් ආශාගේ අතක් සමාධිගේ කොපුළ මත පතිත වූයේ සමාධියේ තොලක් පැලී ලේ ගලද්දීය.

*''එයාට වද දෙන්න එපා. තමුසෙගේ නංගි නේද මේ? ලැජ්ජා නැද්ද මෙහෙම කරන්න?''*

*''නංගි? නංගිනේ... පව්.. කියලා හිතන්න තිබ්බා මේකි මට අක්කා විදිහට සැලකුවා නම්.''*

*''කෙත්මී... මං මේ උඹට අවසාන වතාවට කියන්නේ... ඒකි වද විඳිනවට කැමති නැත්තම් මේක අත්සන් කරපං. ඊට පස්සේ ඒකි නිදහස්..''*

*''රිතූ එපා...''*

අසිතගේ හඬ පරයා ඇසුණේ සමාධිගේ හඬයි.

sinhalaebooks.com

*"මට බැහැ. මං මේවාට අත්සන් කරන්නේ නෑ. විහිළුවටවත් තමුන් එක්ක මේ වගේ බැඳීමක් මට ඕන නෑ."*

*"මොකක්ද තෝ කියන්නේ..."*

අසිත තදින් කෙත්මිගේ කොපුලෙන් අල්ලා ගත්තේ ඇයට රිදෙන්නටමය. නමුත් කෙත්මිගේ දෑස්වල බැල්ම ස්ථිරය.

*"හොඳයි එහෙනම්... උඹ එහෙමනේ කියන්නේ... දැන් බලන් ඉඳපං මේ අසිත කවුද කියලා..."*

කී ඔහු හැරුණේ දොර අසල සිටි මැර පාට මිනිසෙකු වෙතය. කෙත්මිට ඔහුව මතකය. හංසිගේ කොණ්ඩයෙන් ඇදගෙන පහළට ගෙන ආවේ ඔහුය.

*"ජගා... අරක ගනිං..."*

අසිත කියන පරක්කුවට ඔහු සාක්කුවෙන් ගත්තේ පුංචි පිහියකි. එහි දිලිසෙන මුවහත දකිද්දී කෙත්මිත් මදක් ගැස්සුනා කිවහොත් බොරු නොවේ. 'ජගා' නැමැත්තා එය දුන්නේ ආශා අතටය. ආශා පිහිය

අතට ගෙන වියරු සිනහවක් නංවාගෙන සමාධි වෙතට හැරුණේ කෙත්මිගේ ඇඟ සීතලවී යද්දීය.

*"කරන්න දෙයක් නෑ සමාධි... උඹත් ඉල්ලන්නෙම මේකනේ..."*

ආශා පිහියත් රැගෙන ළඟට එද්දී සමාධි මද සිනහවක් නංවාගෙන බැලුවේ කෙත්මි දෙසය.

*"කිසිම දේකට බය වෙන්න එපා නංගී. මූං මට මොන දේ කලත් ඔයා ඕක අත්සන් කරන්න එපා. අයියා ඉක්මනටම එයි."*

*"එපා....."*

ආශා පිහියේ මුවහත් පැත්ත සමාධියේ අතේ මැණික්කටුව අසලට තබද්දී කෙත්මිට කෑගැසුණි. සමාධිගේ අත පුටුවට තබා ගැටගසා ඇති නිසා ඇයට අත සොලවන්නටවත් බැරිය. කෙත්මිගේ වදන් ගණනකට නොගෙනම ආශා පිහිය සමාධිගේ අතට තද කළේ සමාධි වේදනාවෙන් දැස් වසා ගනිද්දීය.

*"එපා... ඕක කරන්න එපා. මං අත්සන් කරන්නම්... අත්සන් කරන්නම්."*

sinhalaebooks.com

කෙත්මි කෑගසා කියද්දී ආශා පිහිය අතහැරියේ මහහඬින් සිනාසෙමිනි. අසිතත් ඇයගේ සිනහවට එක් වූයේ කෙත්මි සමාධි දෙස වරක් බලා පෑන අතට ගනිද්දීය. වෙන කරන්නට දෙයක් නැත. දැනටමත් සමාධිගේ අත කැපී ලේ ගලයි.

***"රිතූ.... ඕක කරන්න එපා නංගී. මූන් මාව මැරුවත් ඕක කරන්න එපා."***

***"කටවහපන් බැ***"*** ආශාගෙන් ලැබුණ කම්මුල් පහරත් සමඟ සමාධිට දැනුණේ වටේ ඇති සියල්ල අඳුරු වී යන බවකි.

***"රිතූ...එ..පා.."*** දෑස් පියවී යන තත්පරයේත් ඇය කිව්වේ එයයි.

***"හ්ම්... ඉක්මනට අත්සන් කරපං..."***

***"එපා.."***

sinhalaebooks.com

39.

*"එපා.."*

එකරම දොර දෙසින් ඇසුණ කටහඬත් සමඟ කෙත්මි අතේ තිබූ පෑන අතහැරී ගියේ ඉබේටමය.ඇය හිස හරවා බැලුවේ කඳුළු පිරුණ දෑසිනි.

දොරෙන් ඇතුළට ආ පිරිස දකිද්දී කෙත්මිට දැනුණේ සැනසීමකි. සංදේශ් රංගනත් සමඟ රනුක්ද උන්නේය. තවත් නොදන්නා පිරිසකුත් සමඟ පොලීසියෙනුත් ඔවුන්ව වට කරගෙන සිට ගත්තේ අසිතත් ඔහුගේ පිරිසත් කිසිවක් සිතාගත නොහැකිව බලා ඉද්දීය.

***"අසිත... දැන් ඉතිං උඹේ සෙල්ලම් ඉවරයි... කරපු දේවල් සේරටම දඬුවම් විඳින්න ලෑස්ති වෙයන් දැන්..,"***

sinhalaebooks.com

සංදේශ්ගේ කතාවට මහහඬින් සිනාසුණු අසිත ඔහු අසලම සිටි කෙත්මිව තමාවෙත ඇදගෙන ඇයගේ ගෙලට පිහියක් තැබුවේ ඇයට සිතන්නටවත් ඉඩක් නොතබාය. පිහිතුඩේ සීතල ගෙට දැනෙද්දී කෙත්මිට හුස්ම ගන්නටත් අමතක වී ගියේය.

*"රිතූ..."*

*"සුදූ අක්කී..."*

රනුක් මෙන්ම සංදේශුත් කෑගසද්දී අසිත තවත් හඬින් සිනාසෙන්නට විය.

*"මෙයාව ආයේ උඹලට දෙන්නේ නෑ... අන්න ඉන්නවා උඹේ නංගී. ඒකිවත් අරන් යන දිහාක පලයං..."* අසිත දෑසින් සමාධිව දක්වද්දී රංග ඒ වෙත දුවගෙන ගියේ මඟ අහුරාගෙන සිටි ආශාව පසෙකට තල්ලු කරමිනි.

*"අසිත... හොඳ හිතින් අතඇරපං මගේ අක්කාව..."* රනුක් කීවේ ඔවුන් වෙතට පය ඔසවමිනි.

*"හා...හා.. මස්සිනා. තව අඩියක් ආවොත් අක්කා මෙතනම ඇස් දෙක පියා ගනියි."* අසිත තවත් ටිකක් පිහිය තද කරද්දී කෙත්මිට දැනුණේ වේදනාවකි.

තවත් මෙසේ ඉන්නට බැරිය. කරන දෙයක් කළ හැක්කේ තමාටම බව කෙත්මි දනී. ඇය බැලුවේ සංදේශ් දෙසය. ඔහුගේ දෑස්වල ඇත්තේද එයයි. දෑස් පියාගෙන තදින් හුස්මක් ගත් කෙත්මි නිදහස්ව තිබූ අත නවා වැලමිටින් අසිතගේ උදරය දෙසට පහරක් එල්ල කලේ උපරිම ශක්තිය යොදවාය.

*"ආහ්..."*

වේදනාත්මක හඬක් පිට කරමින් අසිත මදක් පසුපසට විසි වුනේ අතේ තිබූ පිහිය කෙත්මිගේ ගෙලේ කැපුමක්ද ඇති කරමින් ගිලිහී යද්දීය.

*"අක්කී....."*

ඔවුන් වෙත මද දුරක් පැමිණ සිටි රනුක් කෙත්මිව ඔහු වෙත ඇද ගනිද්දී කෙත්මිට දැනුණේ සියල්ලම බොඳවී යන බවකි.

***************

සමාධි දෑස් හැරියේ අපහසුවෙනි. ඇඟම තලා දැමුවාක් මෙන් වේදනාවක් දැනෙයි. අතපය සොලවන්නටවත් බැරි සෙයකි. දෑස් විවර කරද්දීම මේ ඉන්නේ රෝහලක බව තේරුම් ගන්නට ඇයට අපහසු වූයේ නැත.

*"අ...යි..යා.."*

*"පැංචි..."* සංදේශ් ඉක්මනින් ඇය වෙත ඇවිත් ඇයගේ අතකින් අල්ලාගෙන ඒ හිස අතගාන්නට වූවේය.

*"කොහොමද පැංචි ඔයාට?"*

*"ඇඟ ටිකක් රිදෙනවා..."*

*"බෙහෙත් බොද්දී අඩුවෙයි පැංචි. ඔයාට හවසට ගෙදර යන්න පුළුවන්."*

*"අයියේ..."*

sinhalaebooks.com

***"ම්..."***

***"රිතූ?"***

සමාධි අහද්දී සංදේශ් සුසුමක් හෙළා බැලුවේ රංගන දෙසය. ඔහුත් බිම බලාගත්තේ කියන්න දෙයක් නැතිවය.

***"අනේ ඇයි අයියේ? කෝ රිතූ? රංග අයියේ... ඔයාවත් කියන්නකෝ.."***

***"රිතූ ඉන්නවා පැංචි. අපි තව ටිකකින් එයාව බලන්න යමු.."***

***"එයාට තුවාලද අයියේ...? අනේ එයාට අමාරුවක් නෑ නේද?"***

***"පැංචි... රිතූට ටිකක් තුවාලයි."***

***"මට එයාව බලන්න ඕන."***

sinhalaebooks.com

*"අපි තව ටිකකින් යමු. තාම ඔයාට සිහිය ආවා විතරනේ.."*

*"අයියේ..."*

සමාධි මදක් දැඩි හඩින් කියද්දී සංදේශ්ට තවත් ඇයගේ ඉල්ලීම ඉවතලන්නට බැරිය. ඒ නිසාම වෛද්‍යවරයාගේ අවසරයත් ගෙන ඔහු සමාධිව එක්කාගෙන ආවේ කෙත්මි උන් කාමරය අසලටය.

පිටත බංකුවක වාඩි වී සිටි රනුක් උන්නේ පුටු ඇන්දට හිස බරකරගෙනය. ඔහු අසලම සිටි දිලූෂව හඳුනාගන්නට සමාධිට අපහසු වූයේ නැත. සංදේශුත් රංගත් සමඟ ඇවිද එන සමාධිව දකිද්දී දිලූෂ පුටුවෙන් නැඟිට්ටේය.

*"සමාධි නංගී... ඔයා මොකද මේ? දැන් කොහොමද ඔයාට?"* දිලූෂගේ හඩට රනුක්ද ඉක්මනින් හිස ඔසවා බැලුවේය.

*"සමාධි අක්කී... ඇයි මේ? ඔයා තව ටිකක් රෙස්ට් කරන්න එපැයි..."*

sinhalaebooks.com

*"කිව්වට අහන්නේ නෑ බං. රිතූව බලන්න ඕනලු. කියලා කියලා බැරිම තැන මේ ඩොක්ටර්ට කියලා එක්කන් ආවේ."*

සංදේශ් සමාධිත් සමඟ රෝහල් කාමරයට ඇතුළු වූයේ රංග දිලූෂලා සමඟ පිටත නවතිද්දීය. කාමරයට ඇතුළු වද්දීම සමාධි දුටුවේ කෙත්මිගේ ඇඳ අසල පුටුවට වී ඇයගේ අතකින් අල්ලාගෙන සිටින හංසිවය. ඇයට මදක් එහායින් උන්නේ කෙත්මිගේ අම්මාත් තාත්තාත්ය.

*"සමාධි අක්කී..."*

හංසි ඉක්මනින් පුටුවෙන් නැඟිට සමාධිව එතනින් වාඩි කරවූයේ සුසුමක් හෙළමිනි.

*"අනේ දරුවෝ... තාම හරියට සනීපත් නැතුව ඇයි මේ නංගිව ඇවිද්දවන්නේ?"* හසන්ති ඇසුවේ සංදේශ් දෙස බලමිනි.

*"මට ලොකු අමාරුවක් නෑ ආන්ටි. මමයි අයියට කිව්වේ නංගිව බලන්න ඕන කියලා."* සමාධි කීවෙ කෙත්මිගේ අතකින් අල්ලාගෙනය

sinhalaebooks.com

කෙත්මි තවමත් දෑස් පියාගෙනය. ඇයගේ ගෙලෙත් නළලෙත් වෙළුම්පටි යොදා ඇත. සමාධි ඇය දෙසම බලා ඉද්දී සංදේශ් හැරුණේ කෙත්මිගේ පියා වෙතය.

*"ඩොක්ටර් ආවද ජගත් අංකල්?"*

*"ඔව් පුතා. හවස් වෙද්දී නම් සිහිය එයි කිව්වා. ගැඹුරට තුවාල නැති නිසා සිහිය ආවට පස්සේ බලලා ඩිස්චාර්ජ් කරමු කියලා කිව්වේ.."*

ජගත් කියද්දී සංදේශ් කෙත්මි දෙස බලා සුසුමක් හෙළුවේය.

*"පැංචි... අපි දැන් යමුද? මං දැන් අංකල් එක්ක පොලීසියට ගිහින් එන්නත් ඕන."* සංදේශ් ඇසුවේ ඔරලෝසුව දෙසත් වරක් බලමිනි.

*"අනේ අයියේ... මං නංගි ළඟ තව ටිකක් ඉන්නම්..."*

*"දුව හිටියාවේ පුතා. අපේ දිලූෂයි හංසියි දෙන්නත් ඉන්නවානේ. අපි ගිහින් එමු."* කී ජගත්

sinhalaebooks.com

සමාධිගේ හිසත් අතගාගෙනම එළියට ආවේ සංදේශ්ද ඔහු පසුපසින්ම එද්දීය.

*"චූටි පුතා... යමු එහෙනම් පොලීසියට ගිහින් එන්න."*

*"යමු තාත්තේ."*

*"දිලූෂ පුතා. ඔයා පොඩ්ඩක් මෙතන ඉන්න. සමාධි දුවත් ඉන්නවානේ."*

*"හරි බාප්පේ..."*

*"අපි හතර දෙනා යමු එහෙනම් ගිහින් එන්න."*

*"දිලූෂ.. තව ටිකකින් හංසියා එක්ක අපේ පැංචිව රූම් එකට එක්කන් යන්න හොදේ"*

sinhalaebooks.com

*“හරි හරි බං… මං නංගිව බලන්නම්. බය නැතුව ඔය ගමන ගිහින් වරෙන්. බාප්පේ… පොලීසියෙදි කලබල කරන්න එපා.”*

*“කලබල නොකර කොහොමද දිලූෂ? අර ඇඳ උඩ සිහිය නැතිව වැටිලා ඉන්නේ අපේ පණ.”* ජගත් කීවේ බිඳුණ හඬිනි.

*“තාත්තී…”* රනුක් ඔහුගේ උරහිසට අතක් තැබුවේ ඔහුගේ වේදනාව හොඳින්ම දැනෙද්දීය.

*“අපි යමු අංකල්. කොහොමත් උඹට මේ පාර නම් ගැලවීමක් නෑ…”* කියූ සංදේශ් ඉස්සර වූයේ අනෙක් තිදෙනා ඔවුන් පසුපස යද්දීය. ඔවුන් යන දෙසම බලා සිටි දිලූෂ ඇතුළට ගියේය.

sinhalaebooks.com

40.

කෙත්මිට සිහිය ආවේ පසු දින පාන්දරය. රෑ එළිවන තුරුම ඇය අසල සිටි අම්මාත් තාත්තාත් ගෙදර ගොස් එන්නට ගියේ ඇය අසල හංසි නවතිද්දීය. සිහිය ආ පසු නැවතත් නින්ද යන්නට බෙහෙත් දුන් නිසා කෙත්මි පැය දෙක තුනක නින්දකට වැටී සිට අවදි වූවාය.

*"කෙත්මියෝ..."* හංසි කතා කළේ ඇයගේ අතක් සියුම්ව පිරිමදිමිනි.

*"හංසි... අම්මලා කෝ..?"*

*"අම්මලා ගෙදර ගිහින් එන්න ගියා කෙල්ලේ... තව ටිකකින් එයි. උඹට දැන් කොහොමද?"*

*"ප්‍රශ්නයක් නෑ හංසි... සමාධි අක්කී?"*

sinhalaebooks.com

කෙත්මි ඇසුවේ ඇයට ඒ මොහොතේ කුමක් වන්නට ඇතිදැයි සිහිකරමිනි. අවසානයට ඇයව දකිද්දීත් ඇය උන්නේ තුවාල වී අඩපණව ගොසිනි.

*"තව ටිකකින් එයි දුවගෙන. ඊයෙත් රෑ වෙනකම් ඉඳලා ඩොක්ටර්ගෙන් බැනුම් අහලා රූම් එකට ගියේ..."*

*"එයාට ප්‍රශ්නයක් නෑ නේද?"*

*"නෑ කෙල්ලේ... පොඩි පොඩි තුවාල ටිකක් තියෙනවා. අද උදේට ඩිස්චාර්ජ් කරනවා කිව්වලු. උඹට නම් හවස් වෙනකම් ඉන්න වෙයි. රිපෝට්ස් එනකම්..."*

කෙත්මි අපහසුවෙන් හිස වැණුවේ බෙල්ලට දමා ඇති කොළරය නිසාය. අසිත බෙල්ලෙන් අල්ලා හැරවූ මොහොතේ දැනුණ වේදනාව ඇයට තවමත් මතකය.

*"එදා උඹට කරදරයක් වුණේ නෑ නේද හංසියෝ...? මල්ලීට.."*

***"නෑ... නෑ... අපි දෙන්නටම මොකුත් නෑ. උන් ආවේ අපිට කරදර කරන්න නෙමෙයි උඹව අරන් යන්න... දැන් හරිනේ.. අන්න සේරමලා ඉන්නවා කූඩුවේ."***

හංසි කියද්දී කෙත්මිට සුසුමක් හෙළුණි. තමා අවුරුදු ගානක් තිස්සේ පණ දීගෙන ආදරය කළේ එවැනි නරුමයෙකුට ද?

ඔවුන් කතා කරමින් සිටිද්දී කාමරයේ දොරත් ඇරගෙන ඇතුළට ආවේ සංදේශුත් දිලූෂත්ය. කෙත්මි ඔවුන් දෙදෙනා දෙස බලා සිනහවක් පෑවාය. දිලූෂ පැමිණ ඇයගේ හිස අතගාද්දී සංදේශ් මදක් එහායින් නතර වී උන්නේය.

***"දැන් කොහොමද සුදූ?"***

***"ප්‍රශ්නයක් නෑ ටොම්යෝ... බෙල්ල චුට්ටක් රිදෙනවා..."*** ඇය කීවේ සිහින් සිනහවක් නඟාගෙනය.

***"සංදේශ් අයියලා තව ටිකක් පරක්කු වුණානම් අරූ උඹේ බෙල්ල ගලවලා... ඇයි බං උඹ මේවා යකඩින් හදපුවා කියලා හිතාගෙනද දන්නේ නෑ එහෙට මෙහෙට කැරකුවේ.."***

sinhalaebooks.com

හංසි කෙත්මිගේ ගෙලට අතක් තියාගෙන කිව්වේ කේන්තියෙනි. සංදේශ්ගේ දෑස් තුළ වූයේ හංසිටත් වැඩි කේන්තියකි.

*“හංසි..”*

*“උඹට ආයේ තමුසෙට අතක්වත් තියන්න අපි ඉඩ තියන්නේ නෑ සුදූ... දැන් ඒ දේවල් ගැන ආයේ හිතන්න එපා. දැන් සේරම ඉවරයි.”* දිලූෂ කීවේ සංදේශ් දෙසද බලමිනි.

*“හංසි නංගි... සමාධිව ඩිස්චාර්ජ් කළා. එයාගේ අත නිසා ඇඳුමක් මාරු කරගන්න ටිකක් අමාරුයි. තරහා නැතුව ටිකක් බලලා එයාවත් මෙතනට එක්කන් එන්න පුළුවන්ද?”*

සංදේශ් ඇසුවේ අසරණ හඬිනි. ඇය වෙනුවෙන් ඒ දේවල් කරන්නට තමාට බැරිය. අම්මා නැති අඩුව තදින්ම දැනෙන්නේ මේ වෙලාවටය.

*“අනේ කලින් කියන්න එපැයි ඉතිං... මං ඉක්මනට යන්නම්. ඔයත් යමු...”*

sinhalaebooks.com

කියමින් හංසි දිලූෂගේ අතකින් ඇදගෙනම රෝහල් කාමරයෙන් පිටතට ආවේ කෙත්මිවත් සංදේශ්වත් එහි තනි කරමිනි.

හංසිලා ගිය පසු කෙත්මි සංදේශ් දෙස බැලුවේ දුක්බරවය. සමාධිට ආ කරදරත් සමඟ අම්මා කල්පනා කරමින්ම සිට අසනීප වී මියගිය බව කෙත්මිට කීවේ රනුක්ය.

*"දුක් වෙන්න එපා අයියේ.. සමාධි අක්කිගේ ඕන දේකට මායි හංසියි අපේ අම්මියි ඉන්නවා. ඔයාලා දෙන්නා තනි වෙලා නෑ..."* කෙත්මි කියද්දී මද සිනහවක් පෑ සංදේශ් ඇය අසලටම පැමිණ ඇයගේ හිස මතින් අතක් තැබුවේය.

*"තැන්ක්ස් රිතූ. දැන් ඔයාට කොහොමද? සොරි අපි එතනට එන්න පරක්කු වුණා. අර බ** ඔයාටයි මගේ පැංචිටයි ගොඩක් වද දීලා.."* ඔහු කීවේ පසුතැවිලි වන ස්වරයෙනි. ඒ දෑස් තිබුණේ කොළරයෙන් වැසුණ කෙත්මිගේ ගෙල වෙතය.

*"එහෙම හිතන්න එපා අයියේ... ඔයාලා ආවේ හරිම වෙලාවට. තව ටිකක් පරක්කු වුණා නම්..."*

sinhalaebooks.com

කෙත්මි කියන්නට ගිය දෙය නතර කර සුසුමක් හෙළුවාය. ඔවුන් තව ටිකක් පමා වූවා නම් සියල්ලම අසිතට වුවමනා විදිහටම සිදුවන්නට ඉඩ තිබුණි. සංදේශ් කෙත්මිගේ කම්මුලක් වැසී යන පරිදි ඔහුගේ සුරත තබා කම්මුල සියුම්ව පිරිමැද්දේ කෙත්මි සීතල වී යද්දීය.

*"මේ කම්මුල් දෙකේ උගේ ඇඟිලි පාරවල්... මං.. මගේ ඇස් දෙකෙන්ම දැක්කා රිතූ... අර ආශා කියන බැ** එක්ක එකතු වෙලා ඌ ඔය දෙන්නට වද දෙනකම් මට මුකුත් කරගන්න බැරි වුණා..."* සංදේශ් කියද්දී කෙත්මි ඔහුගේ අත මෘදුව අල්ලාගෙන ඔහුගේ දෑසට එබුණාය.

*"දැන් ඒ දේවල් ඉවරයි අයියේ... ඒක නරක හීනයක්... එදා වගේම අදත්... මං ඔයාට පිං දෙනවා මාව ඒ නරුමයාගෙන් ගලවා ගත්තට. ඒ වගේම මට සමාවෙන්න..."* කෙත්මි කීවේ ඇස් දෙකට කඳුළු පිරෙද්දීය.

*"ෂ්... ඇයි මේ අඬන්නේ? අනිත් එක සමාවෙන්න කියන්නේ ඇයි රිතූ... ඔයා වරදක් කරලා නෑ."* සංදේශ් කීවේ ඇයගේ කඳුළු පිසදමමිනි.

*"නෑ අයියේ... මට ඔයාගෙන් සමාව ඉල්ලන්න දෙන්න. අවුරුදු තුනකට කලින් වගේම අදත්... සමාධි අක්කිට මේ දේවල් වුණේ මං නිසා. උන් එයාට මට වඩා කරදර කළා අයියේ.."*

*"රිතූ... එහෙම දෙයක්..."*

සංදේශ් කියන්නට ආ දෙය නතර වූයේ එකවරම කාමරය තුළට ආ රනුක්ව දකිද්දීය. ඇස් දෙකේ කඳුළු පුරවාගෙන සංදේශ් දෙස බලා සිටින සොයුරියත්.. ඇයගේ කොපුලක් මත තවමත් ඇති ඔහුගේ සුරතත් දකිද්දී තමා ආවේ වැරදි වෙලාවක බව රනුක්ට තේරුම්යන්නට වැඩි වෙලාවක් නොගියේය.

*"ස්.. සොරි... මං එළියෙන් ඉන්නම්.."*

*"මල්ලී..."*

කෙත්මි කතා කරන විටත් රනුක් කාමරයෙන් පිටවී ගොස් අවසන්ය.

*"මං ගිහින් කතා කරන් එන්නම්. අර කලින් කිව්ව කිසිම දෙයක් ඔයා නිසා සිද්ධ වුණ දේවල් නෙමෙයි රිතූ. ඒක එයාගේ දෛවය. ඔයාගේ වරදක් නෑ... ඒක හොඳට මතක තියාගන්න."*

sinhalaebooks.com

කියා කෙත්මිගේ හිස අතගාගෙනම ඔහු පිටතට ගියේ රනුක්ව එක්කන් එන්නටය.

තවත් ටික වෙලාවක් යද්දී රනුක් පමණක් නොව සමාධිත් හංසිත් සංදේශුත් දිලූෂත් තරුදිත් උන්නේ කාමරය ඇතුළේ කතාබහ කරමිනි. සමාධි නම් උන්නේ කෙත්මිගේ අතක් අල්ලාගෙන ඇයගේ හිස අතගාමිනි.

*"මොනවා නැතත් අපේ අක්කි වාසනාවන්තයි තරූ.."* රනුක් කීවේ සියල්ලන්ටම ඇසෙන්නටය.

*"ඒ මොකද?"*

*"නෑ ඉතිං.. බලන්නකෝ එයාගේ නෑනා එයාට කොච්චර ආදරේද කියලා... සිහිය ආපු ගමනුත් දුවගෙන ආවේ මෙයාව බලන්නනේ..."*

රනුක් කියද්දී කෙත්මිට දැනුණ ලැජ්ජාව නිසාම ඇය බිම බලා ගත්තාය.

*"නෑනා නෙමෙයි. රිතූ මගේ නංගි... දැක්ක දවසේ ඉදන් මං මෙයාට ආදරෙයි."* සමාධි කීවේ රනුක්ට රවමිනි.

sinhalaebooks.com

*"හරි හරි.. කෙත්මියෝ මේ.. අම්මා මල්ලි අතේ සුප් එකක් එවලා. මේක බීලා ඉමු. දවස් දෙකකින් හරියට කෑමක් නෑනේ."*

හංසි කීවේ මේසය මත තිබූ සුප් බඳුන අතට ගනිමිනි. නමුත් 'සුප්' කියද්දී කෙත්මිගේ කට ඇදවී යනු සියල්ලන්ටම පෙනුණි. කවදත් කෙත්මි සුප් බොන්නට අකමැති බව රනුක් මෙන්ම හංසිත් දනී.

*"කට ඇද කළාට වැඩක් නෑ සුදූ අක්කි. ඕක නම් බොන්න වෙනවා... කිව්වත් වගේ ඊයේ දවසම සේලයින් වලින්නේ හිටියේ.."*

*"අනේ.. වෙන මොනවා හරි... සුප් එපා..."* කෙත්මි කටත් ඇදකරගෙන කියද්දී හංසි සුප් කෝප්පයත් අතේ තියාගෙන ඇයට රැව්වාය.

*"හංසි.. ඩොක්ට මෙයාට වෙන දේවල් දෙන්න එපා කිව්වද?"*

සංදේශ් ඇසුවේ බෙරි වූ මුහුණ දෙස බලාගෙන අපහසුවෙන් සිනහව වළකාගෙනය.

sinhalaebooks.com

*"එහෙම නම් කිව්වේ නෑ අයියේ... එකපාර ලොකු දේවල් දෙන්න එපා කියලා කිව්වේ..."*

*"ආ එහෙනම්. සුප් බොන්න එපා. මේක කන්න රිතූ.."* සංදේශ් එද්දී රැගෙන ආ බෑගය ඔහු හංසි අත තැබුවේ ඇයට කවන්න යැයි ඉඟි කරමිනි.

*"මේ මොනවද?"*

කියමින් කවරය දිගහැර බැලූ හංසිට එහි වූ දේවල් දකිද්දී නැඟුණේ අපූරු සිනහවකි. සැන්ඩ්විච්චර්ස් සමඟ ස්ට්‍රෝබෙරි රසැති කිරි එක එළියට ගනිද්දී රනුක්ට මෙන්ම දිලූෂටත් සිනහවක් නැඟුණි. කෙත්මි නම් බිම බලා ගත්තේ එදා ඔහුත් සමඟ සැන්ඩ්විච්චර්ස් කෑ හැටි සිහිවෙද්දීය.

*"මස්සිනා සීඝ්‍රයෙන් ලකුණු රැස්කරමින් සිටින බවක් මට පෙනී යනවා.."* රනුක් කිව්වේ සියල්ලන් සිනහා ගස්වමිනි.

*"හරි.. හරි.. හංසි ඕක ටික ටික සුදූට කවන්න එහෙනම්. මං ගෙදර ගිහින් පුංචිලා එක්ක එන්නම්.."* කී දිලූෂ යන්නට හැරුණේය.

sinhalaebooks.com

*"මාත් තරුව ඔෆිස් එකට දාලා එන්නම්. හංසියෝ... අපේ අම්මි හදපු සුප් එක දැන් උඹවත් බීහං.. බලපංකෝ ඇගේ හැටි උඹේ.. මැස්සො බීලා වගේ..."* කී රනුක් එළියට දිව්වේ හංසි තවත් යමක් කියන්නට පෙරය.

sinhalaebooks.com

41.

කෙත්මිගේත් සමාධිගේත් සාක්ෂිත් පෙර ඔහුට විරුද්ධව ගොනුකර තිබූ පැමිණිලිත් නිසා අසිතට ගැලවීමක් නොවීය. වසර පහළොවකට ඔහු සිරගත වෙද්දී ඔහුට අනුබල දීමේ වරදට ආශාට වසර පහක සිර දඬුවමක් නියම විය.

උසාවියේ සිට දිලූෂත් රංගත් ඔෆිස් එකට යද්දී අනෙක් සියල්ලන්ම පැමිණියේ කෙත්මිලාගේ කොළඹ නිවසටය. සියල්ලන්ම සාලයේ පුටුවලට බරවූයේ සැනසීමෙනි. කාටත් වඩා ඒ සැනසීම කෙත්මිගේ මුහුණේ පෙනෙන්නට තිබුණි. හසන්ති හංසිවත් අඩගසාගෙන කුස්සියට ගියේ කට්ටියටම බොන්න දෙයක් හදන්නටය.

***"පෙනේද ඉතිං... අපේ අම්මිටත් එයාගේ දුව වෙලා තියෙන්නේ හංසියා.. තාත්තී.. මට ඇත්තම කියන්න. ඔයාලා මෙයාව කොහේ කුණු කාණුවෙන්ද ගෙනාවේ..?"***

රනුක් ජගත් අසලට ලංවී කියද්දී කෙත්මි පුටුවේ කුෂන් එකක් ගෙන ඔහුට දමාගැසුවේ සංදේශුත් සමාධිත් සිනාසෙද්දීය.

sinhalaebooks.com

*"ඇති යන්තම් ඒ ප්‍රශ්නේ නම් ඉවරයක් වුණා..."* කෙත්මි කීවේ සමාධිගේ උරහිසට හිස බර කරගනිමිනි.

*"එහෙම කොහොමද ඉවරයක් වෙන්නේ?"*

එකවරම දොර දෙසින් ඇසුණ හඬට සියල්ලන් හිස හරවා බැලුවේ එකවරමය.

*"රමණී ආන්ටී.."*

රනුක් මිමිණුවේ සමාධිගේ මුහුණ සුදුමැලි වී යද්දීය. ඇයත් සමඟ සිටි අවුරුද්දට ඇය කුමන ආකාරයේ ගැහැණියක්දැයි සමාධි තේරුම් ගෙන උන්නාය. අසිතගේ හැම වැඩකටම උල්පන්දම් දෙන්නේ ඇයයි.

*"රමණී.."*

ජගත් කීවේ වාඩි වී සිටි පුටුවෙන් නැඟිටිමිණි.

*"ඔව්.. රමණී තමයි. මගේ කොල්ලාව හිරේට යවලා උඹලට දැන් සතුටු ඇති... උඹලා සේරම*

sinhalaebooks.com

*එකතු වෙලා මගේ එකාව විනාස කළා..”* ඇය කීවේ සමාධි දෙසත් වියරු බැල්මක් හෙළමිනි.

*“මේ ළමයි කවුරුවත් තමුන්ගේ එකාව විනාස කළේ නෑ රමණී. ඌම තමයි විනාස වුණේ?”*

*“හහ්... කලින්ම පුතා ගෙනාපු යෝජනාවට කැමති වුණා නම් මේ දේවල් මෙහෙම වෙන්නේ නෑ...”*

ඇයගේ කතාවට ජගත්ගේ අතක් මිට මෙළවුණේ කේන්තියෙනි. කෙත්මි ඉක්මනින් ඔහුගේ අතේ එල්ලුණේ වෙන්නට යන්නේ එතරම් හොඳ දෙයක් නොවෙන බව දැනීය.

*“මං තමුන්ට එදත් කිව්වා රමණී... මේ ඉන්නේ අපේ පණ. මගේ දරුවාව ඒ වගේ එකෙක්ට දෙන්න තරම් අපට අහේනියක් වෙලා නෑ...”*

*“ඒ වුණාට මේ ළමයි ආදරේ කළා.. මෙන්න මෙකි මැදට පැනලා මේ සේරම විනාස කළා..”* රමණී කීවේ සමාධි වෙතට හැරෙමිනි.

sinhalaebooks.com

*"මේ ආන්ටි.. සමාධි අක්කා කිසිම දෙයක් කළේ නෑ. ඔයා කියන විදිහට සමාධි අක්කි මැදට පැන්නේ නැත්තං... ඔයාලාගේ ළඟ හිර වෙලා දස දුක් විඳලා දික්කසාද වෙලා ගෙදර එන්න වෙන්නේ මට... මට ගෙවන්න තිබ්බ පවක් සමාධි අක්කිගේ පිටින් ගියේ.."*

කෙත්මි ඉදිරියට එමින් කීවේ සමාධි ඇස්වල කඳුළු පුරවාගෙන සංදේශ්ගේ අතක එල්ලෙද්දීය.

*"ඔය ජේනවානේ.. මූන් ඔයාලාගේ ඔලුවලට විසබීජ පුරවලා... උන්ගේ වැරදි වහගන්න අපිව අල්ලනවා.."*

*"රමණී... දැන් ඇති. ඇත්ත මොකක්ද බොරුව මොකක්ද කියලා මං හොඳට දන්නවා... කරුණාකරලා ආපු විදිහටම එළියට බැහැලා ගියොත් හොඳයි පොලීසියට කතා කරන්න කලින්..."*

*"කොහොමත් මං මෙතන බින්න බහින්න ආවේ නෑ... හැබැයි එකක් මතක තියා ගනිල්ලා.. උඹලා සේරම එකතු වෙලා මගේ කොල්ලට කරපු අපරාදෙට උඹලට හෙණ ගහණවා.."*

sinhalaebooks.com

*"මේ ආන්ටී... වැරදි කරපු අයට කොහොමත් හෙණ වදියි. ඔයත් පරිස්සමින් ඉන්න... මේ දවස්වල නිතරම වැස්සනේ.."*

රනුක් කියූ කතාව වැටහුණු සංදේශ් දෙතොල් තදකර ගත්තේ සිනහව වළකාගන්නටය. තවත් මොන මොනවාදෝ කියමින් පිටවී යන රමණී දෙස බලා සුසුමක් හෙළූ ජගත් පුටුවට බරවූවේය.

*"වැහැලා පැච්චා වගේ ජගත්.."*

මෙතෙක් වෙලා කුස්සියේ සිටි හසන්ති බීම වීදුරු ටිකත් ගෙන හංසිත් සමඟ ආවේ එසේ කියමිනි.

*"ගෑණිට දැන් කාලා ඉන්න බැරුව ඇති. උන් බැලුවේ සුදූව කොහොම හරි අර නොසන්ඩාලයට බන්දලා දීලා මේ දේපළ අයිතිකර ගන්න.."*

*"මට සමාවෙන්න තාත්තී.."*

කෙත්මි කීවේ ඔහුගේ බාහුවකට හිස බර කර ගනිමිනි.

*"ඒ මොන එහෙකටද සුදූ...?"*

sinhalaebooks.com

*"මං ඒ මිනිහාට දවසක් හරි ආදරේ කරපු නිසයි මේ සේරම ප්‍රශ්න."*

*"පිස්සුද ළමයෝ... ඔය විකාර හිතන්න එපා. ඔයා කිසිම වැරැද්දක් කරලා නෑ.."*

ජගත් කීවේ ඇයගේ හිස අතගාමිනි.

*"ජගත්... මේ දේවල් අමතක වෙන්නත් එක්ක අපි කට්ටියම කොහේ හරි ඇවිදින්න යමුද?"*

*"ෂා... අම්මිටත් මාර ප්‍රගතිශීලී අදහස්නේ එන්නේ..."* රනුක් කීවේ ඇය කී දෙය අසා කෙත්මිගේත් හංසිගේත් මුහුණුවලට ආ සිනහව දෙස බලාගෙනය.

*"ඒක නම් හොඳයි තමයි හසා. සංදේශ් පුතා මොකද කියන්නේ..."*

*"යමු අංකල්.. මටත් හිතෙනවා ඒක හොඳයි කියලා. ටිකක් රිලැක්ස් වෙන්නත් එක්ක."*

සංදේශ් කීවේ සිනාසෙමිනි. කාලයකින් එහෙම ගමනක් යන්නට ඉඩක් ලැබුණේ නැත.

sinhalaebooks.com

*"කොහෙද යන්නේ ඉතිං අපි?"*

රනුක් ඇසුවේ බීම වීදුරුවකුත් කේක් කැබැල්ලකුත් අතට ගනිමිනි.

*"මං කියන්නද... මං දන්න ලස්සන තැනක් තියෙනවා. අයිතිකාරයා කැමති නම් අපිට යන්න පුළුවන්.."* කෙත්මි කීවේ සංදේශ් දෙස හොර බැල්මක් හෙලමිනි.

*"ඒ ගමන මෙයා දාපු බැල්ම නම් මට ඇල්ලුවේ නෑ අම්මා... කියනවාකෝ බලන්න. කොහොමත් තාත්තී යන්නේ තමුසේ කැමති දිහාක තමයි අක්කා.."*

රනුක් අසද්දී කෙත්මි යළිත් වරක් සංදේශ් දෙස බැලුවේ සංදේශ් දෑස් කුඩාකර ඇය දෙස බලද්දීය. හංසිට නම් සිනහවක් නැඟුනේ කෙත්මි මේ කියන්නට යන දේ තේරුම් ගිය නිසාය.

"නෑ තාත්තී... මේ සමාධි අක්කලාගේ... ලස්සන බංග්ලෝ එකක්... තියෙනවා.. නුවරඑළියේ.."

කෙත්මි පටලවමින් කියද්දී රනුක් හා හංසි පහක් දමමින් මහහඬින් සිනාසෙන්නට විය. සංදේශ්ගේ මුවේද ඇඳුණේ අපූරු සිනහවකි.

*“මට නිකමට හිතුණා.. සංදේශ් අයියා දිහාට හොර බැල්මක් දාද්දී..”*

*“හැබැයි ඒ අදහස හොඳයි කියලා මටත් හිතෙනවා. මොකද කියන්නේ අයියා?”* සමාධි කීවේ සංදේශ් දෙස බලමිනි.

*“අංකලුයි ආන්ටියි කැමතියි නම් යමු. ඕකේ ආයේ අහන්න දෙයක් තියෙනවායැ..”*

*“එහෙනම් හරි. මේ වීක්එන්ඩ් එකේ මං ගමන ලෑස්ති කරන්නම්කෝ. අපි කට්ටියයි.. සංදේශ් පුතාගේ යාළුවයි දිලූෂයිනේ යන්න ඉන්නේ..”*

ජගත් කියද්දී රනුක් බැලුවේ කෙත්මි දෙසය. ඇයත් බලා උන්නේ ඔහු දෙසය. ඔහු දෑසින් ඉඟිබිඟි පා කියන දේ කෙත්මිට වටහාගන්නට අපහසු නැත. කෙත්මි හංසි දෙස බලා සිනහවක් නැගුවාය.

*“තාත්තී... තව කෙනෙක් ඉන්නවා.”*

***"තව කවුද සුදූ?"*** හංසන්ති ඇසුවේ පුදුමයෙනි.

***"අපේ ඔෆිස් එකේ හංසිගෙයි මගෙයි ළඟම යාළුවා. තරුදි... අපි එයාවත් එක්කන් යමු. එයාව දාලා අපි දෙන්නා ගියොත් ඒ ළමයට දුක හිතෙයිනේ.."***

කෙත්මි කියද්දී සංදේශ් ඉවත බලාගෙන සිනාසුණේ මේ අක්කලා මල්ලිලාගේ බොරුවලටය.

***"ඔය කියන්නේ අර සුදූව බලන්න හොස්පිටල් එකට ආපු ළමයානේ... හරි හරි... ඒක ප්‍රශ්නයක් නෑ. එන්න කියමු."***

***"ඒකත් හරි එහෙනම්... මේ කෙත්මියෝ.. අපිට පොඩි ෂොපින් පාරක් දාන්න වෙයි නේද යන්න කලින්? සමාධි අක්කී.. මොකද කියන්නේ?"***

***"ඇත්ත තමයි හංසි. ළඟදි අපි ෂොපින් ගියෙත් නැනේ. අම්මී.. ඔයත් එනවද?"***

කෙත්මි අසද්දී රනුක් සංදේශ් දෙස බලා ඉඟි කලේ ඔහුත් ජගතුත් සිනාසෙද්දීය.

sinhalaebooks.com

*"මං ඒත් බැලුවා මොකද පරක්කු කියලා... හෙට එහෙනම් අම්මලා දූවලා කට්ටියම ගිහින් ඇති තරම් ෂොපින් කරගෙන එන එකයි ඇත්තේ.. නේද සංදේශ් පුතා.."* ජගත් සිනහව මැද්දෙන්ම කීවේය.

*"යමුකෝ එහෙනම්... ඒත් මේ ගෑණු ළමයි එක්ක මට තනියම යන්න බෑනේ ජගත්.. චූටි පුතාවත් එක්කන් යන්නම්.."*

*"ඔය කළේ ඉතිං... ඒ කියන්නේ මගේ හෙට දවසම රෙදි කඩවල් අස්සේ ගෑණුන්ගේ විගඩං දිහා බලාගෙන ගත කරන්න වෙනවා..."*

රනුක් කීවේ සියල්ලන් සිනහා ගස්වමිනි.

sinhalaebooks.com

42.

*"කෙත්මියෝ... මේ..."*

හංසි හෙමිහිට ඇඳුම් තෝරමින් සිටින කෙත්මි අසලට ලං වූයේ අනිත් අයට නොපෙනෙන්නටය. සමාධිත් තරුදිත් උන්නේ මදක් ඈතිනි. අම්මා රනුක් සමඟ උඩට ගියේ රනුක්ටත් තාත්තාටත් ඇඳුම් තෝරන් එන්නටය.

*"මොකෝ බං? මේ... මට නම් දැන් ඇති බං... තෝරනවා තෝරනවා ඉවරයක් නෑනේ..."* කෙත්මි කීවේ මුහුණත් ඇද කරගෙනය. දැන් පැය දෙක තුනක් තිස්සේ රෙදි කඩවල රවුම් ගසා ඇයට දැනුණේ වෙහෙසකි.

*"මේ අහපංකෝ..."*

*"මොකක්ද?"*

sinhalaebooks.com

*"එකපාර බලන්න එපා හරිද..."*

*"කෝ... මොනවද?"* කියමින් කෙත්මි වටපිට බලද්දී හංසි ඇයගේ අතක් කෙනිත්තුවේ රිදෙන්නටම.

*"ආව්... මොකද යකින්නියේ.."*

*"ඇයි බං ඊරියේ... බලන්න එපා කිව්වම යස අගේට බෙල්ල කරකවලා බලන්නේ? පිස්සුද බොට?"*

*"හරි හරි... බලන්නේ නෑ. කියපංකෝ.."*

*"මං දැන් අපි ගියපු ෂොප්ස් තුනේදිම දැක්කා බං... කවුද මන්දා හයේ හතරේ ඩයල් එකක් උඹේ දිහාම බලන් ඉන්නවා.."*

*"ඇහ්...?"*

sinhalaebooks.com

හංසිගේ කතාව නිසා මදක් කලබලයෙන් කෙත්මි වටපිට බලන්නට වූවාය.

*"නටන්නේ නැතුව ඉදපං බං..."*

*"කෝ හංසී... කවුද? මං දැක්කේ නැනේ... අසිතගේ මිනිහෙක්වත්ද දන්නේ නෑ..."*

*"ඕකනේ ඉතිං බැරි... උඹ ඔහොම කලබල වෙන්න එපා. ඉදපංකෝ මල්ලිට කෝල් එකක් දීලා ගෙන්න ගමු."* කියමින් හංසි දුරකතනය අතට ගත්තාය.

*"ඔයාලා දෙන්නා ඔතන මොනවද කුටු කුටු ගාන්නේ..."* කියාගෙන ඔවුන් අසලට ආවේ සමාධිත් තරුදිත්ය. කෙත්මිගේ මුහුණ දකිද්දීම සමාධි ඇයගේ වෙනස හඳුනාගත්තාය.

*"ඇයි රිතූ මේ... ඔයා බය වෙලා වගේනේ ළමයෝ... මොකද වුණේ?"*

sinhalaebooks.com

*"සමාධි අක්කී... කවුද මන්දා මනුස්සයෙක් දැන් සෑහෙන වෙලාවක ඉඳන් අපේ කෙත්මිව ෆලෝ කරනවා.."* හංසි රහසින් මෙන් කීවේ සමාධිගේත් තරුදිගේත් දෑස් විසල් වෙද්දීය.

*"කෝ... කවුද?"*

*"අන්න අර රෝස පාට සාරි එක අන්දලා තියෙන ඩමි එක ළඟ ඉන්නේ..."*

හංසි කියද්දී තිදෙනාම එකවර ඒ දෙස බැලුවේ විමසිල්ලෙනි. ඒ රුවේ මද හුරුපුරුදු බවක් දුටු සමාධි අඩියක් දෙකක් ඉදිරියට තැබුවේ ඔහුව හොඳින් දැක ගන්නට හිතාගෙනය.

*"අක්කී...."*

*"පොඩ්ඩක් ඉන්නකෝ..."*

ඒ රූපය මදක් ළඟට දකිද්දී සමාධිගේ මුවෙහි නැඟුණ සිනහව දුටු අනිත් තිදෙනාටම දැනුණේ පුදුමයකි. ඔහු වෙත යමින් සමාධි ඔවුන්ට ඉඟි කළේ ඇය පසුපසින් එන ලෙසය. අකමැත්තෙන් වුවත් කෙත්මි ඒ දෙසට පය එසවූයේ සමාධිත් යන නිසාමය.

*"රමේෂ්..?"*

සමාධිගේ හඬට වෙනතක් බලන් සිටි ඔහු තිගැස්සී සමාධි වෙතට හැරුණේය.

*"ස.. සමා..ධි... බේ..බි.."*

රමේෂ් ගොතගැසුවේ කලබලයෙනි. ඔවුන් තමාව දුටු බවක් ඔහුට නොදැනුණි. ඒ මදිවාට සමාධි නොසිතූ ලෙස ඔහුව හඳුනාගෙන ඇත. ඔහුගේ හැසිරීමට සමාධිට නම් සිනහවක් නැඟුණි.

*"මොකද රමේෂ් මෙතන කරන්නේ? ගෑණු ළමයට ඇඳුම් තෝරනවද?"* ඇය ඇසුවේ සිනාවෙන්මය. අනෙක් තිදෙනා නම් බලා උන්නේ පුදුමයෙනි.

*"බ්.. බේ..බි.. මං.. මේ..."*

*"හරි හරි... මං දන්නවා. ඔච්චර ගොත ගහන්න දෙයක් නෑ... ආපු වැඩේ හරියට කරන්න. අයියා මොනවා හරි කියලනේ එවන්න ඇත්තේ... මේ ළමයි බය වෙලා රමේෂ්ව දැකලා.."*

සමාධි කියද්දී ඔහු කවුරුන්දැයි තේරුම් ගන්න කෙත්මිට අපහසු වූයේ නැත. ඔහුව තමා පසුපසින්

sinhalaebooks.com

එවන්න ඇත්තේ සංදේශ්‍ය. රමේෂ් ඇය දෙස බැලුවේ සමාව අයදින බැල්මකිනි.

*"වෙරි සොරි රිතූ මැඩම්. මැඩම්ලාව බය කරන්න හිතුවේ නෑ මං..."*

*"ඉට්ස් ඕකේ අයියේ.."*

*"ඕකේ...? ඕකේ තමයි. තව ටිකෙන් පොලිසියටත් කෝල් කරලයි නවතින්නේ... එහෙම වුණා නම් ලොක්කටයි ගෝලයාටයි දෙන්නටම ස්වීප් එක ඇදෙනවා."* හංසි කීවේ ඔහුට රවමිනි.

*"සොරි හංසි මැඩම්. සර් මට කිව්වේ මැඩම්ලට නොදැනෙන්න මැඩම්ලා එක්කම ඉන්න කියලා."*

*"හරි හරි... ඒකට කමක් නෑ. රමේෂ් එහෙනම් ඔයාගේ ඩියුටිය කරන්නකෝ. රිතූ ඔයාව අඳුනගත්ත එකත් හොඳයි."* සමාධි කීවේ හංසිගේ උරහිසකට තට්ටුකර සිනාසෙමිනි.

*"අම්මටසිරි... රමේෂ් අයියා..."*

රනුක් ඔවුන් වෙත ආවේ කෑගසමිනි. රමේෂ් සිනාවක් මුහුණ මැදට ගනිද්දී රනුක් ඔහුගේ කරට අතක් දමාගෙන බැලුවේ ඔහුව වට කරගෙන සිටින තරුණියන් සිව් දෙනා දෙසය.

*"අනේ අනේ බොඩිගාර්ඩ්... අන්තිමට ඔයත් මේ වට්ටි අම්මලා ටිකට මාට්ටු වුණා නේද එහෙනම්?"*

*"මල්ලී... ඔයා රමේෂ් අයියව දන්නවද?"* කෙත්මි ඇසුවේ පුදුමයෙනි.

*"නැතුව... ඔයාලා මේ අද දැක්කට එදා අර පාටි එකට ගිහින් අපේ අක්කා නටපු ජෝගියෙන් පස්සේ දවසේ ඉදලා රමේෂ් අයියා අපේ අක්කා පිටිපස්සෙමනේ හිටියේ..."*

*"හෑ..."*

හංසිටත් කෙත්මිටත් කියවුණේ එක හඬිනි. රමේෂ්ටත් රනුක්ටත් සිනාය.

sinhalaebooks.com

*"ඔව් ඔව්... මාත් දන්නවා. අයියා ඒ කාලේ ඉඳන්ම රිතූව ගාඩ් කරන්න කාව හරි දාලා තිබ්බා කියලා. ඒ හිටියේ රමේෂ් කියලා දන්නේ නම් අද තමයි.."*

*"මදැයි ඉතිං... අපි නොදැන අපිට බොඩිගාර්ඩ් කෙනෙකුත් ඉඳලානේ..."*

කියමින් හංසි යලිත් ඇඳුම් තෝරන්නට ගියේ තරුදිගේ අතකිනුත් ඇදගෙනය.

*"ඒකත් මරු. අපේ අයියා මට බොඩිගාර්ඩ් කෙනෙක් දුන්නේ නෑ... මෙයාට තියෙන ආදරේ බලන්නකෝ.."* සමාධි කියද්දී කෙත්මි සිනාසෙමින්ම ආපසු හැරුණේ රමේෂ් වෙතත් සිනහවකින් සංග්‍රහ කරමිනි.

****************

*"ඇයි අයියේ හදිස්සියේම මට එන්න කිව්වේ?"*

කෙත්මි ඇසුවේ සංදේශ්ගේ වාහනයේ ඉදිරි අසුනට බර වෙමිනි. ඔෆිස් එකේ සිටි කෙත්මි පිටතට ආවේ සංදේශ්ගෙන් ලැබුණු ඇමතුමටය.

*“ගමනක් යන්න...”*

*“කොහෙද?”*

*“පොඩ්ඩක් ඔයත් එක්ක කතා කරන්න ඕන රිතූ මට...”*

*“මොනවා ගැනද අයියේ?”*

කෙත්මි අසද්දී සංදේශ් ඇය දෙස බලා මද සිනහවක් පෑවේය.

*“රිතූ... ඔයා තාමත් පරණ දේවල් ගැන හිතනවද? මං අහන්නේ අසිත...”*

*“අයියේ ප්ලීස්... ඔය නමවත් මට ඇහෙන්න ආයෙත් කියන්න එපා. මට පුළුවන් නම් ඒ අතීතේ සදහටම මගේ හිතෙන් මකලා දාන්න... මං ඒකට දෙපාරක් හිතන්නේ නෑ... මගේ කරුමෙට ඒක*

sinhalaebooks.com

*කරන්න විදිහක් මේ ලෝකේ නෑ...”* කෙත්මි කීවේ සුසුමක් හෙළමිනි.

*“සොරි රිතූ... මං ඔයාගේ හිත රිද්දන්න ඒක ඇහුවේ නෑ...”*

*“ඉට්ස් ඕකේ අයියේ...”*

*“මේ අහන්න රිතූ... ඔයා ඒ දේවල් හිතෙන් අයින් කරලා නම් ඉන්නේ... ඉස්සරහට මොකද වෙන්නේ රිතූ...?”* සංදේශ් ඇසුවේ වාහනය නිදහස් තැනක නතර කරමිනි.

*“මොනවා ගැනද අයියා අහන්නේ?”*

*“මං අහන්නේ ඔයාගේ අනාගතේ ගැන. අයි මීන්... ඔයා කාට හරි...”*

*“කාට හරි? මොකක්ද අයියේ?”*

*“ඔයා කාට හරි ආදරේ කරනවද රිතූ?”*

sinhalaebooks.com

සංදේශ් අසද්දී කෙත්මිගේ මුහුණේ ඇඳුණේ අපූරු සිනහවකි. සංදේශ් ඇය දෙසම බලා උන්නේ ඇයගේ පිළිතුරක් වෙනුවෙනි.

*"ඔව්.."*

කෙත්මි එක එල්ලේම ඔහු දෙස බලා දුන් උත්තරයට සංදේශ් මදක් තිගැස්සී ගියේය. ඒ ගැන කියන විට ඇයගේ මුහුණට නැඟුණ සිනහව දකිද්දීත් සංදේශ්ට ලෝභය. නමුත් ඇය ආදරය කරන්නේ කාටද?

***"ඒ කවුද කියලා මං ඇහුවට කමක් නැද්ද?"***

***"ඒකට කමක් නෑ අයියේ. මං කැමතියි එයා ගැන මේ මුළු ලෝකෙත් එක්කම හරි කතා කරන්න... ඒක මට හරි සතුටක්..."***

***"ඔය තරම් සතුටින් කතා කරන්නේ කා ගැනද රිතූ?"*** සංදේශ් ඇසුවේ කටහඬ ටික ටික බිඳී යද්දීය.

***"මේ ලෝකේ මගේ අම්මටයි තාත්තාටයි මල්ලිටයි හංසිටයි පස්සේ මට වැඩියෙන්ම ආදරේ කරන***

sinhalaebooks.com

*කෙනා ගැන... මාව ආරක්ෂා කරන... මං ගැන හිතන කෙනා ගැන...''*

*"ඒ කවුද රිතූ?''*

*"සංදේශ් අයියේ....''*

sinhalaebooks.com

43.

සංදේශ් වෙත හැරුණ කෙත්මි ඔහුගේ දෑතින්ම අල්ලාගෙන ඒ දෑස්වලට එබුණේ සංදේශ් පුදුමයෙන් ඇය දෙස බලා හිඳිද්දීය. ඇය මේ කියන්න යන්නේ කවුරුන් ගැනදැයි සංදේශ්ට සිතාගන්නට බැරිය. නමුත් ඒ කෙනා ගැන කියද්දී කෙත්මිගේ මුහුණ එළියවන අයුරු දකිද්දී ඔහු උන්නේ ඇතුළාන්තයෙන් දැවෙමිනි.

***"කවදාවත්ම ඔයාගේ ඇස් ඉස්සරහට එන්න එපා කිව්වට... දකින දකින තැන රණ්ඩු කරලා මගේ හිත රිදෙව්වට... ඔයා මාව දකින්න බලන් හිටියා.... මටත් නොදැනෙන්න මාව ආරක්ෂා කළා කියලා මං දන්නවා අයියේ.."***

***"රිතූ... මං.."***

***"මං ආයේ ලංකාවට එන්න තීරණය කළේ ඇයි කියලා දන්නවද අයියේ ඔයා?"*** කෙත්මි අහද්දී සංදේශ් හිස වැණුවේ නැහැ කියන්නටය.

sinhalaebooks.com

*"මං ආවේ ඔයා නිසා අයියේ..."*

*"මං නිසා?"*

*"ඔව්... එදා අන්තිමට හොස්පිට්ල් එකේදි දැක්කට පස්සෙ අවුරුදු තුනක් ගෙවුණා... ටික ටික මං පරණ දේවල් අමතක කරද්දී ඔයා විතරක් ආයෙ ආයෙත් හිතේ උඩටම ආවා. ඒ ඇයි කියන්න මං දන්නේ නෑ. ඒත් ඒ හැඟීම තවත් ඉවසන් ඉන්න බැරිම තැන මං තීරණය කළා ඔයා එපා කිව්ව දේ කරන්න. ඔව්. මං තීරණය කලා ආයෙමත් ඔයාගේ ඇස් ඉස්සරහට එන්න..."*

*"රිතූ..."*

*"ඔයා මාත් එක්ක කේන්ති අරන් කෑගහද්දී... මාව ප්‍රතික්ෂේප කරද්දී මට ගොඩක් රිදුණා අයියේ. මට මෙහෙම කරන්න නම් ඔයා මාව එදා මැරෙන්න නොදී බේරගත්තේ අපරාදේ කියලා හිතුණා... අඩු තරමේ නංගි කෙනෙක්ට වගේ මට සලකයි කියලා හිතුවා.*

sinhalaebooks.com

*ඇත්තටම එදා... අසිතට ආදරේ කරපු කෙත්මි ඇත්තටම මැරුණා අයියේ. ඊට පස්සේ ඉපදුණ රිතූ හුස්ම ගත්තේ වෙන කෙනෙක් වෙනුවෙන්. ඒත් ඒ කෙනා මාව දකින්නවත් අකමැති වෙද්දී.. දිගටම එයා වෙනුවෙන්ම බලන් ඉන්න මගේ හිතට ඕන වුණා."*

කෙත්මි කීවේ ඇස් දෙකෙන් කඳුළු පිටාර ගලද්දීය. ඇය කියන දේවල් අසා සිටි සංදේශ්ගේ ඇස් දෙකටත් කඳුළු පිරුණේ නොදැනීමය.

*"ඒත් මං ඇත්ත දන්නවා අයියේ... බැන බැන මාව පරිස්සම් කරද්දී... මගේ ළඟින් ඉද්දී... මටත් මීට වැඩිය හිතන්න තිබ්බා.. ඔයා දන්නවද අයියේ... එදා අසිත මාව බලෙන්ම කසාද බඳින්න හදද්දී සමාධි අක්කා කෑගහලා ඒක මට කිව්වා..."*

*"මොනවද රිතූ පැංචි කිව්වේ?"*

*"එයාට මොනවා වුණත් කමක් නෑ කිව්වා... ඒ දේ කරන්න එපා කිව්වා. අ..අයියා... මං වෙනුවෙන් බලන් ඉන්නවා කිව්වා... අයියා වෙනුවෙන්... මට ඒක කරන්න එපා කිව්වා."*

කෙත්මි කියද්දී සංදේශ්ට සුසුමක් හෙළුණි.

sinhalaebooks.com

*"දැන්වත් මට කියන්නේ නැද්ද අයියේ ඒක?"*

*"මොකක්ද?"*

සංදේශ් අසද්දී කෙත්මි ඔහුගේ අත් දෙකම අතහැර ඉවත බලාගත්තේ කේන්තියෙනි. සංදේශ් නැඟෙන්නට ආ සිනහව තදකරගෙන ඇය දෙස බැලුවේය.

*"මොකක්ද කියන්නකෝ රිතූ..."*

*"අනේ මේ... යන්න අයියේ... මාත් එක්ක බොරුවට රණ්ඩු වෙවී... මටත් හොරෙන් මගේ පස්සෙන් බොඩිගාර්ඩ්ලා දාලා මාව ගාඩ් කරනවා. මං ආස දේවල් සේරම දන්නවා. තාත්තෙක් වගේ වෙලාවකට මාව බලාගන්නවා... මේ දේවල් සේරම කරන්නේ ඇයි අයියේ? මං වෙනුවෙන් මේ තරම් දේවල් කරන්න මං ඔයාගේ කවුද? මේ දේවල් කරලා ඔයා මගෙන් මොනවද බලාපොරොත්තු වෙන්නේ?"*

කෙත්මි කියාගෙන ගියේ අමනාපය මුසු කටහඬිනි. සංදේශ් මද සිනහවක් පා කෙත්මිගේ මුහුණ දෝතටම ගත්තේය.

sinhalaebooks.com

*"ආදරේ... මේ දේවල් කරලා මං ඔයාගෙන් බලාපොරොත්තු වෙන්නේ ඔයාගේ ආදරේ රිතූ... පුළුවන්ද ඒක මට දෙන්න? මගේ වයිෆ් විදිහට ජීවිත කාලෙම මං ළඟින් ඉන්න... පුළුවන්ද?"*

සංදේශ් අසද්දී කෙත්මි 'ඔව්' කියන්නට මෙන් හිස වැණුවේ ඇස් දෙකේ පිරී තිබූ කඳුළු කැට වාහනය පුරා විසිරී යද්දීය.

*"මගේ ජීවිතේ මගේ අම්මාටයි නංගිටයි පස්සේ මගේ හිතේ ඇඳුණු එකම ගෑණු රූපේ ඔයා රිතූ... අදක ඊයෙක නෙමෙයි.. එදා ඔයා එක්ක මුලින්ම කතා කළාට පස්සේ.. නංගිගේ වෙඩින් එකේදී ඔයාව දැක්කට පස්සේ... කවදාවත් ගෑණු ළමයෙක් ගැන නොහිතපු මං ඔයා ගැන ගොඩක් හිතන්න පටන් ගත්තා..."*

කෙත්මි කඳුළු අතරින්ම ඔහුගේ උරහිසකට හිස බර කර ගත්තේ සැනසීමෙනි.

*"ඔයාගේ හිත හදාගන්න කාලයක් දීලා ඔයත් එක්ක ඒ ගැන කතා කරන්න මං හිතන් හිටියේ. ඒත් එදා ඔයා කරපු දේ..."*

*"මට සමාවෙන්න අයියේ..."*

sinhalaebooks.com

*"එදා ඒක දකිද්දී මට ඉන්න තැන පවා අමතක වුණා රිතූ... අම්මටයි නංගිටයි පස්සේ මගේ ජීවිතේ ලොකුම ඉඩක් ගත්ත ගෑණු රූපේ ඒ විදිහට දකිද්දී... අදටත් ඒ සිද්ධිය මතක් වෙද්දී මගේ පපුව ඇතුලෙන් මහා වේදනාවක් දැනෙනවා රිතූ... මේ ළඟක් වෙනකම්ම ඔයාගේ රූපේ දකිද්දී ඒ සිද්ධිය මගේ ඉස්සරහා ආයේ ආයේ මැවෙද්දී... මට මැරෙන්න හිතුණා... එදා බැරි වෙලාවත් මං තව ටිකක් පරක්කු වුණා නම්... "*

සංදේශ් කියද්දී කෙත්මි හඬමින්ම ඔහුගේ පපුව මත හාදුවක් තැබුවේ සංදේශ්ගේ මුවෙහි අපූරු සිනහවක් මැවී එද්දීය.

*"මෙච්චරකල් ඒ දේවල් නිසා රිද්දුවට මට සමාවෙන්න රිතූ. ඔයාට රිද්දලා මං සතුටු වුණා කියලා හිතන්න එපා. ඔයාට රිදේද්දී මටත් ගොඩක් රිදුණා. මේක ඔයාට කියාගන්න විදිහක් නැතුවයි මං මෙච්චර කල් හිටියේ රිතූ... මං ඔයාට ආදරෙයි..."*

*"මාත් ආදරෙයි..."*

කෙත්මි මිමිණුවේ ඔහුගේ පපුවේ මුහුණ සඟවාගෙනය. සංදේශ් එහෙම්මම පහත් වී ඇයගේ හිස් මුදුන මතින් දෙතොල් තැබුවේ ආදරයෙනි.

sinhalaebooks.com

සංදේශ්ට තුරුළු වී සිටි කෙත්මි තිගැස්සී ගියේ මහ හඬින් සංදේශ්ගේ දුරකතනය නාද වෙද්දීය. ඇය එහෙම්මම සිටිද්දී සංදේශ් ඇමතුමට සම්බන්ධ වූයේ සිනාසෙමිනි.

*"කියන්න පැංචි..."*

*"අයියේ... ඔයා කොහෙද ඉන්නේ?"*

*"මං මේ ටිකක් එළියට ඇවිත් ඉන්නේ පැංචි. ඇයි මොකුත් ප්‍රශ්නයක්ද? රංගයා ඉන්නවා නේද?"*

*"රංග අයියා ටිකක් එළියට ගියා අයියේ... හෙට නුවරඑළියේ යන නිසා මොනවද මොනවද ගන්න ඕන කිව්වා. අයියා දැන්ම ඔෆිස් එකට එනවද?"*

*"මොකක්ද ප්‍රශ්නේ පැංචි?"*

sinhalaebooks.com

*"මට ටිකක් ඔයත් එක්ක කතා කලොත් හොඳයි අයියේ... හදිස්සියක් නෑ. ඔයාගේ වැඩේ ඉවර වෙලා එන්න."*

*"එහෙම වැඩකට ආවා නෙමෙයි බං. මං රිතූ එක්ක ටිකක් එළියට ආවේ. ඉන්නකෝ එහෙනම්... මං රිතූව ඔෆිස් එකෙන් දාලා පැය බාගෙන් එන්නම්..."*

සංදේශ් කීවේ කෙත්මි දෙසත් බලමිනි.

*"අනේ අයියේ... රිතූවත් එක්කන් එන්නකෝ..."*

*"අපේ ඔෆිස් එකට?"*

*"නැතුව ඉතිං.. එදා මීටින් එකෙන් පස්සේ කොහොමත් හැමෝම නංගි ගැන දන්නවානේ... එක්කන් එන්න."*

*"හරි හරි... ඉදපං එහෙනම්..."*

සංදේශ් දුරකතනය තබද්දී කෙත්මි ඔහුගේ පපුවෙන් ඈත් වී අසුනට හේත්තු වී ඔහු දෙස බලා උන්නාය.

sinhalaebooks.com

*"අපේ ඔෆිස් එකට ටිකක් ගිහින් එමුද රිතූ?"*

*"ඇයි අයියේ... ප්‍රශ්නයක්ද? සමාධි අක්කි මොකද කිව්වේ?"*

*"පැංචිට ටිකක් කතා කරන්න ඕන කියනවා. මටත් හිතාගන්න බෑ. ගිහින්ම බලමු."*

සංදේශ් කීවේ වාහනය පණගන්වා ගනිමිනි.

*"මාව මඟින් දාගෙන යන්න අයියේ... මං ටැක්සි එකක් දාන් යන්නම්. ඔයා ඉක්මනට ඔෆිස් එකට ගිහින් බලන්න..."* කෙත්මි කියද්දී සංදේශ් ඇය දෙස රවා බැලුවේය.

*"මඟින් දාලා යන්න ඔයාව ළඟට ගත්තේ නෑ රිතූ... ඔයාට දැන් කොහොමත් අපේ ඔෆිස් එක පිට තැනක් වෙන්න බෑ. ඒ නිසා යමු ගිහින් එන්න. නෑනලා දෙන්නා ඉන්නවානේ ඔයාගේ වැඩ ටික බලන්න."*

සංදේශ් කීවේ හංසිවත් තරුදිවත් සිහිකර සිනාසෙමිනි. නමුත් කෙත්මිට නම් එකවරම ඔහුත් සමඟ

එහි යන්නට දැනුණේ කෝල බවකි. ඒ බව සංදේශ්ට කියන්නේ කෙසේදැයි ඇය සිතුවේ වාහනයට පසුවන ගොඩනැඟිලි දෙස නෙතු රඳවාගෙනය. ඇයගේ මේ කල්පනාව සංදේශ්ට නම් ගෙන ආවේ සිනහවකි.

*"රිතූ... මොකද ඔය... ලැජ්ජද මාත් එක්ක එහෙම යන්න?"*

*"අහ්... අනේ නෑ... ඒත්..."*

*"අපේ ඔෆිස් එකේ එවුන් ඔයා ගැන දන්නවා රිතූ. ඒ නිසා ඒ ගැන හිතලා වද වෙන්න එපා."*

*"ඒ කොහොමද?"* කෙත්මි ඇසුවේ ඇස් දෙකත් ලොකු කරගෙනය.

*"කොහොමහරි... දන්නවා. ඒ නිසා ඒ ගැන හිතන්න එපා."* සංදේශ් කීවේ ඒ සිදුවීම කෙත්මිගෙන් සඟවමිනි.

*"අනේ..."*

sinhalaebooks.com

***"නෑ... නෑ... ඒක ඔයාට ඕන නෑ... කොහොමහරි එවුන් දන්නවා. ඒ ඇති නේ.."***

***"හරි නරකයි. මං අහගන්නම් සමාධි අක්කිගෙන්.."***

කෙත්මි කීවේ බොරු අමනාපයක් මවාගෙන ඉවත බලාගනිමිනි.

***"අහ්... මට අමතක වුණා. ඒකි මගේ නංගි වුණාට ඉන්නේ ඔයාගේ පැත්තෙනේ... හා.. හා... අහලා දැනගන්නකෝ එහෙනම්..."***

සංදේශ් කීවේ මහ හඬින් සිනාසෙමිනි.

44.

සෙනසුරාදා උදෑසන සියලු දෙනාම කෙත්මිලාගේ නිවසට එකතු වුණේ නුවරඑළියේ යන්නටය. රනුක් මේ ගමන සඳහා කුඩා බස් රථයක් සූදානම් කලේ සියල්ලන්ගේම කැමැත්තටය. අනෙක් සියල්ලන්ම බසයට නැඟුණු පසු සංදේශ් අවසානයට බසයට නැඟුණේය.

ඒ වන විටත් කෙත්මි බසයට නැඟ අවසන්ය. අම්මලා ඉදිරියෙන් වාඩි වෙද්දී කෙත්මි මැද අසුනක සිටි හංසි අසලින් වාඩි වූයේ දිලූෂගේ නම් කට ඇද වී යද්දීය. හංසිත් කෙත්මි දෙස බැලුවේ දෑස් කුඩාකරගෙනය.

*"මොකද උඹ ඔහොම බලන්නේ?"*

sinhalaebooks.com

*"ඇයි වදේ... අදත් මගේ අස්සටම ආවේ... පලයන්කෝ උඹේ අර ඊරි යකා ගාවට..."*

හංසි කීවේ බසයට නඟින සංදේශ් දෙසත් බලමිනි. සංදේශ් බසයට නැඟුණේම ඇය දෙස බලාගෙනය.

*"මට බෑ... උඹ මගේ යාළුවානේ.. මං යන්නේ උඹ ගාව. එච්චරයි... ටොමියෝ... ඔයාටත් එක්කමයි මං මේ කියන්නේ.. මං මෙතන."*

කෙත්මි රවාගෙන කියද්දී දිලූෂ පමණක් නොව සමාධිලා රනුක්ලා පවා ඇය දෙස බැලුවේ පුදුමයෙනි. ඇයත් සංදේශුත් පෙම්වතුන් බව මේ වන විටත් ඔවුන්ට රහසක් නොවේ. ඉතිං ඇය සංදේශ් අසලින් වාඩි නොවෙන්නේ ඇයි? තවමත් දොර අසලට වී සංදේශ් මේ දෙස බලාගෙනය.

*"අක්කේ... මොකද හලෝ වෙලා තියෙන්නේ... උන් දෙන්නට එතන දීලා වෙන සීට් එකකට යනවාකෝ සංදේශ් අයියා එක්ක..."*

*"මට බෑ එයත් එක්ක යන්න. මං යන්නේ මෙතන.."*

sinhalaebooks.com

*“ඒ මොකද?”*

*“මං තරහයි. යක්කු ළඟ වාඩි වෙලා ට්‍රිප් යන්න බෑනේ..”* කෙත්මි කීවේ සංදේශ් දෙස නෙත් කොනින් බලා රවමිනි.

ඒ කතාව ඇසෙද්දී සංදේශ් අඩියට දෙකට ඇය අසලට ඇවිත් ඇයගේ අතකින් අල්ලා ගත්තේ රවාගෙනමය. කෙත්මි නිකමටවත් ඔහු දෙස නොබැලුවාය. ඔහු ඉන්නේ කේන්තියෙන් බව ඇය දැනී.

*“විකාර නොකර මෙන්න මෙහේ එනවා රිතූ..”*

*“මට බෑ...”*

*“රිතූ... මං ආයේ කියන්නේ නෑ... පොඩි එකෙක් වෙන්න හදන්න එපා.”*

*“බෑ කිව්වානේ... මට බෑ...”*

***"ඒකත් එහෙමද?"*** කියමින් සංදේශ් බැලුවේ හංසි දෙසය.

***"හංසි... ඔයා යන්න දිලූෂ ඉන්න සීට් එකට. මං මේ මැඩම්ගේ ප්‍රශ්නේ විසඳලා දෙන්නම්.."***

හංසි නැඟිට දිලූෂ සිටින අසුන වෙත යද්දී කෙත්මිව එහාට තල්ලු කරමින් සංදේශ් බලෙන්ම මෙන් ඇය අසල වාඩි වූයේ සියල්ලන් සිනහා ගස්වමිනි. කෙත්මි කේන්තියෙන් ඉවත බලා ගත්තාය.

***"මොකද දැන් මේ උදේ පාන්දර මගේ සුදු නෝනා කේන්ති අරන් ඉන්නේ?"*** සංදේශ් ඇසුවේ ඇයට පමණක් ඇසෙන ලෙසය.

***"මොකුත් නෑ..."***

***"නැත්තේ නෑ... මාත් එක්ක තරහින් ඉන්න බව මට පේනවා."***

***"මොනවා නැතත් ඒක නම් පේනවානේ.."***

sinhalaebooks.com

*"මොකද බං මේ හරහට කතා කරන්නේ? මොකද වෙලා තියෙන්නේ? මට දැන් මොනවද නොපෙනුනේ කියන්නකෝ..."*

*"මොකුත් නෑ..."*

*"අනේ මැණිකේ... කියන්නකෝ ඉතිං.. අද මගේ කෙල්ල වෙනදටත් වැඩිය ලස්සනයි. එහෙම එකේ ඇයි මේ බුම්මාගෙන?"*

*"ලස්සනයි? ඔව් ඉතිං... ඔයාට ඕන එක ඇන්දම ඔයාට හොඳයි..."*

කෙත්මි කියද්දී සංදේශ්ට සිනහවක් නැඟුණේ ඇය මේ තරහින් සිටින හේතුව තේරුම් යද්දීය. අද ගමනට ඇය අඳින්නට උන් ක්‍රොප් ටොප් එක අඳින්න එපා යැයි කියා තමා ඊයේ ඇයට ටිකක් කෑගැසූ බව සංදේශ්ට මතකය.

*"ඒකටද මේ තරහා වෙලා ඉන්නේ? මං ඔයත් එක්ක තරහකට කෑගැහුවා නෙමෙයිනේ ළමයෝ... ඔයා ලස්සනයි. ඒ ඇඳුමත් ඔයාට ලස්සනයි. ඒත් ඒකට ටිකක් ඇඟ පේන නිසානේ මං එපා කිව්වේ.."*

sinhalaebooks.com

*"කිව්වා? කිව්වද කෑගැහුවද ඒ?"*

*"සොරි සොරී ඉතිං... ඔයා දන්නවානේ මැණිකේ මට ටිකක් කේන්ති යනවා කෑගහනවා කියලා. දැන් ඉතිං ඔය විදිහට මාත් එක්ක තරහා වෙලා ඉන්න එපා."*

*"මහ නපුරෙක් අයියේ ඔයා."*

කෙත්මි කීවේ සංදේශ්ගේ උරහිසකට හිස බර කර ගනිමිනි.

*"මෙන්න බලපල්ලා... ඒ ගමන තරහයි කිව්ව අය යාළුවෙලා..."* රනුක් කෑගැසුවේ කෙත්මි තවත් සංදේශ්ගේ උරහිසේ හිස සඟවා ගනිද්දීය.

*"අම්මෝ... මෙන්න මෙයාට ලැජ්ජා හිතිලා..."* හංසිත් කීවේ රනුක්ට එකතු වෙමිනි.

*"පොඩ්ඩක් ෂේප් කරගත්තා විතරයි. ඉන්න දීපංකෝ බං..."* සංදේශ් කීවේ ලැජ්ජාවෙන් මුහුණ සඟවාගෙන සිටින කෙත්මිගේ හිස් මුදුනේ හාදුවක් තබමිනි.

**************

***"සංදේශ් පුතා... මං බැලුවේ මේවා ඉක්මනට පිළිවෙළක් කරලා දාන්න කියලා.. පුතාගේ අකමැත්තක් නැනේ.."***

ජගත් කීවේ සංදේශ්ලාගේ නුවරඑළිය බංගලාවේ ඉදිරිපස තනා තිබූ අසුනකට බර වෙමිනි. හසන්ති සමඟින් ජගත් පිටතට එනවිට සංදේශ් රංග මෙන්ම දිලූෂත් උන්නේ මිදුලේ කතාබහ කරමිනි.

***"පිළිවෙළක් කරලා දාන්න කිව්වේ අංකල්?"***

***"අපි කියන්නේ පුතේ දැන් ඉතිං ඔයාලාගේ වයසත් හරිනේ... හංසිලාගේ අම්මත් මාත් එක්ක කතා කරා. ඔය දිලූෂටත් එක්කම තමයි අපි මේ කියන්නේ... දැන් ඉතිං ඔහොම හිටියා ඇති..."*** හසන්ති කීවේ සිනාසෙමිනි.

සංදේශ් බැලුවේ මිදුලේ කොණක ඇති ඔන්චිල්ලාවේ වාඩි වී සමාධිලා සමඟ කියවමින්

මොනවාදෝ කන කෙත්මි දෙසය. අද ඇයගෙන් පෙනෙන්නේ වෙනදා නොදුටු සැහැල්ලු බවකි.

*"අංකල්... අපිට රිතූට තව ටික කාලයක් දෙන්න වෙයි කියලා හිතෙන්නේ නැද්ද?"*

සංදේශ් කියද්දී ජගත් සිනාසෙමින් ම බැලුවේ හසන්ති දෙසය.

*"පුතා දන්නේ නෑ ඔය කෙල්ලගේ හැටි. අද වෙඩින් එක ගමු කිව්වත් හා කියයි ඔය ළමයා..."*

*"අනේ ඔව් පුතා. පුතා පරණ දේවල් දන්න නිසා අපිට හංගන්න දෙයක් නෑ. ආයේ කවදාවත් ලංකාවට එන්නේ නෑ කියලා ගිය කෙල්ල ඔය ආයේ ආවේ පුතා නිසාමයි..."*

*"ආන්ටි?"*

*"මං අපේ කෙල්ල ගැන හොඳට දන්නවා පුතා. එයා ඔයාට ආදරේ කරන්න ගත්තේ කවද්ද කියන්න මං දන්නේ නෑ. හැබැයි එයා ආපහු ලංකාවට ආවේ ඔයාගේ ආදරේ බලාපොරොත්තුවෙන් කියන්න මං දන්නවා.."*

sinhalaebooks.com

හසන්ති කියද්දී සංදේශ් කෙත්මි දෙස බලා සුසුමක් හෙළුවේය. තමාගේ ආදරය බලාපොරොත්තුවෙන් ආ ඇයට තමා කළ නපුරුකම් ඔහුට යළි සිහිවිය.

*"හරි.. පුතා මට කියන්නකෝ පුතාගේ කැමැත්ත. රිතූට තව කල් ඕන නම් අපිට ප්‍රශ්නයක් නෑ..."*

*"මගේ අකමැත්තක් නෑ අංකල්. ඒත් මට ටික දවසක් ඕන. මොකද මං නංගි ගැන බලන්න ඕන. එයා ඔය විදිහට ඉද්දී මට වෙඩින් එකක් ගන්න බෑනේ..."*

*"හරි පුතා... මට තේරෙනවා පුතා කියන දේ. අපි ඉස්සෙලම නංගි ගැන බලලා ඉමු. එක දෙයක් දරුවෝ..."*

*"මොකක්ද අංකල්?"*

*"කොයි වෙලාවකවත් පුතා නංගිත් එක්ක තනිවෙලා කියලා හිතන්න එපා. ඔයාලාට අපි ඉන්නවා."*

sinhalaebooks.com

*"මං දන්නවා අංකල්..."*

ජගත් සිනාසෙමින්ම ඇතුළට ගියේ හසන්තිත් ඔහු පසුපසින්ම යද්දීය. ඔවුන්ට යන්නට හැර දිලූෂ සංදේශ් වෙත හැරුණේ සුසුමක් හෙළමිනි.

*"ඔයින් ගියා මදැයි මස්සිනේ... තව ටිකෙන් අපිට හෙටම වෙඩින් එකත් ගන්න වෙනවා..."*

*"හිමීට හිමීට... උඹේ නෝනා මහත්තයාට ඇහුණොත් එහෙම අපි තුන්දෙනාම ඉවරයි."*

*"සංදේශ්..."*

මෙතෙක් වෙලා නිහඬව බලා උන් රංග හෙම්හිට කටහඬ අවදි කලේ ඈත මීදුමෙන් වැසීගිය කඳුපන්තියක් දෙස බලාගෙනය.

*"කියපං රංගයා..."*

*"පැංචි ගැන... උඹ තීරණයක් අරන් ද ඉන්නේ?"*

*"මට තේරෙන්නේ නෑ බං. ඒ කෙල්ල පව්... ආයේ මැරි කරන්නත් වැඩි කැමැත්තක් නෑ. ඒත් ඒකි එහෙම ඉද්දී මට කසාදයක් කරගන්නත් බෑ... අනික බං කරන්නං වාලේ ඒ කෙල්ලට කසාද හොයලා දෙන්නත් බැනේ වෙලා තියෙන දේවල් එක්ක..."*

සංදේශ් කීවේ දුක්බරව ඈත සිටින සමාධිලා දෙස බලාගෙනය.

*"සංදේශ්... මං මෙහෙම කිව්වා කියලා උඹ මං ගැන වැරදියට හිතන්න එපා. මං මේ අවංකවමයි කතා කරන්නේ.."*

*"කියපං බං.. උඹට මාත් එක්ක ඕන දෙයක් කියන්න පුළුවන් කියලා දන්නවානේ..."*

*"සංදේශ්... මං කැමතියි නංගිව මැරි කරන්න... ඇත්තටම මං සමාධිට..."*

රංග කියාගෙන ආ දෙය මඟින් නතර කර සංදේශ් දෙස බැලුවේය. සංදේශ් උන්නේ සුන්දර සිනහවකින් මුව සරසාගෙනය.

*"මං සමාධිට ආදරෙයි. එහෙම නේ?"*

sinhalaebooks.com

*"මචං... උඹ..."*

සංදේශ් ඉතිරිය කියද්දි රංග වචන පටලමින් ඔහු දෙස බැලුවේය.

*"මං දන්නවා බං... උඹ මගේ යාළුවානේ... ඒ කාලේ ඉඳන් උඹට පැංචිට කැමැත්තෙන් හිටියා කියලා මං දන්නවා. ඒත් අවාසනාවකට අපේ පැංචි තෝරගත්තේ අසිතව. මේ දේවල් මට තේරුණත් සද්ද නැතුව හිටියේ ආයේ මේවා උඹ එක්ක කතා කරලා වෙන්නේ උඹේ හිත රිදෙන එක විතරයි නිසා..."*

*"මං අවස්ථාවාදියෙක් නෙමෙයි බං... ඒත් මං සමාධිට ගොඩක් ආදරෙයි. ආයෙමත් සමාධි වෙන කෙනෙක්ට අයිතිවෙනවා මට බලන් ඉන්න බැරි නිසයි කෙලින්ම උඹට මේවා කිව්වේ.."*

*"මට තේරෙනවා බං. පැංචිව බලාගන්න මේ ලෝකේ මං ඇරුණම ඉන්න විශ්වාසවන්තම කෙනා උඹ විතරයි. මට ඒ ගැන සැකයක් නෑ..."*

sinhalaebooks.com

***"අන්න අර සෙට් එක මේ පැත්තට එනවා. උඹලා ඔය කතාව පස්සේ කරගත්තොත් හොඳයි."***

දිලූෂ කීවේ ඔවුන් වෙත එන පිරිස දෙස බලාගෙනය.

sinhalaebooks.com

45.

රනුක් තරුදි මෙන්ම සමාධිත් හංසිත් පැමිණෙ සංදේශ්ලා අසලින්ම වාඩි වෙද්දී කෙත්මි දුවගෙන ආවේ අවසානයටය. දුවගෙන ආ වේගයටම ඇය අතේ තිබූ ස්ට්‍රෝබෙරි ගෙඩියක් සංදේශ්ගේ කටට එබුවේ ඔහුට සිතන්නටවත් ඉඩක් නොතබමිනි.

සංදේශ්ගේ මුව ඇදවී යද්දී අනෙක් අය මහ හඬින් සිනාසෙන්නට විය. නමුත් එකවරම සංදේත් අතකින් මුව වසාගෙන මදක් එහාට දිව යද්දී නම් සිනහා හඬවල් මැකී ගියේය.

*"අයියේ...."*

*"අඩෙ ඒ මොකද වුණේ?"*

***"රිතූ නංගී... ඔයා අයියට කැව්වේ ස්ට්‍රෝබෙරිද?'*** සමාධි ඇසුවේ කෙත්මි මෙතෙක් වෙලා මඟින් ගත් ස්ට්‍රෝබෙරි ගෙඩි වගයක් කමින් සිටි නිසාය.

කෙත්මි 'ඔව්' කියන්නට හිස වැනුවේ ඇත ගසක් අල්ලාගෙන වමනය කරන සංදේශ් දෙස බියපත්ව බලාගෙනය. සමාධි හිසේ අතගසාගෙන බැලුවේ රංග දෙසය.

***"මං බලන්නම්.."*** කී රංග සංදේශ් වෙත යද්දී කෙත්මි සමාධි දෙස බැලුවේ පුදුමයෙනි.

***"අනේ අක්කි ඇයි ඒ?"***

***"බය වෙන්න එපා රිතූ... අයියාට ස්ට්‍රෝබෙරි කන්න බෑ. කෑවම වොමිට් වෙනවා. ඒකයි ඔය."***

***"අනේ... මං ඒක හිතලා නෙමෙයි.."***

***"හරි හරි ළමයෝ.. ඒක ලොකු දෙයක් නෙමෙයි. අන්න අයියා එනවා."***

sinhalaebooks.com

කියමින් සමාධි ඔවුන් වෙත ඇවිද එන සංදේශ්ව දැක්වූවාය. ඒ දෑස් ඈත සිටම තමාවෙත එල්ල වී තිබෙනු දකිද්දී කෙත්මි බිම බලාගත්තේ වරදක් කල පුංචි එකෙකු වගේය.

*"මචං සංදේශ්.. අවුලක් නෑ නේද?"*

*"නෑ දිලූෂ. ප්‍රශ්නයක් නෑ."* කියමින් සංදේශ් යළිත් වාඩි වුණේ කෙත්මි තවමත් බිම බලාගෙන සිටිද්දීය.

*"අම්මේ... ඇති යන්තම්. මං බය වුණා මං මාමා කෙනෙක් වෙන්න යනවද කියලා..."* රනුක් කීවේ සියල්ලන්ම සිනහාගස්වමිනි. තරුදි නම් ඔහුව කෙනිත්තුවේ බිම බලාගෙන සිටින කෙත්මිව දක්වමිනි.

*"සංදේශ් අයියේ... කට අප්පිරියයි වගේ නම් කෝපි එකක් හදලා දෙන්නද?"*

*"අනේ ලොකු දෙයක් හංසි නංගි..."*

සංදේශ් කියන පමාවට හංසි දිලූෂගේ අතකින් ඇදගෙන බංගලාව දෙසට ඇවිද ගියාය. අනෙක් අයත්

sinhalaebooks.com

මදක් එහාට ගියේ සංදේශ්වත් කෙත්මිවත් එතන තනි කරමිනි.

තවමත් බිම බලාගෙන කකුලේ ඇඟිලිවලින් බිම හාරන කෙත්මි දෙස සංදේශ් මොහොතක් බලා උන්නේය.

*"සේරම කරලා දැන් මොකද හොර පූසි වගේ බිම බලාගෙන ඉන්නේ..."*

*"ස්.. සොරි... මං හිතලා කලේ නෑ.."* කෙත්මි මිමිණුවේ බිම බලාගෙනමය.

*"බිංකුණ්ඩා වගේ බිම හාරන එක නවත්තලා මෙහේ බලන්න..."*

කෙත්මි බිම බලාගෙනම හිස වැණුවේ 'බැහැ' කියන්නටය.

*"රිතූ..."*

*"කියන දේ අහලා ඔලුව උස්සන්න.."*

sinhalaebooks.com

කෙතරම් කීවත් කෙත්මි ඔලුව උස්සන්නේම නැති තැන සංදේශ් ඇයගේ මුහුණ නිකටින් අල්ලා එසවූයේ බලෙන්ම වාගේය. කෙත්මිගේ මේ වැඩවලට සිනාසෙමින් සිටි සංදේශ් තිගැස්සුණේ කඳුළු පිරී ගිය ඇයගේ දෑස් දකිද්දීය.

*"රිතූ... ඇයි ළමයෝ මේ ඇස්වල කඳුළු?"*

සංදේශ් එසේ අසන පමාවට කෙත්මි අඬාගෙනම ඔහුගේ පපුවට බර වූයේ සංදේශ් කිසිවක් සිතාගන්නට බැරිව බලා ඉද්දීය.

*"ඇයි ළමයෝ මේ?"*

*"මට.. මට... සමාවෙන්න.. මං ඒක... හිතලා නෙමෙයි.. අනේ.. ඔයා..."*

*"අනේ මැණිකේ... කෝ ඉතිං.. මං දැන් ඔයාට මොකුත් කිව්වේ නෑනේ...ෂ් ෂූ... අඬන්න එපා දැන්. ඒක ඉවරයි."*

*"මෝඩයා... කලින් කියන්න තිබ්බානේ මට කන්න බැරි ඇයි කියලා... දවස් කීයක් මට*

sinhalaebooks.com

*ස්ට්‍රෝබෙරි අරන් දුන්නද...*" කෙත්මි කීවේ අත මිට මොළවා ඕහුගේ බාහුවකට ගසමිනි.

*"හරි හරි බං... දැන් දන්නවානේ. අනේ මන්දා උඹව බැඳලා මං කොච්චරකල් යහතින් ජීවත්වෙයිද දන්නේ නෑ බං..."*

සංදේශ් සිනාසෙමින් කියද්දී කෙත්මි දෑස් කුඩා කර ඕහු දෙස බැලුවාය.

*"මොකක්ද කියන්නේ.. බඳින්න?"*

*"ඇයි... බඳින්න බැරිද කියන්නේ දැන්?"*

*"මේ මගෙන්ද අහන්නේ ඔයා...? අද හරි කමක් නෑ අනේ බඳිනවා නම් බඳිමු."*

කෙත්මි කීවේ ඕහුගේ කොපුලක් තදින් දත්වලට හසු කරගනිමිනි..

*"ඔව්... ඔව්.. මේකිට ඒක කරගන්නකම් පුදුම උණක් තියෙන්නේ අයියේ... ඔය අයියව කන්න එපා ගෑණියේ... බලපං මූණේ දත් පාරත් හිටලා"*

කියමින් එතනට පැමිණ කෝපි කෝප්ප දෙකක් මේසය මත තැබූ හංසි යන්නට හැරුණේ ඔවුන් දෙදෙනාට නිදහසේ ඉන්නට ඉඩහරිමිනි. කෙත්මි සිනාසෙමින්ම සංදේශ්ගේ කම්මුලේ රත් පැහැයෙන් සලකුණු වී ඇති දත් පහර මත හාදුවක් තැබුවාය.

*"ඇත්තද අර හංසි කියන්නේ?"*

සංදේශ් ඇසුවේ කෙත්මිව තවත් ඔහු වෙත ළං කර ගනිමිනි.

*"ඒකිට පිස්සු අනේ..."*

*"හ්ම්... අම්මලා නම් කියන්නේ මේවා පිළිවෙලක් කරමු කියලා රිතූ... ඒ වුණත්..."*

*"මං දන්නවා... සමාධි අක්කි ගැන නේද දැන් ඔය හිතන්නේ?"*

*"සොරි රිතූ... හැමදාමත් ඔයාගේ දේවල්වලට නංගි බාධාවක් වෙනවා කියලා හිතන්න එපා. ඒත්... නංගි පිළිවෙළක් වෙනකම් මං කොහොමද..."*

sinhalaebooks.com

*"අනේ අයියේ... මේ අහන්න... මං කවදාවත් සමාධි අක්කා ගැන අහිතක් හිතන්නේ නෑ. මට මේ තරම් ආදරේ කරන නපුරෙක් ලැබුණේ සමාධි අක්කා නිසානේ... කොහොමත් සමාධි අක්කා ගැන බලන්නේ නැතුව අපේ වෙඩින් එක ගැන හිතන්න ඕන නෑ අයියේ. මාත් ඒකට කැමති නෑ."*

*"තැන්ක්ස් රිතූ මාව තේරුම් ගන්නවට. බය වෙන්න එපා මං වෙඩින් එක ගොඩක් කල් දාන්නේ නෑ.."*

*"කල් දැම්මත් මොකද අනේ.. ඔයා ඉන්නවානේ මාත් එක්ක... මේ අයියේ..."*

කෙත්මි කතාව වෙනස් කලේ හදිස්සියේ යමක් සිහිපත් වීය.

*"ම්..."*

*"සමාධි අක්කි කෙනෙක් ගැන හිතනවා කියලා මට හිතෙනවා. ඒත් පරණ දේවල් නිසා එයා ඉස්සරහට යන්න කැමති නෑ වගේ දෙයක් තියෙන්නේ.."*

sinhalaebooks.com

"මං දන්නවා බබා... ඔයා දන්නවද ඒ කොල්ලා නංගි පුංචි කාලේ ඉඳලා නංගිට ආදරේ කරනවා. ඌ ඒක නංගිට කියන්න කලින් අසිත ඉස්සර වුණා.."

"මොකක්..."

කෙත්මි පුදුමයෙන් කෑගැසුවාය.

"ඔයා කියන්නේ රංග අයියා ඒ කාලේ ඉඳලා සමාධි අක්කිට ආදරේ කළා කියලද?"

"හ්ම..."

"අපරාදේ අයියේ... ලස්සනට ගෙවෙන්න තිබුණ ජීවිතයක් අසිත නිසා විනාස වෙලා ගියා..."

"සේරම වෙන්නේ හොඳට රිතූ... පැංචි නොවුණානම් ඌට අහුවෙන්නේ ඔයා... උන් පැංචිට දීලා තිබුණ වද... පැංචි දරාගෙන හිටියට ඔයාට ඒ දේවල් දරාගන්න හිතන්නවත් බෑ බබා.."

sinhalaebooks.com

***"අක්කි පව් අයියේ... දැන් ඉතිං මොකද වෙන්නේ?"***

***"බලන් ඉන්නකෝ..."***

sinhalaebooks.com

46.

සමාධි රනුක් කියන කතාව අසා උන්නේ දුක්බරවය. රෑ කෑමෙන් පසු රනුක් සමාධිවත් තරුදිවත් ඇදගෙන එළියට ආවේ කියන්නට දෙයක් ඇති බව කියමිනි. අනෙක් අය උන්නේ සාලයට වී කතා බහ කරමිනි.

*"මල්ලි එතකොට කියන්නේ අයියා වෙඩින් එක ගන්න බෑ කියනවා කියලද?"*

*"බෑ කියනවා නෙමෙයි අක්කේ... අයියා ටිකක් වැඩේ පස්සට දානවා."*

*"අනේ...ඇයි ඒ? රිතූ හරි ආසාවෙන් ඉන්නේ ලස්සන වෙඩින් එකක් ගන්න. දවසක් මාත් එක්කත් කිව්වා."*

*"අක්කේ... ප්‍රශ්නේ මෙකයි.."*

sinhalaebooks.com

*"රනුක්.. අපි ඔය කතාව නවත්තමු. සංදේශ් අයියා කරන දෙයක් කරයි. සුදු අක්කා වුණත් අයියා කියන දේකට අකමැති වෙන්නේ නෑනේ.."* තරුදි කීවේ ඊළඟට කියන දේ නිසා සමාධිගේ හිත පෑරෙන බව දැන දැනමය.

*"නෑ තරූ... මල්ලිට ඒක කියන්න දෙන්නකෝ..."*

*"හ්ම්... මේකයි අක්කේ... අයියා කැමති නෑ අක්කා පිළිවෙලක් වෙන්නේ නැතුව එයාගේ වෙඩින් එක ගන්න..."*

*"මොකක්! එතකොට මං නිසාද අයියා.."*

*"අයියා විතරක් නෙමෙයි අක්කේ.. අපේ සුදු අක්කත් කැමති නෑ එහෙම කරන්න. ඒ නිසා මං මේක අක්කාගෙන් අහන්න හිතුවේ... අක්කාගේ හිතේ එහෙම කවුරුහරි ඉන්නවද?"*

sinhalaebooks.com

රනුක්ගේ පැනයට පිළිතුරක් නොදීම අසුනින් නැඟිටගත් සමාධි ගේ දෙසට යන්නට වූයේ තරුදි පුදුමයෙන් රනුක් දෙස බලද්දීය. රනුක් ඇසක් වසා ඇයට ඉඟි කලේ සිනාසෙමිනි.

*"කෝ අපේ මෝඩයායි රිතුයි?"*

සමාධි ගෙට ආ වේගයටම සාලයේ සිටි හංසිලාගෙන් ඇසුවේ ඔවුන්ද තිගැස්සී යද්දීය.

*"උඩ බැල්කනි එකේ..."*

හංසි කියා නිම වෙන්නටත් පෙරම සමාධි උඩට දිව්වේ දිලූෂත් පුදුමයෙන් බලා ඉද්දීය. රංගත් බලා උන්නේ ඇය යන දෙසය.

*"ඒ මොකද රංග අයියේ? සමාධි අක්කිට කේන්ති ගිහින්ද?"*

*"ඒ වගේ තමයි හංසි. අපේ එකා මොකක්හරි ගොන් වැඩක් කරාම තමයි කෙල්ල ඔය වර්ෂන් එකට එන්ටර් වෙන්නේ. මට පුදුම අද රිතූවත් ඇහුව එක."*

sinhalaebooks.com

*"ජෝඩුවම එක්ක මොකක් හරි කරන්න ඇති එහෙනම්. අර මෝඩ බතලයා එළියට එක්කන් ගිහින් මොනවා හරි කියන්න ඇති ෂුවර් එකටම. ඕකා ඔහොමමයි."* හංසි බනින්නට වූයේ රනුක්ටය.

සමාධි උඩ බැල්කනියට එද්දී කෙත්මි උන්නේ සංදේශ්ගේ උරහිසකට හිස බර කරගෙන අහස දෙස බලාගෙනය. සංදේශ්ද උන්නේ කල්පනාවකය. සමාධිගේ අඩි සද්දයට මුලින්ම හිස හරවා බැලුවේ කෙත්මිය.

*"අහ් සමාධි අක්කි.. එන්න."*

*"පැංචි.."* සංදේශ්ද හිස හරවා බැලුවේ එවිටය.

*"සොරි ඩිස්ටර්බ් කළා නම්.. ඔය දෙන්නා එක්ක කතා කරන්න ආවේ මං."*

*"එන්න පැංචි... වාඩි වෙලා කියන්නකෝ. ඇයි මේ කේන්තියෙන් වගේ?"*

sinhalaebooks.com

*“කේන්තියෙන් තමයි අයියේ ඉන්නේ මම. ඇයි ඔයා මෙහෙම කරන්නේ? එක සැරයක් මං නිසා මේ කෙල්ල වැටෙන්න පුළුවන් අඩියටම වැටුණා. දැන් ආයෙමත්... ඔයා මං නිසා එයාගේ සතුට නැති කරන්නද යන්නේ?”*

*“අක්කී?”*

*“පැංචි... මොනවාද මේ කියවන්නේ? මං මොනවද කළේ රිතූට?”*

*“අද ජගත් අංකල් ඔය දෙන්නාගේ වෙඩින් එක ගැන කතා කළාද?”*

සමාධි අහද්දී කෙත්මි සංදේශ් දෙස බැලුවේ පුදුමයෙනි. ඒ බවක් සමාධිට නොකියන ලෙස තමාටත් කීවේ ඔහුය. සමාධි එය දැනගත්තේ කාගෙන්ද? නමුත් සංදේශ්ගේ මුහුණේ නම් එතරම් පුදුමයක් පෙනෙන්නට නැත.

*“ඔව් පැංචි... අංකල් කතා කළා...”*

*“ඉතිං...? වෙඩින් එක ඉක්මනට ගන්නවද?”*

sinhalaebooks.com

"මේකයි අක්කේ.. අපි බැලුවේ තව ටික දවසක් මෙහෙම ඉඳලා... පස්සේ.."

"ඇයි ඒ රිතූ... ඔයා කිව්වා නේද ඉක්මනට ලොකු වෙඩින් එකක් අරන් අපේ ගෙදර එනවා කියලා? ඇයි දැන් කල් දාන්නේ?"

"අක්කේ.. මේ.."

"අපේ මෝඩයාද කිව්වේ රිතූ ඔයාට ඔහොම කියන්න කියලා?"

"අනේ නෑ අක්කේ.. ඒක අපි දෙන්නා කතාවෙලා ගත්ත තීරණයක්."

"මං දන්නවා ඒ තීරණේට හේතුව මම කියලා. ප්ලීස්... එහෙම කරන්න එපා රිතූ. අයියේ... ඔයාටත් එක්කමයි මං කියන්නේ... මං ගැන වද වුණා ඇති. මට දැන් මං ගැන බලාගන්න පුළුවන්.."

sinhalaebooks.com

*"පැංචි... මං උඹේ අයියා. කොහෙන් හරි ඔයා දැන් ඇත්ත දැනගෙන නේ ඉන්නේ... එහෙනම් මේකත් අහගන්න. ඔයා පිළිවෙළක් වෙනකම් මං රිතූව මැරි කරන්නේ නෑ..."*

*"අයියේ... මං ඔයාට කිව්වොත් මං හැමදාමත් මේ විදිහට තනියම ඉන්න කැමතියි කියලා?"*

*"එහෙනම් මං කවදාවත් රිතූව මැරි කරන එකක් නෑ පැංචි..."*

සංදේශ් කීවේ කෙත්මිගේ දෑසට කඳුළු පිරී එද්දීය. මද අඳුරේ වුවද ඇයගේ කඳුළු සංදේශ් මෙන්ම සමාධිත් දුටුවෝය.

*"අයියේ... පිස්සුද ඔයාට? මේ කෙල්ලව ළං කරගත්තේ ඔය විදිහට අතරමං කරන්නද?"*

*"කරන්න දෙයක් නෑ පැංචි. හැම දෙයක්ම වෙන්නේ ඔයාගේ තීරණේ උඩ තමයි. රිතූට කලින් ඔයා මගේ නංගි වුණේ..."*

*"මාත් අයියාගේ තීරණේට කැමතියි අක්කේ... අයියා කියන කතාවේ වරදක් නෑ..."*

"රිතූ ඔයත්... ඇයි ඔය දෙන්නා මේ විදිහට මාව අසරණ කරන්නේ? ඔය දෙන්නා එකතුවෙන එක ගැන මේ ලෝකේ වැඩියෙන්ම සතුටුවෙන කෙනා මම. එහෙම එකේ..."

"එහෙනම් අපි කියන දේ ගැනත් හිතලා බලන්න අක්කේ. අයියා ඔයාට වරදක් කරන්න නෙමෙයිනේ හදන්නේ..."

"හරි දැන් ඔය දෙන්නා මට මොනවද කරන්න කියන්නේ?"

"හොඳ කෙනෙක් හොයලා මැරි කරමු පැංචි..."

"නොදන්නවා වගේ කතා කරන්නේ ඇයි අයියේ... මට වුණ දේවල් එක්ක මං කොහොමද ආයෙමත්..."

"පැංචි... මං කවදාවත් ඔයාට වරදක් කරන්නේ නෑ. ජීවිතේ එකතැනක වැරදුණා කියලා එතනින් නතර වෙන්න එපා."

sinhalaebooks.com

"හ්ම්... ඔය දෙන්නා වෙනුවෙන් මං කැමති වෙන්නම් අයියේ... මට මේ ලෝකේ දැන් වැඩියෙන්ම වටින්නේ ඔය දෙන්නාගේ සතුට."

"අපි වෙනුවෙන් නෙමෙයි... ඔයා නොදැන... ඔයාගෙන් පුංචි ඉඟියක්වත් නැතුව.. අවුරුදු ගානක් තිස්සේ ඔයාට තාමත් ආදරේ කරන අර කොල්ලා වෙනුවෙන් මේකට කැමති වෙන්න පැංචි..."

"මොන කොල්ලාද අයියේ? කවුරු ගැනද ඔයා දැන් ඔය කියන්නේ?"

"උඹ හොඳටම දන්න කෙනෙක් පැංචි... මං ඇත්තටම පසුතැවෙනවා ඌ ගැන කලින්ම ඔයත් එක්ක කතා කරන්න බැරි වුණ එක ගැන."

"අනේ කවුද කියන්නකෝ අයියේ..."

"රිතූ... ඔයාම කියන්න මෙන්න මෙයාට. මං පහළට ගිහින් අරූව එවන්නම්.." කී සංදේශ් සමාධිගේ හිසත් අතගාගෙන පහළට ගියේ සමාධිගේ දැස් කෙත්මි වෙතට හැරෙද්දීය.

sinhalaebooks.com

***"රිතූ... කවුරු ගැනද මේ අයියා කියන්නේ?"***

***"සමාධි අක්කී... අයියා ඔය කියන්නේ ඔයාගේ හිතේ ඉන්න කෙනා ගැන."***

***"හිතේ ඉන්න කෙනා කිව්වේ මේ..."***

***"ඔව් ඔව්... රංග අයියා ගැන තමයි කියන්නේ. රංග අයියා මුල ඉඳන්ම ඔයාට ආදරේ කරලා අක්කී. එයා..."*** කෙත්මි කියාගෙන ආ දෙය නතර කළේ ඔවුන් වෙතට ඇවිද එන රංගව දකිද්දීය. ඇය ඔහු වෙතත් සිනහවක් පා සමාධිගේ දෑතින් අල්ලා ගත්තාය.

***"අන්න එනවා... ඔය දෙන්නම කතා කරගන්නකෝ එහෙනම්. අයියා කිව්වා වගේ අපි කියන නිසා නෙමෙයි... ඔයාගේ හිතට එකඟව තීරණයක් ගන්න."***

sinhalaebooks.com

47.

*"රිතූ......"*

*"පැංචී...."*

සංදේශ් උඩුමහළ දෙස බලාගෙන දෙදෙනාගේම නම් කියා කෑගැසුවත් පිළිතුරක් නැත. රංග පහළට ආවේ සිනාසෙමින් ඇද සිටි ෂර්ට් එකේ අතක් නමමිනි.

***"කෝ බං මේ ගෑණු දෙන්නා... බලපං මං මේ කීයේ ඉඳන්ද ලෑස්ති වෙලා ඉන්නේ..."***

***"උඹ විතරයක්ද යකෝ... මේ මාත් ඉන්නවා පේන්නේ නැද්ද? මදැයි ඉඳලා ඉඳලා කසාදයක් බැඳගත්තා මාත්..."***

sinhalaebooks.com

රංග කීවේ සංදේශ්ගේ මුවඟ සිනහවක් නංවමිනි. ඔව්. මාස හයකට පෙර සංදේශ්ගේ හා රිතූගේ විවාහයත් සමඟම සමාධිගේත් රංගගේත් විවාහය සිදු වුණේ සමාධි රංගගේ යෝජනාවට කැමති වීමත් සමඟය.

*"ඇයි දැන් ඉඳලා ඉඳලා බැඳගත්ත කසාදේ නිසා ඔය මහත්තයට මොනවද අඩු වුණේ?"*

සමාධි පහළට ආවේ එසේ අසාගෙනමය. රංග සංදේශ් දෙස බලා කට ඇද කලේ දැන් ඉතිං ගැලවීමක් නැති බව දැනගෙනය.

*"මොනවද පැංචි මෙච්චර වෙලා කළේ? කෝ අර හොල්මන?"* සංදේශ් ඇසුවේ කතාව වෙනතකට හරවමිනි.

*"මෙහේ හොල්මන් නෑ හරිද අයියා... නංගි දැන් එයි. ඔයාලා දෙන්නට පුදුම කලබලයක්නේ තියෙන්නේ..."*

*"කලබල වෙන්නේ නැතුව... කේක් කපලා ඉවර වුණාට පස්සේ බර්ත්ඩේ පාටි එකට ගිහින් වැඩක්ද?"*

sinhalaebooks.com

***"අපෝ රංග අයියා ඒ ගැන බය වෙන්න එපා. අපේ මල්ලි මම නැතුව කීයටවත් බර්ත්ඩේ කේක් එක කපන්නේ නෑ..."***

කෙත්මි කීවේ සුන්දර කෙහෙල් දල්ලේ පාට ගවුමකින් සැරසී පහළට එමිනි.

***"ඔය මැඩම්ට අමතකද දන්නේ නෑ... දැන් මැඩම්ගේ තැන තරුට ගිහින් ඉවරයි කියලා.."*** සංදේශ් කීවේ ඇයගේ සුන්දත්වය දෑස්වලින් විඳගනිමිනි.

***"අයියේ... බොරුවට නංගිව කේන්ති නොකර ඉන්නවා.."*** සමාධි කීවේ සංදේශ්ගේ උරහිසට පහරක් ගසමිනි.

***"බොරු නෙමෙයි ඉතිං... ඔය වයසට ලව් කරන්න ගියාම ඉතිං... සියල්ලට ප්‍රථම ප්‍රේමයනේ.."***

***"එහෙම කළ දාට තමයි ඔය බතලයා මගෙන් පාඩමක් ඉගෙන ගන්නේ.. ඔය දෙන්නත් බොරුවට කැගැහුවට දැන් යන්න ගානක්වත් නෑ. යනවා නම් ඉක්මනට එන්න නැත්තම් අපි යනවා යන්න."*** කියමින් කෙත්මි සමාධිවත් ඇදගෙන එළියට යද්දී

sinhalaebooks.com

සංදේශුත් රංගත් මුහුණින් මුහුණ බලාගත්තේ පුදුමයෙනි.

*"ඒ මොකක්ද බං ඒ වුණේ? අපියැ පරක්කු වුණේ.."*

*"වරෙන් වරෙන් දැන් යන්න. දැන් ඔය අස්ස කුලප්පුව හැදිලා ඉන්නේ මල්ලි එයා නැතුව කේක් කපයි කියලා බය වෙලා."*

කියමින් සංදේශ් වාහනයේ යතුරත් අතට ගෙන නැඟිට්ටේ රංග සිනාසෙමින්ම ඔහු පසුපසින් එද්දීය.

රනුක් මෙන්ම අම්මලාත් බලා උන්නේ කෙත්මිලා එනතුරුය. තරුදි පසෙකට වී පසන් සමඟ කතා කරමින් උන්නේ රනුක්ගේ දෙනෙත් වරින් වර ඔවුන් වෙත යද්දීය. ඔහු අම්මලා අසලට වී ඔවුන් අසලට යා නොහැකිව බලා උන්නේ කෙත්මිලාගේ ප්‍රමාදයට හිතෙන් දොස් පවරමිනි.

*"බලන්නකෝ ජගත් මේ ළමයි තාම නෑනේ... මොනවා කරනවද මෙච්චර වෙලා..? මං හංසිට කියන්නද කෝල් එකක්වත් දෙන්න කියලා..?"*

sinhalaebooks.com

***"තව ටිකක් බලමු හසා. දැන් ඉතිං පොඩි ළමයි නෙමෙයිනේ. ඒ ගෙවල්දොරවල් වල වැඩත් ඉවර කරලා එපැයි එන්න..."***

ජගත් කීවේ ඔවුන් වෙත එන හංසිත් දිලූෂත් දෙස බලා සිනහවක් මුවට නංවාගෙනය.

***"මොකද අංකල් මේකාගේ මූණේ හැටි?"*** හංසි ඇසූවේ මුහුණත් ඇදකරගෙන සිටින රනුක් දෙස විමසිල්ලෙන් බලමිනි.

***"අක්කා තාම නැති නිසා වෙන්න ඇති."***

***"අහ්... අක්කලා අන්න ළඟ එනවලු. මං දැන් කෝල් කළා... මූණ පපඩම වගේ කරන් ඉන්නේ අක්කා පරක්කු නිසා නම් දැන් මූණ පොඩ්ඩක් හදාගනිම්.."***

හංසි කීවේ රනුක් වෙත අමුතුම ආකාරයේ සිනහවක් පා ඔහුගේ හිසකෙස් අවුල් කරමිනි.

ඒ සමඟම ඇසුණේ ගෙමිදුලේ වාහනයක් නතරවන හඬකි. හසන්ති සිනාසෙමින් දොර

වෙත යද්දී ජගතුත් ඒ පසුපසින්ම ගියේ හංසි සඟවාගෙන සිටි සිනහව අපහසුවෙන් පිට කරද්දීය.

*"මොකෝ බං?"*

*"ඇයි අප්පා... ඔයාට පේන්නේ නැද්ද ටොමියෝ මේ බතලයා මූණ ඇද කරගෙන ඉන්නේ ඇයි කියලා?"* කියමින් හංසි ඔහුට දෑසින් තරුදිලා සිටි දෙස දැක්වූවේ දිලූෂටද සිනහවක් නැගෙද්දීය.

*"හැපි බර්ත් ඩේ මගේ බතලයෝ..."*

කෙත්මි කෑගසමින් දුවගෙන විත් රනුක්ගේ ඇඟට පැන්නේ බලා සිටි සියල්ලන් මහ හඬින් සිනාසෙද්දීය.

*"පරක්කු වෙලා ඇවිල්ලා මෙතන... බැහැපං බං අක්කේ මගේ කොන්ද කඩන්නේ නැතුව..."* රනුක් කීවේ මවාගත් අමනාපයකිනි.

*"මං එන්න කලින් කේක් එක කපලා තිබ්බා නම් කඩන්න තමයි ආවේ කොන්ද.."*

sinhalaebooks.com

*"ඈ යකෝ... මං කවද්ද අක්කේ තමුසේ නැතුව කේක් කැපුවේ?"*

*"කියන්න බෑ ඉතිං.. දැන් තව කට්ටිය ඉන්නවානේ.."*

කෙත්මි තරුදි දෙසත් දෑස් කොණින් බලා කීවේ සංදේශුත් රංගත් අපහසුවෙන් සිනහව නවතා ගනිද්දීය.

*"අපෝ ඇති ඇති හුරතල් වුණා අක්කායි මල්ලියි. දැන් වරෙන් මේ කේක් එක කපන්න.."*

හංසි කීවේ රතු පැහැති රිබන් පටිය ගැට ගැසූ කුඩා පිහිය රනුක් අත තබමිනි.

සියල්ලන්ගේ සුබපැතුම් මැද රනුක් කේක් එක කපා සියල්ලන්ටම කේක් කැව්වේ කාලයකට පසුව සියල්ලන් එකතු වූ සතුටිනි. සියල්ලන්ගෙන් ලද තෑගි පාර්සල් පසෙක ගොඩගැහෙද්දී කෙත්මි කුඩා පෙට්ටියකුත් රැගෙන රනුක් වෙත ආවේ සංදේශ්ගේ අතකින්ද ඇදගෙනය.

*"අම්මා... තාත්තා... හංසි.. සමාධි අක්කී ඔයාලාත් එන්නකෝ..."*

sinhalaebooks.com

කෙත්මි සියල්ලන්ටම කතා කළේ ඔවුන් පුදුමයෙන් ඇය දෙස බලද්දීය. සංදේශුත් බලා උන්නේ පුදුමයෙනි. ඔවුන් දෙදෙනා රනුක්ට ගත් තෑග්ග ඔහුට දුන්නේ සියල්ලන්ටම පෙරය. දැන් මේ කරන්නට යන්නේ කුමක්ද?

*"ඔන්න මල්ලී... ඔයාගේ බර්ත්ඩේ එකට මගෙනුයි අයියාගෙනුයි ස්පෙෂල් ගිෆ්ට් එකක් තියෙනවා..."*

*"ස්පෙෂල්?"*

තමාටම මුමුණා ගනිමින් රනුක් තෑග්ග අතට ගත්තේ පුදුමයෙනි.

*"මේක මුලින්ම මල්ලිට කිව්වා කියලා තරහා වෙන්න එපා හොදද සුදු මහත්තයා..."*

කෙත්මි සංදේශ්ගේ සවනට ලං වී කිව්වේ ඔහු තවමත් පුදුමයෙන් රනුක් තෑග්ග විවර කරන බලා ඉද්දීය.

*"අක්කේ....!"*

රනුක් කෑගසාගෙන කෙත්මිව වැළඳගත්තේ ඇස් දෙකේ කඳුළු පුරවානෙය.

***"HAPPY BIRTHDAY මාමා.."***

පුංචි නිල් පැහැ ළමා සපත්තු යුවලත් සමඟ තිබූ කාඩ්පත සංදේශ් මෙන්ම අනිත් අයත් දුටුවේ මදක් පසුවීය.

***"දෙයියනේ රිතූ..."***

සංදේශ් දෝතින්ම මුව වසාගෙන එහෙම්මම පුටුවකට බර වුණේ සතුට දරාගන්නට බැරිවය. රනුක්ගෙන් මිදුණ කෙත්මි පැමිණ සංදේශ් අසලින් වාඩි වී ඔහුගේ පපුවට හිස බර කරගත්තේ නොදැනීම ඔහුගේ අතක් ඇයගේ හිස මත රැඳෙද්දීය.

***"මගෙත් එක්ක තරහා නෑ නේද?"***

***"පිස්සුද බබා... ඇයි මං ඔයත් එක්ක තරහා වෙන්නේ? මට හරිම සතුටුයි මැණික."***

සංදේශ් කීවේ ඇයගේ හිස්මුදුන මත හාදුවක් තබමිනි.

හසන්තිත් ජගතුත් පැමිණ ඔවුන්ව මැදිකරගෙන වාඩි වෙද්දී හංසි, සමාධි මෙන්ම දිලූෂත් බලා උන්නේ ඇස් දෙකේ සතුටු කඳුළු පුරවාගෙනය.

sinhalaebooks.com

රනුක් ඔහු අසලින්ම සිටි තරුදිගේ උරහිස වටා අතක් දමාගෙන ඇයව ළං කර ගත්තේ කඳුළක් පිසදමමිනි.

*"සමාධි අක්කී... ඊළඟට ඔන්න ඔයාටයි අපේ හංසියාටයි තමයි චාන්ස් එක. ඒකත් හොඳයි. නැද්ද බබා?"*

*"ඒ මොකද?"* තරුදි ඇසුවේ පුදුමයෙනි.

*"ඇයි අනේ එතකොට අපේ වෙඩින් එක දවසට මල් කුමාරියෝ මල් කුමාරයෝ අමුතුවෙන් හොයන්න දෙයක් නෑනේ..."*

*"හිතන් ඇති... ඔය පුංචි මහත්තයාත් දැන් ලෑස්ති වෙන්න වෙඩින් එක ගන්න. මං තරුදිට නම් කිව්වා.. ගෙදර හිටි කෙල්ලෝ දෙන්නම දීග දුන්නා. දැන් ඉතිං අපටත් කෙල්ලෙක් ගේන්න ඕන."*

හසන්ති කීවේ රනුක් හිස කසමින් තරුදි දෙස බලද්දීය.

*"මට හරි සතුටුයි අයියේ අද... මහා අඳුරු පාතාලෙකට වැටෙන්න තිබ්බ මගේ ජීවිතේ බේරගෙන මේ ලස්සන ලෝකේ හදලා දුන්නේ ඔයා.*

sinhalaebooks.com

***ඔයාට ගොඩක් පිං අයියේ... මං ඔයාට ගොඩක් ආදරෙයි..."*** කෙත්මි කීවේ සංදේශ්ගේ පපුව මත සියුම් හාදුවක් තවරමිනි.

නිමි.